# මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම්

# 2025

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA





# මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම්

## ශ්‍රී ලංකා මහ බැංකුව

# 2025

75 YEARS

STABILITY FOR PROSPERITY

1950-2025

## අපගේ දැක්ම

ශ්‍රී ලාංකේය ජනතාවගේ සෞභාග්‍යය උදෙසා දායක වන විශ්වසනීය සහ ගතික මහ බැංකුවක්

## අපගේ මෙහෙවර

සර්වජන අන්තර්ගතභාවය සහ තිරසාර වර්ධනයට සහාය වීම උදෙසා දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සුරක්ෂිත කිරීම

## අපගේ සාරාර්ථ

### සුපිළිපන්බව

සදාචාර පැවැත්ම

විශ්වසනීයත්වය

අඛණ්ඩතාව

නායකත්වය

වෘත්තීයභාවය

තාක්ෂණික විශිෂ්ටත්වය

ස්වාධීන දැක්ම

### වගවීම සහ විනිවිදභාවය

වගකීම

හිමිකාරිත්වය

කැපවීම

පාලනය

විනිවිදභාවය

### අන්තර්ගතභාවය

ප්‍රගමනශීලිත්වය

සමායෝජනය

සාමූහිකත්වය



# පරිශීලක සටහන

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ දක්වා ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල ව "ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් 2025" ප්‍රකාශයට පත් කෙරේ.

මහ බැංකු පනතේ 99(2) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි මෙහි ඇතුළත් මූල්‍ය ප්‍රකාශ බැංකුවේ පාලක මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර මහ බැංකු අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් අත්සන් කර විගණකාධිපති විසින් විගණනය කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ එක් එක් මූල්‍ය වර්ෂය අවසාන වී මාස හතරක් ඇතුළත මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7 (1) (ඕ) වගන්තිය ප්‍රකාර ව මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ මෙහෙයුම් පිළිබඳ ව පාර්ලිමේන්තුවට, රජයට සහ ජනතාවට දැනුම් දිය යුතු අතර මෙම සවිස්තරාත්මක වාර්තාව තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව එම කර්තව්‍ය සපුරාලයි.

ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ සෑම කටයුත්තක දී ම විනිවිදභාවය, වගවීම සහ ස්වාධීනත්වය පවත්වා ගැනීමට බැඳී සිටී. ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයින්, මූල්‍ය විශ්ලේෂකයින් සහ මහජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යසාධනය සහ නව්‍යතා සම්බන්ධ නිවැරදි හා කාලීන තොරතුරු වෙත ප්‍රවේශ වීමට මෙතුළින් ඉඩ සලසා ඇත. ඒ අනුව රටේ මූල්‍ය අධිකාරිය ලෙස සුපිළිපන් බව හා අපක්ෂපාතීත්වය තහවුරු කරමින් සිය කාර්යයන් අවංකවත් විශ්වසනීයත්වයෙන් යුතුවත් සිදු කිරීම මහ බැංකුවේ අරමුණයි.




තොරතුරු ගවේෂණය පහසු කිරීමේ අරමුණින් මෙම මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් - 2025 හි සවිස්තරාත්මක, සම්පූර්ණ Interactive PDF පිටපතක් ද ප්‍රකාශයට පත් කෙරේ.

මෙහි දැක්වෙන සබැඳිය තුළින් මෙහි මංගත ප්‍රකාශනයට පිවිසිය හැකි ය.

*https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/financial-statements-operations*

# අධිපතිතුමාගේ පණිවිඩය



**ශ්‍රී ලංකාව 2025 වසරේ දී තීරණාත්මක සන්ධිස්ථානයක් සනිටුහන් කළ අතර ආර්ථිකය ස්ථායීකරණයේ සිට කම්පනයන්ට මැනවින් ඔරොත්තු දිය හැකි තිරසාර වර්ධන මාවතකට අවතීර්ණ විය.**

ශ්‍රී ලංකාව මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදයෙන් පසුව ආර්ථිකය කැපී පෙනෙන අයුරින් යථා තත්ත්වයට පත් වීමත් සමඟ 2025 වසර ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා වඩාත් තීරණාත්මක වසරක් විය. අසීරුවෙන් ළඟා කර ගත් සාර්ව ආර්ථික ස්ථායීතාව සහතික කිරීමත්, ආර්ථික ස්ථායීකරණයේ සිට කම්පනයන්ට මැනවින් ඔරොත්තු දිය හැකි මෙන් ම තිරසර ආර්ථික වර්ධනයක් කරා ගමන් කිරීමට සහාය වීම කෙරෙහිත් 2025 වසර පුරා මහ බැංකුවේ මූලික අවධානය යොමු විය. 2025 වසර සඳහා වන මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාව තුළින් ප්‍රතිපත්ති සම්බන්ධ ව විනයක් පවත්වාගෙන යාම, ආයතනික ප්‍රතිසංස්කරණ සහ විචක්ෂණශීලී මූල්‍ය කළමනාකාරීත්වය සඳහා වන අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරයි.

2025 වසරේ දී මහ බැංකුව 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති කාර්යයන්, මෙහෙයුම් ස්වාධීනත්වයෙන් සහ වගවීමෙන් යුතු ව අඛණ්ඩ ව ඉටු කිරීමට කටයුතු කරන ලද අතර මූල්‍ය පද්ධති ස්ථායීතාව සුරක්ෂිත කරමින් දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළේ ය.

දේශීය සහ ගෝලීය අවිනිශ්චිතතා මධ්‍යයේ වුව ද උද්ධමන අපේක්ෂා මනාව පාලනය වීමට ඉඩ සලසමින් සහ ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමට සහාය වෙමින් දත්ත මත පදනම් ව ඉදිරි දැක්මකින් යුතු ව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී. ආයෝජක විශ්වාසය ඉහළ නැංවීමට සහ වඩාත් ස්ථායී මූල්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් නිර්මාණය කිරීමට මෙම ප්‍රවේශය දායක විය.

2025 වසරේ දී මහ බැංකුව මිල ස්ථායීතාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සහ උද්ධමනය කෙටි කාලයක් පැවති සෘණ මට්ටමේ සිට නැවතත් 5%ක ඉලක්කය කරා ක්‍රමයෙන් මෙහෙයවීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. පෞද්ගලික අංශයේ ණය වර්ධනය ඉහළ යාම සඳහා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හේතු වූ අතර එමඟින් අඩු පොලී අනුපාතික වාතාවරණයක් තුළ ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් විය.

ශක්තිමත් නියාමන අධීක්ෂණය සහ පූර්වෝපායික අධීක්ෂණ කටයුතු හේතුවෙන් වසර පුරා ම මූල්‍ය පද්ධතිය මනා ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කළේය. බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල ශේෂ පත්‍ර ශක්තිමත් කිරීම, පාලනය වැඩිදියුණු කිරීම සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් වර්ධනය කිරීම සඳහා මහ බැංකුව අඛණ්ඩ ව එම ආයතන සමඟ වඩාත් සමීප ව කටයුතු කළේ ය. ඉලක්කගත සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ග, දත්ත මත පදනම් වූ ශක්තිමත් අධීක්ෂණය සහ මූල්‍ය අංශයේ ඒකාබද්ධ කිරීම් සම්බන්ධයෙන් වූ ප්‍රගතිය මඟින් මෙම ප්‍රයත්න තවදුරටත් ශක්තිමත් වූ අතර එය පද්ධතිමය ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමට දායක විය.

**දත්ත මත පදනම් ව ඉදිරි දැක්මකින් යුතු ප්‍රතිපත්ති තීරණ තුළින් මෙහෙයවනු ලබන මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වාගෙන යාම සඳහා මහ බැංකුව දැඩි කැපවීමෙන් කටයුතු කරයි.**

වර්ධනය වූ අපනයන ක්‍රියාකාරීත්වය, සංචාරක ඉපැයීම් සහ අඛණ්ඩ ව ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සහාය ඇති ව විදේශීය අංශය 2025 වසරේ දී තවදුරටත් ස්ථාවරත්වයේ සලකුණු පෙන්වීය. මනා සාර්ව ආර්ථික කළමනාකරණය මඟින් වෙළෙඳපොළ මත තීරණය වන විනිමය අනුපාතික රාමුවක් යටතේ විදේශීය අංශයේ ස්වරාක්‍ෂක ශක්තිමත් කිරීමට හැකි විය. මහ බැංකුව විසින් නිල සංචිත ගොඩ නැඟීමේ අරමුණ පෙරදැරි ව නම්‍යශීලි විනිමය අනුපාත ක්‍රමය ආරක්ෂා කරමින් විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතු මෙහෙයවන ලදි.

**මෑත කාලීන ව අත්කර ගත් ජයග්‍රහණ සුරක්ෂිත කර ගැනීම සඳහා අඛණ්ඩ ප්‍රතිපත්ති විනය, ශක්තිමත් ආයතන සහ ඔරොත්තුදීමේ හැකියාවකින් සහ සියලු දෙනාගේ සහභාගිත්වයෙන් යුතු ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා ස්ථිර කැපවීමක් අත්‍යවශ්‍ය වනු ඇත.**

ඊට සමගාමී ව මහ බැංකුව ආයතනික ශක්තිමත්භාවය ඉහළ නැංවීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේ ය. ප්‍රතිපත්තිමය විශ්වසනීයත්වය සහ ආයතනික ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා අනාගතයට සූදානම් මහ බැංකුවක ඇති වැදගත්කම හඳුනාගනිමින් අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණ රාමු සහ ඩිජිටල් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මුලපිරීම් සිදු කරන ලදි. 2025 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශ, අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල ව සකස් කර ඇති අතර විනිවිදභාවය සහ සම්පත් නිසි පරිදි භාවිත කිරීම සඳහා මහ බැංකුවේ අඛණ්ඩ කැපවීම ඒ තුළින් පිළිබිඹු කෙරෙයි.

මහ බැංකුව රටේ පුළුල් ප්‍රතිසංස්කරණ වැඩසටහනට සහාය දැක්වීම සඳහා ද ක්‍රියාකාරී ව කටයුතු කළේ ය. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ උපායමාර්ගවල විවිධ අංශ සම්බන්ධයෙන් රජයට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට තාක්ෂණික සහාය සහ ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දෙන ලදි. දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වය සඳහා අදාළ ප්‍රතිපත්ති, ශක්තිමත් ආයතන සහ මුදල්, මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය අංශ අතර ශක්තිමත් සම්බන්ධීකරණයක් අවශ්‍ය බව හඳුනාගනිමින් මෙම උත්සාහයන් මෙහෙයවනු ලැබිණි.

2025 වසරේ දී මහ බැංකුව විසින් සිය ආයතනික ගමන්මගෙහි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 75 වන සංවත්සරය සාඩම්බරයෙන් සමරන ලදි. 1950 වසරේ දී ස්ථාපිත කළ දා සිට මහ බැංකුව ජාතිය සමඟ එක් ව වර්ධන, පරිවර්තන සහ අභියෝගකාරී කාලසීමා පසු කරමින් විකාශය වූ අතර මෙම සන්ධිස්ථානය බැංකුවේ උරුමය පිළිබිඹු කිරීමටත් ස්වාධීනත්වය, වෘත්තීයභාවය හා සුපිළිපන්භාවය සඳහා වන එහි කැපවීම නැවත තහවුරු කිරීමටත් වඩාත් සංකීර්ණ ගෝලීය පරිසරයක් තුළ දේශගුණික විපර්යාස තුළින් වන අවදානම්, ඩිජිටල් පරිවර්තනය වැනි උද්ගත වෙමින් පවතින අභියෝග සඳහා සූදානම් වීම සඳහාත් අවස්ථාවක් සලසා දුන්නේ ය.

ඉදිරිය දෙස බැලීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන තිබුණ ද මෙම ජයග්‍රහණ ආරක්ෂා කර ගැනීම සඳහා අඛණ්ඩ ප්‍රතිපත්ති විනයක් සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් අවශ්‍ය බව මහ බැංකුව විශ්වාස කරයි. දේශගුණික හා භූ දේශපාලනික කම්පන හේතුවෙන් ගෝලීය පරිසරය අවිනිශ්චිත ව පවතින අතර වේගයෙන් විකාශය වන තාක්ෂණික පරිසරයකට අනුකූල ව ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ, ස්වාරක්ෂක ශක්තිමත් කිරීමේ සහ විශ්වසනීයත්වය පවත්වා ගැනීමේ වැදගත්කම අවධාරණය කෙරේ. එබැවින් මහ බැංකුව සිය කාර්යභාරය ඉටු කිරීමෙහි ලා නොසැලී සිටින අතර ම ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ සිට සියලු දෙනාගේ සහභාගීත්වය සහිත වර්ධන මාවතක් වෙත පිවිසීම දක්වා සහාය වනු ඇත.

විශේෂයෙන් අතිශයින් ම අසීරු අභියෝගාත්මක කාලයක දී ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යමණ්ඩලයේ වෘත්තීයභාවය සහ අවංකභාවය ආරක්ෂා කරමින් මනා කැපවීමෙන් කටයුතු කිරීම පිළිබඳව මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. තව ද රජය, මූල්‍ය ආයතන, වෙළෙඳපොළ සහභාගීවන්නන් සහ ජාත්‍යන්තර හවුල්කරුවන් මහ බැංකුව වෙත ලබා දුන් අඛණ්ඩ සහයෝගීතාව සහ සහාය පිළිබඳ ව ඔවුන්ට මාගේ කෘතඥතාව පළ කරමි. ශ්‍රී ලාංකේය ජනතාව උදෙසා ස්ථාවර, කම්පනයන්ට ඔරොත්තු දිය හැකි සහ සෞභාග්‍යමත් ආර්ථිකයක් ගොඩනැඟීමට අපි එක් ව කැප වී සිටිමු.



**නන්දලාල් වීරසිංහ**
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ ව

## පිහිටුවීම හා නෛතිකභාවය

1949 අංක 58 දරන මුදල් පනත වෙනුවට 2023 සැප්තැම්බර් 15 වන දින සිට බලාත්මක වූ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මඟින් අඛණ්ඩ පැවැත්මක් සහිත සංස්ථාපිත ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය හා ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය හා නියාමනය සඳහා වගකිව යුතු අධිකාරිය ලෙස මහ බැංකුව කටයුතු කරයි. සිය කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී බාහිර බලපෑම්වලින් තොර පරිපාලන සහ මූල්‍ය ස්වාධීනත්වයක් සහිත ආයතනයක් ලෙස ද මහ බැංකුව කටයුතු කරයි.

## අරමුණු

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 6 වන වගන්තියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන්නේ දේශීය මිල ස්ථායීතාව අත් කර ගැනීම හා පවත්වා ගැනීමයි. මෙහි දී ආර්ථික නිමැවුම, එහි විභව මට්ටම දක්වා ඉහළ නැංවීම ද සැලකිල්ලට ගනියි. අනෙක් අරමුණ වනුයේ මූල්‍ය පද්ධතියේ සංවර්ධනය සහ එහි කාර්යක්ෂමතාව සහතික කරමින් මූල්‍ය පද්ධති ස්ථායීතාව සුරක්ෂිත කිරීමයි. මීට අමතර ව ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ පොදු ආර්ථික ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීමට ද සිය සහයෝගය ලබා දෙයි.

## මෙහෙයුම්

මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, විනිමය අනුපාතය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ රටෙහි නිල විදේශ සංචිත කළමනාකරණය කිරීම සිදු කරයි.

එමෙන් ම අප රටේ මූල්‍ය පද්ධතියේ ආරක්ෂාව, ශක්තිමත් බව සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා මූල්‍ය ආයතන නියාමනය සහ අධීක්ෂණය කිරීම ද ගෙවීම් පද්ධති පිළිබඳ අධීක්ෂණ කටයුතු ද සිදු කරයි.

තව ද මහ බැංකුව විසින් නියාමනය හා අධීක්ෂණය කරන මූල්‍ය ආයතන නිරාකරණය කිරීම, සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සම්පාදනය හා ඒවා ක්‍රියාත්මක කිරීම, මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලීතා ආධාරක යෝජනා ක්‍රම පවත්වාගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලේ විශ්වසනීයත්වය සහ ස්ථායීතාව තහවුරු කරමින් ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය. එමෙන්ම මහ බැංකුව රජයේ මූල්‍ය උපදේශක, රජයේ බැංකුකරු සහ රාජ්‍ය මූල්‍ය නියෝජිතයා ලෙස ද කටයුතු කරයි.

## පාලන ව්‍යුහය

මහ බැංකුවේ පාලන රාමුව ප්‍රධාන තීරණ ගැනීමේ මණ්ඩල දෙකකින් සමන්විත වේ. ඒවා නම්, බැංකුවේ සමස්ත පරිපාලනය හා කළමනාකරණය සඳහා වගකිව යුතු පාලක මණ්ඩලය හා මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයයි. මුදල් අමාත්‍යවරයා විසින් නිර්දේශ කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41"අ" වගන්තිය යටතේ ස්ථාපිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය සහිත ව ජනාධිපතිවරයා විසින් මෙම මණ්ඩල සාමාජිකයින් පත් කරනු ලැබෙති.

මහ බැංකුවේ අධිපතිවරයා එහි ප්‍රධාන විධායක නිලධාරියා ද ප්‍රධාන අනුයෝජිතයා ද වේ. මීට අමතර ව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, නියෝජ්‍ය අධිපතිවරු, සහකාර අධිපතිවරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමන්විත වෙයි.

## ජාත්‍යන්තර සහයෝගීතා සහ සේවා

ශ්‍රී ලංකා මහ බැංකුව කුසලතා සංවර්ධනය, ප්‍රතිපත්ති සැකසීම සහ මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණවලට සහාය දැක්වීම ආදී අරමුණු මුල් කොට ගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව (WB), ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ අන්තර්ජාතික පියවීම් බැංකුව (BIS) ඇතුළු ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟත් ක්‍රියාකාරී ව කටයුතු කරයි. මහ බැංකුව, අනෙකුත් රටවල මහ බැංකු, කලාපීය ආයතන සහ ජාත්‍යන්තර නියාමන ආයතන සමඟ ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික ගිවිසුම්වලට එළඹෙන අතර එතුළින් සහයෝගීතාව ඉහළ නැංවීම, දැනුම හුවමාරු කර ගැනීම සහ නියාමන සම්මුතිකරණය සිදු කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව, ගෝලීය සහ කලාපීය ආර්ථික සමුළුවලට සහභාගි වීම තුළින් ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය හා සමීප ව නිරන්තරයෙන් කටයුතු කරන අතර ගෝලීය වශයෙන් මතු වන ආර්ථික හා මූල්‍ය ප්‍රවණතාවන්ට ද ප්‍රතිචාර දක්වයි.

## මහජන සහභාගීත්වය හා සේවා

ශ්‍රී ලංකා මහ බැංකුව සාම්ප්‍රදායික හා ඩිජිටල් මාධ්‍ය ක්‍රම මෙන් ම නිල ප්‍රකාශන ද ඇතුළු විවිධ සන්නිවේදන මාධ්‍යයන් හරහා ජනතාව සමඟින් අඛණ්ඩ සම්බන්ධතාවක් පවත්වාගෙන යයි. ආර්ථික හා මූල්‍ය ගැටලු පිළිබඳ ජනතාවගේ දැනුම්වත්භාවය ඉහළ නංවනු පිණිස මූල්‍ය සාක්ෂරතා සහ ප්‍රජා සම්බන්ධතා වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ අධ්‍යාපනික වැඩසටහන් යනාදිය ක්‍රියාත්මක කරයි. එමෙන් ම බැංකු රෙගුලාසි, පාරිභෝගික ආරක්ෂාව, මූල්‍ය වංචා වැළැක්වීම සහ මුදල් ප්‍රතිපත්තිය ආදි අංශ පිළිබඳ මහ බැංකුව වෙතින් විමසා දැන ගැනීමටත් ඒවාට ප්‍රතිචාර දැක්වීමටත් අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙමඟින් ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම පාරිභෝගික විශ්වාසය ගොඩනැඟීම සහ මූල්‍ය තීරණ ගැනීමේ දී තොරතුරු මත පදනම් ව කටයුතු කිරීම ප්‍රවර්ධනය කිරීමට උත්සහ දරයි.

## මූලස්ථානය

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන කාර්යාලය කොළඹ 01හි පිහිටා ඇති අතර අනුරාධපුර, මාතර, මාතලේ, නුවරඑළිය, කිළිනොච්චිය සහ ත්‍රිකුණාමලය නගරවල ප්‍රාදේශීය කාර්යාල හයක් පිහිටුවා ඇත.

# අන්තර්ගතය


පරිශීලක සටහන III

අධිපතිතුමාගේ පණිවිඩය IV

ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳව VI

ශ්‍රී ලංකා ආර්ථිකයේ අනාගතය ගොඩනැගීමේ වසර 75ක ගමන් මග VIII

## මෙහෙයුම් තොරතුරු 01

**උපායමාර්ගික ප්‍රමුඛතා 01**

**බැංකුවේ කාර්යභාරය 04**

- දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම 04
- මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම 14
- ගෙවීම් සහ පියවීම් 34
- ව්‍යවහාර මුදල් මෙහෙයුම් 40
- ජාත්‍යන්තර කටයුතු 45
- වෙනත් පවරන ලද වගකීම් 47

**බැංකුව කළමනාකරණය කිරීම 54**

- මානව ප්‍රාග්ධනය කළමනාකරණය 54
- තොරතුරු තාක්ෂණය 56
- පොදු පරිපාලන කටයුතු 58

**පාලනය 60**

- පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් 66
- ආයතනික කළමනාකාරිත්වය 70
- ප්‍රධාන නිලධාරීන් 72
- විගණන කමිටු වාර්තාව 76
- අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව 78
- අභ්‍යන්තර විගණනය 79

## මූල්‍ය ප්‍රකාශ 02

- මූල්‍ය සමාලෝචනය 81
- විගණකාධිපති වාර්තාව 84
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 88
- ආදායම් ප්‍රකාශය 90
- අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය 91
- ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය 92
- මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 93
- මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් 95

## අතිරේක තොරතුරු 03

- ප්‍රකාශන සහ තොරතුරු බෙදා හැරීම 2025 197
- ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වන සංවත්සරය 198
- ප්‍රාදේශීය කාර්යාල 200
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන 201

# ශ්‍රී ලංකා ආර්ථිකයේ අනාගතය ගොඩනැඟීමේ වසර 75ක ගමන් මග

## ජාතික වගකීමක් ඉසිලූ ගමන් මගක්



ශ්‍රී ලංකා මහ බැංකුවේ විකාශය අප රටේ ආර්ථික ගමන් මග විදහා දක්වන කැඩපතකි. නිදහසින් පසු මුල් අවධියේ සිට වර්තමානය දක්වා සිදු කළ ප්‍රතිසංස්කරණ, කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව සහ ස්ථායිතාව පවත්වා ගෙන යාම යන සෑම අංශයක් සම්බන්ධයෙන් ම කටයුතු කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික සහ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරයි.

2025 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සිය 75 වන සංවත්සර සැමරුම සනිටුහන් කරන අතර එය හුදෙක් කාලයේ ගලා යාම විදහා දැක්වීමක් පමණක් නොව එතුළින් මුදල් ස්ථායිතාව, මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම සහ ආර්ථික වර්ධනය සඳහා මහ බැංකුව සිදු කළ කැපවීම ද පිළිඹිබු කරයි.

1884



1950



## ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයේ සිට මහ බැංකුවක් කරා

ශ්‍රී ලංකාවේ විධිමත් මුදල් පරිපාලනය ආරම්භ වූයේ 1884 අංක 32 දරන කඩදාසි මුදල් ආඥා පනත මඟින් ස්ථාපිත කරන ලද ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය යටතේ ය. මෙම ක්‍රමය යටතේ විදේශීය සංචිත ප්‍රමාණය අනුව නිකුත් කළ යුතු දේශීය ව්‍යවහාර මුදල් ප්‍රමාණය තීරණය කළ බැවින් එහි දී දේශීය මුදල් කළමනාකරණය සඳහා පැවති නම්‍යශීලීත්වය ඉතාමත් සීමිත ය.

1948 දී නිදහස ලැබීමෙන් පසු ව සංවර්ධන කාර්ය උදෙසා සහාය වීමට හා ආර්ථික කම්පන කළමනාකරණය කිරීමට හැකියාව ඇති නවීන මූල්‍ය අධිකාරියක අවශ්‍යතාව එවකට සිටි පාලකයෝ හඳුනා ගත් හ.

1948 ජූලි මාසයේ දී ඇමරිකානු අර්ථ ශාස්ත්‍රඥ ජෝන් එක්ස්ටර් මහතා අප රටට අවශ්‍ය මහ බැංකුවක් නිර්මාණය කිරීම සඳහා පත් කර එවන ලදි. එක්ස්ටර් වාර්තාව ලෙස හැඳින්වෙන ඔහුගේ නිර්දේශ මඟින් මහ බැංකුවේ මූලික ආයතනික සහ නීතිමය පදනම සපයා ඇත.

1949 අංක 58 දරන මුදල් නීති පනත බලාත්මක කිරීම මඟින් ලංකා මහ බැංකුව විධිමත් ලෙස ස්ථාපිත කරන ලද අතර එහි මෙහෙයුම් කටයුතු 1950 අගෝස්තු 28 දින ආරම්භ කරන ලදි.

## කාර්යභාරය ස්ථාපිත කිරීම

**මහ බැංකුවේ ආරම්භක අරමුණු වනුයේ,**

- දේශීය මුදලේ අගය ස්ථාවර කිරීම (මිල ස්ථායිතාව)
- රුපියලේ විදේශීය අගය ආරක්ෂා කිරීම
- ඉහළ නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ මූර්ත ආදායම ප්‍රවර්ධනය කිරීම
- රටේ ඵලදායී සම්පත් පූර්ණ ලෙස සංවර්ධනය කිරීම දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

මෙම අරමුණු තුළින් බැංකුවේ ආයතනික අනන්‍යතාව මුල් කාලයේ දී පිළිඹිමු කර ඇත.

ආරම්භයේ සිට ම බැංකුව සතු වගකීම් පුළුල් පරාසයක පැවතුණි:

- මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
- සියලුම බැංකු ආයතන අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම හා පරීක්ෂණය
- ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අධිකාරිය ලෙස කටයුතු කිරීම
- ප්‍රමාණවත් මට්ටමේ ජාත්‍යන්තර සංචිත පවත්වා ගැනීම
- වාණිජ බැංකුවල විදේශ විනිමය මෙහෙයුම් කටයුතු නියාමනය
- රජයේ මූල්‍ය නියෝජිතයා, බැංකුකරු සහ මූල්‍ය උපදේශක ලෙස කටයුතු කිරීම



# 1996



## සෘජු පාලන ක්‍රමවල සිට වෙළෙඳපොළ පාදක කරගත් ක්‍රමවේද දක්වා

ආරම්භක දශකවල දී මහ බැංකුව ණය සීමාවන්, පරිපාලන පොලී අනුපාත සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැනි සෘජු මුදල් ප්‍රතිපත්ති උපකරණ වැඩි වශයෙන් උපයෝගී කර ගත්තේ ය. එමෙන් ම ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය යටතේ සිය මෙහෙයුම් කටයුතු සිදු කළේ ය.

1977 දී විවෘත ආර්ථිකය හඳුන්වා දීමෙන් අනතුරුව මහ බැංකුව ක්‍රමයෙන් එහි ප්‍රතිපත්ති රාමුව නවීකරණය කළේය.

## මුදල් ඉලක්කකරණ යුගය

සමස්ත මුදල් සැපයුමේ වර්ධනයට මෙන් ම ස්ථාවර ආර්ථික සංවර්ධනයක් උදෙසා මහ බැංකුව සිය මෙහෙයුම් ඉලක්කය ලෙස සංචිත මුදල් භාවිතා කළ අතර අතරමැදි ඉලක්කය ලෙස පුළුල් මුදල් යොදා ගත්තේ ය.

## වෙළෙඳපොළ වෙත නැඹුරු නියාමන කාර්යය තව දුරටත් ශක්තිමත් වූ මූල්‍ය ක්‍රමයක්

නියාමන කාර්යය තව දුරටත් ශක්තිමත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු-නොවන මූල්‍ය ආයතන අංශය ආවරණය කිරීම ආරම්භ කළේ ය. එමෙන් ම විද්‍යුත් මුදල් හුවමාරු පහසුකම ඇති කරමින් 1992 දී ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හඳුන්වා දුන්නේ ය. වඩාත් නිදහස් හා නවීන මූල්‍ය ක්‍රමවේදයක් ලෙස මහ බැංකුව 1995 සිට වෙළෙඳපොළ තුළින් විනිමය අනුපාතය තීරණය වීමට ද ඉඩ ප්‍රස්ථා විවර කළේ ය.

## 1996: ආයතනයක් වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව පිළිඹිබු කිරීම

මහ බැංකුව මුහුණ දුන් එක් ඛේදජනකතම සිදුවීමක් වනුයේ 1996 ජනවාරි 31 වන දින මුහුණ දුන් ත්‍රස්ත්‍රවාදී බෝම්බ ප්‍රහාරයයි. එම ප්‍රහාරය හේතුවෙන් මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලය ද කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ සිවිල් පුරවැසියන් රැසකගේ ජීවිත ද විනාශ විය.

බෝම්බ ප්‍රහාරයෙන් යටිතල පහසුකම්වලට දැඩි හානි සිදු වී තිබුණ ද දින කිහිපයක් ඇතුළත අත්‍යාවශ්‍ය මෙහෙයුම් කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට මහ බැංකුවට හැකි විය. ලිපි ලේඛන, තොරතුරු තාක්ෂණ පද්ධති සහ ආයතනික ධාරිතාව සැලකිය යුතු මට්ටමකින් නැවත ගොඩනඟන ලදි.

මහ බැංකු කාර්ය මණ්ඩලයේ ඔරොත්තු දීමේ හැකියාව සහ විශිෂ්ට කැපවීම මැනවින් පිළිඹිබු කළ අවස්ථාවක් ලෙස මෙය සැලකිය හැකි ය.

## නව මූලස්ථානයක්, නව යුගයක්

2000 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සිය 50 වන සංවත්සරය සැමරූ අතර එය දශක පහක් පුරා ජාතික ආර්ථිකයට මඟ පෙන්වීම සනිටුහන් කළේ ය. එමෙන්ම මහ බැංකුවේ විස්තාරණය වන කාර්යභාරය ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය නවීකරණය කිරීම පිළිබඳ කැපවීම පිළිබිඹු කරමින් නවීන ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලක් වෙත පිවිසුණි.

## මහ බැංකුවේ අරමුණු නවීකරණය කිරීම

සංශෝධිත මුදල් නීති පනත මඟින් 2002 දී මහ බැංකු අරමුණු නවීකරණය විය.

- ආර්ථික හා මිල ස්ථායීතාව
- මූල්‍ය පද්ධති ස්ථායිතාව

මෙමඟින් ආයතනික අනන්‍යතාව හා වගවීම තව දුරටත් ශක්තිමත් විය.

## ශ්‍රී ලංකා ආර්ථිකයේ අනාගතය ගොඩනැගීමේ වසර 75ක ගමන් මග



2025



## ආර්ථික අර්බුදයෙන් යළි නැඟී සිටීමට ලබා දුන් දායකත්වය

නිදහසින් පසු ශ්‍රී ලංකාව මුහුණ දුන් දරුණුතම ආර්ථික අභියෝගය ජය ගැනීම සඳහා ජාතික ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ගවල කොටසක් ලෙස මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම, පොලී අනුපාත ගැලපුම් සහ ස්ථායීකරණය සඳහා අවශ්‍ය පියවර යනාදිය ක්‍රියාත්මක කළේය.

අධි උද්ධමනය වැළැක්වීම, විදේශ සංචිත යළි ගොඩනැංවීම, ගෙවුම් ශේෂය මත වූ පීඩනය අඩු කිරීම සහ සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීමෙහි ලා මෙම ක්‍රියාමාර්ග අතිශයින් තීරණාත්මක විය.




## නව නෛතික යුගයක්: 2023 ශ්‍රී ලංකා මහ බැංකු පනත

මුදල් නීති පනත අවලංගු කරමින් බලාත්මක කළ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මහ බැංකුවේ ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කළේ ය.

මෙම පනත මඟින් නම්‍යශීලි උද්ධමන ඉලක්කරණ රාමුවක් සහ නම්‍යශීලි විනිමය අනුපාත ක්‍රමයක් අනුගමනය කිරීමට අවශ්‍ය පසුබිම සපයා ඇත.

එමෙන් ම මෙම පනත මඟින් ආයතනික ස්වාධීනත්වය, පාලනය සහ වගවීම ශක්තිමත් වී ඇත.

සාර්ව විචක්ෂණශීලී අධිකාරිය සහ නිරාකරණ අධිකාරිය ලෙස ද මහ බැංකුව නම් කර ඇත.

## සමෘද්ධිය සඳහා ස්ථාවරත්වය: විශ්වසනීය උරුමයක්

ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයක සිට නවීන හා ස්වාධීන මහ බැංකුවක් දක්වා වූ වසර 75ක ගමන් මග තුළින් ශ්‍රී ලංකාවේ ස්ථාවරත්වය සහ සංවර්ධනය සඳහා වන මහ බැංකුවේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරයි.

වර්තමානයේ දී විනිවිදභාවය සහ වගවීම තහවුරු කරන අතර ආයතනික අවධානය වැඩි වශයෙන් යොමු වී ඇති අංශ නම්:

- උද්ධමන අපේක්ෂා පාලනය කිරීම
- මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම
- අර්බුදවලට මුහුණ දීමේ පෙර සූදානම ඇති කිරීම
- මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම

වසර 75ක් පුරා ශ්‍රී ලංකා මහ බැංකුව සිය මෙහෙවර ඉටු කිරීමෙහි ලා නොසැලී කටයුතු කරයි.

ස්ථායීතාව ඇති කිරීම සඳහා කටයුතු කරන අතර දශක ගණනාවක අත්දැකීම්වලින් පෝෂණය වන, ප්‍රතිසංස්කරණ තුළින් තවදුරටත් ඔප්නැංවෙන, තාක්ෂණික විශිෂ්ටත්වය, වෘත්තීයභාවය සහ සුපිළිපන්බව තුළින් ශක්තිමත් වූ මාර්ගයක මහ බැංකුව ඉදිරියට ම ගමන් කරයි.


75 YEARS
STABILITY FOR PROSPERITY
1950-2025

# හිටපු අධිපතිවරුන්



ජෝන් එක්ස්ටර්
1950 – 1953



එන් යූ ජයවර්ධන
1953 – 1954



ශ්‍රීමත් ආතර් රණසිංහ
1954 – 1959



එච් බී දිසානායක
1992 – 1995



ආචාර්ය එච් එන් එස් කරුණාතිලක
1988 – 1992



ඒ එස් ජයවර්ධන
1995 – 2004



සුනිල් මෙන්ඩිස්
2004 – 2006



අජිත් නිවාඩ් කබ්රාල්
2006 – 2015



ඩී ඩබ්ලිව් රාජපතිරණ
1959 – 1967



ඩබ්ලිව් තෙන්නකෝන්
1967 – 1971

1962 1963 1964 1965 1966 1967 1968 1969 1970 1971 1972 1973 1974 1975 1976 1977 1978



එච් ඊ තෙන්නකෝන්
1971 – 1979



ආචාර්ය ඩබ්ලිව් රාසපුත්‍රම්
1979 – 1988

1979 1980 1981 1982 1983 1984 1985 1986 1987



ආචාර්ය
ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
2016 – 2019



මහාචාර්ය
ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්
2019 – 2021

2014 2015 2016 2017 2018 2019 2020 2021 2022



අර්ජුන මහේන්ද්‍රන්
2015 – 2016



අජිත් නිවාඩ් කබ්රාල්
2021 – 2022

01

# මෙහෙයුම් තොරතුරු

උපායමාර්ගික ප්‍රමුඛතා

බැංකුවේ කාර්යභාරය


04 දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම

14 මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම

34 ගෙවීම් සහ පියවීම්

40 ව්‍යවහාර මුදල් මෙහෙයුම්

45 ජාත්‍යන්තර කටයුතු

47 වෙනත් පවරන ලද වගකීම්


බැංකුව කළමනාකරණය කිරීම


54 මානව ප්‍රාග්ධනය කළමනාකරණය

56 තොරතුරු තාක්ෂණය

58 පොදු පරිපාලන කටයුතු


පාලනය


66 පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්

70 ආයතනික කළමනාකාරිත්වය

72 ප්‍රධාන නිලධාරීන්

76 විගණන කමිටු වාර්තාව

78 අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව

79 අභ්‍යන්තර විගණනය

# උපායමාර්ගික ප්‍රමුඛතා

ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලිය 2006 වසරේ සිට අඛණ්ඩ ව වැඩි දියුණු වෙමින් පවතී. මහ බැංකුවේ එක් උපායමාර්ගික සැලසුම් චක්‍රයක් වසර තුනක කාලපරාසයක් දක්වා විහිදෙන අතර එය දිගුකාලීන ආයතනික අරමුණු සහ එදිනෙදා මෙහෙයුම් කටයුතු අතර පැහැදිලි සම්බන්ධතාවක් පවත්වා ගෙන යන ක්‍රමවේදයකි. එය ආයතනික ඉලක්කයන් පිහිටුවීමේ දී හා දෙපාර්තමේන්තු මට්ටමේ සැලසුම් සම්පාදනයේ දී ඉහළ සිට පහළට මාර්ගෝපදේශ ලබා දෙනවාක් මෙන් ම මෙහෙයුම් මට්ටමේ සිටින නිලධාරින්ගේ අදහස් ඉහළ කළමනාකාරිත්වය වෙත ද යොමු කරන ඒකාබද්ධ ක්‍රමවේදයකි.

නීතිමය රාමුව ශක්තිමත් කිරීම හා ස්වාධීනත්වය ඉහළ නැංවීම මෙන් ම විනිවිදභාවය, වගවීම හා විශ්වසනීයත්වය ඉහළ නැංවීම මත පදනම් ව 2024-2026 උපායමාර්ගික සැලැස්ම 2024 දී හඳුන්වා දුන් අතර ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසරේ දී ද එහි ඉලක්කගත කාර්යයන් අඛණ්ඩ ව ක්‍රියාත්මක කළේ ය.

### උපායමාර්ගික ගැටලු හඳුනා ගැනීම

උපායමාර්ගික සැලසුම් චක්‍රය ආරම්භ වන්නේ පාරිසරික විශ්ලේෂණයක් මගින් උපායමාර්ගික ගැටලු හඳුනා ගැනීමෙනි. මෙම ගැටලු හඳුනා ගැනීම සිදු කරනු ලබන්නේ මිල ස්ථායීතාව, මූල්‍ය පද්ධති ස්ථායීතාව, අවදානම කළමනාකරණය, බාහිර පාර්ශ්වකරුවන් මහ බැංකුව පිළිබඳ දරන අදහස් හා මානව සම්පත් සහ තොරතුරු තාක්ෂණය යන අභ්‍යන්තර සාධක පිළිබඳ සිදු කරනු ලබන විශ්ලේෂණ මත පදනම්ව ය. මෙහි දී වැඩි ප්‍රමුඛතාවක් ලබා දිය යුතු ක්ෂේත්‍ර පැහැදිලි ව හඳුනා ගැනීම සඳහා වර්ණාවලියක් භාවිතා කරන අතර මහ බැංකුවේ මැදි කාලීන උපායමාර්ගික දිශානතිය කෙරෙහි බලපාන අභ්‍යන්තර හා බාහිර සාධක විධිමත් ක්‍රමවේදයකට අනුව විශ්ලේෂණය කරයි.

2024 - 2026 සැලසුම් චක්‍රය සඳහා අවශ්‍ය උපායමාර්ගික ගැටලු හඳුනා ගැනීම 2023 වසර අග භාගයේ දී සිදු කරන ලදි.

### උපායමාර්ගික ප්‍රමුඛතා හඳුනා ගැනීම

උපායමාර්ගික ගැටලු හඳුනා ගැනීමෙන් අනතුරු ව කළමනාකරණ සාකච්ඡා වට කිහිපයක් පවත්වා බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා තෝරා ගනු ලැබේ. කාලීන අවශ්‍යතා සහ වෙළෙඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගෙන එක් උපායමාර්ගික සැලසුම් චක්‍රයක් අතර මැද දී වුවත් නව උපායමාර්ගික ප්‍රමුඛතා හඳුන්වා දිය හැකිය.

**උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය**

රූප සටහන - 01




2024-2026 සැලසුම් චක්‍රය සඳහා උපායමාර්ගික ප්‍රමුඛතා 5ක් හඳුනා ගන්නා ලදි.

මෙම ප්‍රමුඛතා ප්‍රධාන ප්‍රමුඛතා සහ වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා ලෙස වර්ගීකරණය කර ඇත. බැංකුවේ මූලික අරමුණු සමඟ ප්‍රධාන ප්‍රමුඛතා සෘජුවම සම්බන්ධ වන අතර වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මගින් බැංකුවේ මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාව සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සපයා දෙනු ලැබේ. එනම් අදාළ පාර්ශ්වයන්ගේ සහභාගිත්වය ඉහළ නැංවීම, අභ්‍යන්තර ක්‍රියාවලි ශක්තිමත් කිරීම, තාක්ෂණය දියුණු කිරීම සහ හැකියාවන් ඉහළ නැංවීමයි.

**ඉහළ සිට පහළට මාර්ගෝපදේශ ලබා දීමේ ක්‍රමවේදයත් පහළ සිට ඉහළ කළමනාකාරිත්වය වෙත තොරතුරු හා වාර්තා සැපයීමේ ක්‍රමවේදයත් යන උපායමාර්ගික ක්‍රමවේද දෙක ම ඒකාබද්ධ කර ක්‍රියාත්මක කරයි. එතුළින් මහ බැංකුව දේශීය මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව ළඟා කර ගනු පිණිස සිය දැක්ම, මෙහෙවර සහ උපායමාර්ගික අරමුණු අතර මනා සබඳතාවක් පවත්වා ගෙන යයි.**

### උපායමාර්ගික ප්‍රමුඛතා සැලසුම් පිළියෙල කිරීම

උපායමාර්ගික ප්‍රමුඛතා හඳුනා ගැනීමෙන් අනතුරු ව, වසර තුනක කාලයක් සඳහා සවිස්තරාත්මක සැලසුම් පිළියෙල කරනු ලැබේ. නිශ්චිත අරමුණු, පැහැදිලි කාලවකවානු සහිත ක්‍රියාමාර්ග, මැනිය හැකි ප්‍රතිඵල සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක, එක් එක් ක්‍රියාව සඳහා වන බර තැබීම්, කාර්තුමය නිමැවුම් ඉලක්ක සහ වගකිව යුතු දෙපාර්තමේන්තු යන තොරතුරුවලින් මෙම සැලසුම් සමන්විත වේ.

### උපායමාර්ගික ප්‍රමුඛතා සැලසුම් ඇගයීම

මෙම සැලසුම් ඒවායේ ශක්‍යතාව සහ ආශ්‍රිත අවදානම් තක්සේරු කිරීම උදෙසා වන ක්‍රමවත් ඇගයීමේ ක්‍රියාවලියකට භාජනය වේ. මෙම කර්තව්‍ය සඳහා, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයින් 10 - 12 දෙනෙකුගෙන් සමන්විත සමාලෝචන කණ්ඩායම් සෑම වසරක දී ම පත් කරනු ලැබේ. ඒ අනුව සාමාන්‍යයෙන් වසරකට සමාලෝචන කණ්ඩායම් පහක් හෝ හයක් පත් කරනු ලැබේ. සමාලෝචන කණ්ඩායමක් තුළ සිටින සාමාජිකයින් බුද්ධිමය සංවාද සැසි පවත්වා උපායමාර්ගික සැලසුම්වලට අදාළ ව කණ්ඩායමේ සාමූහික අදහස් සහ නිර්දේශ ලබා දෙයි.

### උපායමාර්ගික ප්‍රමුඛතා සැලසුම් සාකච්ඡා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම

බැංකුවේ ප්‍රධානත ම සංවාද මණ්ඩපය ලෙස හඳුන්වන වාර්ෂික උපායමාර්ගික සැලසුම් කතිකාවතේ දී මධ්‍ය කාලීන උපායමාර්ගික දිශානතිය පෙන්වන මෙම සැලසුම් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සාකච්ඡා කර බැංකුවේ පාලක මණ්ඩලයේ මාර්ගෝපදේශ ද සහිත ව එකඟතාවකට පැමිණේ.

### උපායමාර්ගික ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම, ප්‍රගති සමාලෝචනය සහ වාර්තා කිරීම

නිමැවුම් ඉලක්කයන්ට අනුව උපායමාර්ගික ප්‍රමුඛතාවල ප්‍රගතිය කාර්තුමය පදනමක් මත සමාලෝචනය කරනු ලබන අතර සෑම කාර්තුවක දී ම ඒවායේ ප්‍රගතිය කළමනාකාරිත්වයට වාර්තා කරනු ලැබේ.

## උපායමාර්ගික ප්‍රමුඛතා

### 2024-2026 මූලික ප්‍රමුඛතා

#### සාර්ව ආර්ථික ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහනට අනුව තිරසාර ආර්ථික වර්ධනයකට දායක වෙමින් මිල ස්ථායීතාව අත්කර ගැනීම

**අරමුණ**

දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම

**අපේක්ෂිත නිමැවුම**

- වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති තීරණ
- රජයට දෙන ශුද්ධ ණය අඩු කිරීම
- මුදල් ප්‍රතිපත්ති මෙවලම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම
- ස්වාධීනත්වය, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය සහ මහ බැංකුව පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු කරමින් මහ බැංකුවෙහි ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම

**අපේක්ෂිත ප්‍රතිඵලය**

- ඉලක්කගත උද්ධමනය ළඟා කර ගැනීම
- උද්ධමන අපේක්ෂාව මනාව පාලනය කිරීම
- අඩු විචලනයක් සහිත විනිමය අනුපාතය
- ඉහළ විදේශ විනිමය සංචිත
- බැංකු පද්ධතියේ අවම ද්‍රවශීලතා ආතතිය

**අපේක්ෂිත බලපෑම**

තිරසාර ආර්ථික වර්ධනය

#### අවදානම අවම කරමින් සහ මූල්‍ය ආයතනවල ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරමින් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීම

**අරමුණ**

මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීම

**අපේක්ෂිත නිමැවුම**

- කාර්යක්ෂම මූල්‍ය අතරමැදිකරණයට දායකවෙමින් මහජන තැන්පතු ලබා ගන්නා ආයතනවල ස්ථාවරත්වය ඇති කිරීම
- ඵලදායී සාර්ව විචක්ෂණශීලී රාමුවක් සහ ඊට අදාළ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම
- අදාළ පනත් සහ රෙගුලාසි සඳහා සංශෝධන සිදු කිරීම
- නිරාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සහ ප්‍රමාණවත් ආරක්ෂණ ජාල යාන්ත්‍රණ ස්ථාපිත කිරීම
- තාක්ෂණය මත පදනම් වන අධීක්ෂණ මෙවලම් ක්‍රියාත්මක කිරීම

**අපේක්ෂිත ප්‍රතිඵලය**

- ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය කරන ලද මූල්‍ය ආයතන
- ක්‍රියාත්මක කරන ලද සාර්ව විචක්ෂණ අධිකාරිය
- වැඩිදියුණු කළ නීතිමය සහ නියාමන රාමු
- ආරක්ෂිත, ඵලදායී සහ කාර්යක්ෂම ගෙවීම් පද්ධතිය

**අපේක්ෂිත බලපෑම**

- ශක්තිමත් සහ කම්පනවලට ඔරොත්තු දෙන මූල්‍ය ආයතන
- මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ විශ්වසනීයත්වය පිළිබඳ ඉහළ මහජන විශ්වාසය

රූප සටහන - 02

## 2024-2026 වැඩි දියුණු කිරීමේ ප්‍රමුඛතා

### ඉහළ විනිවිදභාවයක්, වගවීමක් සහ විශ්වසනීයත්වයක් සඳහා අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය ශක්තිමත් කිරීම

**අරමුණ**

තේරුම් ගත හැකි මෙන්ම අන්තර්ගතභාවයක් සහ සහභාගීත්වයක් ඇති වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තීන් ඵලදායි ලෙස සන්නිවේදනය කිරීම

**අපේක්ෂිත නිමැවුම**

- අර්බුදකාරී තත්ත්වයන් සන්නිවේදනය කිරීමේ රාමුවක් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ස්ථාපිත කිරීම
- තාක්ෂණික නොවන සාරාංශ සහ අර්ධ මාසික තීරු ලිපි එළි දැක්වීම
- මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ මාධ්‍ය දැනුම්වත් කිරීම් සහ වැඩසටහන් පැවැත්වීම
- පාර්ශ්වකරුවන් සහ ප්‍රේක්ෂකයින් පිළිබඳ විශ්ලේෂණ වාර්තා පිළියෙල කිරීම

**අපේක්ෂිත ප්‍රතිඵලය**

- ශ්‍රී ලංකා මහා බැංකුවේ කාර්යභාර්ය සහ ප්‍රතිපත්ති පිළිබඳ පවතින මහජන අවබෝධය ඉහළ යාම
- මූල්‍ය සාක්ෂරතාව සහ අන්තර්ගතභාවය වැඩිදියුණු වීම
- අභ්‍යන්තර සන්නිවේදනය හා ඒ සඳහා වන සූදානම වැඩිදියුණු වීම

**අපේක්ෂිත බලපෑම**

විනිවිදභාවය සහ වගවීම තුළින් ඉහළ නංවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ විශ්වසනීයත්වය

### නවීන මහ බැංකුවක් සඳහා වර්තමානයේ දී මෙන් ම අනාගතයේදීත් අවශ්‍ය වන මානව සම්පත් කුසලතා වැඩියුණු කිරීම

**අරමුණ**

පවත්නා මානව සම්පත් උපාය මාර්ගය වැඩිදියුණු කිරීම

**අපේක්ෂිත නිමැවුම**

- රැකියා ව්‍යූහයන් සහ මානව ප්‍රාග්ධන මෙහෙයුම් ආකෘතිය සමාලෝචනය කිරීම
- මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ කණ්ඩායම් ස්ථාපිත කිරීම
- මිනිස් බලය පදනම් කර ගත් බඳවාගැනීම
- කාර්යසාධන ඇගයීම් යාන්ත්‍රණය ශක්තිමත් කිරීම
- තාක්ෂණික හා නායකත්ව ප්‍රවීණතා ආකෘති හඳුන්වාදීම

**අපේක්ෂිත ප්‍රතිඵලය**

- තීරණාත්මක තනතුරු සඳහා ශක්තිමත් නායකත්ව ක්‍රමවේදයක්
- සියලූම සේවක මට්ටම් සඳහා කඩිනම් බඳවා ගැනීම්, සේවක ඉවත්ව යාම් අවම වීම සහ ප්‍රබෝධමත් වටාපිටාවක් නිර්මාණය වීම
- වඩා ඉහළ සේවක සහභාගිත්වය

**අපේක්ෂිත බලපෑම**

වැඩි දියුණු කරන ලද මානව සම්පත් උපාය මාර්ග

### මහ බැංකුවේ තාක්ෂණික ධාරිතාව වැඩි දියුණු කිරීම

**අරමුණ**

මහ බැංකුවේ තාක්ෂණික හා ඩිජිටල් ධාරිතාවය ශක්තිමත් කිරීම

**අපේක්ෂිත නිමැවුම**

- නවීකරණය කරන ලද තොරතුරු තාක්ෂණ පද්ධති සහ වැඩිදියුණු කරන ලද දෘඩාංග /මෘදුකාංග
- වැඩිදියුණු කළ සයිබර් ආරක්ෂණ රාමු සහ මෙවලම්
- වැඩ ප්‍රවාහ ඩිජිටල්කරණය සහ ප්‍රධාන ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම
- ඉහළ දත්ත විශ්ලේෂණ ක්‍රමවේද

**අපේක්ෂිත ප්‍රතිඵලය**

- විශ්වාසදායක සහ වේගවත් මෙහෙයුම් ක්‍රමවේදයක් ඇතිවීම
- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වැඩිදියුණු කළ විශ්ලේෂණ ධාරිතාව
- සයිබර් තර්ජනවලට එරෙහි වීමේ සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ යාම
- පාර්ශ්වකරුවන්ට වැඩි දියුණු කළ සේවා සැපයීම

**අපේක්ෂිත බලපෑම**

නවීන මහ බැංකුවක් සඳහා තාක්ෂණික කුසලතාවන් වැඩි දියුණු කිරීම

### බැංකුවේ කාර්යභාරය

# දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම

දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණ වේ. එමඟින් අනවශ්‍ය උච්චාවචනයකින් තොර ව පොදු මිල මට්ටම ස්ථායීව පවතින බව තහවුරු කෙරේ. ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමට, කාර්යක්ෂම ආර්ථික තීරණ ගැනීම පහසු කිරීමට මෙන් ම සමස්ත සාර්ව ආර්ථික සහ මූල්‍ය ස්ථායීතාව සඳහා ද දායක වෙමින්, තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කර ගැනීම සඳහා මිල ස්ථායීතාව පවත්වා ගැනීම උපකාරී වෙයි.

## මුදල් ප්‍රතිපත්ති සම්පාදනය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි සඳහන් වන පරිදි මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූල ව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත පැවරී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය වෙනුවෙන් මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි[1] දක්වා ඇති නියමිත ඉලක්කයට අනුකූල ව උද්ධමනය පවත්වා ගෙන යාම මෙම රාමුවේ අරමුණයි. වත්මන් ගිවිසුම අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාර්තුමය මතුපිට උද්ධමනය 5%ක[2] මට්ටමේ පවත්වා ගත යුතුය.

### මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය

මුදල් ප්‍රතිපත්ති තීරණ ඉදිරි දැක්මක් සහිත වන අතර දත්ත මත පදනම් වේ. වත්මන් සහ අපේක්ෂිත සාර්ව ආර්ථික තත්ත්ව පිළිබඳ පුළුල් තක්සේරුවක් මත පදනම් ව සුදුසු මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අවම වශයෙන් මාස දෙකකට එක් වරක් රැස් වේ. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සිය තීරණ ගැනීමේ දී වත්මන් උද්ධමනය සහ එහි ඉදිරි දැක්ම, ආර්ථික ක්‍රියාකාරකම් සහ අනාගත ආර්ථික වර්ධන අපේක්ෂා මෙන් ම ආශ්‍රිත අවදානම් සහ අවිනිශ්චිතතා ඇගැයීමට ලක් කරන අතර ගෝලීය ආර්ථික වර්ධනයන් සහ ප්‍රවණතා ද සැලකිල්ලට ගනු ලබයි.

මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය කාර්ය මණ්ඩල මට්ටමේ රැස්වීම් සමඟින් ආරම්භ වන අතර එහි දී එක් එක් අංශයේ විශේෂඥයින් විසින් පොලී අනුපාතික, මුදල් සමස්ත, විදේශීය අංශයේ ප්‍රවණතා සහ අනෙකුත් ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශක ඇතුළු සවිස්තරාත්මක ආර්ථික සහ මූල්‍ය දත්ත විශ්ලේෂණය කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේ දී කාර්තුමය පුරෝකථන ආකෘතිය (QPM) මඟින් ලබා ගන්නා පුරෝකථන මෙන්ම විශේෂඥ කාර්ය මණ්ඩලයේ විනිශ්චයන් ද ඇතුළත් කරනු ලැබේ.

පසුව විවෘත (I වන අදියර) සහ සංවෘත (II වන අදියර) යන සැසි වාර දෙකකින් සමන්විත වන පූර්ව මුදල් ප්‍රතිපත්ති කමිටුවේ දී මෙම ඇගැයීම් සාකච්ඡා කරන අතර එහි දී තාක්ෂණික ඇගැයීම්, අවදානම් විශ්ලේෂණය සහ මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන කෙරෙහි අවධානය යොමු කෙරේ.

අනතුරු ව මහ බැංකු අධිපතිවරයා ප්‍රධානත්වය දරන, නියෝජ්‍ය අධිපතිවරුන්, අදාළ සහකාර අධිපතිවරුන් සහ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් සමන්විත වන මුදල් ප්‍රතිපත්ති කමිටුව සාර්ව ආර්ථික තත්ත්වයන් පිළිබඳ සාකච්ඡා කර සුදුසු මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ නිර්දේශ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. අවසාන වශයෙන් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් මුදල් ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශයන් ද ඉතා සූක්ෂම ලෙස සලකා බලමින් සාර්ව ආර්ථික වර්ධනයන්, පුරෝකථනයන් සහ අවදානම් පිළිබඳ සිය ස්වයං ඇගැයීමකින්ද අනතුරු ව මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ ව තීරණයකට එළඹෙනු ලැබේ.

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය තීරණයකට එළඹුණු පසුව එම තීරණය මුදල් ප්‍රතිපත්ති සමාලෝචන මාධ්‍ය නිවේදනයක් හරහා සාමාන්‍යයෙන් පසු දා පෙ.ව.7.30ට ප්‍රකාශයට පත් කරනු ලබන අතර ඉන් අනතුරු ව අදාළ තීරණය පිළිබඳ ව වැඩිදුර පැහැදිලි කිරීම සඳහා අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මාධ්‍යවේදීන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙනුවෙන් මාධ්‍ය හමුවක් ද පැවැත් වේ.

### 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- 2025 වසරේ දී මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීම සඳහා රැස්වීම් හයක් පැවැත් වූ අතර ජනවාරි 29, මාර්තු 26, මැයි 22, ජූලි 23, සැප්තැම්බර් 24 සහ නොවැම්බර් 26 යන දිනවල එම රැස්වීම්වලට අදාළ මාධ්‍ය නිවේදන නිකුත් කරන ලදි.
- කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100) මත පදනම් ව මනිනු ලබන වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යය, වසර පුරා 5%ක ඉලක්කගත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතුණි.
- උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතීමට හේතු, මහ බැංකුව විසින් එම මට්ටම ඉලක්කගත මට්ටම කරා යොමු කිරීම සඳහා යෝජනා කරනු ලබන ක්‍රියාමාර්ග සහ එම ඉලක්කයට ළඟාවීමට ඇස්තමේන්තු කරන ලද කාල රාමුව ද ඇතුළත් සවිස්තරාත්මක වාර්තා මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර එම වාර්තා රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේ දී ද සමාලෝචනය කරන ලදි.[3]

[1] සෑම වසර තුනකටම වරක් හෝ විශේෂිත තත්ත්වයක් උද්ගත වූ අවස්ථාවක දී අමාත්‍යවරයාට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට උද්ධමන ඉලක්කය සහ ඊට අදාළ පරාමිතීන් මෙන්ම විශේෂිත තත්ත්වයන් සමාලෝචනය කළ හැකිය. එවන් සමාලෝචනයකින් අනතුරු ව අමාත්‍යවරයා විසින් සංශෝධිත උද්ධමන ඉලක්කය සහ ඊට අදාළ පරාමිතීන් මෙන්ම විශේෂිත තත්ත්වයන් ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කළ යුතුය.

[2] මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ ඉලක්කගත උද්ධමනයෙන් ප්‍රතිශතාංක ± 2ක ආන්තිකයකට යටත් ව අදාළ කාර්තුවේ මාස තුන සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කර ගත් මාසික මතුපිට උද්ධමනයේ වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස්වීම්වල සරල සාමාන්‍යය කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය මඟින් පිළිබිඹු වේ.

[3] *https://www.cbsl.gov.lk/en/monetary-policy/monetary-policy-communication/accountability-to-parliament*

## ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය (අවම වශයෙන් මාස දෙකකට එක් වරක්)

රූප සටහන - 03




### රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය

මහ බැංකු පනතෙහි 83 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් හා මූල්‍ය පද්ධති ස්ථායීතා ප්‍රතිපත්ති එකිනෙකට බලපාන ආකාරය පිළිබඳ සවිස්තරාත්මක ව සාකච්ඡා කිරීම සඳහා 2023 අග භාගයේ දී රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා සම්බන්ධීකරණ සභාව පිහිටුවන ලදි. මෙහි දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය මෑත කාලීන සාර්ව ආර්ථික ප්‍රවණතා, ඉදිරි දැක්ම සහ අවදානම් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගන්නා අතර උද්ධමනය, මුදල් තත්ත්වයන් සහ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කෙරෙහි රජයේ ආර්ථික ප්‍රතිපත්තිවල බලපෑම ද ඇගයීමට ලක් කරයි.

2025 වසරේ දී මහ බැංකු අධිපතිවරයා සහ භාණ්ඩාගාර ලේකම්වරයා අතර පැවති සම්බන්ධීකරණ සභා රැස්වීම් එම වසරේ පෙබරවාරි 27, ජූනි 26, සැප්තැම්බර් 23 සහ දෙසැම්බර් 16 යන දිනවල දී පැවැත්විණි.

## මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය

රූප සටහන - 04

මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති තීරණ විවිධ ක්‍රම හරහා පුළුල් ලෙස ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය කෙරේ. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සන්නිවේදය කරන ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වන අතර උද්ධමනය එහි ඉලක්කගත මට්ටම කරා මෙහෙයවීමේ අරමුණින් එය වරින් වර වෙනස් කරනු ලැබේ. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, කෙටි කාලීන පොලී අනුපාතිකවලට බලපෑම් කරනු ලබන ප්‍රාථමික මිනුමක් ලෙස ආර්ථිකය තුළ ක්‍රියා කරයි. එක්දින ප්‍රතිපත්ති අනුපාතිකයෙහි සිදු වන වෙනස්කම් ප්‍රධාන සම්ප්‍රේෂණ ක්‍රම පහ වන පොලී අනුපාතික, ණය, විනිමය අනුපාතිකය, වත්කම් මිල සහ අපේක්ෂාවන් හරහා පුළුල් ලෙස ආර්ථිකයට සම්ප්‍රේෂණය වීම සිදු වේ. එක්දින මුදල් ප්‍රතිපත්ති අනුපාතිකයෙහි සිදු වන වෙනස්කම් මෙම ක්‍රම හරහා පරිභෝජන සහ ආයෝජන ප්‍රවණතා, ණය ඉල්ලුම සහ සැපයුම, ආනයන මිල සහ සමස්ත මිල ගතිකත්වයට බලපෑම් සිදු කරන අතර අවසානයේ දී  එමගින් ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටම සහ උද්ධමනය වෙනස් වේ.



# මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

## නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

දේශීය මිල ස්ථායිතාව ළඟා කර ගැනීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තියෙහි මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට අනුකූල ව පවත්වා ගැනීම සඳහා විවට වෙළෙඳපොළ කටයුතු සහ අනෙකුත් ප්‍රතිපත්තිමය උපකරණ භාවිත කරයි. ඒ හා සමගාමී ව වෙළෙඳපොළ බලවේගවලට විනිමය අනුපාතිකය තීරණය කිරීමට ඉඩ සලසමින් විනිමය අනුපාතිකයේ ඇති වන අධික උච්චාවචන අවම කිරීම සහ විදේශ සංචිත ගොඩ නැංවීම සඳහා වෙළෙඳපොළ මැදිහත් වීම් සිදු කරමින් නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබයි. මුදල් සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි මනා ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම, ගෙවීම් සහ පියවීම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය සහ සමස්ත මූල්‍ය පද්ධතියෙහි ස්ථායිතාව තහවුරු කිරීම සඳහා මෙම ක්‍රියාමාර්ග සිදු කරනු ලබයි.

**ශ්‍රී ලංකාව තුළ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය**

රූප සටහන - 05




## විවට වෙළෙඳපොළ කටයුතු

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හා සමගාමී ව කෙටිකාලීන පොලී අනුපාතික මෙහෙයවමින් දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා මහ බැංකුව විසින් විවට වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු භාවිත කෙරේ.

- කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි (පිළිවෙළින් දින 1-7 සහ දින 8-90), ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර මිලදීගැනුම් වෙන්දේසි, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා වූ ද්‍රවශීලතා ආධාරක පහසුකම, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (මිලදීගැනුම් - විකුණුම්) යනාදිය ද්‍රවශීලතාව සැපයීම සඳහා භාවිත කරනු ලැබේ. කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි (පිළිවෙළින් දින 1-7 සහ දින 8-90) ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර විකුණුම් වෙන්දේසි, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (විකුණුම්-මිලදී ගැනුම්) වැනි උපකරණ ද්‍රවශීලතාව අවශෝෂණය සඳහා භාවිත කෙරේ.
- බලපත්‍රලාභී වාණිජ බැංකු සිය සමස්ත රුපියල් තැන්පතු වගකීම්වලට සමානුපාතික ව මහ බැංකුවේ සංචිත ගිණුමෙහි පවත්වා ගත යුතු අවම සංචිත ප්‍රමාණය වන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ද මහ බැංකුව විසින් නියම කරනු ලැබේ.

මීට අමතර ව මහ බැංකුව විසින් පහත පහසුකම් ද සපයනු ලැබේ.

- **නිත්‍ය පහසුකම:** මුදල් වෙළෙඳපොළ සහ දෛනික විවට වෙළෙඳපොළ කටයුතු හරහා කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීමට අපොහොසත් වන සහභාගිත්ව ආයතන සඳහා නිත්‍ය පහසුකම් සපයනු ලැබේ. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ පිළිවෙළින් මහ බැංකුව විසින් නිත්‍ය ණය පහසුකම හා නිත්‍ය තැන්පතු පහසුකම සපයනු ලබයි.
- **දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම:** තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සුමට හා කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිවන්නන්ට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සපයනු ලැබේ.

## 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- 2025 වසර තුළ දී දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව අඛණ්ඩ ව අතිරික්තයක පැවතිණ. 2024 වසර අවසානය වන විට පැවති රුපියල් බිලියන 168.1ක අතිරික්තයට සාපේක්ෂ ව 2025 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට ද්‍රවශීලතා අතිරික්තය රුපියල් බිලියන 175.2ක් විය. විදේශ සංචිත ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් විශාල වශයෙන් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙතින් විදේශ විනිමය මිල දී ගැනීම් මෙම ද්‍රවශීලතා අතිරික්තය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත් රජය මහ බැංකුවෙන් විදේශ විනිමය මිල දී ගැනීම හරහා සිදු කරන ලද විදේශ ණය ගෙවීම්, මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර තොගය මත වන කූපන් පොලී ආදායම් ලැබීම් මෙන් ම 2025 වසර තුළ දී ව්‍යවහාර මුදල් සංසරණය ඉහළ යෑම හේතු කොටගෙන ද්‍රවශීලතා අතිරික්තය යම් ප්‍රමාණයකට අඩු විය.
- 2025 වසර තුළ දී මහ බැංකුව විසින් සපයන ලද පොලී රහිත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම රුපියල් බිලියන 111,788.0ක් වූ අතර එහි දෛනික සාමාන්‍යය රුපියල් බිලියන 466.7ක් විය.
- 2025 වසරේ පළමු භාගයේ දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට බොහෝ දුරට ආසන්න ව පැවති නමුත් අසමතුලිත ද්‍රවශීලතා ව්‍යාප්තිය සමඟ වසරේ දෙවන භාගයෙහි ද්‍රවශීලතාව යම් පමණකට පහළ යෑම මෙන් ම බැංකු කිහිපයක් මත ද්‍රවශීලතාව සංකේන්ද්‍රණය වී පැවතීම හේතුවෙන් 2025 වසරේ ජූලි මස මැද සිට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ඉහළ යෑමක් පෙන්නුම් කළේ ය. මෙම වෙනස්වීම පොලී අනුපාතික මත සැලකිය යුතු බලපෑමක් ඇති නොකරන ලද බැවින් කෙටිකාලීන පොලී අනුපාතිකවල ඉහළ යෑම වැළැක්වීම සඳහා අතිරේක ද්‍රවශීලතාවක් සැපයීමෙන් මහ බැංකුව වැළකී සිටියේ ය. 2026 වසරේ ජනවාරි මස පටන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හා අනුගත වීමක් දක්නට ලැබුණි.
- 2025 වසරේ ජනවාරි මස අගභාගයේ සිට මහ බැංකුව විවට වෙළෙඳපොළ කටයුතු හරහා දේශීය මුදල් වෙළෙඳපොළට මැදිහත්වීමක් සිදු නොකළේය. කෙසේ වෙතත් මහ බැංකුව විසින් 2025 වසරේ ජනවාරි මාසයේ දී අවශ්‍යතාව මත පදනම් ව රුපියල් බිලියන 48.4ක් වූ සීමිත වටිනාකමක එක්දින ප්‍රතිවිකුණුම් වෙන්දේසි සහ කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදි.
- 2025 වසර තුළ දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ සහභාගිත්ව ආයතන විසින් රුපියල් බිලියන 33,686.7ක් තැන්පත් කළ අතර නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ රුපියල් බිලියන 1,082.3ක් මහ බැංකුව විසින් සපයන ලදි.
- 2025 වසර තුළ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 2% මට්ටමේ නොවෙනස් ව පැවති අතර බලපත්‍රලාභී වාණිජ බැංකු ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සමඟ අනුකූල වීම මහ බැංකුව විසින් අඛණ්ඩ ව අධීක්ෂණය කරන ලදි.

### මහ බැංකුවේ මුදල් මෙහෙයුම් කටයුතු සහ කෙටිකාලීන පොලී අනුපාතිකවල හැසිරීම: 2025

ප්‍රස්ථාර සටහන - 01




### දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුව, බලයලත් මුදල් හුවමාරුකරුවන් හෝ ඉලෙක්ට්‍රොනික වෙළෙඳ පද්ධති හරහා අන්තර් බැංකු වෙළෙඳපොළෙහි ක්‍රියාත්මක වන දේශීය මුදල් වෙළෙඳපොළ සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ගනුදෙනු ද්විත්වය ම ග්‍රහණය කර ගන්නා පද්ධතියක් වන මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂකය (Central Integrated Market Monitor) හරහා අන්තර් බැංකු සහ පාරිභෝගික විදේශ විනිමය ගනුදෙනු නිරීක්ෂණය කෙරේ. මෙම පද්ධති මඟින් විනිමය අනුපාතිකයේ ඇති වන වෙනස්වීම් හඳුනා ගැනීමට මහ බැංකුවට පහසුකම් සැපයේ. මීට අමතර ව මිල අනාවරණ හැකියාව වැඩිදියුණු කිරීම, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සහ තත්කාලීන වෙළෙඳපොළ තත්ත්වයන් නිරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගැලපුම් පද්ධතියක් හඳුන්වා දෙන ලදි.

සමස්ත ප්‍රතිපත්ති ස්ථාවරයට අනුව විදේශ විනිමය අනුපාතිකයේ අධික උච්චාවචන අඩු කිරීම සහ විදේශ සංචිත ඉහළ නැංවීම සඳහා විදේශ විනිමය සැපයීම (විකිණීම) හෝ අවශෝෂණය කිරීම (මිලදී ගැනීම) මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් වේ. මෙයට අමතර ව විදේශ විනිමය සංචිත කෙටිකාලීන ව රැස් කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ ද්විපාර්ශ්වික ගැනුම්-විකුණුම් හුවමාරු ගනුදෙනු සිදු කරයි. ඒ අයුරින්ම විදේශ සංචිත ස්ථිර ව ක්ෂය නොකර වෙළෙඳපොළට ද්‍රවශීලතාව සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී බැංකු සමඟ විකුණුම්-ගැනුම් හුවමාරු ගිවිසුම් ද ක්‍රියාත්මක කරයි. මෙම හුවමාරු ගනුදෙනු බලපත්‍රලාභී බැංකුවලට විදේශ විනිමය වෙළෙඳපොළ සහ දේශීය මුදල් වෙළෙඳපොළ යන දෙකෙහිම ඔවුන්ගේ ද්‍රවශීලතා තත්ත්වයන් මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීමට සහ අවදානම් කළමනාකරණ අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට උපකාරී වේ.

## 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- 2024 වසරේ අවසානයේ දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂ ව ශ්‍රී ලංකා රුපියල 292.58ක සිට 2025 වසර අවසානයේ දී 309.99ක් දක්වා 5.6% ක මධ්‍යස්ථ අවප්‍රමාණයක් වාර්තා කළේ ය. මෝටර් රථ වාහන ආනයන සීමා ලිහිල් කිරීම, භූ දේශපාලනික ආතතීන් සහ ඇමරිකා එක්සත් ජනපදය විසින් ප්‍රතිපක්ෂ තීරු බදු පැනවීම හේතුවෙන් විදේශ විනිමය අනුපාතිකයේ අස්ථාවරත්වයක් ඇති වූ අතර 2025 වසර තුළ රුපියල මත අවප්‍රමාණ පීඩනයක් ඇති කළේය.

- තව ද 2025 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව එක්සත් ජනපද ඩොලර් මිලියන 2,045.0ක නව ගැනුම්-විකුණුම් හුවමාරු ගිවිසුම් ක්‍රියාත්මක කරන ලද අතර එක්සත් ජනපද ඩොලර් මිලියන 1,442.0ක ගැනුම්-විකුණුම් හුවමාරු ගිවිසුම් කල්පිරී අවසන් විය. එමෙන්ම එක්සත් ජනපද ඩොලර් මිලියන 1,320.0ක ගැනුම්-විකුණුම් හුවමාරු ගිවිසුම් තවදුරටත් දීර්ඝ කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස පියවීම් දින පදනම මත 2024 වසර අවසානයේ එක්සත් ජනපද ඩොලර් මිලියන 1,318.3ක් වූ කල් නොපිරුණු ගැනුම්-විකුණුම් හුවමාරු ගිවිසුම් වටිනාකම 2025 අවසානය වන විට එක්සත් ජනපද ඩොලර් මිලියන 1,921.3 දක්වා ඉහළ ගියේ ය. මෙම ගැනුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු බැංකුවලට දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සහ දේශීය මුදල් වෙළඳපොළෙහි සිය ද්‍රවශීලතා තත්ත්වය මෙන් ම මුදල් ප්‍රවාහ කළමනාකරණයටත් අවදානම් කළමනාකරණ අවශ්‍යතා සඳහාත් උපකාරී විය.

- 2025 වසරේ දී පියවීම් දින පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුව එක්සත් ජනපද ඩොලර් මිලියන 2,100.4ක් මිල දී ගත් අතර එක්සත් ජනපද ඩොලර් මිලියන 108.0ක් සපයමින් පියවීම් දින පදනම මත එක්සත් ජනපද ඩොලර් මිලියන 1,992.4ක ශුද්ධ මිල දී ගැනීමක් වාර්තා කළේය. මෙම ශුද්ධ මිල දී ගැනීම් 2025 වසර අවසානය වන විට රටේ දළ නිල විදේශ සංචිත එක්සත් ජනපද ඩොලර් මිලියන 6,827.2ක් දක්වා ඉහළ නැංවීමට උපකාරී වූ අතර එය පශ්චාත් අර්බුද කාලය තුළ වාර්තා වූ ඉහළම නිල සංචිත මට්ටම විය.

- 2025 වසරේ දී වඩාත් පුළුල් සහ කාර්යක්ෂම විදේශ විනිමය වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය ගැලපුම් පද්ධතියක් සාර්ථක ව හඳුන්වා දෙන ලදි. සියලුම බලපත්‍රලාභී බැංකුවලට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට ප්‍රවේශ විය හැකි මෙම පද්ධතිය මඟින් වෙළෙඳපොළ සහභාගිවන්නන්ට පොදුවේ එකිනෙකා සමඟ කටයුතු කිරීමට හැකියාව ලබා දී ඇති අතර එමඟින් මිල අනාවරණ හැකියාව වැඩිදියුණු කිරීම, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ වැඩි විනිවිදභාවයක් සහ කාර්යක්ෂමතාවක් ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් නවීකරණය කිරීම අරමුණු කර ගෙන ඇත.

- බලපත්‍රලාභී බැංකු විසින් මධ්‍යම ඒකාබද්ධ වෙළෙඳපොළ නිරීක්ෂක පද්ධතිය හරහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරන ලද විදේශ විනිමය ආශ්‍රිත දත්තවල නිරවද්‍යතාව සහ පුළුල් බව වැඩිදියුණු කිරීම සඳහා පියවර ගන්නා ලදි. ශුද්ධ විදේශ විනිමය වෙළෙඳපොළ අනාවරණ තත්ත්වය (Net Open Position) ගණනය කිරීමේ නිරවද්‍යතාව සහ ඒ හා ආශ්‍රිත අනෙකුත් වැඩිදියුණු වූ දත්ත වාර්තාකරණය හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට වෙළෙඳපොළ ක්‍රියාකාරකම් සමීප ව නිරීක්ෂණය කිරීමට සහ ශුද්ධ විදේශ විනිමය වෙළෙඳපොළ අනාවරණ තත්ත්වය වඩාත් නිරවද්‍යතාවයෙන් තක්සේරු කිරීමට හැකි විය.

- 2026 වසරේ අධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ප්‍රකාශයට පත් කළ පරිදි ශ්‍රී ලංකාවේ පවතින ව්‍යවස්ථාපිත සංචිත අනුපාත රාමුවේ කාර්යක්ෂමතාව ඉහළ නැංවිය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහ ජාත්‍යන්තර හොඳම පරිචයන්ට අනුකූල ව මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් 2025 වසරේ දී එම රාමුව පුළුල් සමාලෝචනයකට ලක් කරන ලදි.

## රජය වෙත තාවකාලික ව අත්තිකාරම් ලබාදීම

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 127 වගන්තිය ප්‍රකාර ව මහ බැංකුව විසින් මුදල් වර්ෂයේ පළමු මාසය ඇතුළත රජයේ වියදම් මූල්‍යකරණය කිරීම සඳහා පවත්නා වෙළෙඳපොළ පොලී අනුපාතික යටතේ ඍජු තාවකාලික අත්තිකාරම් රජය වෙත ලබා දිය හැකි ය.

කෙසේ වුව ද වර්ෂය තුළ රජයේ එවැනි ඉල්ලීමක් නොලැබුණු බැවින් රජයට කිසිදු තාවකාලික අත්තිකාරමක් ලබා දී නොමැත.

## රජයේ ගිණුම් පවත්වාගෙන යාම

මහ බැංකුව රජයේ බැංකුකරු ලෙස ඉටු කරන කාර්යභාරයේ දී වෙළෙඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රජය වෙනුවෙන් රජයේ දෙපාර්තමේන්තු, රජයේ නියෝජිතායතන සහ ඇතැම් විදේශීය ආයතන සඳහා බැංකු පහසුකම් සැපයීම අඛණ්ඩ ව සිදු කරන ලදි.

ඒ අනුව 2025 වසර තුළ වෙළෙඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් එවැනි ගිණුම් 42ක් පවත්වාගෙන යන ලදි. මෙම ගිණුම්වල ගනුදෙනු පරිමාවෙන් දළ වශයෙන් 90%ක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම්, රාජ්‍ය ණය ජංගම ගිණුම, දේශීය ආදායම් කොමසාරිස්ගේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ගිණුම සහ ජනාධිපති අරමුදල් ගිණුමට අදාළ වේ.

## මූල්‍ය ආයතනවල ගිණුම් පවත්වාගෙන යාම

බැංකු සඳහා බැංකුකරු ලෙස මහ බැංකුව සිය කාර්යභාරය ඉටු කිරීමේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ගෙවීම් සහ පියවීම් සේවා සඳහා පහසුකම් සපයන ජංගම ගිණුම් පවත්වාගෙන යාම මහ බැංකුව විසින් අඛණ්ඩ ව සිදු කරගෙන යන ලදි. එවැනි බැංකු සඳහා ලබා දී ඇති පියවීම් පහසුකම් සම්බන්ධයෙන් තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS) හරහා ප්‍රධාන ගෙවීම් සහ පියවීම් පද්ධති, එනම් ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය (CITS), ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) සම්බන්ධයෙන් පියවීම් සිදු කරන ලදි. 2025 අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පාර්ශ්වකරුවන් අතර ගෙවීම් සහ පියවීම් සඳහා පහසුකම් සැලසීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් (SPDs) 7ක් සඳහා තත්කාලීන දළ පියවීම් ගිණුම් පවත්වාගෙන යන ලදි.

## මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා සංඛ්‍යාන දත්ත

රූප සටහන - 06




| දර්ශකය | කාල පරාසය |
|---|---|
| ආර්ථික දර්ශක, මිල වාර්තා | දෛනික |
| ආර්ථික දර්ශක | සතිපතා |
| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණ හා කොළඹ පාරිභෝගික මිල දර්ශක මාධ්‍ය නිවේදන, වැටුප් අනුපාත දර්ශක, භාවිතා කළ වාහන මිල දර්ශකය, දේපළ සඳහා වන ඉල්ලුම් මිල දර්ශක | මාසික |
| ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, ණය සැපයුම් සමීක්ෂණය, සභාධිපත්‍ය වෙළෙඳපොළ සමීක්ෂණය | කාර්තුමය |
| ආර්ථික හා සමාජ සංඛ්‍යාලේඛන, පළාත් දළ දේශීය නිෂ්පාදිතය, සමාජ ආර්ථික දත්ත සහ වාර්ෂික ආර්ථික සමාලෝචනයට දායකත්වයන් | වාර්ෂික |

- පෞද්ගලික අංශයේ වැටුප් ඇගයීම වඩාත් පුළුල් කිරීම
- භාවිත කළ වාහන මිල දර්ශකවල නියෝජනය වැඩිදියුණු කිරීම
- වඩාත් පහසුවෙන් දත්ත පරිශීලනය හැකි ආකාරයට වැඩිදියුණු කරන ලද දෛනික මිල වාර්තාව/ ආර්ථික දර්ශක වාර්තාව
- ස්වාභාවික භාෂා සැකසුම් (NLP) සහ ලිඛිත දත්ත පදනම් කර ගත් දර්ශක

## මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය

මිල ස්ථායීතාව පවත්වා ගැනීම අරමුණු කරගෙන සිදුවන මුදල් ප්‍රතිපත්තිය ඵලදායී ව ක්‍රියාත්මක කිරීමට සහය වෙමින් විනිවිදභාවය, වගවීම සහ විශ්වසනීයත්වය සඳහා වූ කැපවීම ප්‍රතිස්ථාපනය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසරේ දී සිය මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපායමාර්ගය තවදුරටත් ශක්තිමත් කරන ලදි. මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන්, මාධ්‍ය වෘත්තිකයන් සමඟ පැවැත් වූ තාක්ෂණික සාකච්ඡා, භාෂා කිහිපයකින් ඩිජිටල් අන්තර්ගතයන් ප්‍රචලිත කිරීම සහ විවිධ බාහිර සන්නිවේදන වැඩසටහන් ඇතුළු ඉලක්කගත වැඩපිළිවෙළ රැසක් හරහා මෙය සාක්ෂාත් කර ගන්නා ලදි. වසර ආරම්භයේ ප්‍රකාශයට පත් කරන ලද පූර්ව නිකුතු දින දර්ශනයට අනුව මුදල් ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශයට පත් කරන ලද අතර පැවති මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීම් හයෙහිම එක් එක් රැස්වීමෙන් පසුව, මුදල් ප්‍රතිපත්ති තීරණය දැනුම් දීමේ මාධ්‍ය නිවේදනයක්, එම තීරණයට බලපෑ සාධක මෙන්ම ආර්ථිකයේ ඉදිරි දැක්ම පැහැදිලි කරන මාධ්‍ය හමුවක් ද පැවැත්විණි.

මෙම නිවේදන, තොරතුරු වෙත ප්‍රවේශ වීම පහසු කිරීම සහ මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීම අරමුණු කරගත් ව්‍යුහගත සන්නිවේදන ප්‍රයත්නයකින් සමන්විත විය. භාෂා තුනෙන්ම කෙරෙන මාධ්‍ය නිවේදන හා මාධ්‍ය හමුවලට අමතර ව මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ සමාජ මාධ්‍ය දැන්වීම් සහ කෙටි වීඩියෝ පට වැනි සන්නිවේදන මාධ්‍ය හරහා බැංකුව, ඩිජිටල් සහ සමාජ මාධ්‍ය තුළින් මාධ්‍ය හමුවෙහි ඇතුළත් ප්‍රධාන පණිවුඩ සන්නිවේදනය කළේය.

ව්‍යවස්ථාපිත අවශ්‍යතාව අනුව පෙබරවාරි සහ අගෝස්තු මාසවල ප්‍රකාශයට පත් කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාව බැංකුවේ ප්‍රමුඛ ප්‍රකාශනයක් වන අතර එමඟින් ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රවණතාවන්, යටිදැරි සාධක, මැදි කාලීන පුරෝකථන සහ ඒ ආශ්‍රිත අවදානම් පිළිබඳ තක්සේරුවක් සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කගතකරණ රාමුව තුළ, වැඩි උච්චාවචනයන් පාලනය කිරීමට පමණක් සීමා වූ මැදිහත්වීම් සහිතව වෙළෙඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතිකයකට සහාය වීම සහ මිල ස්ථායීතාව පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ලදි.

වෙළෙඳපොළ මෙහෙයුම් වාර්තාව යනු විනිවිදභාවය වැඩි දියුණු කරන සහ දේශීය මුදල් වෙළඳපොළේ මුදල් මෙහෙයුම් සහ වර්ධනයන් පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ අවබෝධය ශක්තිමත් කරන අර්ධ-වාර්ෂික ප්‍රකාශනයකි. එය නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයකින් සහාය ලබමින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන මුදල් හා විදේශ විනිමය මෙහෙයුම් පිළිබඳ පුළුල් අවබෝධයක් සපයයි. මෙහෙයුම් පැහැදිලි ව ගෙනහැර දැක්වීමෙන්, වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව මඟින් පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සමඟ වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය පෙළගැසී ඇති ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීම ප්‍රවර්ධනය කරයි.

මහ බැංකු පනතට අනුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ එකඟ වූ උද්ධමන ඉලක්කයෙන් විතැන් වීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් 2025 වසරේ දී මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කරන ලද අතර එමඟින් එම අපගමනයට හේතු වූ කරුණු, නැවත උද්ධමනය ඉලක්කගත මට්ටමට පැමිණීමට අපේක්ෂිත කාලරාමුව සහ මිල ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳ ව විස්තර සපයන ලදි.



# ජාත්‍යන්තර සංචිත කළමනාකරණය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ජාත්‍යන්තර ව පිළිගත් විශිෂ්ට පරිචයන්ට හා පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්තිවලට අනුකූල ව රටෙහි ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත ආයෝජන කලඹ විදේශීය ස්ථාවර ආදායම් සහිත සුරැකුම්පත්, මුදල් වෙළෙඳපොළ උපකරණ, රන් ආයෝජන, සුරැකුම්පත් ණය දීමේ ක්‍රියාකාරකම් (මහ බැංකුව වෙනුවෙන් භාරකරුවන් විසින් කළමනාකරණය කරනු ලබන), ප්‍රති මිල දී ගැනීම් සහ ප්‍රති විකුණුම් ගනුදෙනු, විදේශ විනිමය හුවමාරු සහ ඉදිරි ගිවිසුම් සහ අනෙකුත් ව්‍යුත්පන්න (derivatives) උපකරණවලින් සමන්විත ය.

ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කරනු ලබන්නේ උපායමාර්ගික වත්කම් වෙන්කිරීමේ රාමුව (Strategic Asset Allocation - SAA) මත පදනම් වූ විද්‍යාත්මක ආකෘතියකට අනුව ය. මේ යටතේ, ජාත්‍යන්තර සංචිත කළමනාකරණය වඩාත් කාර්යක්ෂම ව සිදුකිරීම සඳහා ප්‍රධාන වශයෙන් කාණ්ඩ (tranches) තුනකට වෙන් කරනු ලබන අතර එක් එක් කොටස සඳහා ආයෝජන කාලසීමාවන්, ව්‍යවහාර මුදල් සංයුති සහ නිශ්චිත මිනුම් දඬු (benchmarks) නියම කරනු ලැබේ. සියලු ආයෝජනවල වගකීම ආයෝජන කළමනාකරණ දෙපර්තමේන්තුවට පැවරී ඇති අතර දෙපාර්තමේන්තුව තුළ පවත්වනු ලබන ගනුදෙනුකරුවන්ගේ රැස්වීමේ දී සිදුකරනු ලබන වෙළෙඳපොළ සහ ද්‍රවශීලතා තත්වයන් පිළිබඳ පූර්ණ විශ්ලේෂණයකින් අනතුරු ව ආයෝජන පිළිබඳ තීරණ ගනු ලැබේ.

ජාත්‍යන්තර සංචිත ආයෝජනයන්හි කාර්ය සාධනය සහ අවදානම් පිළිබඳ තොරතුරු, අවශ්‍ය පරිදි දෛනිකව/සතිපතා පවත්වනු ලබන සාකච්ඡාවලින් අනතුරුව මාසික ව පවත්වනු ලබන ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවට (IRIOC) ඉදිරිපත් කරන අතර පාලක මණ්ඩලය (GB) වෙත කාර්තුමය මණ්ඩල පත්‍රිකා ඔස්සේ වාර්තා කරනු ලැබේ. මීට අමතර ව ගනුදෙනු සඳහා අනුමත සීමා උල්ලංඝනය කිරීම්, ප්‍රතිපාර්ශ්වයන්ගේ ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම්, කල් පිරීමට ප්‍රථම තැන්පතු ඉවත් කරගැනීම් වැනි සිදුවීම් ඇත්නම් ඒවා නියමිත පරිදි කළමනාකාරිත්වය වෙත වාර්තා කරනු ලැබේ.




### අවදානම් කළමනාකරණය සහ ව්‍යාපාරික අඛණ්ඩතාව

ඉහළ වෘත්තීයභාවයක් පවත්වාගැනීම සහ වගවීම වඩා ශක්තිමත් කරමින් ආයෝජන කළමනාකරණ කණ්ඩායම දැඩි චර්යාධර්ම සංග්‍රහයක් යටතේ සිය කටයුතු සිදු කරන අතර කණ්ඩායමේ සියලු සාමාජිකයින් වාර්ෂිකව තම සදාචාරාත්මක සහ වෘත්තීයමය ප්‍රමිතීන් පිළිපැදීම නිල වශයෙන් තහවුරු කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි.

බාධාවකින් තොරව මෙහෙයුම් කටයුතු පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා විශේෂයෙන් වෙන් කරන ලද ආපදා ප්‍රතිසාධන ඒකකයක් (Disaster Recovery Site) හරහා පද්ධති බිඳ වැටීම්, ස්වාභාවික ආපදා, සයිබර් සිදුවීම් හෝ අනෙකුත් පෙර හඳුනා ගැනීම අසීරු හදිසි මෙහෙයුම් තත්ත්වයන් වැනි අනපේක්ෂිත බාධාවන්හි දී ගනුදෙනු පද්ධතිවලට (Trading systems) අඛණ්ඩ ප්‍රවේශයක් ලබා ගනිමින් ව්‍යාපාරික කටයුතු අඛණ්ඩ ව පවත්වා ගනු ලැබේ.

මෙම කටයුතු අන්තර්ජාතික ව පිළිගත් විශිෂ්ට පරිචයන්ට අනුකූල ආරක්ෂිත විතැන් ප්‍රතිපාදන (secured off-site provisions) මඟින් තවදුරටත් ශක්තිමත් කර ඇති අතර එමඟින් අසීරු අවස්ථාවක දී හෝ හදිසි තත්ත්වයන් යටතේ වුව ද අත්‍යවශ්‍ය කාර්යයන් පහසුවෙන් හා බාධාවකින් තොරව ක්‍රියාත්මක කළ හැකි ය. මෙ මඟින් ආයෝජන ක්‍රියාවලියේ ඔරොත්තු දීමේ හැකියාව සහ විශ්වසනීයත්වය සුරක්ෂිත කෙරේ.

## 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත, අභ්‍යන්තර අරමුදල් සහ තැන්පතු රක්ෂණ අරමුදල් ආයෝජන ක්‍රියාකාරකම් ඒකාබද්ධ කොට ආයෝජන කළමනාකරණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත ආයෝජනය තුළින් සමස්තයක් වශයෙන් 2025 වසර තුළ දී 5.5%ක ප්‍රතිලාභ ප්‍රතිශතයක් ලබා ඇති අතර එම මුළු ප්‍රතිලාභය එක්සත් ජනපද ඩොලර් මිලියන 260ක් විය.
- ජාත්‍යන්තර සංචිත ප්‍රමාණය ඉහළ යෑමත් සමඟ ආයෝජන කලඹෙහි ප්‍රතිලාභ වැඩිදියුණු කිරීමේ අරමුණින් වසර හතරකට පසුව ආයෝජන කාණ්ඩය (Investment Tranche) නැවත ස්ථාපිත කිරීම.
- ලෝක බැංකුව බාහිර කළමනාකරුවෙකු ලෙස පත් කර ගනිමින් ලෝක බැංකුවේ සංචිත උපදේශන සහ කළමනාකරණ හවුල්කාරිත්වය [Reserve Adivsory and Management Partnership (RAMP)] සමඟ 2021 වසරේ දී එම හවුල්කාරිත්වයෙන් ඉවත් වීමට ගත් තීරණයෙන් අනතුරු ව නැවත සම්බන්ධ වීම.
- ජාත්‍යන්තර සංචිතවල වෙනස්වීම් නිරීක්ෂණය කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ රාමුවක් [Early Warning Framework (EWF)] සකස් කිරීම.
- සංචිත විවිධාංගීකරණ උපාය මාර්ගයට අනුකූල ව මූලික රන් සංචිත නැවත ගොඩනැඟීමේ අරමුණින් ජාත්‍යන්තර රන් වෙළෙඳපොළට නැවත පිවිසීම.
- පොලී පිරිවැය පදනම් අංක 50කින් (Basis Points) අඩු කර ගනිමින් ඉන්දියානු සංචිත බැංකුව සමඟ විශේෂ හුවමාරු පහසුකම යටතේ දෙවන අතිරේකයක් (addendum) අත්සන් කරන ලදි.

# මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම

## සාර්ව විචක්ෂණ අධිකාරිය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමග මහ බැංකුව රට තුළ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස නම් කරන ලදි. ඒ අනුව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව වෙත බලය පැවරී ඇත.

### මූල්‍ය අංශයේ පද්ධතිමය වශයෙන් වැදගත් ආයතනවල සාර්ව විචක්ෂණ අධීක්ෂණය වැඩිදියුණු කිරීම

පද්ධතිමය වශයෙන් වැදගත් වන මූල්‍ය අංශයේ පාර්ශ්වකරුවන් සඳහා වඩාත් ශක්තිමත් සාර්ව විචක්ෂණ අධීක්ෂණ ක්‍රියාවලියක් අනුගමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස මහ බැංකුවට බලය ලබා දී ඇත. මෙම පසුබිම තුළ මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු පහක් පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු (Domestic Systemically Important Banks, DSIBs) ලෙස 2025 වසර තුළ දී නම් කරන ලදි. මෙම බැංකු අහිතකර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කර ගැනීම සඳහා අතිරේක ප්‍රාග්ධන අධිභාරයක් පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. තව ද මහ බැංකුව පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු මඟින් පැන නැගිය හැකි අවදානම් සහ මතුවිය හැකි දුර්වලතා හඳුනා ගැනීම මඟින් සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතියෙහි ස්ථායීතාව ආරක්ෂා කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අර්ධ වාර්ෂික අවදානම් තක්සේරු සිදු කරයි. 2025 වසර සඳහා වූ පළමු අර්ධ වාර්ෂික අවදානම් තක්සේරුව සැප්තැම්බර් මාසයේ දී සිදු කරන ලදි.

### වටිනාකම මත ණය අනුපාත සීමා (Loan to Value Caps - LTV)

මෝටර් රථ සම්බන්ධයෙන් ලබා දෙන ණය පහසුකම් සඳහා අදාළ වන වටිනාකම මත ණය අනුපාත සීමාවන් (LTV caps) 2025 වසරේ ජූලි මාසයේ දී සංශෝධනය කරන ලදි. වටිනාකම මත ණය අනුපාත සීමාවන් සාර්ව විචක්ෂණ අරමුණු සමග පමණක් සමපාත කළ අතර සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති මෙවලමක් ලෙස එහි ඵලදායීතාව වැඩිදියුණු කිරීම මෙම සංශෝධනයේ අරමුණ විය. තව ද බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් විසින් මෝටර් රථ වාහන සම්බන්ධයෙන් ලබා දී ඇති ණය පහසුකම්වල සැලකිය යුතු වර්ධනය සැලකිල්ලට ගනිමින් ලියාපදිංචි නොකළ සහ වසරකට අඩු කාලයක් ශ්‍රී ලංකාවේ භාවිතා කර ඇති ලියාපදිංචි කළ ඇතැම් වාහන කාණ්ඩ සඳහා අදාළ වන වටිනාකම මත ණය අනුපාත සීමා දැඩි කරමින් මහ බැංකුව 2025 නොවැම්බර් මාසයේ දී වටිනාකම මත පදනම් වූ උපරිම ණය අනුපාත සීමා තවදුරටත් සංශෝධනය කළේය.

### පද්ධතිමය අවදානම් ගොඩ නැගීම අධීක්ෂණය කිරීම සඳහා සාර්ව විචක්ෂණ ආවේක්ෂණය

2025 වසර තුළ දී පද්ධතිමය අවදානම් ගොඩනැගීම අධීක්ෂණය කිරීම සඳහා මහ බැංකුව සාර්ව විචක්ෂණ ආවේක්ෂණය අඛණ්ඩ ව සිදු කළේ ය. ඒ අනුව මූල්‍ය පද්ධතියේ මතුවිය හැකි දුර්වලතා හඳුනා ගැනීමේ අරමුණින් සාර්ව මූල්‍ය තත්ත්වයන්, මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළෙඳපොළ වැනි ප්‍රධාන ක්ෂේත්‍ර පුළුල් ලෙස ආවරණය කොට මහ බැංකුව කාර්තුමය අවදානම් තක්සේරුව (Quarterly Risk Assesment - QRA) හරහා මූල්‍ය අංශයේ කාර්තුමය අවදානම් විශ්ලේෂණයන් සිදු කළේය. ඊට අමතර ව අහිතකර කම්පනවලට බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා මහ බැංකුව බැංකු අංශය සඳහා ආතති පරීක්ෂණ අඛණ්ඩ ව සිදු කළේ ය. මූල්‍ය ආයතන අතර අන්තර් සම්බන්ධතා ඇගයීම සඳහා වන විශ්ලේෂණය (Interconnectedness Analysis), බැංකු සහ මුදල් සමාගම් අතර එකිනෙක වෙත පවතින ද්විපාර්ශ්වික නිරාවරණ ද සලකා බැලීම මඟින් තවදුරටත් වැඩිදියුණු කරන ලදි. මෙමඟින් පද්ධතිමය අවදානම් කල්තියා හඳුනා ගැනීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පෙර සූදානම සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා කාලෝචිත සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සපයයි.

### මූල්‍ය ස්ථායීතා විවරණය 2025

මහ බැංකු පනතට අනුකූල ව මහ බැංකුව 2025 වසරේ ඔක්තෝබර් මාසයේ දී සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂාවලින් නිකුත් කරන ලද සාරාංශ වාර්තා ද සමඟින් මූල්‍ය ස්ථායීතා විවරණය 2025 ප්‍රකාශයට පත් කළේය. මෙම ප්‍රකාශනය මඟින් සාර්ව මූල්‍ය තත්ත්වයන්, මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළෙඳපොළ විශ්ලේෂණය කරමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් සපයයි. එමෙන් ම මූල්‍ය පද්ධති ස්ථායීතාව සඳහා ඇති ප්‍රධාන අවදානම් සහ දුර්වලතා හඳුනා ගනු ලබන අතර කම්පන අවශෝෂණය කර ගැනීමට මූල්‍ය පද්ධතිය තුළ පවතින හැකියාව ඇගයීමට ලක් කරමින් සමස්තයක් ලෙස මූල්‍ය ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති ප්‍රතිපත්ති පියවර ගෙනහැර දක්වයි.

### 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- බලපත්‍රලාභී බැංකු පහක් පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු (D-SIBs) ලෙස නම් කරන ලද අතර එම බැංකු අමතර ප්‍රාග්ධන අධිභාරයක් පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ.
- 2025 වසර සඳහා පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකුවල පළමු අර්ධ-වාර්ෂික අවදානම් තක්සේරුව 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී අවසන් කරන ලදි.
- බැංකු සහ මුදල් සමාගම් අංශයේ ඉහළ යන ණය වර්ධනයට පිළියම් යෙදීම සඳහා 2025 වසරේ ජූලි මාසයේ දී මෝටර් රථ වාහන මූල්‍යකරණයේ දී අදාළ වන වටිනාකම මත ණය අනුපාත සීමා (LTV caps) සංශෝධනය කරන ලද අතර 2025 වසරේ නොවැම්බර් මාසයේ දී තවදුරටත් එය දැඩි කරන ලදි.
- මූල්‍ය ආයතනවල ඔරොත්තු දීමේ හැකියාව ඇගයීම සඳහා සහ පද්ධතිමය අවදානම් අධීක්‍ෂණය සඳහා ආතති පරීක්‍ෂණ සහ කාර්තුමය අවදානම් තක්සේරු සිදු කරන ලදි.
- මූල්‍ය ආයතන අතර අන්තර් සම්බන්ධතා ඇගයීම, බැංකු සහ මුදල් සමාගම් අතර එකිනෙක වෙත පවතින ද්විපාර්ශ්වික නිරාවරණ ද සලකා බැලීම මඟින් තවදුරටත් වැඩිදියුණු කරන ලදි.
- 2025 වසරේ ඔක්තෝබර් මාසයේ දී මූල්‍ය ස්ථායීතා විවරණය 2025[1] ප්‍රකාශයට පත් කරන ලදි.

[1] *https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/financial-system-stability-review*

# මූල්‍ය පද්ධති ස්ථායීතාව සුරක්ෂිත කිරීම

රූප සටහන - 08

**මූල්‍ය පද්ධති ස්ථායීතාව සුරක්ෂිත කිරීම**

## සාර්ව විචක්ෂණ අධිකාරිය

**සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම:**
මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම

**මූල්‍ය අංශයේ පද්ධතිමය වශයෙන් වැදගත් සහභාගීවන්නන් ආවේක්ෂණය:**
අවදානම් සහ දුර්වලතා හඳුනා ගැනීම සඳහා අර්ධ වාර්ෂික අවදානම් තක්සේරු සිදු කිරීම

**පද්ධතිමය අවදානම් අධීක්ෂණය කිරීම:**
කාර්තුමය අවදානම් විශ්ලේෂණ සහ ආතති පරීක්ෂණ සිදු කිරීම

## නියාමනය සහ අධීක්ෂණය

**විචක්ෂණශීලී නියාමනය:**
විධාන නියමයන් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම

**ව්‍යවස්ථාපිත පරීක්ෂණ සිදු කිරීම සහ අඛණ්ඩ අධීක්ෂණය:**
අවදානම් අධීක්ෂණය සහ කඩිනම් නිවැරදි කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම

**විධිමත් පාලනය:**
ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ යෝග්‍යතාව ඇගයීම

## ජාතික ගෙවීම් පද්ධති

**තත්කාලීන දළ පියවීම් පද්ධතිය:**
ආයතන 35ක් අතර විශාල වටිනාකම් සහිත ගෙවීම් සිදු කිරීම

**සුළු පරිමාණ ගෙවීම් සහ කලාපීය සම්බන්ධතාව:**
දේශ සීමා අතර සුළු පරිමාණ ගනුදෙනු සඳහා LankaPay සම්බන්ධ කිරීම

**SWIFT මගින් ගෝලීය ප්‍රමිතීන් හා අනුගත වීම:**
ජාත්‍යන්තර සහ දේශීය ගනුදෙනු සම්බන්ධ සුරක්ෂිත දත්ත හුවමාරුව

## මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාල

**නිරාකරණය සඳහා ම වෙන් වූ අධිකාරිය:**
මහ බැංකුව සිය නියාමනය යටතේ ඇති ආයතනවල නිරාකරණ කටයුතු කළමනාකරණය කරයි

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය:**
තැන්පතුකරුවන් සඳහා ආරක්ෂණ ජාලයක් ලබා දීම

## මූල්‍ය අන්තර්ගතභාවය, සාක්ෂරතාව සහ පාරිභෝගික ආරක්ෂණය

**මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය:**
පුරවැසියන් තවදුරටත් සවිබලගැන්වීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම

**මූල්‍ය සාක්ෂරතාව:**
වගකීමෙන් යුතු ව මූල්‍ය තීරණ ගැනීම සඳහා විවිධ සමාජ ආර්ථික පසුබිම් සහිත පුද්ගලයින් සවිබලගැන්වීම

**වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය:**
අනාවරණ පරිචයන්හි පවතින දුර්වලතා හඳුනා ගැනීම

## බැංකු නියාමනය හා අධීක්ෂණය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන සහ 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතියේ සුරක්ෂිතතාව හා ශක්තිමත් බව තහවුරු කිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හඳුන්වනු ලැබේ) තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය කාර්යයන් ඉටු කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කරයි.

- **බලපත්‍ර ලබා දීම සහ නියාමනය** - ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු ව්‍යාපාර සිදු කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරන අතර විචක්ෂණශීලී රෙගුලාසි සකස් කිරීම සහ නිකුත් කිරීම සිදු කරයි.
- **බලපත්‍රලාභී බැංකුවල අඛණ්ඩ අධීක්ෂණය සහ ව්‍යවස්ථාපිත පරීක්ෂණ** - ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී බැංකුවල අඛණ්ඩ අධීක්ෂණය සහ ව්‍යවස්ථාපිත පරීක්ෂණ මෙහෙයවීම සිදු කරයි.
- **පාලන අධීක්ෂණය** - ශ්‍රී ලංකා මහ බැංකුව අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරින්ගේ සහ බලපත්‍රලාභී බැංකුවල විධායක කාර්යයන්හි නියුතු නිලධාරින්ගේ යථායෝග්‍යතාවය තක්සේරු කර අනුමත කිරීම සිදු කරයි.
- **නියාමන අනුමැතීන්** - ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු පනතට අනුව නියාමන අනුමැතීන් ලබා දීම සිදු කරන අතර අවශ්‍ය අවස්ථාවන්හි දී නියාමන ක්‍රියාමාර්ගයන් ආරම්භ කරයි.
- **දැනුම්වත් කිරීමේ හා කුසලතා වර්ධන වැඩසටහන්** - ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු අංශයේ දැනුම්වත්භාවය සහ ශක්‍යතා වර්ධනය සිදු කරයි.

2025 අවසානය වන විට ශ්‍රී ලංකාවේ බැංකු අංශය බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින් සමන්විත විය.

### විචක්ෂණ රෙගුලාසි නිකුත් කිරීම

2025 වසර තුළ බලපත්‍රලාභී බැංකුවල ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විචක්ෂණශීලී සහ නියාමන අවශ්‍යතා පිළිබඳ බැංකු පනත් විධාන, නිර්ණ සහ චක්‍රලේඛ කිහිපයක් නිකුත් කරන ලදි. ප්‍රධාන රෙගුලාසි අතරට බලපත්‍රලාභී බැංකු සඳහා ප්‍රතිසාධන සැලසුම් පිළිබඳ බැංකු (විශේෂ විධිවිධාන) පනත් විධාන, බලපත්‍රලාභී බැංකුවල තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ සිදුවීම් වාර්තා කිරීම පිළිබඳ චක්‍රලේඛය, "බලපත්‍රලාභී බැංකු සඳහා වූ ආයතනික යහපාලනය" යන බැංකු පනත් විධානයට අතිරේකය, "බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්ව සඳහා ලබා දී ඇති අනුග්‍රහයන් සඳහා වන අනුමත සුරැකුම්පත්" යන බැංකු පනත් නිර්ණයට සංශෝධනය සහ "බලපත්‍රලාභී වාණිජ බැංකුවල ජංගම බැංකු ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" යන චක්‍රලේඛයට සංශෝධනය, බලපත්‍රලාභී බැංකු සඳහා "වාර්ෂික බලපත්‍ර ගාස්තු" යන බැංකු පනත් නිර්ණය සහ "මෑත කාලීන සුළිසුළං සහ ගංවතුර හේතුවෙන් ඇතිවූ ආපදා තත්ත්වයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා සහන සැලසීම" යන චක්‍රලේඛය ඇතුළත් වේ.

මූල්‍ය ආයතනයන්හි අධීක්ෂණය, නියාමනය, අර්බුද කළමනාකරණය සහ නිරාකරණය යන ක්ෂේත්‍රවල තොරතුරු හුවමාරු කරගැනීම සහ සහයෝගීතාව වැඩිදියුණු කිරීම මෙන්ම ශක්‍යතා වර්ධනය සහ තාක්ෂණික සහාය ලබා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2025.02.20 දින නේපාල රාස්ට්‍රා බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹිණි. තව ද ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සම්ක්ෂණ මණ්ඩලය සමඟ අදාළ රෙගුලාසි/ප්‍රමිතීන්ට අනුකූල නොවීම සහ නියාමනය කරන ලද මූල්‍ය ආයතනවල අනෙකුත් ගැටලු සම්බන්ධයෙන් දෙපාර්ශ්වය අතර තොරතුරු හුවමාරු කරගැනීමේ අරමුණින් 2025.12.01 දින අවබෝධතා ගිවිසුමකට එළඹිණි.

තව ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොළඹ වරාය නගරයේ අක්වෙරළ බැංකු කටයුතුවලට අදාළ නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කරමින් එම කටයුතුවලට පහසුකම් සැලසීම සඳහා 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට නිරීක්ෂණ සහ යෝජනා ලබා දෙන ලදි.

තව ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තිරසාර මූල්‍ය පෙර දැක්ම 2.0 සකස් කිරීම සඳහා ඊට අදාළ සාකච්ඡාවලට සහභාගී වී නිරීක්ෂණ ලබා දෙමින් එයට සහාය වූ අතර බලපත්‍රලාභී බැංකුවල තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ නව බැංකු පනත් විධාන තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කරන ලදි.

### අඛණ්ඩ අධීක්ෂණ මෙහෙයවීම

2025 වසර තුළ බැංකු අංශයේ පවතින අවදානම් තක්සේරු කර, කඩිනම් නිවැරදි කිරීමේ පියවර ක්‍රියාත්මක කරමින් තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂා කිරීම සඳහා අඛණ්ඩ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරන ලදි. එම වසර තුළ දී නියාමන අනුමැතීන් ලබා දීමේ ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කරන ලද අතර අඛණ්ඩ අධීක්ෂණයට අදාළ කාර්යය ප්‍රවාහ ස්වයංක්‍රීය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි.

**නියාමන සහ අධීක්ෂණ රාමුව** රූප සටහන - 09




බලපත්‍ර නිකුත් කිරීම නියාමනය සහ අධීක්ෂණය යන දෙකම ආවරණය කරයි.
බලපත්‍ර නිකුත් කිරීමේ නිර්ණායක අදාළ නීති සහ නියාමන විධිවිධාන හරහා ස්ථාපිත කර ඇත.

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දුන් නියාමන අනුමැතීන්

2025 වසර තුළ දී බැංකු ශාඛා, බැංකු ඒකක සහ නියෝජිතයන් 3,627ක් සඳහා වන නියාමන ඉල්ලීම් ලැබුණු අතර ඉන් 3,555 කට අනුමැතිය ලබා දෙන ලදි.

### බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකකවලට අදාළ අනුමැතීන් 1 වගුව

| අනුමැතියේ ස්වභාවය | ශාඛා/බැංකු ඒකක/නියෝජිතයින් සංඛ්‍යාව | |
|---|---|---|
| | ඉල්ලීම් | අනුමැතීන් |
| බැංකු ශාඛා, ස්වයංක්‍රිය සේවා සපයන යන්ත්‍ර, ශිෂ්‍ය ඉතුරුම් ඒකක, අනෙකුත් බැංකු ඒකක සහ බලපත්‍රලාභී බැංකුවල නියෝජිත ව්‍යාප්ත කිරීම් සහ ස්ථාපනය කිරීම් | 130 | 103 |
| ශාඛා, ස්වයංක්‍රිය සේවා සපයන යන්ත්‍ර සහ අනෙකුත් ප්‍රතිස්ථාපනය කිරීම් | 83 | 64 |
| ශාඛා සහ වෙනත් සේවා ඒකක වසා දැමීම් හෝ ලබා දුන් අනුමැතීන් අවලංගු කිරීම් | 37 | 28 |
| ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර සහ අනෙකුත් ස්වයංක්‍රිය යන්ත්‍ර ස්ථාපනය සඳහා ලබා දුන් අනුමැතීන් අත්හිටුවීම් සහ අවලංගු කිරීම් | 62 | 45 |
| බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයින් සඳහා ලබා දුන් අනුමැතීන් අත්හිටුවීම් සහ අවලංගු කිරීම් | 3,315 | 3,315 |
| ශාඛා/බැංකු ඒකක/නියෝජිතයින්ගේ මුළු එකතුව | 3,627 | 3,555 |

බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක සඳහා ලබා දුන් අනුමැතීන්ට අමතර ව 2025 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සඳහා පහත සඳහන් නියාමන අනුමැතීන් ලබා දෙන ලදි.

### ලබා දී ඇති වෙනත් නියාමන අනුමැතීන් 2 වගුව

| අනුමැතියේ ස්වභාවය | අනුමැතීන් සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන විධායක නිලධාරින් ඇතුළු ප්‍රධාන කළමනාකරණ නිලධාරින් පත් කිරීම සඳහා යථායෝග්‍යතාව තක්සේරු කිරීම | 130 |
| අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා යථායෝග්‍යතාව තක්සේරු කිරීම | 47 |
| සේවා බාහිරින් ලබා ගැනීමේ කටයුතු සඳහා එකඟතාව | 12 |
| වෙළෙඳපොළ වටිනාකමට වඩා අඩු වටිනාකමකට දේපළ බැහැර කිරීම | 3 |
| දෙවන ස්ථර ප්‍රාග්ධනයට ණයකර ඇතුළත් කිරීම | 7 |
| අත්හරින ලද දේපළ ප්‍රතිපූරණයන් | 1 |
| විදේශික සේවකයන් සඳහා වීසා බලපත්‍ර අලුත් කිරීම/නිර්දේශ නිකුත් කිරීම | 13 |
| වෙනත් අනුමැතීන්/තක්සේරු කිරීම් | 86 |
| මුළු එකතුව | 299 |

බලපත්‍රලාභී බැංකු විසින් කරන ලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමක දී එකී තීරණය අදාළ සාධාරණීකරණය/හේතු ද සහිතව අදාළ බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙනු ලැබේ. 2024.04.08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමත කළ පරිදි, රාජ්‍ය බැංකුවල පාලනය, අවදානම් කළමනාකරණය සහ අධීක්ෂණයට අදාළ ප්‍රතිසංස්කරණවල කොටසක් ලෙස, එම බැංකුවලට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ක්‍රියාවලියට ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසර තුළ දී පහසුකම් සලසන ලදි.

තව ද ඔරොත්තු දීමේ හැකියාව සහ මූල්‍ය ස්ථායිතාව ප්‍රවර්ධනය කිරීම මඟින් රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ මාවතට පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු ක්ෂේත්‍රයට අදාළ ව ඒකාබද්ධ කිරීමේ රාමුව හඳුන්වා දුන් අතර එමඟින් රුපියල් බිලියන 400 ට අඩු වත්කම් සහිත දේශීය ව සංස්ථාපිත බලපත්‍රලාභී බැංකු, අර්ධ වාර්ෂිකව ස්වයං තක්සේරු ඉදිරිපත් කළ යුතු අතර එය නිශ්චිත ශ්‍රේණිගත කිරීමේ නිර්ණායක මත පදනම් ව ඇගයීමට ලක් කෙරෙනු ඇත.

2025 වසර තුළ දී ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවල සිදු කෙරෙමින් පැවති ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩ ව පහසුකම් සපයන ලදි.

තව ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ඒකාබද්ධ කර ගැනීම අධීක්ෂණය කිරීම සහ විදේශීය බැංකු දෙකක් සිය පුද්ගල කේන්ද්‍රීය ව්‍යාපාර කලඹ බැහැර කිරීම සහ බලපත්‍රලාභී බැංකු දෙකක් විසින් එකී ව්‍යාපාර කලඹ මිල දී ගැනීම අධීක්ෂණය කිරීම මඟින් බලපත්‍රලාභී බැංකු ඒකාබද්ධ කිරීම් සඳහා පහසුකම් සපයන ලදි.

### නියාමන ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 වසර තුළ අවස්ථා 08ක දී බැංකු පනත සහ අදාළ විධානයන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් නිකුත් කරන ලදි.

### කාලීන පරීක්ෂණ පැවැත්වීම

2025 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය පද්ධතිමය වශයෙන් වැදගත්කමක් සහිත බැංකු 5ක්, විදේශීය බැංකු 4ක්, විශාල බැංකු 1ක්, මධ්‍යම හා කුඩා පරිමාණයේ බැංකු 7ක් ආවරණය කරමින් ඒකාබද්ධ අධීක්ෂණ 2ක් ඇතුළුව පූර්ණ විෂය පථය ආවරණය කරන පරීක්ෂණ 6ක්, සීමිත විෂය පථය ආවරණය කරන පරීක්ෂණ 6ක් සහ පසු විපරම් පදනම මත පරීක්ෂණ 5ක් ඇතුළු ව බලපත්‍රලාභී බැංකුවලට අදාළ ව ව්‍යවස්ථාපිත පරීක්ෂණ 17ක් සිදු කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එතැන් පරීක්ෂණ 6ක් පවත්වන ලද අතර මූලික බැංකු පද්ධති බිඳ වැටීම්, දත්ත කඩ කිරීම්, ණය පාලනය, වෙළෙඳපොළ අවදානම සහ බැංකු 5ක අක්වෙරළ ණය ලබා දීම්වලට අදාළ පරීක්ෂණ ඊට අයත් වේ. එක් එක් බලපත්‍රලාභී බැංකුවල මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම, සමූලඝාතක අවි සංගණනය මූල්‍යනය යන අවදානම් සම්බන්ධ රෙගුලාසිවලට අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ස්වාධීන පදනම මත මෙන්ම, මූල්‍ය බුද්ධි ඒකකය සමඟ ඒකාබද්ධ ව අඛණ්ඩ අධීක්ෂණ සහ විතැන් පරීක්ෂණ සිදු කරන ලදි. මෙහි දී බැංකුවල ගැටලු තිබේ නම් මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ සුදුසු පරිදි බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා ඒවා මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම් දෙනු ලැබේ. 2025 වසරේ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මූල්‍ය බුද්ධි ඒකකය සමඟ

ඒකාබද්ධ අධීක්ෂණ 10ක් සහ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ස්වාධීන පරීක්ෂණ 5ක් පවත්වන ලදි.

තව ද 2025 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රාථමික වෙළෙඳ ඒකක 5ක් සඳහා විචක්ෂණශීලී අධීක්ෂණ සිදු කරන ලදි.

## පාර්ශ්වකරුවන් සමග සන්නිවේදනය සහ සහභාගීත්වය

පාර්ශ්වකරුවන් සමග ඵලදායී සන්නිවේදනයක් පැවැත්වීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුතුව ප්‍රධාන විධායක නිලධාරීන් සමග මාසික රැස්වීම් පැවැත්වීය. ඊට අමතර ව බැංකු අංශයේ ක්‍රියාකාරිත්වය සහ ආර්ථිකයේ වර්ධනයන් පිළිබඳ ව දැනුම්වත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල සභාපතිවරුන් සමග රැස්වීම් දෙකක් පවත්වන ලදි. අධීක්ෂණ යාන්ත්‍රණයේ කොටසක් ලෙස ප්‍රධාන අධීක්ෂණ ගැටලු/සොයාගැනීම් පිළිබඳ ව ඇතැම් බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමග සාකච්ඡා කිහිපයක් පවත්වන ලදි. එපමණක් නොව බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළ කරුණු සාකච්ඡා කිරීම සඳහා බාහිර විගණකවරුන් සමග රැස්වීම් කිහිපයක් පවත්වන ලදි. තව ද ආරක්ෂිත මූල්‍ය පද්ධතියක් ගොඩනැගීමේ අරමුණින්, තොරතුරු ආරක්ෂණ ක්ෂේත්‍රයේ නවතම ප්‍රවණතා සාකච්ඡා කිරීම සහ තොරතුරු ආරක්ෂණ ක්ෂේත්‍රයේ විභව අවදානම් සහ අභියෝග අවම කිරීම සඳහා බැංකු පද්ධතියේ සූදානම තක්සේරු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන තොරතුරු නිලධාරීන් සමග 2025 දී රැස්වීම් දෙකක් පවත්වන ලදි. බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරීන් ද ඉන් එක් රැස්වීමකට සහභාගී විය. ඊට අමතර ව ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා සහන පියවර ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡාවන් ද ඇතුළු ව බාහිර පාර්ශවයන් සමග රැස්වීම් කිහිපයක් පවත්වන ලදි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 වසර තුළ දී බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම සඳහා මූල්‍ය අංශයේ ස්ථායීකරණ පියවර ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවෙහි දූත මණ්ඩල කිහිපයක් සම්බන්ධීකරණය කරමින් සහභාගී විය. ඊට අමතර ව බැංකු අංශයෙහි පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් සැපයීමෙන් සහ එහි කාර්ය මණ්ඩලයට පුහුණු සහ සංවර්ධන අවස්ථා ලබා දීමෙන් එම අංශයේ ශක්‍යතා වර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩ ව දායක විය.

මහජනතාවට දැනුම්වත් තීරණ ගැනීම පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු අංශයට අදාළ තෝරාගත් මූල්‍ය තොරතුරු සහ දර්ශක ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියට නිතිපතා යාවත්කාලීන කරන ලදි. තව ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවශ්‍ය විටෙක නිසි අනුමැතිය සහිත ව බැංකු අංශයට අදාළ දත්ත, අවශ්‍යතා සහිත බාහිර පාර්ශ්වයන් වෙත සපයන ලදි.

### 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- සහයෝගීතාවය තොරතුරු හුවමාරුව සහ අධීක්ෂණ කටයුතු සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා නේපාල රාස්ට්‍රා බැංකුව සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.
- විධිමත් නියාමන අනුමැතීන් සහ කාර්යය ප්‍රවාහ ස්වයංක්‍රීය කිරීම ආරම්භ කිරීම ඇතුළු ව අඛණ්ඩ අධීක්ෂණය ශක්තිමත් කිරීම.
- බැංකු ශාඛා, බැංකු ඒකක සහ නියෝජිතයන් 3,627ක් සඳහා වන නියාමන ඉල්ලීම් ලැබුණු අතර ඉන් 3,555 කට අනුමැතිය ලබා දීම.
- අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ යථායෝග්‍යතාව තක්සේරු කිරීම්, සේවා බාහිරින් ලබා ගැනීමේ එකඟතා, ප්‍රාග්ධන උපකරණ නිකුත් කිරීම, දේපළ බැහැර කිරීම් සහ විදේශික සේවකයන් සඳහා වීසා බලපත්‍ර ඇතුළුව වෙනත් නියාමන අනුමැතීන් 299ක් ලබා දීම.
- අධ්‍යක්ෂවරුන් පත් කිරීම් සහ අධීක්ෂණය වැඩිදියුණු කිරීම් ඇතුළු ව රාජ්‍ය බැංකුවල යහපාලනය ආශ්‍රිත ප්‍රතිසංස්කරණ සඳහා පහසුකම් සැලසීම.
- දේශීය ව සංස්ථාගත කරන ලද කුඩා බැංකුවලට අර්ධ වාර්ෂික ස්වයං තක්සේරු ඉදිරිපත් කිරීමට නියම කරමින් බැංකු අංශය ඒකාබද්ධ කිරීමේ රාමුව ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවල ප්‍රතිව්‍යුහගත කිරීම අධීක්ෂණය කිරීම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ඒකාබද්ධ කර ගැනීම සහ විදේශීය බැංකු දෙකක් සිය පුද්ගල කේන්ද්‍රීය බැංකු මෙහෙයුම් බැහැර කිරීම ඇතුළු ව ඒකාබද්ධ කිරීමේ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම.

# ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ විකාශය සහ නියාමනයන්හි වෙනස්වීම්



**දශක ගණනාවක් පුරා ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල ව අඛණ්ඩ ව්‍යාප්තියක් තුළින් විශ්වාසදායක සහ ආරක්ෂිත පරිසරයක් ගොඩනැඟීම කෙරෙහි බැංකු අංශය අවධානය යොමු කර ඇත. සැලකිය යුතු ආර්ථික බාධක ජයගෙන බැංකු කර්මාන්තය පරිණත මට්ටමකට ළඟා වී ඇති අතර මේ වන විට එය මනා මූල්‍ය ස්ථාවරත්වයක් සහිත මූලික පදනමකින් සමන්විත වේ. ඒ අනුව එම පදනම අනාගතය මෙහෙය වන ප්‍රධාන මූල්‍ය අතරමැදියා ලෙස කටයුතු කරයි.**

### බැංකු අංශයේ විකාශය

ශ්‍රී ලංකාවේ බැංකු අංශය මූල්‍ය අතරමැදිකරණය සහ පද්ධති ස්ථායිතාව ශක්තිමත් කරමින් නෛතික, ආයතනික සහ ප්‍රතිපත්ති රාමු ඇසුරින් දශක ගණනාවක් පුරා විකාශය වී ඇත. 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ 1950 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු නියාමනය සහ අධීක්ෂණය සඳහා නීතිමය පදනම සැප යූ අතර මුදල් නීති පනත යටතේ එහි ව්‍යවස්ථාපිත දෙපාර්තමේන්තු දෙකෙන් එකක් ලෙස බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

1950-1976 කාලය තුළ ප්‍රධාන වශයෙන් විදේශ වෙළෙඳාම සහ වැවිලි අංශයේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලූ විදේශීය බැංකු අභිබවමින් බැංකු අංශයේ ආධිපත්‍යය ක්‍රමයෙන් තහවුරු කළ අතර රජයේ දැක්මට අනුකූල ව රාජ්‍ය බැංකු දෙකෙහි ශාඛා ජාලයන් ග්‍රාමීය ප්‍රදේශවලට ව්‍යාප්ත වීමත් සමඟ බැංකු අංශය සැලකිය යුතු ලෙස පුළුල් විය. සීමිත ව්‍යාප්තියක් සහිත පෞද්ගලික බැංකු අංශය තුළ දක්නට තිබූ අඩු තරගකාරීත්වය මූල්‍ය පද්ධතියේ කාර්යක්ෂමතාවට සහ වැඩිදියුණුවට බාධාවක් විය.

1977 ලිබරල්කරණ ක්‍රියාමාර්ගයන්ගෙන් පසුව වර්ධනය වන මූල්‍ය අවශ්‍යතාවන්, තාක්ෂණික දියුණුවීම් සහ නව මූල්‍ය උපකරණ හඳුන්වා දීම සමඟ නව දේශීය පෞද්ගලික බැංකු සංස්ථාගත කිරීම සහ විදේශීය බැංකුවල ශාඛා පිහිටුවීමත් සමඟ පරිමාණය සහ සංකීර්ණත්වය සහ නිපුණත්වය පදනම් ව බැංකු අංශය තවදුරටත් පුළුල් විය. තව ද ආයෝජන මණ්ඩලය යටතේ වන නේවාසික සහ අනේවාසික සමාගම්වලට, නම් කරන ලද විදේශ මුදල්වලින් ණය ලබා දීමට පහසුකම් සලසමින් විදේශ මුදල් බැංකු ඒකක ස්ථාපිත කරන ලදි. මීට අමතර ව ප්‍රාදේශීය ව්‍යවසායකයින්ට සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මූල්‍යකරණ පහසුකම් සැලසීම තුළින් ග්‍රාමීය සංවර්ධනයට දායක වීමේ අරමුණින් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ද පිහිටුවන ලදි.

බැංකු ක්ෂේත්‍රයේ විකාශයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් මූල්‍ය පද්ධතියේ වැඩිවන සංකීර්ණත්වයට සහ වඩාත් ශක්තිමත් නියාමන රාමුවක අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් 1988 අංක 30 දරන බැංකු පනත බලාත්මක කරන ලදි. එම පනත මඟින් බැංකු ව්‍යාපාර පවත්වා ගෙන යනු ලබන ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය සහ අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට නිශ්චිත බලයක් ලබා දී ඇති අතර එමඟින් බැංකු අංශයේ ආරක්ෂාව සහ ශක්තිමත්භාවය ප්‍රවර්ධනය කිරීම සහ තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සිදු කෙරේ.

තව ද 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීම තුළින් ඔරොත්තු දීමේ හැකියාව සහිත ශක්තිමත් බැංකු අංශයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව අවධාරණය කරමින් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණක් ලෙස හඳුනා ගන්නා ලදි.

### නියාමන විකාශනය

සමස්ත බැංකු අංශයෙහි අධීක්ෂණය, විචක්ෂණශීලී නියාමනය, අවදානම් කළමනාකරණය සහ යහපාලන පිළිවෙත් ශක්තිමත් කරමින් ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ නියාමන රාමුව, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව අඛණ්ඩ ව විකාශය වෙමින් පවතී. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව 1993 වසරේ දී බාසල් I ප්‍රමිතීන්ට අනුගාමී ව ණය අවදානම සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වූ ප්‍රමිතීන් ස්ථාපිත කරන ලදි. ඉන් පසුව 2008 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව බාසල් II ප්‍රමිතීන් වෙත ප්‍රවේශ වූ අතර එමඟින් අවම ප්‍රාග්ධන අවශ්‍යතා, අධීක්ෂණ සමාලෝචනය සහ වෙළෙඳපොළ විනය යන කරුණු තුනකින් යුත් ප්‍රවේශයක් ඇතුළත් වඩාත් සවිස්තරාත්මක හා අවදානම්-සංවේදී රාමුවක් හඳුන්වා දෙන ලදි. නියාමන ප්‍රතිසංස්කරණවල ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුව විසින් ක්‍රියාත්මක කරන ලද පශ්චාත් ගෝලීය මූල්‍ය අර්බුද ප්‍රමිතීන්ට අනුකූල ව 2016 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව බාසල් III ප්‍රමිතී යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ බැංකු පනත් විධාන හඳුන්වා දෙන ලදි.

තව ද ශ්‍රී ලංකා මහ බැංකුව වෙනස් වන වෙළෙඳපොළ තත්ත්වයන් සමඟ අඛණ්ඩ ව අනුවර්තනය වීම තහවුරු කරමින් නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම උදෙසා පහත අංශයන් සම්බන්ධයෙන් වරින් වර විධාන නිකුත් කරන ලදි.

- ආයතනික යහපාලනය
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව
- බාසල් III යටතේ තෝලන අනුපාතය
- ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය ඇතුළුව බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාත පිළිබඳ විධාන
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 9 අනුව මූල්‍ය උපකරණවලට අනුකූල ව ණය පහසුකම් සහ අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ මිනුම් කිරීම
- බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ විධාන
- බලපත්‍රලාභී බැංකුවල විශාල ගනුදෙනු නිරාවරණය වීම් පිළිබඳ විධාන
- බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්ව සඳහා ලබා දී ඇති අනුග්‍රහයන් සඳහා වන අනුමත සුරැකුම් සහ සීමාවන් පිළිබඳ විධාන

### බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව

2025 වසර අවසන් වන විට බැංකු අංශයේ මුළු වත්කම් පදනම රුපියල් ට්‍රිලියන 24.9 ඉක්මවන ලදි. බැංකු අංශය බලපත්‍රලාභී බැංකු 30කින් සමන්විත වන අතර මෙයට විදේශීය බැංකු ශාඛා 11ක් ඇතුළුව බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක් ද බලපත්‍රලාභී විශේෂිත බැංකු 6ක් ද අයත් වේ. බැංකු සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කරමින් මූල්‍ය අතරමැදිකරණයට සහාය වීම සඳහා එම බැංකු, ශාඛා 3,642ක ජාලයක් හරහා ක්‍රියාත්මක වන අතර 2025 අවසානය වන විට රටේ බැංකු ඝනත්වය (පුද්ගලයින් 100,000 කට ශාඛා ගණන) 16.5ක් විය.

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාව පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය හා එම වසංගතයෙන් පසු ඇති වූ බාධාවන් සහ ඒ සමඟ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී ව යථා තත්ත්වයට පත්වීම, දේශපාලන අවිනිශ්චිතතා සහ සුවිශේෂී අහිතකර ආර්ථික තත්ත්වයන් ඇතුළත් ව බහුවිධ ආර්ථික හා මූල්‍ය අභියෝගවලට මුහුණ දෙන ලදි. කෙසේ වුවත් මෙම අභියෝග මධ්‍යයේ වුව ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු අංශයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන විචක්ෂණ නියාමන ප්‍රතිසංස්කරණ හේතුවෙන් මෙරට බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩ ව පවත්වා ගෙන යන ලදි.

බාසල් III ප්‍රමිති මත පදනම් වූ ශක්තිමත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගැනීම සහ බැංකු විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 9 අනුව අපේක්ෂිත ණය හානි සඳහා ප්‍රමාණවත් හානිකරණ ප්‍රතිපාදන සිදු කිරීම මෙම කාල සීමාව තුළ දී බැංකු අංශයේ ස්ථායීතාව තහවුරු කිරීමට සැලකිය යුතු ලෙස දායක විය.

බැංකු අංශය මුහුණ දෙන අඛණ්ඩ ආර්ථික අභියෝග සැලකිල්ලට ගනිමින් ආර්ථිකය මත වන චක්‍ර බලපෑම් අවම කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කිරීම, මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුව පිහිටුවීම, බලපත්‍රලාභී බැංකු සඳහා හදිසි ණය සහ අත්තිකාරම් ලබා දීම සඳහා රාමුවක් සැකසීම සහ බැංකු ප්‍රතිප්‍රාග්ධනීකරණ උපායමාර්ග සම්පාදනය ඇතුළු අර්බුද සඳහා සූදානම් වීමේ පියවර කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලදි.

මීට අමතර ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය මූල්‍ය පද්ධතියේ වැඩි වැදගත්කමක් සහිත බැංකු සඳහා දැඩි අධීක්ෂණයක් සහතික කරමින් අවදානම් පාදක අධීක්ෂණය ශක්තිමත් කිරීම මඟින් බලපත්‍රලාභී බැංකු අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරන ලදි. තව ද ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු සමූහ සඳහා ඒකාබද්ධ අධීක්ෂණ සිදු කිරීම ආරම්භ කරන ලද අතර පද්ධතිමය අවදානම්වලට එරෙහි ව බැංකු පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වඩාත් ඵලදායී අවදානම් පාදක ඒකාබද්ධ අධීක්ෂණ සිදු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹිණි.

### 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත

නියාමන රාමුවේ වර්ධනයන්, ආර්ථික හා වෙළෙඳපොළ තත්ත්වයන් සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යහභාවිතයන්හි වෙනස්කම් සැලකිල්ලට ගනිමින් බැංකු බලපත්‍ර ලබා දීමේ දී සලකා බලන අවම අවශ්‍යතා, කොටස් හිමියන්ගේ යෝග්‍යතාව, බැංකු හිමිකාරිත්වය, ආයතනික යහපාලනය, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු, ඒකාබද්ධ අධීක්ෂණය, ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා රාමුව සහ විශාල නිරාවරණයන් ඇතුළු ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ වන නෛතික සහ නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත බලාත්මක කරන ලදි.

බැංකු පනතට හඳුන්වා දුන් සංශෝධන මත පදනම් ව බැංකුවල ණය සහ ද්‍රවශීලතා අවදානම් මත ආතතියට තුඩු දෙමින් ස්වෛරී බැංකු සම්බන්ධතාවයෙන් පැන නගින ලද ණය සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල විශාල ගනුදෙනු නිරාවරණය වීම් පිළිබඳ සංශෝධිත විධාන නිකුත් කරන ලදි. ඒ අනුව බලපත්‍රලාභී බැංකු, රාජ්‍ය ගනුදෙනු නිරාවරණය වීම ක්‍රමයෙන් අඩු කිරීමට අවශ්‍ය වේ.

රාජ්‍ය බැංකු සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද රාමුවක් යටතේ කුසලතා මත පදනම් වූ සහ විනිවිදභාවයෙන් යුතු අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම් හරහා රාජ්‍ය බැංකුවල යහපාලනය වැඩිදියුණු වී ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ බලපත්‍රලාභී බැංකු සඳහා ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කිරීමට පහසුකම් සපයා ඇත.

2019 වසරේ සිට පාස්කු ඉරිදා ප්‍රහාරය සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයින් මුහුණ දුන් දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා ණය සහන කාල ලබා දීම, සහන ණය පොලී අනුපාත යටතේ ණය පහසුකම් සැපයීම සහ සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර යළි නඟා සිටුවීම සඳහා කොවිඩ්-19 ව්‍යාපාර යළි පණ ගැන්වීමේ ඒකක පිහිටුවීම ආදී සහන ක්‍රියාමාර්ග රැසක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදි. තව ද සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන්ගෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවල තිරසාර ආර්ථික පුනර්ජීවනයට පහසුකම් සැලසීම සහ බලපත්‍රලාභී බැංකුවල වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා 2024 මාර්තු මාසයේ දී ව්‍යාපාර යළි පණ ගැන්වීමේ ඒකක පිහිටුවීම පිළිබඳ මාර්ගෝපදේශ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලදි. මෑත කාලීන සුළි සුළං සහ ගංවතුර ආපදා තත්ත්වයන් හේතුවෙන් පීඩාවට පත් වූවන්ට ඵලදායී ලෙස සහන සැලසීමේ අවශ්‍යතාව සලකා 2025 දෙසැම්බර් මාසයේ දී සියලුම බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදි.

මීට අමතර ව දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන සහ සමාජීය සහභාගීත්වයකින් යුත් මූල්‍ය පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තිරසාර මූල්‍ය පෙර දැක්ම 2.0 දියත් කළ අතර මූල්‍ය අපරාධ අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීමේ අරමුණින් බැංකු තුළ ක්‍රියාවලීන් සහ පාලනයන් ශක්තිමත් කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ පරීක්ෂණ පැවැත්විය.

බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ ස්ථායීතාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා දායක වෙමින් ශක්තිමත් නියාමන ප්‍රමිතී යටතේ අක්වෙරළ බැංකු කටයුතු සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත කෙටුම්පත් කිරීමට සහ ඉන් පසුව සිදු කරන ලද සංශෝධන සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුව දායකත්වය සැපයීය.

**ඩිජිටල් භාවිතය ශ්‍රී ලංකාවේ බැංකුකරණය වේගයෙන් ප්‍රතිනිර්මාණය කරමින් කාර්යක්ෂමතාව, ප්‍රවේශවීමේ සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කරන අතර ශක්තිමත් සයිබර් ආරක්ෂණ යහපාලනයක් ඉල්ලා සිටී.**

### බැංකු අංශයේ ඩිජිටල් පරිවර්තනය

කොවිඩ්-19 වසංගතය ගනුදෙනුකරුවන්ගේ හැසිරීම සහ සේවා සැපයීම වෙනස් කරමින් බැංකුකරණයේ ඩිජිටල් භාවිතය වේගවත් කරන ලදි. දැඩි තරගකාරිත්වය මධ්‍යයේ වෙනස් වන අපේක්ෂාවන් සපුරාලීමට බැංකු විසින් කාර්යක්ෂමතාව, ප්‍රවිෂ්ට වීමේ හැකියාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගෙන ඇත. බැංකුකරණ සේවාවන් ලබා දෙන ආකාරය වෙනසකට ලක් කරමින් වැඩිදියුණු කළ පරිශීලක අත්දැකීම් සහිත ඩිජිටල් සහ ජංගම බැංකු වේදිකා, තත්කාලීන අන්තර් බැංකු ගෙවීම්, ඩිජිටල් සම්බන්ධතාවලට එළඹීම් (eKYC, vKYC) ක්ලවුඩ් (Cloud) යටිතල පහසුකම් සහ ඩිජිටල් සහායකයින් සහ චැට්බෝට් ඇතුළු කෘතිම බුද්ධිය (AI) පාදක ස්වයංක්‍රියකරණය නවෝත්පාදනයන් ඉතා වේගවත් ආකාරයෙන් උපයෝගී කර ගනිමින් පවතී. මෙම ප්‍රවණතා තීරණ ගැනීම සහ පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කර ඇති අතර ම ශක්තිමත් පාලනයක් සහ මෙහෙයුම් පාලනයන්ගේ අවශ්‍යතාව ඉස්මතු කරමින් සයිබර් ආරක්ෂණ අවදානම් ඉහළ නැංවීමට ද හේතු වී ඇත.

### තාක්ෂණික අවදානම සහ සයිබර් අවදානම සඳහා ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව

තාක්ෂණය ආශ්‍රිත අවදානම්වලට මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව 2021 දී බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුවක් නිකුත් කළ අතර එමගින් තාක්ෂණ අවදානම් පාලනය, තොරතුරු ආරක්ෂණය, තොරතුරු පද්ධති පැවතීම සහ ආපදා ප්‍රතිසාධනය, කාර්ය මණ්ඩල නිපුණතා සහ තෙවන පාර්ශ්වීය යටිතල පහසුකම් භාවිතය ආවරණය වන ලෙස අවම නියාමන අවශ්‍යතා නියම කරන ලදි. තව ද බලපත්‍රලාභී බැංකුවල මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ පාරිභෝගික තොරතුරු සහ වත්කම් ආරක්ෂා කිරීම සඳහා තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ සිදුවීම් මෙන්ම මාර්ගගත හා ඩිජිටල් වංචා කඩිනමින් වාර්තා කරන ලෙස දන්වා බලපත්‍රලාභී බැංකුවල තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ සිදුවීම් වාර්තා කිරීම පිළිබඳ චක්‍රලේඛයක් 2025 වර්ෂයේ දී නිකුත් කරන ලදි. මීට අමතර ව බැංකු ක්ෂේත්‍රය තුළ වගකිවයුතු කෘත්‍රිම බුද්ධියේ භාවිතය සහතික කරමින් කෘත්‍රිම බුද්ධිය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් කෘතිම බුද්ධියේ භාවිතය සඳහා වත්මන් තත්ත්වය තක්සේරු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව මෑතකදී සමීක්ෂණයක් පවත්වන ලදි.

නියාමන සහ වෙළෙඳපොළ ප්‍රවණතා සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යහභාවිතයන්ට අනුකූල ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග කාලෝචිත ලෙස අනුගමනය කරන අතර ම තාක්ෂණය මත පදනම් වූ අධීක්ෂණ මෙවලම් හඳුන්වාදීම මගින් අධීක්ෂණයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම තුළින් බැංකු අංශයේ ස්ථායිතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩ ව කටයුතු කරනු ඇත.

## බැංකු නොවන මූල්‍ය ආයතන නියාමනය සහ අධීක්ෂණය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 61 වන වගන්තිය සමඟ කියවිය යුතු, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි[1] සහ 2016 අංක 06 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතෙහි විධිවිධානයන් යටතේ පිළිවෙළින් මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් නියාමනය සහ අධීක්ෂණය කිරීමේ බලතල ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. මීට අමතර ව 2009 අංක 01 දරන සංශෝධිත ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග සහ 2009 අංක 01 දරන සංශෝධිත දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග යටතේ ප්‍රාථමික අලෙවිකාර සමාගම් අධීක්ෂණය ද බැංකුව විසින් සිදු කරනු ලබයි. අදාළ ප්‍රධාන කාර්යයන් වන්නේ,

- **බලපත්‍ර නිකුත් කිරීම සහ නියාමනය:** බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා බලපත්‍ර/ලියාපදිංචිය නිකුත් කරන අතර විචක්ෂණශීලී රෙගුලාසි සකස් කරයි.
- **බැංකු නොවන මූල්‍ය ආයතනවල අඛණ්ඩ අධීක්ෂණ සහ ව්‍යවස්ථාපිත පරීක්ෂණ කටයුතු කිරීම:** නියාමනයන් සමඟ අනුකූලතාව සහතික කිරීම සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල තිරසරභාවය ඇගයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමට අදාළ අධීක්ෂණ කටයුතු ද ඇතුළු ව අඛණ්ඩ නියාමනය සහ ව්‍යවස්ථාපිත පරීක්ෂණ පවත්වයි.
- **පාලන ව්‍යුහයන් නිරීක්ෂණය කිරීම:** බැංකු නොවන මූල්‍ය ආයතනවල අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් සහ අනෙකුත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයින්ගේ යෝග්‍යතාව ශ්‍රී ලංකා මහ බැංකුව ඇගැයීමට ලක් කර අනුමත කරනු ලබයි.
- **නියාමන ක්‍රියාමාර්ග:** බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධයෙන් නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත.
- **විමර්ශන සිදු කිරීම:** ආයතන නීති විරෝධී ලෙස තැන්පතු භාර නොගන්නා බව හෝ නිසි අවසරයකින් තොරව ක්‍රියාත්මක නොවන බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අනවසර මුදල් ව්‍යාපාර කටයුතු සිදු කරන ආයතන පිළිබඳ විමර්ශනය කරයි.

මෙම සෘජු නියාමන සහ අධීක්ෂණ කාර්යයන්ට අමතර ව මහ බැංකුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ පාර්ශ්වකරුවන්ගේ ශක්‍යතා වැඩිදියුණු කිරීම, මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, අධිකරණ කාර්යයන් සඳහා පහසුකම් සැලසීම සහ මහජන පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වීම වැනි කටයුතුවල දී වඩා පුළුල් කාර්යභාරයක් ඉටු කරයි.

### නියෝග, නියාමන් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම

වත්මන් වෙළෙඳපොළ සහ ජාත්‍යන්තර විශිෂ්ට පරිචයන්ට අනුකූල ව බැංකු නොවන මූල්‍ය ආයතනවල පවත්නා නියාමන රාමුව තවදුරටත් ක්‍රමවත් කිරීමට සහ ශක්තිමත් කිරීමට විචක්ෂණශීලී රෙගුලාසි නිකුත් කරන ලදි. 2025 දී හඳුන්වා දුන් ප්‍රධාන විචක්ෂණ ක්‍රියාමාර්ග අතර මුදල් සමාගම් වෙත නිකුත් කළ තැන්පතු හා ණය උපකරණ මත ගෙවන උපරිම පොලී අනුපාත හා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වෙත නිකුත් කළ ණය අවදානම් කළමනාකරණය සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් වෙත නිකුත් කළ අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ අන්තර්ගත විය[2].

### නියාමන අනුමැතීන්

මහ බැංකුව විසින් ණය උපකරණ නිකුත් කිරීම, ප්‍රාග්ධනය වැඩි කිරීම/අඩු කිරීම, හිමිකාරීත්වය මාරු කිරීම, සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම, පාලිත සමාගම් පිහිටුවීම, වාර්ෂික ශාඛා ව්‍යාප්ති සැලසුම් සහ ප්‍රධාන වගකිව යුතු නිලධාරීන් පත් කිරීම, අඛණ්ඩ ව කටයුතු සිදු කිරීම, ඉල්ලා අස්වීම සහ විශ්‍රාම ගැනීම වැනි කරුණු සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන වෙත අනුමැතීන් 1,121ක් ලබා දෙන ලදි.

### ව්‍යවස්ථාපිත පරීක්ෂණ සහ අඛණ්ඩ අධීක්ෂණය

මහ බැංකුව මුදල් සමාගම් 16කට ප්‍රාථමික අලෙවිකාර සමාගම් 03කට සහ බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් 02කට අදාළ ව ව්‍යවස්ථාපිත පරීක්ෂණ කටයුතු පවත්වන ලදි. අක්‍රමිකතා විමර්ශනය කිරීම සඳහා මුදල් සමාගම් 04ක ස්ථානීය පරීක්ෂණ සිදු කරන ලදි. තව ද ප්‍රධාන වශයෙන් මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇගයීම සහ 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත ද ඇතුළු ව අදාළ නීති, නියෝග හා රෙගුලාසීන්ට ඇති අනුගතතාව ඇගයීම අරමුණු කර ගනිමින් මුදල් සමාගම්වල හා ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ අධීක්ෂණ කටයුතු සිදු කරන ලදි.

මහ බැංකුව විසින් සිය ජාලගත දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය (FinNet) හරහා කාලාවර්තික ව ඉදිරිපත් කරන ලද මූල්‍ය තොරතුරු, විගණන වාර්තා, බාහිර ශ්‍රේණිගත කිරීම්, මාධ්‍ය වාර්තා, වෙනත් මූල්‍ය තොරතුරු ද විශ්ලේෂණය කරමින් සහ භාවිතා කරමින් අඛණ්ඩ සුපරීක්ෂණය සිදු කරන ලදි. දැනුම්වත් තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහතික කරමින් හඳුනාගත් අවදානම් පාලක මණ්ඩලය වෙත දැනුම් දීම සිදු කරන ලදි. අඛණ්ඩ සුපරීක්ෂණය පහසු කිරීම සඳහා මුදල් සමාගම් වඩා අඩු අවදානම් කාණ්ඩයේ සිට ඉතා ඉහළ අවදානම් කාණ්ඩය දක්වා වර්ගීකරණය කරමින් අභ්‍යන්තර අධීක්ෂණ ශ්‍රේණිගතකරණය පිළියෙල කරන ලදි. එමෙන්ම මුදල් සමාගම් ඒකාබද්ධකරණය සඳහා වූ ප්‍රධාන සැලැස්මෙහි දෙවන අදියර යටතේ මුදල් සමාගම් නිරීක්ෂණය කිරීම මෙන්ම ප්‍රතිපත්තිමය ගැටලු සහ බලපත්‍ර අවලංගු කරන ලද මුදල් සමාගම් සම්බන්ධව ලද මහජන පැමිණිලි 354ක් ද නිරාකරණය කරන ලදි.

### සීමා කිරීම් සහ සම්බාධක

මහ බැංකුව විසින් කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුව යටතේ විචක්ෂණ විධානයන්ට අනුකූල නොවූ හා අනෙකුත් බල පවත්නා නීති හා රෙගුලාසි සමඟ අනුගත නොවූ මුදල් සමාගම් මත නියාමන ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කරන ලදි.

- ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූල නොවූ මුදල් සමාගම්වල තැන්පතු ලබා ගැනීම, ණය දීම සහ ණය ගැනීම සඳහා සීමා පැනවීම සහ අනුකූලතාව අත්කරගත් මුදල් සමාගම් සඳහා පනවන ලද සීමාවන් ඉවත් කිරීම සිදු කරන ලදි.
- ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාව සම්බන්ධ ව නියාමන අවශ්‍යතාවන් සඳහා අඛණ්ඩ ව අනුගත නොවූ මුදල් සමාගමක් මත නිරාකරණ ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදි.
- නියාමන ගැටලු විසඳීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා පවත්වන ලදි.
- ඇවර කිරීමේ ක්‍රියාවලීන් කඩිනම් කිරීම සඳහා අසාර්ථක මුදල් සමාගම්වල ඇවර කරන්නන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදි.

[1] ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් සමාගම්වල අධීක්ෂණ, නියාමන හා නිරාකරණ රාමුව වැඩිදියුණු කිරීම සඳහා මුදල් ව්‍යාපාර පනතට සහ කල්බදු මූල්‍යකරණයෙහි හඳුනාගත් ගැටලුවලට පිළියම් යෙදීම සඳහා කල්බදු මූල්‍යකරණ පනතට අවශ්‍ය සංශෝධන කිරීමට කටයුතු කරමින් සිටී.

[2] *https://www.cbsl.gov.lk/en/laws/directions-circulars-guidelines-for-non-banks*

## බැංකු නොවන මූල්‍ය ආයතනවලට අදාළ සන්නිවේදනය සහ දත්ත බෙදාහැරීම

වෙළෙඳපොළ විනිවිදභාවය වැඩි කිරීම සඳහා නියාමන අවශ්‍යතා සහ විචක්ෂණ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අසමත් වූ බැංකු නොවන මූල්‍ය ආයතනවල නම් මහ බැංකුව විසින් සිය වෙබ් අඩවියේ පළ කරන ලදි.[3] එමෙන් ම බැංකුව පහත පුද්ගලයින් සමඟ සාකච්ඡා පැවැත්වීම තුළින් ඇල්මැති පාර්ශ්වයන්ගේ සහභාගීත්වය ඉහළ නංවන ලදි.

- නියාමන සංවර්ධනයන් පිළිබඳ ව මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරින්
- අධ්‍යක්ෂ මණ්ඩල, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, ක්ෂේත්‍ර සංවිධාන, බාහිර විගණකවරු සහ
- අංශය තුළ ඇති වන ගැටලු විසඳීම සඳහා ජාත්‍යන්තර නියෝජිතායතන

ආංශික අවබෝධයන් ලබා ගැනීම ප්‍රවර්ධනය කරුණු සඳහා මහ බැංකුව විසින් මුදල් සමාගම් ක්ෂේත්‍රයේ කාර්තුමය මූල්‍ය තොරතුරු[4] ප්‍රකාශයට පත් කරන ලද අතර ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව වැනි ගෝලීය ආයතන සහ රජයේ ආයතන සමඟ දත්ත හුවමාරු කර ගන්නා ලදි.

2025 වර්ෂය තුළ මහ බැංකුව විසින් ප්‍රධාන වශයෙන් බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා අදාළ නියාමන හා අධීක්ෂණ රාමුව සහ අනවසර තැන්පතු භාරගැනීම/මුදල්, ව්‍යාපාර සම්බන්ධයෙන් විවිධ ඇල්මැති පාර්ශ්ව ඉලක්ක කර ගනිමින් සවිස්තරාත්මක දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදි.

මෙම වැඩසටහන් සඳහා සාමාන්‍ය මහජනතාව, නීති ක්‍රියාත්මක කිරීමේ නිලධාරින්, රජයේ නිලධාරින්, මාධ්‍යවේදීන්, මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය සහ අනෙකුත් ක්ෂේත්‍රවල සිටින අය ඇතුළත් විය.

මෙම පියවරයන් මාධ්‍ය වැඩසටහන්, අන්තර්ජාල සැසි, පුහුණු වැඩසටහන් සහ ඇල්මැති පාර්ශ්ව සමඟ සංවාද ආදී විවිධ මාධ්‍යයන් මඟින් ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව විශේෂයෙන් මුදල් සමාගම් සඳහා අදාළ විධාන හා නියාමන අවශ්‍යතා පිළිබඳ ව අවධානය යොමු කරමින් ඇල්මැති පාර්ශ්වයන්ගේ දැනුම සහ වෘත්තීය මට්ටම් උසස් කිරීමේ අරමුණින් ව්‍යුහගත පුහුණු වැඩසටහන් කිහිපයක් මහ බැංකුව විසින් පවත්වන ලදි. මෙම වැඩසටහන් මහ බැංකුවේ පළපුරුදු සහ සුදුසුකම්ලත් සම්පත් දායකයින් විසින් මෙහෙයවනු ලැබීය.

තව ද මූල්‍ය දැනුම ප්‍රවර්ධනය කිරීමට සමගාමී ව අනවසර තැන්පතු භාරගැනීම සහ නීතිවිරෝධී මුදල් ව්‍යාපාර ක්‍රියාකාරකම් හේතුවෙන් පැන නඟින අවදානම් පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම පිළිබඳ දැඩි අවධානය යොමු කරමින් දැනුම්වත් කිරීමේ සැසි කිහිපයක් සංවිධානය කරන ලදි.

ඒ සමඟ ම අනවසර මූල්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධ නීතිමය රාමුව, නියාමන අවශ්‍යතා සහ බලගැන්වීමේ ක්‍රමවේදයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් පොලිස් නිලධාරින් සහ රජයේ නිලධාරින් සඳහා විශේෂිත හැකියා වර්ධන වැඩසටහන් ද පවත්වන ලදි. ප්‍රජා නායකයින්ගේ සක්‍රිය සහභාගීත්වය සමඟ ග්‍රාමීය ප්‍රදේශවල ක්‍රියාත්මක කළ බාහිර සම්බන්ධතා වැඩසටහන් තුළින් සමාජයේ අවදානමට ලක් වූ කණ්ඩායම් දැනුම්වත් කළ හැකි වූ අතර මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමට සහ පාරිභෝගික ආරක්ෂාව ශක්තිමත් කිරීමට දායක විය.

### 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- බලපත්‍ර ලබා දීම, විචක්ෂණශීලී නියාමනය, අඛණ්ඩ අධීක්ෂණය (මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම අධීක්ෂණය ඇතුළු), ව්‍යවස්ථාපිත පරීක්ෂණ සහ අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරින් සහ වගකිව යුතු පුද්ගලයින්ගේ පාලන ව්‍යුහයන් අධීක්ෂණයන් සිදු කිරීම හරහා නියාමන රාමුව ශක්තිමත් කරන ලදි.
- ණය උපකරණ නිකුත් කිරීම්, ප්‍රාග්ධන වෙනස් කිරීම්, හිමිකාරීත්වය මාරු කිරීම්, ශාඛා ව්‍යාප්ති සැලසුම්, පාලිත සමාගම් පිහිටුවීම සහ ප්‍රධාන වගකිව යුතු නිලධාරින් පත් කිරීම, අඛණ්ඩ ව කටයුතු සිදු කිරීම, ඉල්ලා අස්වීම සහ විශ්‍රාම ගැනීම වැනි කරුණු ආවරණය වන පරිදි නියාමන අනුමැතීන් 1,121ක් ලබා දෙන ලදි.
- විචක්ෂණ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අසමත් වූ හෝ නියාමන සීමාවන්ට යටත් වූ බැංකු නොවන මූල්‍ය ආයතන ප්‍රසිද්ධියේ අනාවරණ කිරීම මඟින් විනිවිදභාවය වැඩිදියුණු කරන ලදි.
- ප්‍රධාන විධායක නිලධාරින්, අධ්‍යක්ෂ මණ්ඩල, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, බාහිර විගණකවරු, ක්ෂේත්‍ර සංවිධාන සහ ජාත්‍යන්තර නියෝජිත ආයතන සමඟ නියාමනය ගැටලු සහ අංශයේ සංවර්ධනය සම්බන්ධයෙන් නිරන්තර සාකච්ඡා පැවැත්වීම හරහා ඇල්මැති පාර්ශ්වයන්ගේ සහභාගීත්වය ශක්තිමත් කරන ලදි.
- මුදල් ව්‍යාපාරවල අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා සහ අනවසර තැන්පතු ලබා ගැනීම/අනවසර මුදල් ව්‍යාපාර පාලනය කිරීම සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

### මුදල් තැරැව්කරණ සමාගම් නියාමනය කිරීම

2018 අංක 01 සහ 2019 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි යටතේ මහ බැංකුව මුදල් තැරැව්කරණ සමාගම් නියාමනය කරනු ලබයි. මහ බැංකුවේ නියාමන කාර්යභාරයට ඇතුළත් වන්නේ,

සුදුසුකම්ලත් මුදල් තැරැව්කරණ සමාගම් වෙත බලය පැවරීමේ සහතිකය නිකුත් කිරීම.

බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් සඳහා වාර්ෂික සහතික පත්‍ර ගාස්තු පැනවීම.

මාර්ගෝපදේශ, චක්‍රලේඛ සහ අධීක්ෂණ පරීක්ෂණ (එතැන් සහ විතැන් ) හරහා අනුකූලතාව පරීක්ෂා කිරීම.

[3] https://www.cbsl.gov.lk/authorized-financial-institutions/licensed-finance-companies

[4] https://www.cbsl.gov.lk/en/statistics/statistical-tables/financial-sector

# බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ විකාශය සහ එහි නියාමන ප්‍රවණතා



බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ විකාශය මඟින් තිරසර සහ සමාවේශී ආර්ථික වර්ධනයක පදනම ලෙස මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව දක්වන දිගු කාලීන කැපවීම පිළිබිඹු කෙරේ. සිය වසකට ආසන්න කාලයක් පුරා බැංකු නොවන මූල්‍ය ආයතන අංශය කැපී පෙනෙන ලෙස පරිණාමය වී ඇති ඇත. සාම්ප්‍රදායික බැංකු පද්ධතියෙන් ඔබ්බට ගොස් ආර්ථික වර්ධනයට සහ මූල්‍ය අන්තර්ගතභාවයට සහාය දක්වන ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොලබන ජන කණ්ඩායම් වෙත මූල්‍ය සේවා සැපයීම ඉලක්ක කරමින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ පරිවර්තනය ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ක්‍රියාත්මක කළ නියාමන ප්‍රතිසංසකරණ හා ස්ථායීතා ක්‍රියාමාර්ගයන් ද, ආයතිනක වර්ධනයන් හා තාක්ෂණයේ වූ දියුණුවීම් සමඟ සමීප ලෙස බැඳී පවතී.

## මුල් ආරම්භය: 1940-1970

බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ආරම්භය 1940 දශකය දක්වා දිව යන අතර බැංකු අංශය මඟින් ප්‍රමාණවත් ලෙස ඉටු නොවූ ණය ඉල්ලුම සපුරාලීම සඳහා මුදල් සමාගම් ස්ථාපිත කිරීමත් සමඟ බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ආරම්භය නිල වශයෙන් සනිටුහන් විය. මෙම ආරම්භක කාලපරිච්ඡේදය තුළ දී, විධිමත් නියාමන රාමුවක් නොමැති පසුබිමක මෙම අංශය විශාල වශයෙන් ව්‍යාප්ත විය. 1950 දශකයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ එහි බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කළ ද 1980 දශකය දක්වා ම මුදල් සමාගම් විධිමත් නියාමන නිරීක්ෂණයන්ගෙන් බැහැර ව පැවතුණි.

1970 දශකයේ අග භාගය දක්වා නිසි නියාමන රාමුවක් නොමැති වීම, නියාමනය නොවන මුදල් සමාගම් සංඛ්‍යාව ඉහළ යෑමට හේතු වූ අතර විශේෂයෙන් 1977ට පෙර කාල පරිච්ඡේදය තුළ දී ඉන් බොහෝ සමාගම් ප්‍රමාණයක් බිඳ වැටුණි. නියාමනයට ලක් නොවන මූල්‍ය අතරමැදිකරණය මඟින් උද්ගත වන අවදානම්, මෙම බිඳවැටීම් හරහා මැනවින් පෙන්නුම් කෙරුණු අතර තැන්පතුකරුවන් ආරක්ෂා කිරීම, මහජන විශ්වාසය පවත්වා ගැනීම සහ මූල්‍ය ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා විධිමත් නියාමන රාමුවක් ගොඩනැඟීමේ අවශ්‍යතාව එමඟින් අවධාරණය කළේ ය.

### විධිමත් නියාමන ක්‍රියාවලියක් හඳුන්වාදීම: 1979-1999

#### 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලනය කිරීමේ පනත බලාත්මක කිරීම.

මුදල් සමාගම් සඳහා පළමු වරට විධිමත් නියාමන අධීක්ෂණයක් හඳුන්වා දෙමින් 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලනය කිරීමේ පනත බලාත්මක කිරීම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ ක්‍රියාවලියෙහි ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මෙම පනත බලාත්මක කිරීම මඟින් බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම, තැන්පතුකරුවන් ආරක්ෂා කිරීම සහ අදාළ ආයතන විචක්ෂණශීලී නියාමන අවශ්‍යතාවලට අනුකූල වන බව සහතික කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යුහගත නියාමන මැදිහත්වීම්වල ආරම්භය සනිටුහන් කළේ ය. ආරම්භයේ දී මෙම පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සතු විය.

#### 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත බලාත්මක කිරීම

1979 අංක 27 දරන මුදල් සමාගම් පාලනය කිරීමේ පනත වෙනුවට 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත බලාත්මක කිරීමත් සමඟ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලද අතර එමඟින් විචක්ෂණශීලී නියාමන විධිවිධාන නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතු බලතල වැඩි කිරීම මඟින්, අධීක්ෂණ සහ නියාමන රාමුව නවීකරණය කරන ලදි.

මෙම පනත අනුව ශ්‍රී ලංකා මහ බැංකුව, 1988 වසරේ දී, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය සඳහා ම වෙන් වූ වෙනම දෙපාර්තමේන්තුවක්, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව නමින් ස්ථාපනය කරන ලදි. බැංකු අධීක්ෂණය හා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය ආයතනික මට්ටමින් වෙන් කිරීම හේතුවෙන් මෙම අංශය සඳහා ම විශේෂිත වූ කාර්යක්ෂම අධීක්ෂණ සහ නියාමන රාමුවක් බිහි විය.

#### 1980 දශකයේ හඳුන්වා දුන් මුදල් සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය

ප්‍රධාන වශයෙන්ම දුර්වල පාලන ක්‍රමවේද සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් හේතු කොට ගෙන 1980 දශකයේ අග භාගයේ දී බොහෝ මුදල් සමාගම් බරපතල මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දුන් අතර ඒ නිසා තැන්පතුකරුවන්ට ඇති වගකීම් ආපසු ගෙවීමට නොහැකි තත්වයක් ඇති විය. එයට ප්‍රතිචාර වශයෙන් මෙම අංශය විධිමත් කිරීමට ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ විය. 1988 අග භාගයේ දළ වශයෙන් 72ක් ලෙස පැවති ක්‍රියාකාරී මුදල් සමාගම් ගණන නියාමන මැදිහත්වීම් සහ ඒකාබද්ධ කිරීමේ පියවරයන් තුළින් 1990 අවසානය වන විට 40ක් දක්වා අඩු විය.

### නියාමන විෂය පථය, නියාමන ප්‍රතිසංස්කරණ සහ ස්ථායීතා ක්‍රියාමාර්ග පුළුල් කිරීම:2000 -2005

#### 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත බලාත්මක කිරීම

2000 දශකය නව බැංකු නොවන මූල්‍ය ආයතන ඇතුළත් කර ගනිමින් නියාමන ආවරණය පුළුල් කෙරුණු අවධියක් ලෙස සැලකිය හැකි ය. කල්බදු මූල්‍යකරණ පහසුකම් ලබා දෙන ආයතන ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණ සහ නියාමන විෂය පථය යටතට ගෙන ඒම සඳහා 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත බලාත්මක කෙරුණි.

#### 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත බලාත්මක කිරීම

පෙර පැවති මුදල් සමාගම් පනත පරිච්ඡින්න කරමින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත බලාත්මක කිරීමත් සමඟ බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් විය. මුදල් ව්‍යාපාර පනත මඟින් මුදල් සමාගම් සඳහා බලපත්‍ර ලබා දීම නියාමනය සහ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරන ලද අතර අනවසර මුදල් ව්‍යාපාර විමර්ශනයට සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට වැඩි බලතල ලබා දෙන ලදි. මෙම නීති සම්පාදනය මඟින් ශ්‍රී ලංකාවේ මුදල් ව්‍යාපාර පාලනය කරන නියාමන ව්‍යුහය නවීකරණය කරන ලදි.

#### බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ පළමු වැඩසටහන

බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ව්‍යුහාත්මක දුර්වලතා සහ අවදානම් වර්ධනය වෙමින් පවතින තත්ත්වයක් මධ්‍යයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2014 ජනවාරි මාසයේ දී බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ පළමු වැඩසටහන හඳුන්වා දෙන ලදි. ඒ වන විට මෙම අංශය බැංකු නොවන මූල්‍ය ආයතන 58කින් සමන්විත විය. මෙම සැලසුම ක්‍රියාත්මක කිරීමෙන් පසු 2020 වසරේ නොවැම්බර් මස අවසානය වන විට බැංකු නොවන මූල්‍ය ආයතන සංඛ්‍යාව 42ක් දක්වා අඩු විය.

#### ප්‍රාථමික අලෙවිකාර සමාගම් අධීක්ෂණය ශක්තිමත් කිරීම

ප්‍රාථමික අලෙවිකාර සමාගම් සඳහා අදාළ වන නියාමන රාමුව ශක්තිමත් කිරීමේ අරමුණ ඇති ව 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග සහ 2009 අංක 01 දරන ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගවල විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 ජූනි 03 වන දින සිට ප්‍රාථමික අලෙවිකාර සමාගම් අධීක්ෂණය, පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි.

#### බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් අධීක්ෂණය

එයට අමතර ව 2018 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් අධීක්ෂණය ද ආරම්භ කරන ලදි.

#### බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ දෙවන වැඩසටහන

ශ්‍රී ලංකා මහ බැංකුව ශක්තිමත් සහ වඩාත් ස්ථාවර බැංකු නොවන මූල්‍ය ආයතන අංශයක් ගොඩ නගා ගැනීමේ අරමුණ ඇති ව 2020 වසරේ දී බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා වන වැඩපිළිවෙළ (ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ) නමින් දෙවන ඒකාබද්ධ කිරීමේ වැඩසටහන හඳුන්වා දෙන ලදි. මෙම වැඩසටහන අදියර දෙකකින් සමන්විත වේ. ඒකාබද්ධකරණ වැඩපිළිවෙළෙහි පළමු අදියරේ දී ප්‍රාග්ධන හිඟයන් පැවති මුදල් සමාගම්, එක ම කණ්ඩායම තුළ ක්‍රියාත්මක වන මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ඒකාබද්ධ කිරීම කෙරෙහි මෙහිදී අවධානය යොමු කරන ලදි. එහි පළමු අදියර අවසන් කිරීමත් සමඟ, 2025 වසර අවසානය වන විට මුදල් සමාගම් සංඛ්‍යාව 32 දක්වා පහත වැටුණි. ක්‍රියාත්මක කිරීමේ කාල පරාසය 2025 වසරේ සිට 2028 වසර දක්වා වන ඒකාබද්ධකරණ වැඩපිළිවෙළෙහි දෙවන අදියර සඳහා වන සංශෝධිත රාමුව දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

#### ආංශික ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම

පසුගිය ආර්ථික අර්බුද සහ ආයතනික බිඳවැටීම්වලින් උගත් පාඩම් මත පදනම් ව ආංශික ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කරමින් බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ආයතනික යහපාලනය, ප්‍රාග්ධන අවශ්‍යතා සහ අවදානම් කළමනාකරණ රාමු ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමන උපදෙස් සහ මාර්ගෝපදේශ හඳුන්වා දෙන ලදි. මෙම පියවර මඟින් අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණ,

පාලන ක්‍රියාමාර්ග සහ අභ්‍යන්තර පාලනවල ඇති අඩුපාඩු ඇතුළු පීඩනය සහිත කාලවල දී නිරීක්ෂණය වූ ප්‍රධාන දුර්වලතා සඳහා විසඳුම් ලබා දිය හැකි වූ අතර ප්‍රධාන වගකිවයුතු පුද්ගලයන්ගේ වගවීම සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා එම පුද්ගලයන්ගේ යෝග්‍යතාව තක්සේරු කිරීමේ අවශ්‍යතාවන් ද ශක්තිමත් කරන ලදි. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ අවදානම්වලට හා කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා මූලික ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව, ණය, ද්‍රවශීලතාව සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය සඳහා වන වැඩිදියුණු කළ නියාමන රාමු නිර්මාණය කෙරුණි.

2025 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් නියාමනය වන මුදල් සමාගම් 32ක්, විශේෂිත කල්බදු සමාගම් 1ක්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් 4ක් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 5 කින් බැංකු නොවන මූල්‍ය ආයතන අංශය සමන්විත විය.

### අනවසර තැන්පතු ලබාගැනීම් සහ අනවසර මුදල් ව්‍යාපාර ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම

අනවසර තැන්පතු ලබාගැනීම් සහ මුදල් ව්‍යාපාර ක්‍රියාකාරකම් අනාවරණය කර ගැනීම, වැළැක්වීම සහ ඒවැනි ක්‍රියාකාරකම්වලට එරෙහිව බලාත්මක පියවර ගැනීම තුළින් මහජනතාවගේ සුරක්ෂිතතාව ශ්‍රී ලංකා මහ බැංකුව අනවසර තැන්පතු ලබා ගැනීම සහ මුදල් ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ විමර්ශන කටයුතු අඛණ්ඩ ව සිදු කළේ ය.

### අස්ථාවරත්වයෙන් ස්ථායීතාව

ශ්‍රී ලංකාවේ බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ පරිණාමය මඟින් සමෘද්ධිය සඳහා පූර්ව අවශ්‍යතාවක් ලෙස ස්ථායීතාව වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසර ප්‍රයත්නය පැහැදිලි ව පෙන්නුම් කරයි. මුල් අවධියේ නියාමනයක් නොමැති ණය සපයන්නන්ගෙන් සමන්විත වූ මෙම අංශය මනාව නියාමනය කළ සහ මූල්‍ය පද්ධතියේ වැදගත් ස්ථරයක් බවට ක්‍රමයෙන් පරිවර්තනය වී ඇත. අනුප්‍රාප්තික ව්‍යවස්ථාපිත ප්‍රතිසංස්කරණ මඟින් අධීක්ෂණ හැකියාව, වැඩි දියුණු කළ පාලනය සහ අවදානම් කළමනාකරණ ප්‍රමිතීන් සහ කාලෝචිත නියාමන මැදිහත්වීම ශක්තිමත් කළ අතර ඒකාබද්ධකරණයට මුලපිරීම් මඟින් ව්‍යුහාත්මක අවදානම් අවම කරමින් සමස්ත ක්ෂේත්‍රයේ ම ශක්තිමත්භාවය වැඩිදියුණු කර ඇත.

"සෞභාග්‍ය සඳහා ස්ථායීතාව" යන තේමාව යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය 75 වන සංවත්සරය සමරන අවස්ථාව වන විට නියාමන ඉදිරි දැක්ම, ආයතනික ශක්තිමත්භාවය සහ පූර්වෝපායික අධීක්ෂණය තුළින් තිරසර මූල්‍ය ස්ථාවරතාවට දායක වන්නේ කෙසේ ද යන්න පැහැදිලි කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අංශය කදිම සාක්ෂියකි. ඉදිරියේ දී ද අඛණ්ඩ නියාමන ප්‍රතිචාර දැක්වීම, අවදානම් පාදක වූ අධීක්ෂණය සහ ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මඟින් මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ආරක්ෂා කරමින් ආර්ථික සංවර්ධනය, මූල්‍ය තීව්‍රතාව සහ ජාතික සෞභාග්‍ය සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන ඵලදායී ලෙස දායක වන බව සහතික කරනු ඇත.

**නියාමන දූරදර්ශිතාව සහ ආයතනික ශක්තිමත්කරණය තුළින් පද්ධතිමය ස්ථාවරත්වය වැඩි දියුණු වන ආකාරය මනාව පිළිබිඹු කරමින් බැංකු නොවන මූල්‍ය ආයතන අංශය මනා නියාමනයක් සහිත අංශයක් දක්වා මේ වන විට වර්ධනය වී ඇත.**

# මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය සාක්ෂරතාව

මනා ලෙස අර්ථ දක්වන ලද සහ ශක්තිමත් පාලන රාමුවක් තුළ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සමීප සහයෝගීතාවයෙන් ඵලදායී ලෙස, කාලෝචිත ව සහ නිසි සම්බන්ධීකරණයෙන් යුතුව **ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපායමාර්ගය** (NFIS) ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහසුකම් සලසන ලදි. මහ බැංකුව තුළ පිහිටුවා ඇති මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගික ලේකම් කාර්යාලය (NFIS Secretariat) මඟින් උපායමාර්ගික අරමුණු සමඟ අනුකූල බව සහ වගවීම සහතික කරමින් මෙම උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමට අදාළ කාර්තුමය ප්‍රගතිය විධිමත් ව නිරීක්ෂණය සහ ඇගයීම සිදු කරන ලදි.

"මූල්‍ය සාක්ෂරතාව සහ අනුරූපී හැකියා සංවර්ධනය" (Financial Literacy and Capacity Building) මෙම උපායමාර්ගයෙහි මූලික අංශයක් වේ. ඒ අනුව 2024 වසර මැද භාගයේ දී ශ්‍රී ලාංකේය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය එළි දක්වන ලද අතර මෙහි අරමුණ සියලුම ජන කොටස්වල මූල්‍ය හැකියාව වැඩිදියුණු කිරීම සඳහා පුළුල්, ව්‍යූහගත සහ ජාතික වශයෙන් සම්බන්ධීකරණය කරන ලද රාමුවක් ස්ථාපිත කිරීමයි. ඉලක්කගත මැදිහත්වීම් සහ එකිනෙක හා සම්බන්ධීකරණය කරන ලද පාර්ශ්වකරුවන්ගේ මූලික වැඩසටහන් ක්‍රමානුකූල ව අදියරෙන් අදියර ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ගික මඟ පෙන්වීමක් ලබා දෙමින් මෙම මාර්ගෝපදේශයේ ක්‍රියාකාරී සැලැස්ම වර්තමානයේ ක්‍රියාත්මක වෙමින් පවතී.

### මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය යටතේ සිදු කරන මූලික මූල්‍ය සාක්ෂරතා මුලපිරීම්

කැලණිය විශ්වවිද්‍යාලයේ තාක්ෂණික සහාය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය සහාය ඇති ව, මූල්‍ය සාක්ෂරතා විෂය මාලාවක් මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය යටතේ සාර්ථක ව පිළියෙල කර 2025 ජූලි 03 වන දින නිල වශයෙන් එළි දක්වන ලදි. පුළුල්, සාධාරණ සහ සියල්ලන් ඇතුළත් ප්‍රවේශයක් සහතික කිරීමට මෙන් ම විවිධ සමාජ-ආර්ථික පසුබිම්වල සිටින පුද්ගලයින් ව වගකිව යුතු මූල්‍ය තීරණ ගැනීම සඳහා සවි බලගැන්වීම පිණිස මෙම විෂය මාලාව ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ ජාතික භාෂා තුනෙන් ම එළි දක්වා තිබේ.

### මූල්‍ය සාක්ෂරතා වීඩියෝ මාලාව







මූල්‍ය සාක්ෂරතා විෂය මාලාවට අනුකූල ව ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) මූල්‍ය සහාය ඇති ව මූල්‍ය සාක්ෂරතා තේමාවන් යටතේ මූල්‍ය සාක්ෂරතා වීඩියෝ මාලා දෙකක් නිර්මාණය කරන ලදි. මහජනතාවට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකර්ෂණීය ඩිජිටල් මාධ්‍යයන් හරහා මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයේ ප්‍රධාන ඉගෙනුම් ප්‍රතිඵල ළඟා කර ගැනීම තවදුරටත් තහවුරු කිරීම මෙහි මූලික අරමුණ වේ.

පවතින මූල්‍ය අවදානම් සහ හැසිරීම් හා සම්බන්ධ අභියෝග පිළිබඳ ව දැනුම්වත් කිරීම තුළින් පොදු ජනතාව අතර ඇති මූල්‍ය සාක්ෂරතා පරතරය අවම කිරීම සඳහා මෙම වීඩියෝ මාලාව නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම අවිධිමත් ණය ගැනීම්, නොසැලකිලිමත් වියදම් රටා, විචක්ෂණශීලි නොවන මූල්‍ය සැලසුම්කරණය, අනවසර තැන්පතු භාර ගැනීම් සහ පිරමීඩ යෝජනා ක්‍රම හා සම්බන්ධ අවදානම් වැනි ගැටලු පිළිබඳ ව මෙම වීඩියෝ මාලාවේ දී අවධානය යොමු කර ඇත. තොරතුරු මත පදනම් ව තීරණ ගැනීම සහ වගකිව යුතු මූල්‍ය හැසිරීම ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණයි.

### මූල්‍ය සාක්ෂරතා මාසය

මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහයෝගයෙන් රට පුරා මූල්‍ය දැනුම්වත්භාවය සහ සවිබලගැන්වීම වැඩිදියුණු කිරීම සඳහා "2025 මූල්‍ය සාක්ෂරතා මාසය" වෙනුවෙන් 2025 සැප්තැම්බර් 10 දින සාර්ථක ව මුල පුරන ලදි. ඒ අනුව, 2025 සැප්තැම්බර් මාසයේ දී "Fin Lit Expo -2025" යන තේමාව යටතේ මාතලේ, කිලිනොච්චිය, අනුරාධපුරය, බදුල්ල, ත්‍රිකුණාමලය සහ ගාල්ල යන නගරවල ප්‍රාදේශීය මූල්‍ය සාක්ෂරතා දින වැඩසටහන් පවත්වන ලද අතර ඒ සඳහා 30,000කට අධික පිරිසක් සහභාගී විය.

### ණය උපදේශන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා බැංකු සංගමයේ (SLBA) සහයෝගය සහිත ව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ණය උපදේශන මධ්‍යස්ථානය, එහි ප්‍රතිසංස්කරණයෙන් පසු සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර එම මධ්‍යස්ථානය 2023 අංක 16 දරන මහ බැංකු පනතට අනුකූල ව මූල්‍ය සාක්ෂරතාව, මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා දායක වේ. ණය උපදේශන මධ්‍යස්ථානය විසින් විශේෂයෙන් ණය සීමාවන් හෝ මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන පුද්ගලයින්ට සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ඉලක්කගත මූල්‍ය උපදේශන සහ ණය විසඳීමේ සහාය ලබා දෙන අතර ම මූල්‍ය සැලසුම්කරණය, ණය කළමනාකරණය සහ මූල්‍ය ප්‍රවේශය පිළිබඳ මාර්ගෝපදේශ ද ලබා දේ. මෙහි දී ණය ලබා ගැනීමේ සීමාවන්ට හෝ මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා විශේෂ අවධානයක් දෙනු ලැබේ.

2025 වසරේ දී ණය උපදේශන මධ්‍යස්ථානය විසින් මූලිකව ම අක්‍රීය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් සිදු කරන ලද විමසීම් 1,257කින් ආසන්න වශයෙන් 75%ක් මැදිහත් වීම, පොලී ආරවුල් විසඳීම සහ ණය ප්‍රතිව්‍යූහගත කිරීම සඳහා මග පෙන්වීම හරහා සාර්ථක ව විසඳා ඇත. ඉදිරියේ දී ණය උපදේශන මධ්‍යස්ථානයේ සේවාවන් පුහුණු ණය උපදේශකයින් යෙදවීම හරහා ප්‍රාදේශීය මට්ටම කරා ගෙන යාමටත් එම වැඩි දියුණු වූ ප්‍රවේශය හරහා පුද්ගලයන්ට සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට මූල්‍ය මාර්ගෝපදේශ කෙරෙහි පුළුල් හා කාලෝචිත ප්‍රවේශයක් ලබා ගැනීමටත් හැකි වනු ඇත.

### මූල්‍ය සාක්ෂරතාව සහ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ දී ප්‍රාදේශීය කාර්යාලවල කාර්යභාරය

2025 වසරේ දී මූල්‍ය සවිබලගැන්වීම් වෙනුවෙන් වන ශ්‍රී ලංකා මහ බැංකුවේ කැපවීම තවදුරටත් තහවුරු කරමින් ප්‍රාදේශීය කාර්යාල මඟින් දිවයින පුරා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් 635කට අධික සංඛ්‍යාවක් පවත්වන ලද අතර ආසන්න වශයෙන් පුද්ගලයින් 70,000ක් පමණ ඒ සඳහා සහභාගී වූහ.

### ප්‍රාදේශීය සැසි

2025 වසර තුළ දී ප්‍රාදේශීය මට්ටමින් මූල්‍ය සාක්ෂරතාව සහ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුවේ උපායමාර්ගික කැපවීම විදහා දක්වමින් ප්‍රාදේශීය සැසි තුනක් පවත්වන ලදි. එමඟින් මහ බැංකුවේ ආයතනික පැවැත්ම දිවයින පුරා ම තවදුරටත් ශක්තිමත් විය. මෙම සැසි මාතර, නුවරඑළිය සහ මාතලේ යන ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගීතාවෙන් හම්බන්තොට, නුවරඑළිය සහ මාතලේ යන නගරවල සාර්ථක ව පවත්වන ලදි.

සියලුම සැසි සඳහා අධිපතිතුමා ඇතුළු මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ද ප්‍රධාන රාජ්‍ය ආයතන, බලපත්‍රලාභී බැංකු, පොලීසිය, සන්නද්ධ හමුදාවල ජ්‍යෙෂ්ඨ නියෝජිතයින් සහ ප්‍රමුඛ ප්‍රාදේශීය ව්‍යවසායකයින් ද සහභාගී වූහ.

### මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි දෙවන අදියර

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි පළමු අදියර සාර්ථක ව අවසන් වීමෙන් අනතුරු ව එහි දෙවන අදියර පිළියෙළ කිරීමට සහාය වීම සඳහා මූලික වැඩසටහන් මාලාවක් ආරම්භ කරන ලදි. මෙම සන්දර්භය තුළ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන අන්තර් ජාතික සන්ධානයේ (Alliance Financial Inclusion - AFI) “In-Country Implementation” (ICI) වැඩසටහන යටතේ තාක්ෂණික සහ මූල්‍ය සහාය ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකිවිය.

මේ යටතේ පහත ක්‍රියාකාරකම් සඳහා සහාය දක්වනු ඇත;

(i) ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපායමාර්ගයෙහි පළමු අදියර පිළිබඳ ව ව්‍යාපෘති ඇගයීම

(ii) දිවයින ම ආවරණය වන පරිදි මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සමීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම, සහ

(iii) මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි දෙවන අදියර (NFIS Phase II) දත්ත මත පදනම් ව සැලසුම් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය විශේෂිත තාක්ෂණික සහාය ලබා දීම.

**ශ්‍රී ලංකා මහ බැංකුව සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන අන්තර් ජාතික සන්ධානය (AFI) ක්‍රියාත්මක කරන "In-Country Implementation" (ICI) වැඩසටහන**

රූප සටහන - 10




ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිකාරී බලය සහ ක්‍රියාකාරී වගකීම් වඩාත් නිවැරදිව පිළිබිඹු කිරීමේ අරමුණින් ද සෙසු ගෝලීය මහ බැංකු අනුගමනය කරන පිළිගත් ජාත්‍යන්තර පරිචයන්ට අනුකූල වීම සඳහා ද මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (RDD) 2026 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි “මූල්‍ය සමාවේශන දෙපාර්තමේන්තුව” (DFI) ලෙස නිල වශයෙන් නම් කරන ලදි.

# මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය

**මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය**

රූප සටහන - 11

**ඔබගේ මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම**




2025 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි මාලාව ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කළ අතර එහි දී අධීක්ෂණ කටයුතු, පැමිණිලි නිරාකරණය කිරීම, විමර්ශන සහ මහජන සම්බන්ධතා යන අංශයන් සඳහා ප්‍රමුඛතාව දෙන ලදි. ඒ අනුව වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය ශක්තිමත් කිරීම, මූල්‍ය පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම, තහනම් යෝජනා ක්‍රම පිළිබඳ විමර්ශනය සහ ඉලක්කගත වැඩසටහන් හරහා පාරිභෝගික දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා වන මෙහෙයුම් ප්‍රයත්නයන් මෙම වසර තුළ දියත් කෙරිණි.

## වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ අවශ්‍යතාවන් සඳහා වන අනුකූලතාව ඇගයීම පිණිස මහ බැංකුව විසින් 2025 වසර තුළ දී පූර්ණ පරිමාණයේ වෙළෙඳපොළ හැසිරීම් පරීක්ෂණ හතරක් සහ තේමාත්මක විමර්ශන තුනක් සිදුකරන ලදි. මෙම අධීක්ෂණයන්හි දී බාලවයස්කාර ගිණුම්, ඩිජිටල් මූල්‍ය නිෂ්පාදන සහ ණය කාඩ්පත් මෙහෙයුම් යන අංශ ආවරණය කිරීමට හැකිවිය. එහි දී මෙහෙයුම් ක්‍රියාවලිය තුළ පවතින හිඩැස්, තොරතුරු හෙළිදරව් කිරීමේ දුර්වලතා, පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රියාවලියේ අකාර්යක්ෂමතා සහ චර්යා ආශ්‍රිත අවදානම් වැනි ගැටලු හඳුනා ගැනීමට අධීක්ෂකවරුන්ට හැකි විය. එකී ගැටලු විසඳීම සඳහා නිශ්චිත අධීක්ෂණ උපදෙස් සහ පසු විපරම් ක්‍රියාමාර්ග අදාළ ආයතන වෙත දැනුම් දෙන ලදි.

## මූල්‍ය පාරිභෝගික පැමිණිලි හැසිරවීම

මූල්‍ය පාරිභෝගික පැමිණිලි හැසිරවීම සහ නිරාකරණය ශක්තිමත් කිරීම සඳහා 2025 වර්ෂයේ දී මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීම සිදු කරන ලදි. අදාළ වසර තුළ දී මහ බැංකුව වෙත පැමිණිලි 5,610ක් ලැබී ඇති අතර ඉන් 4,252ක් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ කටයුතුවලට අදාළ විය. මින් පැමිණිලි 2,226ක් 2025 වසර තුළ නිරාකරණය කිරීමට හැකි වූ අතර පැමිණිලි 2,026ක් වසර අග වන විට විමර්ශන

මට්ටමේ පැවතිණි. ඉහත පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රියාවලියේ දී ආයතනික ප්‍රතිචාර තහවුරු කිරීම, මූල්‍ය සේවා සපයන්නන්ගෙන් පැහැදිලි කිරීම් ලබා ගැනීම, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැලසීම සහ සහන සැලසීමේ වගකීම් සඳහා අනුකූලතාව සහතික කිරීම කෙරෙහි අවධානය යොමු විය. මෙලෙස පැමිණිලි සංඛ්‍යාව ඉහළ යාමෙන් මහජන දැනුම්වත්භාවය වර්ධනය වීම සහ මහ බැංකුවේ පැමිණිලි නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයන් භාවිතය කෙරෙහි පවතින පාරිභෝගික විශ්වාසය පිළිබිඹු වේ.

### මහජන දැනුම්වත්භාවය සහ මූල්‍ය සාක්ෂරතාව

ඉලක්කගත දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා මූල්‍ය අවදානම් පිළිබඳ මහජන අවබෝධය වැඩි දියුණු කිරීමට පියවර ගන්නා ලදි. පාසල්, පරිපාලන කොට්ඨාස සහ ආරක්ෂක අංශ කේන්ද්‍ර කරගනිමින් ජාතික මට්ටමේ පිරමිඩ යෝජනා ක්‍රමවලට එරෙහිව දැනුම්වත් කිරීමේ සතියක් ක්‍රියාත්මක කළ අතර ඒ යටතේ දැනුම්වත් කිරීමේ සැසි සහ දැනුම්වත් කිරීමේ මෙවලම් බෙදා හැරීම සිදු කළේය. මීට අමතරව මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම, පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ දැනුම්වත් කිරීම සහ වංචනික මූල්‍ය යෝජනා ක්‍රම හඳුනා ගැනීම සඳහා මහජනතාවට ඇති හැකියාව ශක්තිමත් කිරීම පිණිස වසර තුළ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 43ක් පවත්වන ලදි.

### ආයතනික සංවර්ධනය සහ ජාත්‍යන්තර සහයෝගීතාව

දැනට පවතින මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාවලිය ආශ්‍රිත මෙහෙයුම් කටයුතු තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය ඇති ව පවතින මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාවලීන් පිළිබඳ සවිස්තරාත්මක ඇගයීමක් සිදු කරන ලදි. මෙහි දී අධීක්ෂණය, පැමිණිලි හැසිරවීම සහ බලාත්මක කිරීමේ ක්‍රියාවලීන්හි පවතින මෙහෙයුම් අඩුපාඩු හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු විය. තව ද මෙම වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ පූර්ණ සාමාජිකත්වය ලබා ගත් අතර එමගින් ප්‍රායෝගික වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණ මෙවලම්, වෙනත් සමාන සාමාජික රටවල අත්දැකීම් මෙන්ම දෛනික වෙළෙඳපොළ කටයුතුවලට අදාළ ව අන්තර්ජාතික සිද්ධි අධ්‍යයනයන් සඳහා ද ප්‍රවේශය ලබා ගැනීමට මෙහෙයුම් කාර්ය මණ්ඩලයට අවස්ථාව හිමි විය.

2025 වසරේ සිදු කරන ලද ඉහත මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය, පැමිණිලි නිරාකරණය කිරීම, තහනම් යෝජනා ක්‍රම විමර්ශනය සහ මහජනතාව සමග සෘජුවේ සම්බන්ධවීමේ හැකියාව යනාදිය සඳහා මහ බැංකුව සතු ධාරිතාව තවදුරටත් ශක්තිමත් විය. මෙම ක්‍රියාමාර්ග මූල්‍ය අංශය තුළ පාරිභෝගික ආරක්ෂණ අවශ්‍යතා වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමටත්, පාරිභෝගික විශ්වාසය ඉහළ නැංවීමටත්, අධීක්ෂණ ප්‍රතිචාර වැඩිදියුණු කිරීමටත් දායක විය.

### 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- අධීක්ෂණය, පැමිණිලි නිරාකරණය, විමර්ශන සහ මහජන සම්බන්ධතා යන අංශයන් කෙරෙහි අවධානය යොමු කරමින් 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි මාලාව ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම.
- බාල වයස්කාර ගිණුම්, ඩිජිටල් මූල්‍ය නිෂ්පාදන සහ ණය කාඩ්පත් මෙහෙයුම් ආවරණය වන පරිදි තේමාත්මක විමර්ශන 3ක් සහ පූර්ණ පරිමාණයේ වෙළෙඳපොළ හැසිරීම් පරීක්ෂණ 4ක් පවත්වා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා මඟපෙන්වීම.
- පාරිභෝගික පැමිණිලි 5,610ක් ලැබුණු අතර ඉන් 4,252ක් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණයට අදාළ විය. ඉන් පැමිණිලි 2,226ක් සාර්ථක ව නිරාකරණය කරන ලද අතර ඉතිරිය වසර අවසන් වනවිට විමර්ශන මට්ටමේ පැවතිණ.
- ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වූ පිරමිඩ යෝජනා ක්‍රමවලට එරෙහි ව දැනුම්වත් කිරීමේ සතියට අමතර ව පාරිභෝගික අයිතිවාසිකම් සහ මූල්‍ය අවදානම් පිළිබඳ ඉලක්කගත මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් 43ක් ක්‍රියාත්මක කිරීම.
- ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව අධීක්ෂණ කටයුතු, පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය සහ බලාත්මක කිරීම යන අංශයන්ගේ ගැටලු හඳුනා ගැනීමට දායක වෙමින් පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාවලීන්හි පවතින මෙහෙයුම් අඩුපාඩු හඳුනා ගැනීම සඳහා සවිස්තරාත්මක ඇගයීමක් සිදු කිරීම.






# මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාල ශක්තිමත් කිරීම

## නිරාකරණ අධිකාරිය

නියාමනයට යටත් මූල්‍ය ආයතන පිළිබඳ මහජන විශ්වාසය පවත්වාගෙන යාම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් හා විශ්වසනීය නිරාකරණ රාමුවක් අත්‍යවශ්‍ය වේ. 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටු කරන අතර බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත ද නිරාකරණ බලතල ව්‍යාප්ත කිරීම, ශ්‍රී ලංකාවේ මූල්‍ය ආරක්ෂණ ජාලය සහ නිරාකරණ රාමුව ශක්තිමත් කිරීමේ වැදගත් සන්ධිස්ථානයකි.

2025 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම කෙරෙහි අඛණ්ඩ ව අවධානය යොමු කළ අතර විශේෂයෙන් නිරාකරණ සැලසුම් සකස් කිරීම, ආයතනික සූදානම සහ අදාළ පාර්ශ්වයන් අතර දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙන ලදි. මෙම කටයුතු ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ ජාත්‍යන්තර යහපත් පරිචයන්ට අනුකූල ව සිදු කරන ලදි.

මෙම වර්ෂය තුළ ආසියානු සංවර්ධන බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද මූල්‍ය අංශයේ ස්ථායීතාව සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන (Financial Sector Stability and Reforms Programme) යටතේ තාක්ෂණික සහාය ලබා ගැනීම මෙන්ම "ඵලදායී නිරාකරණ ක්‍රියාත්මක කිරීම" සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ලබා ගැනීම සිදු කරන ලදි. මෙම තාක්ෂණික සහාය නිරාකරණ සැලසුම් සකස් කිරීමේ ක්‍රමවේද ශක්තිමත් කිරීම, කාර්යමණ්ඩල හැකියාවන් වර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ නිරාකරණ රාමුව ජාත්‍යන්තර ව පිළිගත් ප්‍රමිතීන්ට තවදුරටත් අනුකූල කිරීම සඳහා දායක විය.

අදාළ ආයතන සඳහා ම විශේෂිත නිරාකරණ සැලසුම් සකස් කිරීම 2025 වර්ෂයේ දී ප්‍රධාන ප්‍රමුඛතාවක් විය. ඒ අනුව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ යහපත් පරිචයන්ට අනුකූල ව නිරාකරණ සැලසුම් සකස් කළ අතර සුදුසු නිරාකරණ ක්‍රමෝපායයන් හඳුනා ගැනීම, ක්‍රියාත්මක කිරීමේ සහ මූල්‍යමය ශක්‍යතා ඇගයීම සහ නිරාකරණයට බාධා විය හැකි කරුණු හඳුනා ගැනීම කෙරෙහි ද අවධානය යොමු කරන ලදි. එමඟින් මූල්‍ය පද්ධතියේ විවිධ කොටස්වල නිරාකරණ සූදානම ශක්තිමත් කරන ලදි.

බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ නිරාකරණ ප්‍රේරක සකස් කිරීමෙන් අනතුරු ව 2025 වර්ෂයේ දී බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා ද නිරාකරණ ප්‍රේරක සකස් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලදි. මෙම ප්‍රේරකවල අරමුණ බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිරාකරණ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා නිශ්චිත, පාරදෘශ්‍ය සහ කාලෝචිත පදනමක් සැපයීමයි.

බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 15 වන වගන්තිය අනුව 2024 ඔක්තෝබර් 03 දින ස්ථාපිත කරන ලද මූල්‍ය ස්ථායීතා අරමුදල 2025 වර්ෂයේ දී ද අඛණ්ඩ ව පවත්වා ගෙන යන ලදි. මෙම අරමුදල සඳහා මුදල් අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 1,000ක මූලික මුදලක් වෙන් කර ඇති අතර අයවැය ප්‍රතිපාදන හරහා අරමුදල තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අමතර අරමුදල් සැපයීමට පසුකාලීන ව එකඟ වී ඇත.

2025 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරාකරණ සඳහා වූ ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන්ගේ මණ්ඩලයක් පත් කළ අතර අද්මිනිස්ත්‍රාසිකරුවන්ගේ මණ්ඩලයක් පත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. එමඟින් අවශ්‍ය අවස්ථාවල නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුවේ ක්‍රියාකාරී සූදානම තවදුරටත් ශක්තිමත් කරන ලදි.

බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිරාකරණ රාමුව පිළිබඳ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්, බලපත්‍රලාභී බැංකුවල සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඉලක්ක කර ගනිමින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරන ලදි. එමෙන්ම නිරාකරණ සැලසුම් සම්බන්ධ මාර්ගෝපදේශ සහ දත්ත ආකෘති පිළිබඳ ව බලපත්‍රලාභී බැංකු නිලධාරීන් සඳහා විශේෂ වැඩසටහනක් ද පැවැත්වීය.

## ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය, මූල්‍ය අංශ ආරක්ෂණ ජාලයේ කොටස්කරුවකු ලෙස ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීමට අඛණ්ඩ ව දායකත්වය සැපයූ අතර 2025 වසර තුළ දී එහි මූල්‍ය හා ආයතනික හැකියාව ශක්තිමත් කිරීම සඳහා විවිධ පියවර ගනු ලැබී ය.

සිව් අවුරුදු ව්‍යාපෘතියක් වශයෙන් 2024 වසරේ දී ආරම්භ කරන ලද ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (Financial Sector Safety Net Strengthening Project), 2025 වසර තුළ දී ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සාර්ථක ව ක්‍රියාත්මක කරන ලදි. 2025 වසර අවසානය වන විට වසර සඳහා ඉලක්ක කරන ලද කාර්යසාධනය මත පදනම් වූ කොන්දේසි සම්පූර්ණ කිරීමත් සමඟ ව්‍යාපෘතිය යටතේ ලැබුණු මුළු ණය මුදල එක්සත් ජනපද ඩොලර් මිලියන 130 දක්වා ඉහළ ගියේය.

තව ද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබද ව මහජනතාව දැනුම්වත් කිරීමේ දිගුකාලීන උපායමාර්ගයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ වත්මන් මහජන දැනුම්වත්භාවයේ මට්ටම මැන බැලීම සඳහා දීපව්‍යාප්ත සමීක්ෂණයක් 2025 වසරේ දී සිදු කරන ලදි.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ මහජන දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ප්‍රදර්ශනය කිරීම හා තැන්පතු රක්ෂණාවරණය ලබා ගැනීමට ඇති හැකියාව" පිළිබඳ විධානයන් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 දෙසැම්බර් 15 වන දින නිකුත් කරන ලදි.

තව ද මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ තැන්පතු රක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (International Association of Deposit Insurers) විසින් නිකුත් කරන ලද කාර්යක්ෂම තැන්පතු රක්ෂණ පද්ධතියක් සඳහා වූ මූලධර්ම (Core principles for effective Deposit Insurance Systems) හා අනුකූල වන පරිදි ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට පියවර ගන්නා ලදි. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා අවදානම මත පදනම් වූ වාරික ක්‍රමවේදයක් සහ ඉලක්කගත අරමුදල් ආකෘතියක් පිළියෙල කිරීම, නිරාකරණ ක්‍රියාමාර්ගයක් ලෙස සාමාජික ආයතනයක වත්කම් හා බැරකම් පැවරීම සඳහා මූල්‍ය සහාය ලබා දීම පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම, 2025 වසරේ දී ආරම්භ කරන ලද එවැනි ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වේ.

තව ද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ගෙවීම් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් දැනට පවත්නා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කොට අංගසම්පූර්ණ ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතියක් (Management Information System) ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතුවල ද ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විට නිරතව සිටී.

2025 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් සම්බන්ධ කටයුතු අඛණ්ඩ ව සිදු කළ අතර අදාළ පාර්ශ්වකරුවන්ට අවශ්‍ය තොරතුරු ලබා දීම ද සිදු කරන ලදි. එමෙන්ම අර්බුදකාරී අවස්ථාවල දී මහා පරිමාණ වශයෙන් හෝ ආයතන කිහිපයක තැන්පත්කරුවන්ට එකවර වන්දි ගෙවීම් සිදු කළ යුතු අවස්ථා කළමනාකරණය කිරීමෙහි ලා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීමේ අරමුණින්, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ කාර්යසාධනය පදනම් කරගත් කොන්දේසියක් ලෙස අනපේක්ෂිත හෝ අර්බුදකාරී අවස්ථාවන්ට මුහුණ දීම සඳහා සූදානම් වීමේ සැලැස්මක් සකස් කරන ලදි. තව ද වන්දි ගෙවීමේ දී තනි නියෝජිත බැංකුවක් මත විශාල වශයෙන් රඳා පැවතීම අවම කිරීම සහ වන්දි ගෙවීම් ඵලදායී ලෙස සිදු කිරීම සහතික කිරීම සඳහා, පුළුල් ශාඛා ජාලයක් සහ ප්‍රමාණවත් සම්පත් සහිත බලපත්‍රලාභී බැංකුවලින් සමන්විත නියෝජිත බැංකු සංචිතයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික පියවර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබිය.

එමෙන් ම ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ පරිපාලන සහ කළමනාකරණ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩ ව සිදු කළ අතර බැංකු (විශේෂ විධිවිධාන) පනතට අනුකූල වන පරිදි ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නියමිත කාලසීමාව තුළ දී ඉදිරිපත් කරන ලදි.

### තහනම් යෝජනා ක්‍රමවලට අදාළ විමර්ශන කටයුතු

2025 වසර තුළ දී තහනම් සහ වංචනික යෝජනා ක්‍රම පිළිබඳ විමර්ශන 02 අවසන් කිරීමට හැකි වූ අතර ඒ අනුව මේ දක්වා නිර්ණය කරනු ලැබූ මුළු තහනම් යෝජනා ක්‍රම සංඛ්‍යාව 23 දක්වා ඉහළ ගියේය. මෙම වසර අවසාන වන විට විමර්ශන 02 ක්‍රියාත්මක වෙමින් පැවති අතර කරුණු සෙවීමේ මූලික විමර්ශන 21 සම්පූර්ණ කිරීමට හැකි විය.

මෙම විමර්ශන කටයුතු යටතේ තොරතුරු රැස් කිරීම, මූල්‍ය ප්‍රවාහයන් තහවුරු කිරීම, අදාළ අධිකාරීන් සමඟ සම්බන්ධීකරණය සහ නිර්ණයන් ප්‍රකාශයට පත් කිරීම යනාදිය සිදු කරන ලදි. මෙම ක්‍රියාමාර්ග කාලෝචිත මැදිහත්වීම් සිදු කිරීමටත් අවදානම් අවම කිරීමටත් දායක විය.

### ආයතන නීති විරෝධී ලෙස තැන්පතු භාර නොගන්නා බවත් නිසි අනුමැතියකින් තොරව මුදල් ව්‍යාපාර නොකරන බවත් තහවුරු කිරීම

අනවසර තැන්පතු ලබා ගැනීම් සහ මුදල් ව්‍යාපාර පවත්වාගෙන යෑම සම්බන්ධව ලැබුණු පැමිණිලි සහ තොරතුරු මත පදනම් ව 2025 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් ව්‍යාපාර පනතේ 42 වන වගන්තිය ප්‍රකාර ව විමර්ශන 119ක් මෙහෙයවන ලදි.

මෙම විමර්ශනවල අරමුණ වූයේ මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ආයතන හෝ පුද්ගලයින් මුදල් ව්‍යාපාරවල නියැලී සිටින්නේ හෝ තැන්පතු භාර ගන්නේ ද යන්න නිර්ණය කිරීමයි. 2025 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විමර්ශනයට ලක් ව ඇති ආයතන සහ පුද්ගලයින්ගේ වත්කම් අන්සතු කිරීම වැළැක්වීම සඳහා මුදල් ව්‍යාපාර පනතේ 44 වන වගන්තිය යටතේ අත්හිටුවීමේ නියෝග සඳහා කොළඹ මහාධිකරණයෙන් දීර්ඝ කිරීම් 23ක් ලබා ගෙන ඇත. තව ද මුදල් ව්‍යාපාර පනතේ 45(3) වගන්තිය යටතේ පුද්ගලයින් තිදෙනෙකුගේ විදේශ ගමන් තහනම් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණවල නියෝග ලබා ගැනීමට කටයුතු කරන ලදි.

මුදල් ව්‍යාපාර පනතේ විධිවිධානවලට පටහැනි ව මුදල් ව්‍යාපාර පවත්වාගෙන ගිය/පවත්වාගෙන යනු ලබන හෝ තැන්පතු භාරගත්/තැන්පතු භාරගනු ලබන ආයතන/පුද්ගලයින් පිළිබඳ තීරණ සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා මුදල් ව්‍යාපාර පනතේ 42(10) වගන්තිය ප්‍රකාර ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දෛනික සහ සති අන්ත පුවත්පත්වල සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂාවලින් නිවේදන පළ කරන ලදි.

# ගෙවීම් සහ පියවීම්

ශ්‍රී ලංකාවේ ජාතික ගෙවීම් පද්ධතිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන අතර එය විශාල වටිනාකම් සහිත ගෙවීම් පද්ධතියකින්, සුළු පරිමාණ ගෙවීම් පද්ධතිවලින් සහ බලපත්‍රලාභී සේවා සපයන්නන් විසින් සපයනු ලබන ගෙවීම් සේවාවලින් සමන්විත වේ. විශාල වටිනාකම් සහිත ගෙවීම් පද්ධතිය යනු මහ බැංකුව යටතේ ක්‍රියාත්මක වන තත්කාලීන දළ පියවීම් (RTGS) පද්ධතිය යි. සුළු පරිමාණ ගෙවීම් පද්ධතිවලට ප්‍රධාන වශයෙන් ජාතික ගෙවීම් ජාලයේ ක්‍රියාකරු වන ලංකාපේ (පෞද්ගලික) සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන වේගවත් ගෙවීම් පද්ධති සහ සමූහ වශයෙන් සිදු කරන ගෙවීම් සඳහා වන පද්ධති, විදුලි සංදේශ සේවා සපයන්නන් විසින් ක්‍රියාත්මක කරනු ලබන විද්‍යුත් මුදල් පද්ධති සහ ජාත්‍යන්තර කාඩ්පත් යෝජනා ක්‍රම විසින් ක්‍රියාත්මක කරන ගෙවීම් කාඩ්පත් ජාල ඇතුළත් වේ. තත්කාලීන දළ පියවීම් පද්ධතිය, ඉහළ වටිනාකමක් ඇති අන්තර් බැංකු ගෙවීම් සඳහා සහාය දක්වන අතර සුළු පරිමාණ ගෙවීම් පද්ධති තනි පුද්ගලයන්, ව්‍යාපාර සහ රජයේ ආයතන සඳහා ප්‍රවේශ්‍යතාව, පහසුව සහ ආරක්ෂාව වැඩි දියුණු කරමින් ක්ෂණික ගෙවීම් සඳහා සහාය වේ.

**ශ්‍රී ලංකාවේ ජාතික ගෙවීම් පද්ධතිය** රූප සටහන - 12




## ගෙවීම් පද්ධතියේ නියාමනය, අවේක්ෂණය සහ අධීක්ෂණය

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත මගින් අර්ථ දක්වා ඇති පරිදි නියාමන රාමුවක් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හරහා ශ්‍රී ලංකා මහ බැංකුව මෙරට ගෙවීම් ක්ෂේත්‍රයේ සංවර්ධනය මෙහෙයවමින් එය හැඩගස්වනු ලබයි. මෙරට ක්‍රියාත්මක වන ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කිරීමටත් ඒ ආශ්‍රිත අවදානම් හඳුනාගෙන ඒවා අවම කිරීමටත් ගෙවීම් පද්ධති අවේක්ෂණය කිරීම සඳහාත් මහ බැංකුවට බලය පැවරී ඇත. මහ බැංකුව විසින් ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නන්, මූල්‍ය අත්පත්කරුවන් සහ විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් ඇතුළත් බලපත්‍රලාභී සේවා සපයන්නන් විසින් සපයනු ලබන ගෙවීම් සේවා සඳහා බලපත්‍ර ලබා දීම සහ අධීක්ෂණය කිරීම සිදු කරයි. මහ බැංකුව විසින් නවෝත්පාදන මෙන්ම ක්ෂේත්‍රයේ සංවර්ධනය ද දිරිමත් කරන අතර ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා අවදානම් මත පදනම් වූ නියාමන ක්‍රමවේද අනුගමනය කරයි. ජංගම ගෙවීම් යෙදවුම් සහ ගෙවීම් කාඩ්පත් මගින් සිදු කෙරෙන විද්‍යුත් වාණිජ ගනුදෙනු සඳහා නිකුත් කරන ලද විධිවිධාන මගින් මූල්‍ය තාක්ෂණික සේවා සඳහා වන අවශ්‍යතා විශේෂයෙන් සැලකිල්ලට ගනිමින් පහසුකම් සලසා ඇත. ණය කාඩ්පත් මාර්ගෝපදේශ මගින් පාරිභෝගික ආරක්ෂාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ණය කාඩ්පත් නිකුත් කරන්නන්ට අදාළ වන කරුණු දක්වා ඇත.

මූල්‍ය අංශය තුළ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව 2020 වසරේ දී නියාමන පරීක්ෂණ අවකාශය හඳුන්වා දුන් අතර එමගින් මහ බැංකු නියෝග, චක්‍රලේඛ, මාර්ගෝපදේශ සහ රීතිවල තාවකාලික ලිහිල් කිරීම් සහිත ව පාර්ලිමේන්තු පනත් සහ ඒ යටතේ පනවා ඇති රෙගුලාසිවලට සම්පූර්ණ වශයෙන් අනුකූල වෙමින් නව්‍ය මූල්‍ය තාක්ෂණික නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා පාලිත සජීවී පරිසරයක් නිර්මාණය කර දී ඇත.

## විශාල වටිනාකම් සහිත ගෙවීම් පද්ධතියේ (තත්කාලීන දළ පියවීම් පද්ධතියේ) මෙහෙයුම්

මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන පද්ධතිමය වශයෙන් වැදගත් ගෙවීම් පද්ධතියක් වන තත්කාලීන දළ පියවීම් පද්ධතිය යනු සහභාගී වන ආයතන අතර විශාල වටිනාකම් සහිත ගෙවීම් ආරක්ෂිත ව සහ අවලංගු කළ නොහැකි ආකාරයෙන් එසැණින් පියවීම පහසු කරන ගෙවීම් පද්ධතියකි. ඒ අනුව තත්කාලීන දළ පියවීම් පද්ධතියේ බිඳ වැටීමක් සිදු වුවහොත් තීරණාත්මක මෙහෙයුම් අඩාල විය හැකි අතර එය මූල්‍ය පද්ධතියේ සහ සමස්ත සාර්ව ආර්ථිකයේ ස්ථාවරත්වයට තර්ජනයක් විය හැකි ය. මහ බැංකුව විසින් ISO 20022 ප්‍රමිතියට අනුකූල වෙමින් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ අවදානම් කළමනාකරණය ඉහළ නංවමින් තත්කාලීන දළ පියවීම් පද්ධතිය LankaRTGS නම් වූ නව පද්ධතියක් සමග යාවත්කාලීන කරන ලදි.

තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගීකරුවන් ලෙස මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක්, එක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්, බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන් 7ක්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් වෙළෙඳපොළේ මධ්‍යම තැන්පතු පද්ධතිය කටයුතු කරයි.

අන්තර් බැංකු ඒක්ෂණ මුදල් ගනුදෙනු, රජයේ සුරැකුම්පත් ගනුදෙනු, විවට වෙළෙඳපොළ කටයුතු, විදේශ විනිමය ගනුදෙනුවල දේශීය කටයුතු, නිෂ්කාශන ආයතනය හරහා සිදුවන සුළු පරිමාණ ගනුදෙනුවල ශුද්ධ පියවීම්, සහභාගීකරුවන් අතර සිදු වන අනෙකුත් අරමුදල් හුවමාරු සහ පාරිභෝගිකයින් විසින් සිදු කරන ගනුදෙනු ඇතුළු විවිධ වර්ගයේ ගනුදෙනු පියවීමට තත්කාලීන දළ පියවීම් පද්ධතිය උපකාරී වේ. ගනුදෙනු පියවීම් බාධාවකින් තොර ව සිදු කිරීම සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ඇප සුරැකුම් ලෙස ලබා ගනිමින් තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගීකරුවන් වෙත දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් සපයනු ලබයි.

ප්‍රස්ථාර සටහන - 02

**2025 දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ පියවන ලද ගනුදෙනු වර්ග සහ වටිනාකම (රු. බිලියන)**




2025 වසරේ දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා වටිනාකම රුපියල් ට්‍රිලියන 430කට ආසන්න ගනුදෙනු 597,859ක් සිදු කරන ලදි.

## සුළු පරිමාණ ගෙවීම් පද්ධතිවල මෙහෙයුම්

රටෙහි සුළු පරිමාණ ගෙවීම් පද්ධතිවල ආරක්ෂිත, විශ්වාසදායක සහ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය හේතුවෙන් මහජනතාව විසින් ඩිජිටල් ගෙවීම් වෙත හුරුවීම අඛණ්ඩ ව වර්ධනය වී ඇත.

ලංකාපේ (පෞද්ගලික) සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන සුළු පරිමාණ ගෙවීම් පද්ධති අතරට වේගවත් ගෙවීම් පද්ධතිය වන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS), ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS), විකුණුම්පොළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS), ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) සහ ඡායාගත චෙක්පත් පිළිඹිබු නිෂ්කාශන පද්ධතිය (CITS) ඇතුළත් වේ.

වේගවත් ගෙවීම් පද්ධතිය මඟින් ගනුදෙනුකරුවන්ට අන්තර්ජාල බැංකුකරණය, ජංගම දුරකථන පදනම් කරගත් බැංකුකරණය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, කියෝස්ක් සහ කවුන්ටරය හරහා එසැනින් මුදල් හුවමාරු කිරීමට හැකියාව ලැබේ. LANKAQR, ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LPOPP), ජස්ට්පේ (JustPay), GovPay සහ සෘජු හර (Direct Debit) යන ගෙවීම් ක්‍රම වේගවත් ගෙවීම් පද්ධතිය තුළින් ක්‍රියාත්මක වේ.

පෙර වසරට සාපේක්ෂ ව 2025 වසරේ දී වේගවත් ගෙවීම් පද්ධතිය වටිනාකමෙන් 34.1%ක වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර එහි මුළු ගනුදෙනු වටිනාකම රුපියල් ට්‍රිලියන 23.13කි. සුළු පරිමාණ ගෙවීම් සඳහා වේගවත් ගෙවීම් පද්ධතිය හරහා ක්‍රියාත්මක වන ගෙවීම් ක්‍රම භාවිත කිරීමේ ඉහළ වර්ධනයක් මෙයින් පෙන්නුම් කෙරේ.

ප්‍රස්ථාර සටහන - 03

**තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පාරිභෝගික ගනුදෙනුවල වර්ධනය: 2015 - 2025**



ජංගම ගෙවීම් යෙදවුම් භාවිත කරන ගනුදෙනුකරුවන්ගෙන් ඩිජිටල් ගෙවීම් ලබා ගැනීමට වෙළෙඳුන් විසින් ජාතික QR කේත ප්‍රමිතිය වන LANKAQR භාවිතා කරයි.

ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව මගින් ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සේවක අර්ථසාධක අරමුදල වැනි රාජ්‍ය ආයතන සඳහා මාර්ගගත තත්කාලීන ගෙවීම් සඳහා පහසුකම් සපයන අතර සාමාජික මූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන්ට තම ජංගම හෝ ඉතුරුම් ගිණුමෙන් රජයේ ආයතනයකට ක්ෂණිකව මුදල් ගෙවීම් සිදු කිරීමට ඉඩ සලසයි. 2025 දී ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව විසින් රුපියල් ට්‍රිලියන 3.40ක වටිනාකමක් සහිත ගෙවීම් සිදු කරන ලද අතර එය 2024ට සාපේක්ෂව 90% ඉක්මවන වර්ධනයක් පෙන්වයි.

### වේගවත් ගෙවීම් පද්ධතිවල වර්ධනය: 2015 - 2025

ප්‍රස්ථාර සටහන - 04




### ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හරහා රාජ්‍ය ආයතන වෙත සිදු කළ ගෙවීම්වල වර්ධනය: 2015 - 2025

ප්‍රස්ථාර සටහන -05




GovPay, 2025 පෙබරවාරි මාසයේ දී දියත් කරන ලද අතර තමන්ගේ ම තොරතුරු තාක්ෂණ පද්ධති නොමැති රජයේ ආයතනවලට ඔවුන් සපයන සේවාවන් සඳහා මහජනතාවගෙන් ක්ෂණික ඩිජිටල් ගෙවීම් පිළිගැනීමට හැකියාව ලබා දෙයි. මෙම යාන්ත්‍රණය ඩිජිටල් ගෙවීම් පිළිගන්නා රජයේ ආයතනවල ආවරණය තවදුරටත් පුළුල් කරන අතර ම ඒවායේ කාර්යක්ෂමතාව සහ මහජනතාවට ඇති ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කරයි. 2026 ජනවාරි වන විට ආයතන 254ක් GovPay වෙත සම්බන්ධ කර ඇති අතර 2025දී ඒ හරහා සිදු කරන ලද ගනුදෙනුවල මුළු වටිනාකම රුපියල් බිලියන 2.27ක් විය.

### SWIFT පද්ධතියේ මෙහෙයුම්

අන්තර්ජාතික සහ දේශීය ගෙවීම් පණිවුඩ සම්ප්‍රේෂණය කිරීම සහ ලබා ගැනීම සඳහා මහ බැංකුව SWIFT මූල්‍ය සන්නිවේදන ජාලය භාවිතා කරයි. ගෝලීය ප්‍රමිතීන්ට සහ ජාත්‍යන්තර කාල රාමුවලට අනුකූල ව 2025 නොවැම්බර් 22 වන දින වන විට මහ බැංකුව සියලුම SWIFT සම්බන්ධ පද්ධති ISO 20022 ප්‍රමිතියට අනුකූල කිරීම සාර්ථකව සම්පූර්ණ කළේ ය. මෙම සංක්‍රාන්තිය මගින් ශ්‍රී ලංකාවේ ගෙවීම් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, ජාත්‍යන්තර භාවිතයන් සමඟ අඛණ්ඩ ව අනුකූල වීම සහතික කිරීම සහ මූල්‍ය පණිවුඩකරණයේ කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම සිදු කරයි.

### ආසියානු නිෂ්කාශන සංගමයේ මෙහෙයුම්

ආසියානු නිෂ්කාශන සංගමයේ සාමාජිකයෙකු ලෙස මහ බැංකුව 2025 දී මෙම බහුපාර්ශ්වික පියවීම් පද්ධතිය තුළ සිය කාර්යභාරය ඉටු කළේ ය.

ආසියානු නිෂ්කාශන සංගමය විසින් එහි සාමාජික මහ බැංකුවලට ශුද්ධ පදනමක් මත අන්තර් කලාපීය ගෙවීම් පියවීමට හැකියාව ලබා දෙන අතර එමගින් විදේශ විනිමය සංචිත භාවිතය සහ හුවමාරු පිරිවැය අඩු කරයි. ඒ සමඟ ම එහි සාමාජිකයින් වන බංග්ලාදේශය, බෙලරුස්, භූතානය, ඉරානය, ඉන්දියාව, මාලදිවයින, මියන්මාරය, නේපාලය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳ හා බැංකු සබඳතා ප්‍රවර්ධනය කරයි.

## 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- අන්තර්ග්‍රහණ හැකියාව, කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව ඉහළ නංවමින් ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම සඳහා වසර තුළ දී ප්‍රතිපත්තිමය පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි. මෙම ප්‍රතිපත්ති අතරට ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හරහා සිදු කරන ගනුදෙනු සඳහා අය කරන ගාස්තු අඩු කිරීම, GovPay ගෙවීම් ක්‍රමය හරහා සිදු කරන ගෙවීම් සඳහා උපරිම ගනුදෙනු ගාස්තුවක් අනිවාර්ය කිරීම, සමූහ වශයෙන් සිදු කරන සුළු පරිමාණ ගෙවීම් සක්‍රිය කරන ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියෙහි මුදල් හුවමාරු සඳහා උපරිම ගනුදෙනු වටිනාකම රුපියල් මිලියන 5 සිට රුපියල් මිලියන 10 දක්වා වැඩි කිරීම ඇතුළත් වේ.
- ඩිජිටල් ගෙවීම් පද්ධතිවලට අදාළ වංචා සහ වංචනික ක්‍රියාකාරකම් අවම කිරීම සඳහා ගෙවීම් යෙදවුම ඇති උපාංගයේ ජංගම දුරකථන අංකය පාරිභෝගිකයාගේ බැංකු ගිණුමේ ලියාපදිංචි කර ඇති ජංගම දුරකථන අංකයට සමාන බව සත්‍යාපනය කිරීමෙන් පාරිභෝගිකයා හඳුනා ගැනීම වැඩිදියුණු කරන ලෙස ජංගම ගෙවීම් යෙදවුම් සපයන්නන්ට නියම කරන ලදි.
- වෙළෙඳුන්හට AliPay+ සක්‍රිය ජංගම ගෙවීම් යෙදවුම් හරහා සංචාරකයින් විසින් සිදු කරන LANKAQR ගනුදෙනු පිළිගැනීම සඳහා AliPay+ ජාලය සමඟ සම්බන්ධ වීමට LankaPay හට අනුමැතිය ලබා දෙන ලදි. මෙය ජාතික ගෙවීම් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සහ දැනටමත් චීනය සහ ඉන්දියාව දක්වා ව්‍යාප්ත වී ඇති LANKAQR හි විදේශ ගෙවීම් පද්ධති සමඟ අනුකූල වීමේ හැකියාව වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.
- මූල්‍ය තාක්ෂණික සමාගම් සඳහා වැඩි ප්‍රවේශයක් ලබා දීමට සුදුසුකම් ලැබීමේ කොන්දේසි ලිහිල් කරමින් මූල්‍ය තාක්ෂණ නියාමන පරීක්ෂණ අවකාශය සඳහා වන නියාමන රාමුව සංශෝධනය කරන ලදි.
- අවම මුදල් භාවිතයක් සහිත ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම සඳහා උපායමාර්ගික මග පෙන්වීම් ලබා දෙමින් ආරක්ෂිත, කාර්යක්ෂම සහ ගෝලීය වශයෙන් සම්බන්ධිත ජාතික ගෙවීම් පද්ධතියක් සංවර්ධනය කිරීම තුළින් ජනතාවගේ මූල්‍ය යහපැවැත්ම සක්‍රිය කිරීම සඳහා ජාතික ගෙවීම් කවුන්සිලයේ සාමාජිකයින් සමඟ එක් ව 2026-2027 සඳහා වූ ජාතික ගෙවීම් පද්ධති මාර්ග සැලසුම සකස් කරන ලදි.
- මහජනතාව අතර දැනුම්වත්භාවය වැඩි කිරීම සඳහා හම්බන්තොට, නුවරඑළිය, දඹුල්ල සහ මහ බැංකු පරිශ්‍රයේ දී ඉලක්කගත ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදි.

## මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා නියාමනය සහ අධීක්ෂණය

මහ බැංකුව 2024 දී 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ 2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග හරහා ශ්‍රී ලංකාවේ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් නියාමනය සහ අධීක්ෂණය කිරීම ආරම්භ කළේය.

මෙම නියෝග සියලුම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් මහ බැංකුවේ ලියාපදිංචි කිරීම අනිවාර්ය කරන අතර එමඟින් ලියාපදිංචි නොකළ සැපයුම්කරුවන්ට ඔවුන්ගේ මෙහෙයුම් විධිමත් කිරීමට සහ නියාමනය කරන ලද පරිසරයක් යටතේ ගනුදෙනුකරුවන්ට ආරක්ෂිත සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමට ඉඩ සලසයි.

2025 දෙසැම්බර් 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2025 අංක 01 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග සඳහා සංශෝධන නිකුත් කරන ලද අතර ඒ යටතේ විදේශීය මුදල් පැවරීම් සේවා සපයන්නන් මෙම නියෝගයන්හි නියාමන සහ අධීක්ෂණ රාමුව යටතේ ලියාපදිංචි විය යුතුය.

## විදේශ විනිමය, රන් සහ විදේශ සුරැකුම්පත් පියවීම සම්බන්ධ කටයුතු

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මඟින් විදේශ විනිමය මෙහෙයුම් සිදු කිරීම සඳහා බලය පවරන ලද පරිදි මහ බැංකුව විදේශ විනිමය, රන් සහ විදේශ සුරැකුම්පත් සම්බන්ධ ජාත්‍යන්තර මෙහෙයුම් සිදු කරයි. මෙම ක්‍රියාකාරකමේ කොටසක් ලෙස මහ බැංකුව සතු විදේශ සංචිත කළමනාකරණය සහ මහ බැංකුවේ දේශීය විදේශ විනිමය මෙහෙයුම්වලට අදාළ සියලුම ගනුදෙනු පියවීම සහ සැසඳීම, කඩිනමින් සහ නිවැරදිව කළමනාකරණය කරමින් පියවීමේ ක්‍රියාවලියේ ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව තහවුරු කරයි.

ඊට අමතර ව මහ බැංකුව විසින් විදේශ සංචිත කළමනාකරණය අරමුණු කරගනිමින් නොස්ට්‍රෝ සහ භාරකාර ගිණුම් විවෘත කිරීම සහ වසා දැමීම ද එම ගිණුම්වල කටයුතු කළමනාකරණයට අදාළ ප්‍රතිපත්තිමය ගැටලු විසඳීම සඳහා ද මැදිහත් වේ.

## ලංකාසෙක්‍යු පද්ධතිය සහ එහි සේවා නඩත්තු කිරීම

මධ්‍යම තැන්පතු පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය ඇතුළත් ලංකාසෙක්‍යු පද්ධතිය, 2025 වසර පුරා 100% ක ප්‍රවේශ්‍යතාවයකින් ක්‍රියාත්මක විය. මධ්‍යම තැන්පතු පද්ධතිය විසින් නිර්ලේඛන රජයේ සුරැකුම්පත්වල හිමිකාරිත්වය පිළිබඳ වාර්තා තබා ගන්නා අතර නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය එවැනි සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු පියවීමට පහසුකම් සපයයි.

2025 වර්ෂය තුළ ලංකාසෙක්‍යු ප්‍රාථමික නිකුත් කිරීම්, ද්විතීයික වෙළෙඳපොළ වෙළෙඳාම් (සම්පූර්ණ, ප්‍රතිමිලදීගැනීම් සහ පොරොන්දු ගනුදෙනු), විවට වෙළෙඳපොළ කටයුතු, දිනය තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම සහ අනෙකුත් ගනුදෙනු ඇතුළු ව ගනුදෙනු 649,629ක් සඳහා පහසුකම් සපයා ඇත.

වර්ෂය තුළ සුරැකුම්පත් තබාගැනීම්, ගනුදෙනු, පොලී සහ කල්පිරීමේ ගෙවීම් පිළිබඳ කාලීන විද්‍යුත් ගනුදෙනු වාර්තා මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට නිකුත් කරන ලදි. ඊට අමතර ව සුරැකුම්පත් සම්බන්ධ සෑම හර සහ බැර ගනුදෙනුවක් සඳහා ම තත්කාලීන දැනුම් දීම් එවැනි පහසුකම් සඳහා ලියාපදිංචි වී ඇති මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට කෙටි පණිවුඩ සහ/හෝ විද්‍යුත් තැපැල හරහා ලබා දෙන ලදි.

තව ද ලියාපදිංචි මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට LankaSecureNet පහසුකම හරහා ඔවුන්ගේ සුරැකුම්පත් ගිණුම් විස්තර මාර්ගගත ව බැලීමට හැකි වේ. රජයේ සුරැකුම්පත් ආයෝජනවල ආරක්ෂාව සහ විනිවිදභාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා හඳුන්වා දුන් අනෙකුත් සේවාවන් අතර වාර්ෂික හෝ කලින් කල සිදු වන විගණන, වීසා අයදුම්පත් සහ නියාමන ඉදිරිපත් කිරීම් වැනි නිශ්චිත අරමුණු සඳහා හිඟ සුරැකුම්පත් ශේෂයන් පිළිබඳ වාර්තා ලබා ගැනීමට පහසුකම් සැපයීම ද වේ.

# ගෙවීම් සහ පියවීම් පද්ධතිවල විකාශය



ගෙවීම් සහ පියවීම් පද්ධතියේ විකාශය, නවීකරණයේ සහ නවෝත්පාදනයේ අඛණ්ඩ ගමනක් පිළිබිඹු කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව, ජාතික ගෙවීම් පද්ධතිය සාම්ප්‍රදායික, කඩදාසි මත පදනම් වූ ක්‍රියාවලීන්හි සිට වේගවත්, අන්තර් ක්‍රියාකාරී සහ ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධිත ඩිජිටල් පරිසර පද්ධතියක් දක්වා සංවර්ධනය කිරීම සඳහා සක්‍රීය මඟ පෙන්වීමක් සිදු කරන ලදි. එය ස්ථාවරත්වය, අන්තර්ගතභාවය යන පදනම මත ගොඩනගා ඇති අතර නවෝත්පාදනයන් හරහා ආර්ථිකයේ වෙනස් වෙමින් පවතින අවශ්‍යතාවන්ට අඛණ්ඩව සහාය වන ආරක්ෂිත සහ කාර්යක්ෂම ගෙවීම් යාන්ත්‍රණයන් සක්‍රීය කරයි.

## චෙක්පත් නිෂ්කාශනයේ සිට ක්ෂණික ගෙවීම් දක්වා වූ පදනම ගොඩනැඟීම

ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත කිරීම අන්තර් බැංකු ගෙවීම් විධිමත් කිරීමේ සන්ධිස්ථානයකි. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු සඳහා බැංකුකරු ලෙස තම භූමිකාව දරමින් වාණිජ බැංකු සඳහා චෙක්පත් නිෂ්කාශන මෙහෙයුම් ආරම්භ කරන ලදි.

## ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශන ආයතනය ස්ථාපිත කිරීම

දිනපතා නිෂ්කාශනය සඳහා ඉදිරිපත් වන චෙක්පත් ප්‍රමාණය ඉහළ යාමත් සමඟ චෙක්පත් නිෂ්කාශන ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම අත්‍යවශ්‍ය විය. ඒ අනුව ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශන ආයතනය 1988 දී ස්ථාපිත කරන ලද අතර එමඟින් චෙක්පත් නිෂ්කාශනය සඳහා ගත වන කාලය සැලකිය යුතු මට්ටමකින් අඩු විය.

## ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය පිහිටුවීම

බැංකු අතර ඉලෙක්ට්‍රොනික් මුදල් හුවමාරුවට පහසුකම් සලසමින් එක් ගිණුමකින් තව ගිණුමකට හෝ ගිණුම් කිහිපයකට චෙක්පත් හෝ ගෙවුම් ඇණවුම් ආදී කඩදාසි මත පදනම් වූ මෙවලම් භාවිතා නොකර ගෙවීම් සිදු කිරීම සක්‍රීය කරමින් බැංකු අතර ඉලෙක්ට්‍රොනික ගෙවීම්වල නව යුගයක් ලෙස 1993 දී ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හඳුන්වා දෙන ලදි.

අඩු වටිනාකම් සහිත ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු කිරීම් සඳහා එදින ම අරමුදල් ලැබීම මෙන්ම වේගය, කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වය කැපී පෙනෙන මට්ටමකින් වැඩි දියුණු කරමින් 2010 වසරේ දී ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය මාර්ගගත අන්තර් බැංකු ගෙවීම් වේදිකාවක් බවට පත් කරන ලදි.

## ගෙවීම් පද්ධති යටිතල පහසුකම් නව්‍යකරණය කිරීම

2002 දී ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා නීතිමය සහ ආයතනික ප්‍රතිසංස්කරණවල සහාය ඇති ව ජාතික ගෙවීම් පද්ධතියේ සමස්ත නව්‍යකරණයක ආරම්භය සනිටුහන් කළේය.

## නිෂ්කාශන මෙහෙයුම්වල උපායමාර්ගික බෙදා හැරීම - LankaClear ස්ථාපිත කිරීම

නව්‍යකරණය වැඩසටහන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව නිෂ්කාශන මෙහෙයුම් ක්‍රියාවලිය ලංකාක්ලියර් (පෞද්ගලික) සමාගමට (වර්තමානය වන විට ලංකාපේ (පෞද්ගලික) සමාගම ලෙස නම වෙනස් කර ඇත) ලබා දෙන ලදි. මෙම ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුව හා ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු අතර හවුල් හිමිකාරීත්වයෙන් ස්ථාපිත කර ඇත.

ලංකාපේ (පෞද්ගලික) සමාගමෙහි පාලන ආකෘතිය ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ ගෙවීම් අවකාශයේ වේගවත් දියුණුවට පහසුකම් සැලසීය. නිෂ්කාශනය සඳහා ඉදිරිපත් කරන ලද චෙක්පත් සඳහා ඊළඟ ව්‍යාපාරික දිනයේ දී දිවයිනේ ඕනෑම ස්ථානයකින් මුදල් ලබාගැනීමට හැකියාව ලබා දෙන ලද ඡායාගත චෙක්පත් පිළිඹිබු නිෂ්කාශන පද්ධතිය (CITS) 2006 දී දියත් කිරීම එහි ප්‍රධාන ජයග්‍රහණයකි.

### තත්කාලීන දළ පියවීම් පද්ධතිය දියත් කිරීම

2003 දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය දියත් කරමින් විශාල වටිනාකමක් ඇති සහ කාල-තීරණාත්මක ගෙවීම් සඳහා තත්කාලීන පියවීම් අනුගමනය කළ පළමු දකුණු ආසියානු රට බවට ශ්‍රී ලංකාව පත් වූ අතර එය ජාතික ගෙවීම් පද්ධතිය ඉදිරියට ගෙන යාමේ ප්‍රධාන සන්ධිස්ථානයක් විය. 2024 වර්ෂයේ දී ISO 20022 ප්‍රමිතියට යාවත්කාලීන කරන ලද RTGS පද්ධතිය, 2025 වර්ෂය තුළ දෛනික සාමාන්‍ය රුපියල් ට්‍රිලියන 1.8ක් ලෙස පවත්වා ගනිමින් වටිනාකම රුපියල් ට්‍රිලියන 400 ඉක්මවන ගනුදෙනු පියවමින් රටේ මූල්‍ය පද්ධතියේ මධ්‍ය ලක්ෂය ලෙස තවදුරටත් පවතී.

### නීතිමය හා නියාමන රාමුව ශක්තිමත් කිරීම

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත මගින් ගෙවීම් පද්ධතිවල නියාමකයා සහ අධීක්ෂකයා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කරන අතර ම එතුළින් එම පද්ධතිවල ආරක්ෂාව සහතික කිරීම සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කරයි.

### ජාතික ගෙවීම් කවුන්සිලය පිහිටුවීම

රජයේ ආයතන සහ මූල්‍ය වෙළෙඳපොළ කටයුතු සඳහා සහභාගිවන්නන්ගෙන් සමන්විත උපදේශන ආයතනයක් ලෙස ගෙවීම් ක්ෂේත්‍රයේ උපායමාර්ගික දිශානතිය මෙහෙයවීම සඳහා ජාතික ගෙවීම් කවුන්සිලය 2006 දී පිහිටුවන ලදි.

### අන්තර් ක්‍රියාකාරී ගෙවීම් යටිතල පහසුකම් හඳුන්වාදීම

#### කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ක්‍රම සඳහා වූ පොදු යාන්ත්‍රණය

2013 දී කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ක්‍රම සඳහා වූ පොදු යාන්ත්‍රණය හඳුන්වා දීමත් සමඟ රට තුළ ඩිජිටල් භාවිතය සහ ගෙවීම් සේවා නවෝත්පාදනය වේගවත් විය. කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ක්‍රම සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් බැංකු අන්තර් ක්‍රියාකාරී ගෙවීම් පද්ධතිවලට සම්බන්ධ කර ශ්‍රී ලංකාව තුළ අන්තර් ක්‍රියාකාරී ක්ෂණික ගෙවීම්වල නව යුගයක් නිර්මාණය කළේය. කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ක්‍රම සඳහා වූ පොදු යාන්ත්‍රණය යටතේ 2013 දී දියත් කරන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS) මගින් මහජනතාවට දිවයිනේ ඕනෑම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයකින් මුදල් ලබා ගැනීමට හැකි වූ අතර 2015 දී දියත් කරන ලද විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) මගින් මහජනතාවට දිවයිනේ ඕනෑ ම මූල්‍ය ආයතනයක ගනුදෙනුකරුවන් වෙත මුදල් හුවමාරු කිරීම් සිදු කිරීමට හැකි විය. එමගින් එවැනි ගෙවීම් සේවා වෙත ප්‍රවේශ වීමට ගනුදෙනුකරුවන්හට තම ගිණුම් පවත්වාගෙන යන බැංකු වෙතම යාමේ අවශ්‍යතාව අහෝසි විය.

#### LankaPay ජාතික කාඩ්පත් යෝජනා ක්‍රමය

තව ද 2018 දී හඳුන්වා දුන් LankaPay ජාතික කාඩ්පත් යෝජනා ක්‍රමය මගින් ගෙවීම් කාඩ්පත් නිකුත් කිරීම සඳහා පහසුකම් සපයන ලද අතර එහි දී දේශීය ගනුදෙනු විකුණුම්පොළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS) හරහා සිදු කෙරෙන අතර ජාත්‍යන්තර ගනුදෙනු සම-සන්නාමගත ජාත්‍යන්තර කාඩ්පත් ජාලයක් හරහා සිදු කෙරේ.

### ක්ෂණික ගෙවීම් පද්ධතිය

ශ්‍රී ලංකාවේ ක්ෂණික ගෙවීම් පද්ධතිය වන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS), මහජනතාව සඳහා නව්‍ය සහ අන්තර්ග්‍රාහී ඩිජිටල් ගෙවීම් සඳහා අඩිතාලම සකසමින් ශ්‍රී ලංකාවේ ඩිජිටල් ගෙවීම් සඳහා නව යුගයක් උදා කළ සන්ධිස්ථානයකි.

#### CEFTS පහසුකම සහිත නවෝත්පාදනයන් LANKAQR, JustPay, LPOPP සහ GovPay

CEFTS යාන්ත්‍රණයේ අන්තර් ක්‍රියාකාරී සහ නම්‍යශීලී ස්වභාවය මගින් ගිණුමකින් ගිණුමකට ක්ෂණික ගෙවීම් සක්‍රිය කරන ක්‍රම පදනම් කරගත් නව ඩිජිටල් ගෙවීම් උපකරණ නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දීමට හැකි විය. අන්තර් ක්‍රියාකාරී QR කේත ගෙවීම් සඳහා LANKAQR (2018), ගනුදෙනුකරුවන්ගේ බැංකු ගිණුම් ඕනෑම ජංගම ගෙවීම් යෙදුමකට සම්බන්ධ කිරීම සඳහා JustPay (2019) සහ ඔවුන්ගේ බැංකු ගිණුම් භාවිතා කරන විද්‍යුත්-වාණිජ ගනුදෙනු සඳහා JustPay Web (2024) යන ක්‍රමවේදයන් CEFTS යටිතල පහසුකම් මත ගොඩනගා ඇති ප්‍රධාන නවෝත්පාදනයන් වන අතර එමගින් ශ්‍රී ලංකාවේ ඩිජිටල් ගෙවීම් සඳහා ප්‍රවේශය, පහසුව සහ කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස පුළුල් විය.

රජයේ ආයතනවලට ක්ෂණික ගෙවීම් පහසු කිරීම සඳහා 2017 දී දියත් කරන ලද ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LPOPP) සහ 2025 දී දියත් කරන ලද GovPay පහසුකම හඳුන්වාදීමට CEFTS දායකත්වය සපයන ලදි.

#### තරගකාරී සහ ආරක්ෂිත ඩිජිටල් ගෙවීම් පරිසර පද්ධතියක් සඳහා මාවත සකස් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ ගෙවීම් ක්ෂේත්‍රය තුළ තරගකාරීත්වය, නවෝත්පාදනය සහ ආරක්ෂාව සඳහා ඉඩ සලසමින් ඒ සඳහා වටපිටාවක් නිර්මාණය කරන ලදි. ඒ අනුව ගෙවීම් කාඩ්පත්, QR-සක්‍රිය ගෙවීම් යෙදවුම්, විද්‍යුත් මුදල් පද්ධති සහ ගෙවීම් පසුම්බි ඇතුළු බහුවිධ ඩිජිටල් ගෙවීම් උපකරණ හඳුන්වා දීමට පහසුකම් සැලසීය. 1989 දී ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් ගෙවීම් කාඩ්පත්, 2009 දී සහ 2013 දී බලපත්‍ර ලබා ගත යුතු නියාමන රාමුවක් යටතට ගෙන එන ලදි. ඒ හා සමාන ව ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා සපයන්නන් සඳහා ද 2012 සිට බලපත්‍ර ලබා දී ඇත.

වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ කුඩා වටිනාකම් සහිත සුළු පරිමාණ ගෙවීම් සඳහා මුදල් නෝට්ටු මත යැපීම අඩු කරමින් JustPay සහ LANKAQR සක්‍රිය ජංගම ගෙවීම් යෙදවුම් 30කට අධික සංඛ්‍යාවක් ඇති අතර LANKAQR වෙළෙඳුන් 400,000කට අධික සංඛ්‍යාවක් QR ගෙවීම් පිළිගැනීම සිදු කරයි. 2020 දී හඳුන්වා දුන් මූල්‍ය තාක්ෂණ නියාමන පරීක්ෂණ අවකාශය (FinTech Regulatory Sandbox) හරහා තවදුරටත් නවෝත්පාදන දිරිමත් කරන ලද අතර එමගින් මූල්‍ය තාක්ෂණ සමාගම්වලට ඔවුන්ගේ නව නිපැයුම් වාණිජමය වශයෙන් පූර්ණ ව දියත් කිරීමට පෙර ලිහිල් නියාමන පියවරයන් යටතේ නියාමකයාගේ අධීක්ෂණය යටතේ ඔවුන්ගේ නිපැයුම් පරීක්ෂා කිරීම සඳහා පාලිත පරිසරයක් සපයයි.

#### ශ්‍රී ලංකාවේ ගෙවීම් පද්ධතියේ ගෝලීය ඒකාබද්ධතාව

2023 දී චීනයේ UnionPay, 2024 දී ඉන්දියාවේ NIPL සහ 2025 දී AliPay+ International සමඟ LANKAQR ඒකාබද්ධ කිරීමෙන් ශ්‍රී ලංකාවේ ගෙවීම් පද්ධතිය ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධ වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහසුකම් සපයා ඇත. එහි දී LANKAQR හි ජාත්‍යන්තර ව ප්‍රමිතිගත, අන්තර් ක්‍රියාකාරී සැකැස්ම මෙම සාර්ථක ඒකාබද්ධ කිරීම් සක්‍රිය කිරීම සඳහා මහෝපකාරී වී ඇත.

ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධතියේ විකාශය, සාම්ප්‍රදායික චෙක්පත් නිෂ්කාශනය කිරීමේ සිට අද වන විට ජාත්‍යන්තර ව සම්බන්ධිත ඩිජිටල් ගෙවීම් පරිසර පද්ධතිය දක්වා ප්‍රගතිශීලී පරිවර්තනයක් පෙන්නුම් කරයි.

තාක්ෂණ හා ගෙවීම් ක්ෂේත්‍රයේ ගතිකත්වය මත පදනම් ව මෙම පරිවර්තනය අඛණ්ඩ ව විකාශය වෙමින් පවතින අතර එමගින් සහායක නියාමන රාමුවක් සහ අඛණ්ඩ කර්මාන්ත නවෝත්පාදනයන් සඳහා අඛණ්ඩ අවශ්‍යතාවක් ඇති කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම අනිවාර්ය අවශ්‍යතා හඳුනා ගනිමින් ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධතීන් තාක්ෂණික දියුණුව හා මෙහෙයුම් විශිෂ්ටත්වය අතින් ඉදිරියෙන්ම පවතින බව සහතික කරයි. තව ද ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර ඒකාබද්ධ කිරීම් දිරිමත් කරන අතර ම ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා නැගී එන තාක්ෂණ විධි ක්‍රම යොදා ගැනීම ප්‍රවර්ධනය කරයි.

# ව්‍යවහාර මුදල් මෙහෙයුම්

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත ප්‍රකාර ව මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීම සහ ඒවායේ සම්පූර්ණ ජීවන චක්‍රය කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත.

මෙම වගකීම ඉටු කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සමස්ත මුදල් චක්‍රය ම අධීක්ෂණය කරන අතර පවිත්‍ර, ආරක්ෂිත සහ ප්‍රමාණවත් මුදල් සංසරණයක් සහතික කරමින් ශ්‍රී ලංකා රුපියල කෙරෙහි මහජන විශ්වාසය ඇති කිරීමට සහ රට පුරා මුදල් ගනුදෙනු ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට සහාය වේ.

## ව්‍යවහාර මුදල්වල වගකීම සහ මෑතකාලීන ප්‍රවණතා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල අවශ්‍යතා අනුව ඔවුන් වෙත මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කරන අතර එම බැංකු විසින් සිදු කෙරෙන මුදල් තැන්පතු භාර ගනු ලබයි. මෙම මුදල් නිකුත් කිරීමේ සහ තැන්පතු භාර ගැනීමේ අඛණ්ඩ ක්‍රියාවලිය හරහා ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් සංසරණ මට්ටම කළමනාකරණය කරනු ලබන අතර එමගින් මහජනතාව අතැති මුදල් නෝට්ටු හා කාසිවල වටිනාකම නිරූපණය කිරීම මෙන්ම ආර්ථිකය තුළ මුදල් ඉල්ලුම මැන බැලෙන ප්‍රධාන මෙහෙයුම් දර්ශකයක් ලෙස ද ක්‍රියා කරයි. මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, නැවත සංසරණය වීම නවතා අවලංගු කරන තෙක් මහ බැංකුවේ වගකීමක් වන්නේ ය.

2025 වර්ෂයේ දී මුදල් නෝට්ටු සඳහා වන ඉල්ලුමේ සැලකිය යුතු ලෙස ඉහළ යාමක් දක්නට ලැබුණු අතර 2024 වර්ෂයේ රුපියල් බිලියන 1,358.72ක් වූ සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය 2025 වර්ෂය වන විට රුපියල් බිලියන 1,568.94 දක්වා 15.5%කින් වර්ධනය වී ඇත.

## ව්‍යවහාර මුදල් කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් කළමනාකරණය යටතට මුදල් නිර්මාණය, මුද්‍රණය සහ ටංකනය, තොග ඇණවුම් කිරීම, තොග කළමනාකරණය, භාවිතයට නුසුදුසු මුදල් ප්‍රතිස්ථාපනය, ව්‍යාජ මුදල් වැළැක්වීම, මුදල් සැකසීම සහ මහජන දැනුම්වත් කිරීම යන අංශ ඇතුළත් වේ.

### ව්‍යවහාර මුදල් නිර්මාණය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයුම් සහ ජාතික අවශ්‍යතා මත පදනම් ව වරින් වර නව මුදල් නිර්මාණ, නව කාණ්ඩ සහ සමරු මුදල් නිකුත් කරනු ලබයි. 2025 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වන සංවත්සරය සනිටුහන් කිරීම සඳහා "සමෘද්ධිය සඳහා ස්ථාවරත්වය" යන 75 වන සංවත්සර තේමාවට අනුව නිර්මාණය කරන ලද රු. 2000 සංසරණ සමරු මුදල් නෝට්ටුවක් නිකුත් කරන ලදි. එය ජාතික ප්‍රගතිය සඳහා පදනම ලෙස ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම පිළිබඳ මහ බැංකුවේ නොසැලෙන කැපවීම පිළිබිඹු කරයි.

මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පස්වැනි සමරු මුදල් නෝට්ටුව වන අතර නෝට්ටු මිලියන 50ක සීමිත නිකුතුවක් වේ.

### මුද්‍රණය සහ ටංකනය කිරීම

මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමේ පරම අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විධිමත් සැලසුම්කරණය, පුරෝකථනය කිරීම, නිරන්තර අධීක්ෂණය සහ නියමිත වේලාවට ඇණවුම් ලබා දීම හරහා ප්‍රමාණවත් මුදල් සැපයුමක් සහතික කිරීමේ වගකීම දරයි.

### මුදල් ඇණවුම් කිරීම

පුරෝකථනය කරන ලද නිකුත් කිරීමේ අවශ්‍යතා, භාවිතයට නුසුදුසු මුදල් ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතාව, හදිසි අවශ්‍යතා සඳහා පවත්වා ගන්නා තොග මට්ටම් සහ පවතින ආර්ථික තත්ත්වයන් මත පදනම්ව වාර්ෂික මුදල් ඇණවුම් ලබා දීම සිදු කරනු ලැබේ. ඇණවුම් ප්‍රමාණයන් සහ සැපයුම්කරුගේ සූදානම මත පදනම් ව එකඟ වූ බෙදාහැරීමේ කාලසටහනට අනුව මුදල් තොග ලබා ගැනීම සිදු වේ.

### තොග කළමනාකරණය

විධිමත් ඉල්ලුම් පුරෝකථනය මගින් ස්ථායී හා අඛණ්ඩ මුදල් සැපයුමක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නෝට්ටු හා කාසිවල ප්‍රමාණවත් තොග පවත්වා ගනී.

එමෙන් ම සැපයුම් ප්‍රමාදවීම, ස්වභාවික විපත් හෝ විශේෂයෙන් උත්සව සමයන්හි ඇතිවිය හැකි හදිසි ඉල්ලුම් වැඩිවීම් වැනි අනපේක්ෂිත සිදුවීම්වලින් මතු විය හැකි අවදානම් අවම කිරීම සඳහා ආරක්ෂිත තොග මට්ටම් පවත්වාගෙන යනු ලැබේ. මෙය ඕනෑම තත්ත්වයක් යටතේ රටේ මුදල් අවශ්‍යතාව සපුරාලීමට මහ බැංකුවට ඇති හැකියාව සහතික කිරීම සඳහා වූ පුළුල් ආරක්ෂිත උපායමාර්ගයේ කොටසක් වේ.

### භාවිතයට නුසුදුසු මුදල් ප්‍රතිස්ථාපනය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපිරිසිදු, විකල වූ සහ අනෙක් අයුරින් භාවිතයට නුසුදුසු නෝට්ටු සහ කාසි ක්‍රමානුකූල ව සංසරණයෙන් ඉවත් කර ඒවා භාවිතයට සුදුසු මුදල්වලින් ප්‍රතිස්ථාපනය කිරීම මගින් සංසරණයේ පවතින මුදල්වල ගුණාත්මකභාවය සහතික කරයි.

### ව්‍යාජ මුදල් වැළැක්වීම

ව්‍යාජ මුදල් නිෂ්පාදනය වැළැක්වීම සහ මහජන විශ්වාසය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් ඒකකය සමඟ සමීප ව කටයුතු කරයි.

### දැනුම්වත් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නීති රීති ක්‍රියාත්මක කරන නිලධාරින්, මුදල් හසුරවන්නන්, සිසුන් සහ මහජනතාව සඳහා සැබෑ මුදල්වල ආරක්ෂණ සලකුණු පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ද සිදු කරනු ලැබේ. මෙම වැඩසටහන් මඟින් සැබෑ මුදල් සහ ව්‍යාජ මුදල් හඳුනා ගැනීමේ හැකියාව වැඩිදියුණු කරයි.

## මුදල් හුවමාරුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා ඇති හානි වූ මුදල් නෝට්ටු හුවමාරු කවුළුව සහ ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවේ පිහිටුවා ඇති විශේෂ මුදල් කවුළුව හරහා ව්‍යවහාර මුදල් හුවමාරු කරගැනීමේ සේවා පහසුකම් සලසනු ලැබේ.

## නව පියවර - මුදල් මෙහෙයුම් නවීකරණය

සංසරණයේ පවතින මුදල් ප්‍රමාණයේ වර්ධනය, මුදල් මෙහෙයුම් ප්‍රමාණයේ වැඩිවීම සහ පවතින මුදල් සැකසීමේ පහසුකම්වල ඇති ධාරිතා සීමා හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 දෙසැම්බර් මාසයේ දී සිය මුදල් මෙහෙයුම්වල සම්පූර්ණ නවීකරණයක් සිදු කිරීම ආරම්භ කරන ලදි.

### 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 496.95ක් වූ අතර එයින් රුපියල් බිලියන 496.29ක් මුදල් නෝට්ටුවලින් සහ රුපියල් බිලියන 0.66ක් කාසිවලින් සමන්විත විය. එසේ ම එම බැංකු වෙතින් භාරගත් මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 287.08ක් වූ අතර ඒවා මුදල් නෝට්ටු වේ.
- අධිකරණ කටයුතුවල දී මුදල් නෝට්ටු අනුකරණය කර ඇති බවට අවසානාත්මක සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාජ මුදල් නෝට්ටු යන්න තීරණය කිරීමේ සහතික 83ක් නිකුත් කර ඇති අතර ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ අධිකරණ නඩු 13ක් සඳහා සහභාගී වී ඇත.
- මහ බැංකුවේ මුදල් හුවමාරු කවුළු හරහා රුපියල් මිලියන 1,139ක මුදල් නෝට්ටු සහ රුපියල් මිලියන 11.84ක කාසි හුවමාරු කර ඇති අතර රුපියල් මිලියන 196.46ක පලුදු වූ මුදල් නෝට්ටු හුවමාරු කර ඇත.
- මහ බැංකුව විසින් මුදල් නෝට්ටු මිලියන 141.55ක ප්‍රමාණයක් සංසරණයෙන් ඉවත් කරන ලද අතර එහි වටිනාකම රුපියල් බිලියන 91.23ක් විය.

## 5 වන සමරු මුදල් නෝට්ටුවේ නිදර්ශකය

රූප සටහන - 13

### ඉදිරිපස




### පිටුපස




### ඉදිරිපස

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ කොළඹ ප්‍රදීපාගාර ඔරලෝසු කණුව මෙන්ම මෑත කාලීන නාගරික සංවර්ධනය පෙන්නුම් කරන කොළඹ නගරයට අලුතින් එක් වූ ගොඩනැගිලි ඇතින් දැක්වෙන පිළිබිඹුවක් සහ 75 වන සංවත්සර ලාංඡනය දක්වා ඇත. මුදල් නෝට්ටුවේ ආරක්ෂක සලකුණු දැක්වීමට මෙම රූපය මත අංක (1, 2, 3, 4, 5) යොදා ඇත.

### පිටුපස

ශ්‍රී ලංකා සිතියමෙහි නිර්මාණාත්මක පිළිබිඹුවක්, මානෙල් මලක් සහ මහ බැංකුවේ දැක්ම ප්‍රකාශය ඉදිරිපත් කර ඇති අතර එමගින් ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සහ ප්‍රගතිය සඳහා මහ බැංකුවේ කැපවීම සංකේතවත් කර ඇත. එමෙන්ම ආරක්ෂක සලකුණු දැක්වීමට අංක (1, 2, 5) යොදා ඇත.

### රුපියල් 2000 සමරු මුදල් නෝට්ටුව

රුපියල් 2000 වටිනාකමකින් යුත් මෙම සමරු මුදල් නෝට්ටුව 2025 අගෝස්තු 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වන සංවත්සරය සනිටුහන් කිරීම නිමිත්තෙන් නිකුත් කරන ලදී.





**1 2 සැලකිල්ලෙන් බලන්න**

මුදල් නෝට්ටුව හරහා ආලෝකය ගමන් කරන ලෙස අල්ලාගෙන කවුළුව අතින් රැගත් සිංහයා සහිත දිය සලකුණ සැලකිල්ලෙන් බලන්න.

මුදල් නෝට්ටුව හරහා ආලෝකය ගමන් කරන ලෙස අල්ලාගෙන කවුළුව අතින් රැගත් සිංහයාගේ රුව සහිත විනිවිද පෙනෙන ආරක්ෂක සලකුණ සැලකිල්ලෙන් බලන්න.

මුදල් නෝට්ටු නිර්මාණයෙහි ඇතුළත් ඉතා කුඩා අක්ෂර සැලකිල්ලෙන් බලන්න.



**3 ඇල කර බලන්න**

මුදල් නෝට්ටුව තිරස් අතට ඇල කර බැලීමේ දී ආරක්ෂණ නූලේ ඇතුළත් කර ඇති කොළඹ ප්‍රදීපාගාර ඔරලෝසු කණුව සහ 2000 ඉලක්කම් නිල් වර්ණයේ සිට කොළ වර්ණය දක්වා වෙනස් වීම නිරීක්ෂණය කරන්න.



**4 ස්පර්ශයෙන් හඳුනා ගන්න**

උස්ව මුද්‍රණය කර ඇති නෝට්ටුවේ 2000 වටිනාකම සහ ශ්‍රී ලංකා මහ බැංකුව නමැති පාඨය ස්පර්ශයෙන් හඳුනා ගන්න.

එමෙන්ම එක් එක් තීරුව අවසානයේ දියමන්තියක හැඩයක් සමඟ උස්ව මුදිත තීරු හය ස්පර්ශයෙන් හඳුනා ගන්න. මෙම සලකුණ දෘෂ්‍යාබාධිත පුද්ගලයින්ට නෝට්ටුවේ වටිනාකම හඳුනා ගැනීමට උපකාර වේ.



**5 පරීක්ෂා කරන්න**

මුදල් නෝට්ටුව පාරජම්බුල (UV) ආලෝක කිරණවලට යොමු කොට පරීක්ෂා කිරීමේ දී නෝට්ටුවේ දෙපස ම ද්විත්ව වර්ණයෙන් යුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වන සංවත්සර තේමාව පෙන්නුම් කරන අතර මුදල් නෝට්ටුවේ ඉදිරිපස කොළඹ නගරයට අලුතින් එක් වූ ගොඩනැගිලි ඇතින් දිස්වන ආකාරය ද පිළිබිඹු වේ.

මුදල් නෝට්ටවේ වටිනාකම ද පාරජම්බුල (UV) ආලෝක කිරණවලට යොමු කොට පරීක්ෂා කළ හැකි වේ. මෙය මුදල් ගණින යන්ත්‍ර මඟින් ද පරීක්ෂා කළ හැකි සලකුණක් වේ.

# ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් කළමනාකරණයේ විකාශය




**වෙනස්වන ආර්ථික තත්ත්වයන්, තාක්ෂණික ප්‍රගතිය, වැඩිදියුණු කළ ආරක්ෂණ අවශ්‍යතා සහ මහජන අපේක්ෂාවන් වැඩිවීමට අනුකූල වන පරිදි පසුගිය අවුරුදු 75 තුළ ශ්‍රී ලංකාවේ මුදල් කළමනාකරණය සැලකිය යුතු ලෙස විකාශය වී ඇත.**

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා මුදලේ විශ්වාසය පවත්වාගෙන යාමටත්, ජාතික මුදල් පද්ධතියේ විශ්වසනීයත්වය සහ ස්ථායිත්වය රැක ගැනීමටත් කරනු ලබන අඛණ්ඩ කැපවීම මෙමඟින් පිළිබිඹු වෙයි.**

### මුදල් කළමනාකරණය පාලනය කිරීම සඳහා වන නීතිමය රාමුවේ ආරම්භය

ශ්‍රී ලංකාවේ මුදල් කළමනාකරණය සඳහා වූ විධිමත් රාමුව 1884 වර්ෂයේ කඩදාසි මුදල් ආඥා පනත යටතේ ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය ස්ථාපිත කිරීමත් සමඟ ආරම්භ විය. මෙම රාමුව 1949 අංක 58 දරන මුදල් නීති පනත සම්මත වන තෙක් ක්‍රියාත්මක වූ අතර එය ජාතියේ මුදල් ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් වන 1950 අගෝස්තු 28 දින ලංකා මහ බැංකුව ස්ථාපනය කිරීම

සඳහා නීතිමය පදනම සපයන ලදි. එතැන් සිට ශ්‍රී ලංකාවේ වලංගු මුදල් නිකුත් කිරීම, කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා පූර්ණ වගකීම මහ බැංකුව විසින් භාරගෙන ඇත.

ආරම්භයේ දී මුදල් කළමනාකරණය කිරීමේ වගකීම මහ බැංකුවේ බැංකු සහ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ ව්‍යවහාර මුදල් අංශය වෙත පැවරී තිබුණි.

### මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව පිහිටුවීම

1978 වර්ෂයේ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමඟ මුදල් කළමනාකරණයට අදාළ ආයතනික ධාරිතාවය තවදුරටත් ශක්තිමත් වීමෙන් මුදල් මෙහෙයුම් කටයුතු සැලකිය යුතු ලෙස පුළුල් විය. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වෙත සංසරණය සඳහා ව්‍යවහාර මුදල් නිර්මාණය කර නිෂ්පාදනය කිරීමේ සිට අවසාන බැහැර කිරීම දක්වා මුදල්වල ජීවන චක්‍රය කළමනාකරණය කිරීමේ වගකීම පවරා ඇත.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් පහත දැක්වෙයි.

- මුදල් නෝට්ටු මුද්‍රණ සහ කාසි ටංකන අවශ්‍යතා තක්සේරු කිරීම
- නිර්මාණය සහ නිෂ්පාදනය (ප්‍රසම්පාදනය)
- සැපයුම සහ බෙදාහැරීම (ගුණාත්මකභාවය සහ ප්‍රමාණය සහතික කරමින්)
- සේවා අනිසි මුදල් නිසිපරිදි සංසරණයෙන් ඉවත් කිරීම
- ව්‍යවහාර මුදල් සත්‍යාපනය සහ ව්‍යාජ මුදල් නෝට්ටු වැළැක්වීම

මුදල් නීති පනත පරිච්ඡින්න කරමින් බලාත්මක වූ 2023 අංක 16 දරන මහ බැංකු පනතින් මහ බැංකුවේ ස්වාධීනත්වය, වගකීම් සහ පාලන කාර්යක්ෂමතාවය තවදුරටත් වර්ධනය වූ අතර එමඟින් මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය සම්බන්ධ පූර්ණ බලය මහ බැංකුවට පවතින බව නැවතත් තහවුරු කරමින් මුදල් කළමනාකරණය සඳහා වන නීතිමය රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදි.

1970 දී අවලංගු කරන ලද 1970 ඔක්තෝබර් 26 දිනට පෙර දිනයන් සහිත රු. 50/- සහ රු. 100/- නෝට්ටු හැර මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලු මුදල් නෝට්ටු සහ කාසි වලංගු මුදල් වේ.

### ව්‍යවහාර මුදලේ මුහුණත වටිනාකම් ව්‍යුහයේ විකාශය




1951 වර්ෂයේ දී මහ බැංකුව විසින් එහි පළමු බැංකු නෝට්ටු කාණ්ඩය ලෙස හයවන ජෝර්ජ් රජුගේ රුව සහිත නෝට්ටු කාණ්ඩය යටතේ රු. 1/- සහ රු. 10/- මුහුණත වටිනාකමින් යුතු නෝට්ටු නිකුත් කරන ලදි. එතැන් සිට ශ්‍රී ලංකා මුදලේ මුහුණත වටිනාකම් ව්‍යුහය, ආර්ථික වර්ධනය, උද්ධමනය සහ මුදල් කළමනාකරණයේ වර්ධනය වීම අනුව සීඝ්‍රයෙන් පරිණාමය වී ඇත. නිදහස ලබාගැනීමෙන් පසු මුල් කාලයේ දී සිදු කරන ලද නිකුත්කිරීම්, රු. 1/-, රු. 2/-, රු. 5/-, රු. 10/-, රු. 50/- සහ රු. 100/- වැනි අඩු මුහුණත වටිනාකම්වලින් සමන්විත විය. එම කාලයේ මිල දී ගැනීමේ ශක්තිය පිළිබිඹු කරමින් ඉන්පසු දශකවල දී ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනයට අනුරූපව මුහුණත වටිනාකම් ක්‍රමයෙන් ඉහළ දමමින් 1979 දී රු. 20/- නෝට්ටුව හඳුන්වා දෙන ලද අතර 1981 දී රු. 500/- සහ රු. 1000/- නෝට්ටු ද, 1998 දී රු. 200/- නෝට්ටුව ද හඳුන්වා දෙන ලදි. ඉහළ වටිනාකම් සහිත ගනුදෙනු සඳහා පහසුකම් සලසමින් 2000 වර්ෂයෙන් අනතුරු ව රු. 2000/- හා රු. 5000/- ආදී ලෙස ඉහළ වටිනාකමින් යුතු මුදල් නෝට්ටු නිකුත් කරන ලදි.

වර්තමාන බැංකු නෝට්ටු කාණ්ඩය වන එකොළොස්වන කාණ්ඩය 2011 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද අතර එය රු. 20/- සිට රු. 5000/- දක්වා සම්පූර්ණ මුහුණත වටිනාකම් පරාසයක් ආවරණය කරයි. ව්‍යාජ මුදල් නෝට්ටු නිෂ්පාදනය වැළැක්වීම සඳහා වැඩිදියුණු කළ ආරක්ෂණ සලකුණුවලින් සමන්විත මෙම නෝට්ටු මාලාව, වර්ධනය වන ආර්ථිකයක වැඩි වටිනාකම් ගනුදෙනු අවශ්‍යතා සපුරාලීමට සහාය වේ. මෙම පරිණාමීය ව්‍යුහය මඟින් ආර්ථික යථාර්ථයන්, තාක්ෂණික වෙනස්වීම් සහ මහජන භාවිත රටාවන්ට අනුකූල ව මුදල් කළමනාකරණ පද්ධතිය නිරන්තරයෙන් අනුවර්තනය කරමින් පවත්වාගෙන යාම සඳහා මහ බැංකුව විසින් ගන්නා ලද අඛණ්ඩ ප්‍රයත්නයන් පිළිබිඹු කරයි.

එමෙන් ම කාසි නිකුත් කිරීම ද මුහුණත වටිනාකම්, ප්‍රමාණයන් සහ ලෝහ සංයුතියේ වෙනස්කම් හරහා කල්පැවැත්ම, භාවිතයේ පහසුව සහ පිරිවැය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් විකාශනය වී ඇත. 2017 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද නවතම සංසරණ කාසි කාණ්ඩය මුහුණත වටිනාකම් හතරකින් සමන්විත වන අතර ඒ සියල්ලම මළ නොබැඳෙන වානේ භාවිතයෙන් නිෂ්පාදනය කර ඇත.

### මුදල් සත්‍යාපනය, ගණන් කිරීම සහ වර්ග කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීම

මුදල් මෙහෙයුම් කාර්යන්හි ක්‍රමික විකාශයට ප්‍රතිචාර වශයෙන් මුදල් හැසිරවීමේ ක්‍රියාවලීන් ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූල ව ශ්‍රමය මූලික ක්‍රමයේ සිට තාක්ෂණය මත පදනම් වූ මෙහෙයුම් වෙත සංක්‍රමණය වී ඇත. 1992 දී ප්‍රථම වරට හඳුන්වා දුන් අධිවේගී මුදල් නෝට්ටු සත්‍යාපනය, ගණන් කිරීම සහ වර්ග කිරීමේ පද්ධති මඟින් සහ ඉන් අනතුරුව හඳුන්වා දෙන ලද වඩාත් වැඩිදියුණු කළ මුදල් නෝට්ටු සැකසුම් පද්ධති මඟින් අතින් ගණන් කිරීම, වර්ග කිරීම, සත්‍යාපනය සහ බැහැර කිරීමේ ක්‍රියාවලීන් ක්‍රමයෙන් ප්‍රතිස්ථාපනය කරන ලදි. මෙම පද්ධති මඟින් මුදල් නෝට්ටු වල යෝග්‍යතාව අනුව වර්ග කිරීම, සත්‍යාපනය, ඇසුරුම් කිරීම, හැකිලීමේ එතුම් ක්‍රියාවලිය (Shrink Wrapping), ස්වයංක්‍රීය ගිණුම්කරණය සහ සම්පීඩක ක්‍රමවේදය හරහා ආරක්ෂිතව බැහැර කිරීම ආදිය සඳහා පහසුකම් සපයයි. දැනට භාවිතයේ පවතින මුදල් නෝට්ටු සැකසුම් යන්ත්‍ර 2013 දී මෙහෙයුම්වලට හඳුන්වා දෙන ලදි.



යන්ත්‍ර මඟින් සැකසිය නොහැකි හානි වූ මුදල් නෝට්ටු අතින් හසුරුවා දැඩි අධීක්ෂණ පාලනයන් යටතේ පාලිත කැබලි කිරීමේ පද්ධති භාවිතයෙන් බැහැර කරනු ලැබේ. මෙම වැඩිදියුණු කිරීම් හේතුවෙන් ඉහළ ස්වයංක්‍රීය, කාර්යක්ෂම සහ ආරක්ෂිත මෙහෙයුම් රාමුවක් ඇති කිරීමට මෙන්ම අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම, මෙහෙයුම් අවදානම අඩු කිරීම සහ මුදලේ ජීවන චක්‍රය පුරා සේවා සැපයීම ශක්තිමත් කිරීම සිදු කර ඇත.

### සමරු මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීම.

1998 අංක 6 දරන මුදල් නීති පනත (සංශෝධනය) මඟින් හඳුන්වාදුන් 52 A වගන්තිය අනුව, මහ බැංකුවට සමරු මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමේ සහ ඒවා මුහුණත් වටිනාකමට වඩා ඉහළ මිලකට විකිණීමේ පැහැදිලි බලතල ලබා දී ඇත. මෙම ප්‍රතිපාදන 1998 පෙබරවාරි 4 සිට ක්‍රියාත්මක වූ අතර, එම දිනට පෙර නිකුත් වූ හෝ විකිණූ සමරු මුදල් නෝට්ටුවක් හෝ කාසියක් නීතියට අනුකූලව නිකුත් කළ හෝ විකිණූ බවට පිළිගැනේ.

1957 දී නිකුත් කරන ලද පළමු සමරු කාසියේ සිට, මහ බැංකුව විසින් මේ දක්වා සමරු කාසි 71 ක් සහ සමරු නෝට්ටු 5 ක් ඇතුළුව සමරු මුදල් 76 ක් නිකුත් කර ඇත. මෙම නිකුතු වලංගු මුදල් වුවද, ප්‍රධාන වශයෙන් නාණක විද්‍යාව, අධ්‍යාපනික සහ එකතු කිරීම යනාදී අරමුණු සඳහා භාවිතා කෙරේ.

### ව්‍යවහාර මුදල් කෞතුකාගාරය

1982 දී ප්‍රථම වරට පිහිටුවන ලදුව, කාලයත් සමඟ පුළුල් කෙරුණු ව්‍යවහාර මුදල් කෞතුකාගාරය , තවදුරටත් මහජන දැනුවත් කිරීමේ කටයුතු සඳහා සහාය සපයනු ලබයි. 2011 වර්ෂයේදී විවෘත කරන ලද සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ලේ පිහිටුවා ඇති නවීන ආර්ථික ඉතිහාස කෞතුකාගාරය හරහා, මුදල් පරිණාමය, ආරක්ෂණ සලකුණු සහ මහ බැංකුවේ කාර්යභාරය පිළිබඳ අන්තර්ක්‍රියාකාරී ප්‍රදර්ශන සහ අධ්‍යාපනික අන්තර්ගතයන් සපයන අතර, එය මහජන සම්බන්ධතා සහ මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන මාධ්‍යයක් ලෙස භාවිතා කෙරේ.

### ව්‍යවහාර මුදල් මෙහෙයුම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

වැඩිදියුණු වන මෙහෙයුම් අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් සහ මධ්‍ය කාලීන මෙහෙයුම් සීමාවන් ඉලක්ක කරගත් මුදල් මෙහෙයුම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය මඟින් මෙහෙයුම් ධාරිතාව වැඩිදියුණු කරන අතරතුර මෙහෙයුම් ප්‍රවාහයන් විධිමත් කිරීම, සේවක මැදිහත්වීම අවම කිරීම, ආරක්ෂාව සහ ආරක්ෂණ ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සහ මහ බැංකුවේ මුදල් කළමනාකරණ මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

### අනාගතයට සූදානම් වූ මුදල් කළමනාකරණ පද්ධතියක් කරා

වසර 75ක ගමන් මඟ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථික හා මෙහෙයුම් පීඩන පවතින කාලවල දී පවා ප්‍රතිරෝධශීලීත්වය, විශ්වාසනීයත්වය සහ මහජන විශ්වාසය සහතික කිරීම සඳහා ජාතියේ මුදල් පද්ධතිය අඛණ්ඩ ව ශක්තිමත් කර ඇත. දශක ගණනාවක අත්දැකීම් උපයෝගී කරගනිමින්, බැංකුව ශක්තිමත් ව්‍යාපාර අඛණ්ඩතා විධිවිධාන, ආරක්ෂිත ගබඩා යටිතල පහසුකම් හරහා රට පුරා මුදල් සඳහා අඛණ්ඩ මහජන ප්‍රවේශය සහතික කරමින් කාර්යක්ෂම මුදල් බෙදාහැරීමේ රාමු ගොඩනඟා ඇත.

හදිසි තත්ත්ව සැලසුම්කරණය, මෙහෙයුම් නම්‍යශීලීභාවය සහ නවීන යටිතල පහසුකම්වල අඛණ්ඩ වැඩිදියුණු කිරීම් මඟින් සියලු තත්ත්වයන් යටතේ ජාතික මුදලේ ගුණාත්මකභාවය, අඛණ්ඩතාව සහ විශ්වසනීයත්වය ආරක්ෂා කිරීම සඳහා මහ බැංකුවේ කැපවීම ප්‍රකාශ කරයි.

ගෙවීම් ක්ෂේත්‍රය අඛණ්ඩ ව විකාශය වන අතර ම මුදල් තවදුරටත් ආර්ථිකයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස පවතී. ඉදිරියේ දි මුදල් කළමනාකරණයේ අනාගතය වඩාත් ස්වයංක්‍රීය, දත්ත මත පදනම් වූ ඉල්ලුම් පුරෝකථනය, වැඩිදියුණු කළ ආරක්ෂණ සලකුණු සහ තිරසාර භාවිතයන් මඟින් හැඩගැසෙනු ඇත. වසර 75ක ආයතනික දැනුම සහ මහජන සේවය මත ගොඩනැගෙමින් ඉදිරි පරම්පරාවන් සඳහා ආර්ථික ස්ථාවරත්වය සහ සෞභාග්‍යයට දායකවන, ආරක්ෂිත, ප්‍රතිරෝධශීලී සහ විශ්වාසනීය හුවමාරු මාධ්‍යයක් ලෙස මුදල් අඛණ්ඩ ව ක්‍රියාත්මක වන බව සහතික කිරීමට මහ බැංකුව කැප වී සිටී.



# ජාත්‍යන්තර කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුව ගෝලීය මූල්‍ය හා ආර්ථික කටයුතු සම්බන්ධයෙන් අප රට නියෝජනය කිරීමේ දී නිරතුරුවම ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව බහුපාර්ශ්වික ආයතන, ද්විපාර්ශ්වික පාර්ශ්වකරුවන්, වෙනත් රටවල මහ බැංකු, ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන සහ අනෙකුත් විදේශීය පාර්ශ්වකරුවන් සමඟ 2025 වසර තුළ දී ද උපායමාර්ගික සබඳතා ශක්තිමත් ව පවත්වා ගෙන ගියේ ය. ජාත්‍යන්තර සැසි, සාමූහික ව සිදු කරන නවෝත්පාදන කටයුතු සහ දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන්වලට සහභාගී වීම තුළින් ශ්‍රී මහ බැංකුව විසින් ප්‍රතිපත්ති සම්බන්ධීකරණයට, තාක්ෂණික සහයෝගීතාවට සහ කුසලතා වර්ධනයට අවශ්‍ය පියවර ගන්නා ලදි.

## බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ආයතන සමඟ සම්බන්ධ වීම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාවේ විස්තීර්ණ අරමුදල් පහසුකම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2025 දී ද සක්‍රිය ව දායක වූයේ ය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී රජය සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගත් ශ්‍රී ලංකා මහ බැංකුව එකඟ වූ පරිදි ප්‍රතිසංස්කරණ සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග නිසි අයුරින් ක්‍රියාත්මක කරන බව තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ පැවති ප්‍රතිපත්ති උපදේශන, වැඩසටහන් සමාලෝචන සැසි සහ තාක්ෂණික සාකච්ඡා වට සඳහා සහභාගී විය.

2025 දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ චීන මහ බැංකුව අතර වන ද්විපාර්ශ්වික මුදල් හුවමාරු ගිවිසුම දීර්ඝ කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉන්දියානු සංචිත බැංකුව සමඟ වන විශේෂිත හුවමාරු ගිවිසුමේ දෙවන දිගුව අත්සන් කරන ලද අතර එහි දී අන්‍යෝන්‍ය වශයෙන් වැදගත්වන කරුණු රැසක් පිළිබඳ ව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදි.

මූල්‍ය සාක්ෂරතාව සහ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම, මූල්‍ය අංශයේ ආරක්ෂක ජාලය සහ නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම ඇතුළු ව මූල්‍ය පද්ධතියේ ශක්තිමත් බව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2025 දී ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ ද කටයුතු කළේ ය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDPA) සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) යන ආයතන මූල්‍ය සාක්ෂරතා විෂය මාලාව පිළියෙල කිරීමට හා හඳුන්වා දීමට අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍ය සහයෝගය ලබා දුන් හ. මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ සන්ධානය (AFI) විසින් 2025 වසරේ දී මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය (NFIS) ක්‍රියාත්මක කිරීම තුළින් අප රට තුළ ඇති වූ බලපෑම තක්සේරු කිරීමට මෙන්ම ජාතික උපායමාර්ගයේ ඊ ළඟ අදියර පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය හා තාක්ෂණික සහාය ලබා දෙන ලදි. එමෙන් ම මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ සන්ධානය විසින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ප්‍රවර්ධනය කරන මූල්‍ය තානාපති ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසරේ දී නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි. ඊට අමතර ව ලෝක බැංකුවේ සහයෝගය සහිත ව ක්‍රියාත්මක වන මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (FIaIaKaMa) යටතේ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය (VaBaIa) සතු ආයතනික කුසලතා සහ පාලන රාමුව ශක්තිමත් කර ඇත. එමෙන් ම කාර්ය සාධනය මත පදනම් ව ලෝක බැංකුව විසින් මූල්‍ය ආධාර ද සපයා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) 2026 දී පැවැත්වීමට නියමිත ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ (APG) 3 වන අන්‍යෝන්‍ය ඇගයීම සඳහා පූර්ව සූදානම් වීමේ කටයුතු උදෙසා ජාත්‍යන්තර සංවිධාන සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව 2025 වර්ෂයේ දී කටයුතු කළේ ය.

මුදල් ප්‍රතිපත්තිය, මූල්‍ය අංශයේ ස්ථායීතාව සහ ප්‍රතිසංස්කරණ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව වැඩසටහන්, සාර්ව මූල්‍ය අධීක්ෂණය සහ තිරසාර මූල්‍ය වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, [(IFC), UNDP, SAARCFINANCE], ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය, ප්‍රංශයේ මහ බැංකුව වැනි ජාත්‍යන්තර ආයතන සමඟ ප්‍රතිපත්තිමය සාකච්ඡා සිදු කළ රැස්වීම් රැසකට මහ බැංකුව සහභාගී විය. ඊට අමතර ව දේශීය හා විදේශීය පාර්ශ්වකරුවන් අතර සිදු කරන ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡාවල දී හා ආයතනික නායකත්වය ඉහළ නැංවීමේ වැඩසටහන්වල දී ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ඩිජිටල්කරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ඉන්දියානු විද්වතුන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත් වූයේ ය.

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විකල්ප අධ්‍යක්ෂක

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර ආර්ථික කටයුතු සම්බන්ධයෙන් මහ බැංකු නිලධාරීන්ගේ විශේෂඥතාව විදහා දක්වමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විකල්ප අධ්‍යක්ෂවරයා ලෙස මහ බැංකු නිලධාරියෙක් අඛණ්ඩ ව සේවය කරයි. මෙම විකල්ප අධ්‍යක්ෂකවරයා ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංග්ලාදේශය සහ භූතානය යන රටවල් ගෝලීය වශයෙන් නියෝජනය කරයි.

## කුසලතා වර්ධන වැඩසටහන්

කුසලතා වර්ධන සහ දැනුම බෙදා ගැනීම ද ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර ක්‍රියාකාරකම්වල වැදගත් අංශයන් ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි දකුණු ආසියානු කලාපීය පුහුණු සහ තාක්ෂණික සහාය මධ්‍යස්ථානය, ජර්මානු මහ බැංකුව, අග්නිදිග ආසියානු මධ්‍යම බැංකු වැනි ආයතන විසින් සංවිධානය කළ පුහුණු වැඩසටහන්, තාක්ෂණික සහාය වැඩසටහන්, දැනුම බෙදා ගැනීම, ජාත්‍යන්තර සැසි සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ යනාදිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරිහු සහභාගී වූහ. මෙවැනි වැඩසහන්වල දී ආයෝජන හා ප්‍රතිපත්තිමය ආකෘති හඳුන්වා දීමට අවශ්‍ය විශ්ලේෂණ හැකියාවන් තව දුරටත් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා ගන්නා ලදි.

ශ්‍රී ලංකා මහ බැංකුව තම දැනුම සහ අත්දැකීම් වෙනත් මහ බැංකු සමඟ ද බෙදා ගත්තේ ය. ෆීජි සංචිත බැංකුව විසින් පවත්වන ලද දැනුම හුවමාරු වැඩසටහනක දී පාරිභෝගික ආරක්ෂාව, තිරසාර මූල්‍ය, ඩිජිටල් මූල්‍ය සේවා සහ වෙළෙඳපොළ අධීක්ෂණය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම බෙදා ගත්තේ ය. නේපාල රස්ට්‍රා බැංකුවේ නිලධාරීන් සඳහා පාලනය, අවදානම් පාදක විගණනය, තොරතුරු පද්ධති විගණනය සහ ගෝලීය අභ්‍යන්තර විගණන ප්‍රමිති පිළිබඳ පුහුණු සැසි පවත්වන ලදි. "අර්බුදකාරී තත්ත්වයන් සහ ඉන් මිදී යථා තත්ත්වයට පත් වන අතරතුර ශේෂ පත්‍ර අවදානම කළමනාකරණය කිරීම - අවදානම් දර්ශක ප්‍රවේශයක්" යන මාතෘකාව යටතේ සම්පත්දායකයෙකු ලෙස 18 වන වාර්ෂික මහ බැංකු අවදානම් කළමනාකරුවන්ගේ සංසදයට ද මහ බැංකුව සහභාගී වූයේ ය.

## ණය ශ්‍රේණිගත කිරීම් සහ නියාමන ගිවිසුම්

ශ්‍රී ලංකාවේ මූල්‍ය විශ්වසනීයත්වය පවත්වා ගැනීම සඳහා 2025 වසර පුරාම ෆිච්, මූඩීස් සහ ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (එස් ඇන්ඩ් පී) වැනි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩ ව සහයෝගයෙන් කටයුතු කළේ ය.

## ජාත්‍යන්තර කටයුතු සඳහා අධිපතිතුමාගේ සහභාගීත්වය - 2025

බහුපාර්ශ්වික ආයතන සමඟ සබඳතා ශක්තිමත් කිරීම, මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම, මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩනැගීම සඳහා සහාය දැක්වීම උදෙසා 2025 වසරේ දී අධිපතිතුමා සහභාගි වූ ජාත්‍යන්තර කටයුතුවල දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු විය. මෙම ජාත්‍යන්තර කටයුතු මඟින් ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ වඩාත් ගැඹුරු සංවාදවලට එළඹීමට, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රතිසංස්කරණ වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීමට මෙන්ම ආර්ථික සංවර්ධනයේ හවුල්කරුවන්, නියාමකයින් සහ කලාපීය පාර්ශ්වකරුවන් සමඟ පුළුල් සහයෝගීතාවකින් යුතුව කටයුතු කිරීමට අවස්ථාව සැලසුණි.

### බහුපාර්ශ්වික ආයතන සමඟ කටයුතු කිරීම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) සහ ලෝක බැංකුව සමඟ වන සහයෝගීතාව ශක්තිමත් කර ගැනීම මෙම වසරේ ප්‍රධාන අරමුණක් විය. පෙබරවාරි මාසයේ දී ටෝකියෝ නුවර පැවති ජා.මූ. අරමුදල - ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිත ආයතනය (IMF-JICA) විසින් සංවිධානය කරන ලද කලාපීය සමුළුවට අධිපතිතුමා සහභාගී වූ අතර නැඟී එන සහ වර්ධනය වෙමින් පවතින ආසියානු කලාපයේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයින් මීළඟට කුමක් කළ යුතු ද (what is Next for Economic Policy Makers in Emerging and Frontier Asia) යන තේමාව යටතේ වූ සම්පත් දායකයෙක් ලෙස කටයුතු කළේ ය. අනතුරු ව අන්‍යෝන්‍ය සහයෝගීතාව හරහා කලාපීය ආර්ථිකයන්හි ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කර ගැනීමේ අරමුණ ඇති ව මාර්තු මාසයේ දී ටෝකියෝ නුවර පැවති ජා.මූ. අරමුදලේ ඉහළ පෙළේ සාකච්ඡාවකට ද අධිපතිතුමා සහභාගී වූ අතර, "A Reinforced GFSN and the IMF's Role at Its Core" යන සැසිය සඳහා සම්පත් දායකත්වය ලබා දුන්නේ ය.

තව ද ජා.මූ. අරමුදලේ සහ ලෝක බැංකුවේ අප්‍රේල් මාසයේ දී පැවති රැස්වීම්වලට සහ ඔක්තෝබර් මාසයේ දී පැවති වාර්ෂික රැස්වීම්වලට සහභාගී වීම මඟින් ජා.මූ අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ අත්කර ගෙන ඇති ප්‍රගතිය සමාලෝචනය කිරීමට, ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා පිළිබඳ සාකච්ඡා කිරීමට, තාක්ෂණික සහාය සහ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට මෙන් ම සංවර්ධන හවුල්කරුවන්, ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ අයෝජක කණ්ඩායම් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීමට අවස්ථාව සැලසිණි.

### කලාපීය සහයෝගීතාව සහ දැනුම හුවමාරු කරගැනීම

නේපාල මහ බැංකුව සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සන්ධානය විසින් සංවිධානය කරනු ලැබූ 6 වන දකුණු ආසියානු නායකයින්ගේ වටමේස සාකච්ඡාවට සහභාගී වූ අධිපතිතුමා එහි දී කලාපීය ප්‍රතිපත්ති සාකච්ඡාවලට සක්‍රීය ව දායක වූයේ ය. ඩිජිටල් ගෙවීම් සම්බන්ධයෙන් පවතින සයිබර් අවදානම් කළමනාකරණය, මූල්‍ය අවදානමට ලක් විය හැකි කාණ්ඩවල පාරිභෝගික ආරක්ෂණය ඉහළ නැංවීම සහ දකුණු ආසියාව පුරා ඩිජිටල් මූල්‍ය යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා වන හැකියාව ශක්තිමත් කිරීමට මෙම සාකච්ඡා ඉවහල් විය.

නැමීබියාවේ පැවති මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සන්ධානයේ ගෝලීය ප්‍රතිපත්ති සමුළුව සහ නව දිල්ලි නුවර පැවති කෞටිල්‍ය අර්ථික සමුළුව සඳහා අධිපතිතුමාගේ සහභාගීත්වය, කලාපීය දැනුම හුවමාරු කර ගැනීම සහ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ ඇති කැපවීම තවදුරටත් තහවුරු කරන ලදි.

### මූල්‍ය ස්ථායීතාව සහ නියාමනය සඳහා වූ සහභාගීත්වය

මූල්‍ය පද්ධති ස්ථායීතාව තහවුරු කිරීම ඉහළ ප්‍රමුඛතාවක් ලෙස අඛණ්ඩ ව පැවතුණි. ඒ අනුව අධිපතිතුමා මැඩ්රිඩ් නුවර පැවති මූල්‍ය ස්ථායීතා මණ්ඩලයේ මූලික රැස්වීම්වලට සහ සම්මන්ත්‍රණයට සහභාගී වීම ඔස්සේ මූල්‍ය ස්ථායීතාවට එල්ලවන ගෝලීය අවදානම් සහ ඒවා අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳ ව සාකච්ඡා කිරීමට අවස්ථාව හිමි විය. අධිපතිතුමාගේ මෙම සහභාගීවීම ශ්‍රී ලංකාවේ මූල්‍ය කටයුතු ගෝලීය නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම ශක්තිමත් කිරීමට සහ මූල්‍ය පද්ධතිය පුරා ඇති විය හැකි අවදානම් නිරීක්ෂණය වැඩිදියුණු කිරීමට උපකාරි විය.

### මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන දායකත්වය පුළුල් කිරීම

ටෝකියෝ නුවර පැවති ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ වාර්ෂික සමුළුව සඳහා අධිපතිතුමාගේ සහභාගීත්වය 2025 වසරේ සුවිශේෂී අවස්ථාවකි. ඉහළ නිලධාරි මට්ටමේ ද්විපාර්ශ්වික සාකච්ඡා වට කිහිපයක් මඟින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ප්‍රමිතීන්ට ශ්‍රී ලංකාවේ ඇති කැපවීම යළි තහවුරු කරන ලද අතර 2026 මාර්තු මස ආරම්භ වීමට නියමිත අන්‍යෝන්‍ය ඇගැයීම සඳහා සූදානම් වීම පිළිබඳව අවධානය යොමු කෙරුණි.

මෙම සබඳතා මඟින් ඉලක්කගත තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා වැඩසටහන් කිහිපයකට ප්‍රවේශය ලබා ගැනීමටත් ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ ලේකම් කාර්යාලය, ආධාර සපයන්නන් සහ තාක්ෂණික සහාය සපයන්නන් සමඟ සහයෝගීතාව වැඩිදියුණු කර ගැනීමටත් පහසුකම් සැලසීය.

### වෙළෙඳ හා ආයෝජක සබඳතා

ශ්‍රී ලංකාවේ විදේශීය අංශය සහ ආයෝජන පරිසරය සඳහා සහාය වනු පිණිස අධිපතිතුමා අනෙකුත් රජයේ නිලධාරින් එක් ව එක්සත් ජනපද වෙළෙඳ නියෝජිතයන් සමඟ සම්බන්ධ වූ අතර එය තීරු බදු අඩු කිරීම පිළිබඳ පවතින සාකච්ඡා අඛණ්ඩ ව ඉදිරියට ගෙන යෑමට දායක විය.

අගෝස්තු මාසයේ දී කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මඟින් සංවිධානය කරන ලද සිංගප්පූරුවේ පැවතස "Invest Sri Lanka" ආයෝජන සමුළුව සඳහා අධිපතිතුමා සහභාගී විය. ජාත්‍යන්තර ආයෝජකයන් අතර ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම, වෙළෙඳපොළ විශ්වාසය ඉහළ නැංවීම සහ ආයෝජන සබඳතා සඳහා සහාය වීමට මෙම සමුළුව මූලික වශයෙන් උපකාරි විය.

මෙම සියලුම ජාත්‍යන්තර කටයුතු වල දී අධිපතිතුමාගේ සහභාගී වීම ප්‍රධාන ගෝලීය හා කලාපීය පාර්ශ්වකරුවන් සමඟ සබඳතා ඵලදායී ලෙස ශක්තිමත් කිරීම, ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතා වැඩිදියුණු කිරීම, සාර්වආර්ථික ස්ථායීතා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සහාය වීම සහ ආයෝජක සහ සංවර්ධන හවුල්කරුවන් අතර විශ්වාසය වැඩිදියුණු කිරීම සඳහා දායක විය. මෙම සබඳතා විදේශීය ඇගැයීම් සඳහා සූදානම වැඩිදියුණු කිරීමට, මූල්‍ය ස්ථායීතා රාමු ශක්තිමත් කිරීමට සහ මූල්‍ය අංශයේ මනා ඔරොත්තු දීමේ හැකියාව සහ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමට ද සුවිශේෂී ලෙස දායක විය.

### "A" ශ්‍රේණියේ මහ බැංකු අධිපතිවරුන් සඳහා වන සම්මානය - 2025

සිය විශිෂ්ට නායකත්වය සහ ආර්ථික කළමනාකරණය සඳහා වූ සුවිශේෂී දායකත්වය අගයමින් "Global Finance" සඟරාව මඟින් පිරිනමනු ලබන "A" ශ්‍රේණියේ මහ බැංකු අධිපතිවරුන් සඳහා වන සම්මානයෙන් මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා 2025 වසරේදී ද පිදුම් ලැබීය. මෙම සම්මානය ලබා ගත් ප්‍රතිඵල වෙනුවෙන් පමණක් නොව ඒ ප්‍රතිඵල ලබාගැනීම සඳහා පාදක වූ ස්වාධීනත්වය, විනය සහ උපායමාර්ගික දැක්ම වෙනුවෙන් ද වූ ගෞරව ප්‍රණාමයකි.

# වෙනත් පවරන ලද වගකීම්

## විදේශ විනිමය ගනුදෙනු නියාමනය සහ ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා මහ බැංකුව, රජයේ නියෝජිතයා වශයෙන් රට තුළ විදේශ විනිමය ගනුදෙනු නියාමනය කිරීම සහ ප්‍රවර්ධනය වෙනුවෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත බලාත්මක කිරීමේ වගකීම දරනු ලබයි.

මේ යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන වශයෙන් පහත සඳහන් කාර්යයන් ඉටු කරයි:

- පවත්නා ප්‍රතිපත්තිවල ඵලදායීතාව සමාලෝචනය කිරීම සහ විදේශ විනිමය වෙළෙඳපොළේ වර්ධනයන්ට අනුකූල ව නව ප්‍රතිපත්තිවල අවශ්‍යතාව හඳුනා ගැනීම.
- විදේශ විනිමය පනත යටතේ රෙගුලාසි සහ නියෝග නිකුත් කිරීමට අදාළ ව මුදල් අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත විධානයන් නිකුත් කිරීම.
- විදේශ විනිමය ගනුදෙනු සඳහා බලයලත් මුදල් හුවමාරු කරන්නන්ට සහ අනෙකුත් ආයතනවලට අවසර ලබා දීම.
- පොදු අවසර යටතේ ආවරණය නොවන විදේශ විනිමය ගනුදෙනු සඳහා විශේෂ අනුමැති ලබා දීම.
- විදේශ විනිමය පනතට අනුකූල වනවා දැයි නිරීක්ෂණය කිරීම සහ උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් අදාළ පියවර ගැනීම.
- මහ බැංකු පනත යටතේ නිකුත් කරන ලද රීතිවලට අනුකූල ව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීම සහ අවසරලත් ගනුදෙනු සඳහා භාවිත කිරීමෙන් පසුව ඉතිරි වන ශේෂය ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම නියාමනය කිරීම.

### අපනයන ඉපැයීම් මෙරටට ගෙන්වා ගැනීම

2023 අංක 16 දරන මහ බැංකු පනත යටතේ නිකුත් කරන ලද රීතිවලට අනුකූල ව අපනයන ආදායම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව අධීක්ෂණය කරනු ලබයි. 2025 වසර තුළ මෙරටට ගෙන්වන ලද මුළු අපනයන ආදායම සහ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලද ප්‍රමාණය පිළිවෙළින් එක්සත් ජනපද ඩොලර් මිලියන 17,103ක් සහ එක්සත් ජනපද ඩොලර් මිලියන 5,207ක් විය.

### අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග

පවත්නා විදේශ විනිමය නියාමන රාමුවට අනුකූල වීම සහතික කිරීම සඳහා පෙර තීරණය කරන ලද සැලසුමකට අනුව වසර පුරා බලයලත් වෙළෙඳුන් සහ බලයලත් මුදල් හුවමාරු කරන්නන් සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු සිදු කරන ලදි. ඒ අනුව බලයලත් වෙළෙඳුන් සම්බන්ධයෙන් පරීක්ෂණ 16ක් ද, බලයලත් මුදල් හුවමාරු කරන්නන් සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණ 24ක් ද සිදු කර නියාමන ක්‍රියාමාර්ග ගනු ලැබීය. තව ද අපනයන ඉපැයීම් මෙරටට ගෙන්වා ගැනීමේ සහ පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවට අපනයනකරුවන් දක්වන අනුකූලතාව තවදුරටත් ශක්තිමත් කරමින් අනනුකූල අපනයනකරුවන් 201 දෙනෙකුට එරෙහි ව නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදි.

තව ද 2025 වසරේ දී පෙර ගෙවීම් පදනම මත ගෙවීම් සිදු කර තවමත් භාණ්ඩ මෙරටට ආනයනය කර නොමැති අවස්ථා සම්බන්ධයෙන් නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදි. වසර තුළ දී විදේශ විනිමය නියාමන අවශ්‍යතා උල්ලංඝනය කළ ආයතන සහ පුද්ගලයින් සඳහා රුපියල් මිලියන 34 ක දඩ මුදලක් පනවන ලදි.

### විදේශ විනිමය බලපත්‍ර නිකුත් කිරීම සහ මහජන දැනුවත් කිරීම

සිය නියාමන උත්සාහයන් හි කොටසක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසරේ දී මුදල් හුවමාරු කරන්නන් 59 දෙනෙකුට ද (නව බලපත්‍රයක් ඇතුළු ව), බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා බලපත්‍ර 06ක් ද සහ හෝටල් සඳහා බලපත්‍ර 12ක් ද නිකුත් කරන ලදි. බැංකු පද්ධතියට විදේශ ව්‍යවහාර මුදල් තැන්පත් කිරීම සඳහා නියම කර ඇති අවම අවශ්‍යතාව සපුරාලමින් මෙම බලයලත් මුදල් හුවමාරු කරන්නන් 2025 වසරේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 171ක් වාණිජ බැංකුවල තැන්පත් කරන ලදි.

පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහ මහජන දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම සඳහා, මහ බැංකුව විදේශ විනිමය රෙගුලාසි, විදේශ විනිමය නියාමන රාමුව සහ මෙහෙයුම් කටයුතුවල අනුකූලතාව පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

### 2025 ප්‍රධාන ක්‍රියාකාරකම්

- ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් පිටතට ගලා යන විදේශ විනිමය සඳහා පනවා තිබූ නිශ්චිත සීමාවන් සහ බාධාවන් ලිහිල් කරමින්, විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නියෝග නිකුත් කරන ලදි. ඒ අතර:

  i. කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම්වලට ඔවුන්ගේ ව්‍යාපාර විදේශයන්හි ව්‍යාප්ත කිරීමේ අරමුණින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා විදේශයන්හි සංස්ථාපිත සමාගම්වල සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් 750,000ක් හෝ ඔවුන්ගේ ශුද්ධ වත්කම්වලින් 20%ක් යන දෙකෙන් වඩා අඩු අගය දක්වා අවසර ලබා දෙන ලදි.

  ii. ඉහත (i) හි සඳහන් කර ඇති සමාන කොන්දේසි යටතේ ලැයිස්තුගත නොකළ සමාගම් සඳහා එක්සත් ජනපද ඩොලර් 200,000ක උපරිමයකට යටත් ව ආයෝජනය කිරීමට අවසර ලබා දෙන ලදි.

  iii. විදේශ විනිමය උපයන ව්‍යවසායයන්ට සිය ව්‍යාපාර විදේශයන්හි ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීම සඳහා ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනුවල සීමාව එක්සත් ජනපද ඩොලර් 500,000 දක්වා වැඩි කරන ලදි.

  iv. නේවාසිකයන්ගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අවසර දී ඇති උපරිම සීමාව එක්සත් ජනපද ඩොලර් 25,000 දක්වා ඉහළ නංවන ලදි.

- බලයලත් මුදල් හුවමාරු කරන්නන් සඳහා පැවති විධාන සංශෝධනය කරමින් නව විධානයන් නිකුත් කරන ලදි. ඒ අනුව ඔවුන්ගේ බලපත්‍රයේ වලංගු කාල සීමාව වසර තුනක් දක්වා දීර්ඝ කිරීම, ඔවුන්ගේ අනුමත ව්‍යාපාර පරිශ්‍රය තුළ මුදල් හුවමාරු ව්‍යාපාර කටයුතුවල පමණක් නියැලිය යුතු බවට නියම කිරීම සහ බස්නාහිර පළාතෙන් පිටත සංචාරකයන් බහුල ව ගැවසෙන ප්‍රදේශවල මුදල් හුවමාරු ව්‍යාපාර දිරිමත් කිරීම අරමුණු කර එවැනි ආයතන සඳහා වූ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් හී වෙනස්කම් සිදු කරනු ලදි.

- තව ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාග්ධන ගනුදෙනු සඳහා විශේෂ අනුමැති 03ක් සහ අවසර 82ක් ලබා දී ඇති අතර, විදේශ ආයෝජන සහ සංක්‍රමණිකයන්ගේ ප්‍රේෂණ ආදිය සම්බන්ධයෙන් නිෂ්කාශන 929ක් වාණිජ බැංකුවලට නිකුත් කරන ලදි.

# ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය නියාමනය සහ ප්‍රවර්ධනය කිරීම



**ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය නියාමනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුව සතු වේ. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත (විදේශ විනිමය පනත) යටතේ අදාළ පාර්ශ්වයන්ගේ ජංගම[1] සහ ප්‍රාග්ධන[2] ගනුදෙනුවලට පහසුකම් සපයමින් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය නියාමනය කිරීමේ දී ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා ලෙස විදේශ විනිමය දෙපාර්තමේන්තුව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.**

### ශ්‍රී ලංකාවේ විදේශ විනිමය නියාමන රාමුවේ විකාශනය

පසුගිය දශක හතක කාලය තුළ ශ්‍රී ලංකාවේ විදේශ විනිමය නියාමන රාමුව සැලකිය යුතු පරිවර්තනයකට ලක් ව තිබේ. 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ මහ බැංකුව පිහිටුවීමත් සමඟ මෙහි මූලික පදනම සකස් විය. පසුව 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ පුළුල් නෛතික ව්‍යුහයක් බිහි වූ අතර එමඟින් රටේ සීමිත විදේශ විනිමය සම්පත් කළමනාකරණය කිරීම සඳහා පාලනය මත පදනම් වූ ක්‍රමවේදයක් ඇති විය.

[1] ජංගම ගනුදෙනු - විදේශ වෙළෙඳාම් සහ සේවා සම්බන්ධ ගෙවීම්, පොලී ගෙවීම් සහ ආයෝජන ආදායම්, ණය ආපසු ගෙවීම් සහ ජීවන වියදම් ප්‍රේෂණ වැනි එදිනෙදා සිදු කරන ජාත්‍යන්තර ගෙවීම් මෙයට ඇතුළත් වේ.

[2] ප්‍රාග්ධන ගනුදෙනු - ආයෝජන හෝ වත්කම් හුවමාරු කිරීම්වලට අදාළ දේශසීමා හරහා සිදුවන විදේශ විනිමය ගනුදෙනු මෙයට ඇතුළත් වේ. (උදාහරණ: අනේවාසික පුද්ගලයින් විසින් ශ්‍රී ලංකාවේ සිදු කරනු ලබන ආයෝජන, නේවාසික පුද්ගලයින් විසින් සිදු කරනු ලබන විදෙස් ආයෝජන සහ සංක්‍රමණික අරමුදල් හුවමාරු කිරීම්)

[3] ප්‍රධාන වශයෙන් 1960 සිට 1977 දක්වා කාලය තුළ.

### විවෘත ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ආංශික ලිහිල්කරණය

1977 වසරේ දී ආරම්භ කරන ලද ලිහිල්කරණ ප්‍රතිසංස්කරණ මඟින් මූලික ව්‍යුහාත්මක වෙනසක් ඇති විය. 1994 වසරේ දී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ VIII වැනි වගන්තියේ නෛතික ප්‍රතිපාදන පිළිගනිමින් ජංගම ගනුදෙනු සඳහා පැවතී සීමාවන් මුළුමනින් ම ලිහිල් කිරීමට කටයුතු කරන ලදි. ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළ අරමුදල් රට තුළට ගලා ඒම් ක්‍රමයෙන් ලිහිල් කළ ද ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළ අරමුදල් රටින් පිටතට ගලා යාම් තවදුරටත් සැලකිය යුතු පාලනයන්ට සහ විශේෂ අනුමැතීන්ට යටත් විය.

### ශ්‍රී ලංකාවේ විදේශ විනිමය නියාමන රාමුවේ විකාශය



| 1953-1977 | 1977-1994 | 1990-2017 | 2017-2020 | 2020-2023 | 2023ට පසුව |
|---|---|---|---|---|---|
| පාලිත යුගය | ජංගම ගිණුම් ගනුදෙනු ක්‍රමයෙන් ලිහිල් කිරීම | විනිමය පාලන පනත යටතේ ප්‍රාග්ධන පාලනයන් ක්‍රමයෙන් ලිහිල් කිරීම | විදේශ විනිමය පනත යටතේ ප්‍රාග්ධන පාලනයන් අඛණ්ඩ ව ලිහිල් කිරීම | ප්‍රාග්ධන ගනුදෙනු මත පනවන ලද තාවකාලික සීමා කිරීම් | තාවකාලික සීමා අදියරෙන් අදියර ඉවත් කිරීම |

ශ්‍රී ලංකාවේ විදේශ විනිමය නියාමන ගමන් මඟ, දැඩි ලෙස පාලිත යුගයක සිට විදේශ විනිමය නියාමනය සහ ප්‍රවර්ධනය කිරීමේ ව්‍යුහාත්මක වෙනස පිළිබිඹු කරමින් වඩාත් ලිහිල් කරන ලද රාමුවක් කරා ගමන් කර ඇත.

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත දක්වා පරිවර්තනය වීම

2017 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශ විනිමය නියාමනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, පෙර පැවති විනිමය පාලන පනත අවලංගු කර විදේශ විනිමය පනත බලාත්මක කරන ලද අතර එය විදේශ විනිමය ප්‍රතිපත්තියේ විකාශයෙහි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේ ය.

විදේශ විනිමය පනත මඟින් හඳුන්වා දුන් ප්‍රධාන වෙනස්කම්වලට පහත දෑ ඇතුළත් විය:

- පූර්ණ ජංගම ගිණුම් පරිවර්තනය පිළිබඳ ව්‍යවස්ථාපිත වගකීම
- විදේශ විනිමය උපයන්නන්හට ඔවුන්ගේ සියලුම විදේශ විනිමය ඉපයීම්, ජංගම සහ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා භාවිත කිරීමට නිදහස ලබා දීම
- අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිත ව අවසර ලත් ප්‍රාග්ධන ගනුදෙනු කාණ්ඩ නියම කිරීම සඳහා නියෝග සහ නියම නිකුත් කිරීමට මුදල් අමාත්‍යවරයාට බලය ලබා දීම
- විනිමය පාලන පනත යටතේ අපරාධමය වැරදි ලෙස අර්ථදැක්වීම්වලට ප්‍රතිපක්ෂ ව විදේශ විනිමය පනත යටතේ සිදුවන සියලුම වැරදි, අනුකූලතා නොවීම් ලෙස සැලකීම
- පරිපාලනමය සාධාරණත්වය සහතික කිරීම සඳහා අභියාචනාධිකාරි බලය සහිත විමර්ශන මණ්ඩලයක් පිහිටුවීම
- ශ්‍රී ලංකාව තුළට හෝ ඉන් පිටතට විදේශ විනිමය ප්‍රේෂණය කිරීම මූල්‍ය ස්ථායීතාවට විභව තර්ජනයක් විය හැකි යැයි හඳුනා ගත් අවස්ථාවන්හි දී, මූල්‍ය ස්ථායීතාව සුරැකීම සඳහා විදේශ විනිමය ප්‍රේෂණ සීමා කිරීමට හෝ නියාමනය කිරීමට පියවර ගැනීමේ බලතල හඳුන්වා දීම.

ඒ අනුව විදේශ විනිමය පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ බලධාරියා ලෙස විදේශ විනිමය දෙපාර්තමේන්තුව රටේ ආර්ථික සමෘද්ධියට දායක වන්නා වූ කාර්යක්ෂ ම, ඵලදායී සහ විධිමත් ලෙස කළමනාකරණය කරන ලද විදේශ විනිමය වෙළෙඳපොළක සංවර්ධනයට පහසුකම් සැලසීමේ දැක්ම (vision) ඇති ව කටයුතු කරයි.

**විදේශ විනිමය නියාමනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම අරමුණින් 2017 වසරේ දී බලාත්මක කරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනත ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ප්‍රතිපත්ති විකාශයෙහි වැදගත් සන්ධිස්ථානයකි.**

විදේශ විනිමය පනත බලාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් සහ රාජකාරි:

- දත්ත මත පදනම් වූ විශ්ලේෂණයන්ගේ සහාය ඇති ව ප්‍රාග්ධන ගනුදෙනු අනුපිළිවෙළින් ලිහිල් කිරීම සඳහා ලිහිල් කළ යුතු ප්‍රාග්ධන වර්ගීකරණයන් පිළිබඳ ව රජයට නිර්දේශ ඉදිරිපත් කරයි.
- විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු (LBs) සහ බලයලත් මුදල් හුවමාරු කරන්නන් (AMCs) වෙත විධාන නිකුත් කිරීම
- විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීම සඳහා බලපත්‍රලාභී බැංකු, බලයලත් මුදල් හුවමාරු කරන්නන් සහ අනෙකුත් ආයතන වෙත අවසර ලබා දීම
- විදේශ විනිමය වාර්තා කිරීමේ පද්ධති හරහා විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කිරීම
- පූර්ව නිශ්චිත සැලසුමකට අනුව ස්ථානීය සහ ස්ථානීය නොවන පරීක්ෂණ හරහා විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණයක් සිදු කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී බලාත්මක කිරීමේ පියවර ගැනීම (මීට බලපත්‍ර අත්හිටුවීම හෝ අවලංගු කිරීම සහ මූල්‍ය දඩ පැනවීම ඇතුළත් වේ)
- මහජන තොරතුරු මත පදනම් ව අනවසර විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ විමර්ශන පැවැත්වීම සහ විදේශ විනිමය පනත යටතේ ක්‍රියාමාර්ග ගැනීම

## අර්බුද කළමනාකරණය සඳහා වූ විධිවිධාන

විදේශ විනිමය අර්බුදකාරී අවස්ථාවන්හි දී වහාම මැදිහත්වීම් සිදු කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් මෙවලම් විදේශ විනිමය පනත මඟින් සපයයි. මෑතක දී ඇති වූ විදේශ විනිමය අර්බුදය හමුවේ මෙය සනාථ විය. මතු වෙමින් පවතින දුෂ්කරතා කල්තියා හඳුනා ගනිමින්, රට යථා තත්ත්වයට පත් කිරීමේ ගමන් මඟට සහාය වෙමින් කාලෝචිත ලෙස ඵලදායී ප්‍රතිපත්තිමය පියවර හඳුන්වා දීමට විදේශ විනිමය දෙපාර්තමේන්තුව බලගන්වා ඇත. එවැනි පියවර කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රාග්ධන පිටතට ගලා යාම පාලනය කිරීම සඳහා ලිහිල් කර තිබූ ප්‍රාග්ධන ගනුදෙනු තාවකාලික ව අත්හිටුවමින් ප්‍රාග්ධන ගලා යාම කළමනාකරණය කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම.
- අපනයනකරුවන් විසින් ඔවුන්ගේ අපනයන ආදායම නියමිත කාලය තුළ මෙරටට ගෙන්වා ගත යුතු බවටත් එම ආදායම දේශීය වෙළෙඳපොළේ විදේශ විනිමය ද්‍රවශීලතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතු බවටත් නියම කිරීම.
- විදේශ විනිමය රට තුළට ගලා ඒම දිරිමත් කිරීම සඳහා විශේෂ තැන්පතු ගිණුම් (SDAs) හඳුන්වා දීම.
- විදේශ විනිමය වෙළෙඳපොළට බාධාවක් නොවන පරිදි බලශක්ති සහ විදුලි උත්පාදන ක්ෂේත්‍ර වැනි මෙරට නේවාසික ආයතනවලට ඔවුන්ගේ ආනයන අවශ්‍යතා ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමට ඉඩ සලසමින් ඇතැම් දේශීය විදේශ විනිමය ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම.

මෙම පියවර තාවකාලික පදනම මත හඳුන්වා දුන් අතර විදේශ විනිමය වෙළෙඳපොළේ හිතකර වර්ධනයන් සමඟ ඒවා ක්‍රමයෙන් ලිහිල් කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලාංකික ව්‍යවසායයන්ගේ ගෝලීය ව්‍යාප්තිය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් ප්‍රාග්ධන ගලායෑම් කළමනාකරණ විධිවිධාන ලිහිල් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව දැනට කැපවී සිටින අතර එය මෙරට ව්‍යවසායකයන්ගේ ගෝලීය ඒකාබද්ධතාවය තහවුරු කිරීමට සහ බාහිර ස්ථාවරත්වය වැඩිදියුණු කිරීමට අදහස් කරන වැඩි වශයෙන් වෙළෙඳපොළ ඉලක්ක කරගත් රාමුවක් රට තුළ නිර්මාණය කරයි.

## සේවක අර්ථසාධක අරමුදල

කම්කරු දෙපාර්තමේන්තුව සමග එක් ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල (සේ. අ. අ.), ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විශ්‍රාම වැටුප් අරමුදල ලෙස සිය ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කරගෙන ඇත. ජාතික ආර්ථිකය තුළ අරමුදලෙහි ප්‍රමාණාත්මක සහ පද්ධතිමය වැදගත්කම පිළිබිඹු කරමින් 2025 වසර අවසානයේ දී එහි වත්කම් පදනම රුපියල් ට්‍රිලියන 5ක මට්ටමට ළඟා විය.

සාමාජිකයින්ට හිමි දිගුකාලීන අරමුදල් සුරක්ෂිත ව ගොඩනැගීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් වෙනස්වන ආර්ථික තත්ත්වයන් තුළ එහි ආයෝජන කටයුතු සාර්ථක ව හැසිරවීම මඟින් වෙළෙඳපොළ පැවති මට්ටම අභිබවා ගිය පොලී අනුපාතිකයන් අඛණ්ඩ ව ප්‍රකාශ කිරීමට අරමුදල සමත් විය. සේ.අ.අ. හි සාමාජිකයින්හට ලබා දුන් තරඟකාරී ප්‍රතිලාභ තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව විචක්ෂණශීලී ව එහි අරදමුල් කළමනාකරණය සඳහා කළ කැපවීම මනාව පිළිබිඹු වන අතර අදාළ අමාත්‍යවරුන්ගේ එකඟතාව ලැබීමට යටත් ව 2025 වසර සඳහා 10.75%ක පොලී අනුපාතයක් ප්‍රකාශ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

සේ.අ.අ. 2025 වසර පුරාම එහි ආයෝජන කළඹ උපායමාර්ගික ව ප්‍රතිසංවිධානය කරන ලදි. මෙම ක්‍රියාවලිය තුළ සාංගමික ණයකර සහ ESG (පාරිසරික, සමාජීය සහ යහපාලන) තේමාව සහිත බැඳුම්කරවල ආයෝජනය කිරීම සහ කොටස් වෙළෙඳපොළ වෙත සක්‍රීය ප්‍රවේශයක් අනුගමනය කිරීම යනාදිය තුළින් ආයෝජන විවිධාංගීකරණය කරන ලදි. වාසිදායක වෙළෙඳපොළ ප්‍රවණතා උපයෝගී කර ගන්නා අතර ම අඩු ක්‍රියාකාරී වත්කම්වලින් ඉවත් වෙමින් අරමුදල අවදානම් - ගැළපූ ඉහළ කාර්යසාධනයක් ලබා ගෙන ඇති අතර එමගින් අරමුදලෙහි දිගු කාලීන තිරසාරභාවය සහතික කර ඇත.

මෙහි සඳහන් පරිදි සේ.අ.අ. විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය සහ සාමාජික කේන්ද්‍රීය මෙහෙයුම් ප්‍රතිසංස්කරණය යනාදී ඒකාබද්ධ උත්සාහයන් හරහා ශ්‍රී ලාංකේය ශ්‍රම බලකායට ආරක්ෂිත සහ ගෞරවනීය විශ්‍රාම ජීවිතයක් ලබා දීමේ මෙහෙවරට සේ.අ.අ. කැප වී සිටී.

සවිස්තරාත්මක තොරතුරු සඳහා කරුණාකර සේවක අර්ථසාධක අරමුදලේ වෙබ් අඩවිය වෙත ප්‍රවේශ වන්න[1].

## රාජ්‍ය ණය කළමනාකරණය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පැහැදිලි කර ඇති නීතිමය රාමුව තුළ ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසරේ දී රාජ්‍ය ණය කළමනාකරණ කාර්යයන් සිදු කළේ ය. පනතේ 132 වගන්ති යටතේ රාජ්‍ය ණය කළමනාකරණ අධිකාරියක් ස්ථාපිත කිරීමට අදාළ නීතිමය විධිවිධාන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන තෙක් රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සහ රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධයෙන් රජයේ නියෝජිතයා ලෙස කටයුතු කිරීමට අවශ්‍ය බලතල අන්තර්කාලීන ව මහ බැංකුවට පවරා දී තිබුණි. ඒ අනුව 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන තෙක් සහ එම වගකීම් මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පැවරෙන තෙක් මහ බැංකුව විසින් 2025 දෙසැම්බර් මාසය දක්වා රාජ්‍ය ණය නියෝජිත කාර්යයන් අඛණ්ඩ ව ඉටු කරන ලදි.

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත සහ ශ්‍රී ලංකා මහ බැංකු පනතේ අදාළ විධිවිධානවලට අනුකූල ව රජයේ සුරැකුම්පත් සම්බන්ධ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය සහ මධ්‍යම තැන්පතු පද්ධතියට අදාළ රාජකාරී කටයුතු මහ බැංකුව විසින් 2026 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි තවදුරටත් ක්‍රියාත්මක කරනු ඇත.

ඊට අමතර ව රජය සඳහා ජාත්‍යන්තර ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් මහ බැංකුව විසින් සපයන ලදි.

සවිස්තරාත්මක විස්තර සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න[2].

## මූල්‍ය බුද්ධි ඒකකය

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සිදු කරන ලද නියෝගයට අනුව 2007 පෙබරවාරි මාසයේ සිට මූල්‍ය බුද්ධි ඒකකය ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිපාලන ව්‍යුහය තුළ ස්වාධීනව ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුවක් ලෙස කටයුතු කරයි.

මූල්‍ය බුද්ධි ඒකකයෙහි මෙහෙයුම් විෂය පථය මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත වෙතින් ව්‍යුත්පන්න වී ඇත. මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම සහ ඒ ආශ්‍රිත නීති විරෝධී ක්‍රියාකාරකම් වළක්වාලීම, අනාවරණය කිරීම සහ විමර්ශනය කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය පහසුකම් සලසනු ලබයි.

2025 දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් ප්‍රගාමී (proactive) හා නිගාමී (reactive) මූල්‍ය බුද්ධි තොරතුරු බෙදා හැරීම, අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම, පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩපැවැත්වීම සම්බන්ධ නෛතික ප්‍රතිසංස්කරණ සඳහා පහසුකම් සැලසීම තුළින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩපැවැත්වීමේ නීතිමය රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදි.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වූ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ නායකත්වය යටතේ 2026 වර්ෂයේ දී අන්‍යෝන්‍ය ඇගයීම සඳහා සූදානම් වීමේ දී රටෙහි මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩපැවැත්වීම සඳහා වූ රාමුව ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය පුළුල් හා උපායමාර්ගික පියවර මාලාවක් ගෙන තිබේ.

තම මෙහෙයුම් කාර්යක්ෂමතාව පෙන්නුම් කරමින් උසස් තත්වයේ මූල්‍ය බුද්ධි තොරතුරු රැස් කර, විශ්ලේෂණය කර නීතිය බලාත්මක කරන ආයතන හා නිසි බලධාරීන් වෙත විමර්ශන හා නඩු පැවරීම් සම්බන්ධව අවශ්‍ය වන මූල්‍ය බුද්ධි තොරතුරු සැපයීමේ තම මූලික කාර්යය මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩව ඉටු කිරීමට කටයුතු කරන ලදි.

සවිස්තරාත්මක විස්තර සඳහා, කරුණාකර මූල්‍ය බුද්ධි ඒකකයේ වෙබ් අඩවියෙහි ඇති මූල්‍ය බුද්ධි ඒකක වාර්ෂික වාර්තාව වෙත යොමුවන්න[3].

[1] *https://epf.lk/?page_id=243*

[2] *https://www.treasury.gov.lk/web/public-debt-management-office/section/public%20debt%20management%20office*

[3] *https://fiusrilanka.gov.lk/annual_reports.html*

# ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිත කාර්යය සහ එහි අවසන් කිරීම පිළිබඳ සාරාංශයක්



## රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ මහ බැංකුවේ සාම්ප්‍රදායික කාර්යභාරය

### ණය කළමනාකරණ නියෝජිත කාර්යය

1950 දී ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත කළ දා සිට ප්‍රතිවර්තනය කරන ලද මුදල් නීති පනතේ 113 වගන්තිය යටතේ රජයේ නියෝජිතයා ලෙස මහ බැංකුව ණය කළමනාකරණ කිරීමේ සීමිත කාර්යයක් ඉටු කර ඇත. ඒ අනුව දේශීය හෝ විදේශීය මුදලින් නාමකරණය කරන ලද වෙළෙඳපොළෙහි අලෙවි කළ හැකි භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (ISB) සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB) නිකුත් කිරීම හරහා රාජ්‍ය මූල්‍ය සම්පාදනය කිරීම සඳහා මහ බැංකුව දායක විය.

### ණය වෙළෙඳපොළවල ප්‍රධාන ප්‍රතිසංස්කරණ සහ නවීකරණයන්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දශක ගණනාවක් පුරා ක්‍රමානුකූල ව රාජ්‍ය ණය කළමනාකරණය සඳහා ආයතනික සහ වෙළෙඳපොළ යටිතල පහසුකම් ශක්තිමත් කරන ලදි..

- **1986** – සතිපතා භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි හඳුන්වා දීම
- **1997** – භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව
- **1998** – වෙන්දේසි පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීම
- **2000** – ප්‍රාථමික අලෙවි නියෝජිත පද්ධතිය ස්ථාපිත කිරීම
- **2004** – මුළුමනින් ම නිර්ලේඛිත රජයේ සුරැකුම්පත් ක්‍රමයකට මාරු වීම
- **2006** – විදේශීය ආයෝජකයින් සඳහා භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ විවෘත කිරීම
- **2007** – ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම
- **2008** – විදේශීය ආයෝජකයන් සඳහා භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ විවෘත කිරීම
- **2017** – රජයේ සුරැකුම්පත් සඳහා වෙබ් පාදක වෙන්දේසි ක්‍රමයක් හඳුන්වා දීම

මෙම උපකරණ හරහා දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමට රජයට සහයෝගය ලබා දෙමින් රාජ්‍ය වියදම් සඳහා අරමුදල් රැස් කිරීමට මහ බැංකුවට හැකි විය.

## රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

දශක ගණනාවක් පුරා මහ බැංකුව රාජ්‍ය ණය කළමනාකරණය සඳහා ආයතනික හා වෙළෙඳපොළ යටිතල පහසුකම් ක්‍රමානුකූල ව ශක්තිමත් කළේය. 1986 දී සතිපතා භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි හඳුන්වා දීම, 1997 දී භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සහ 1998 දී වෙන්දේසි ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම ප්‍රධාන සන්ධිස්ථාන අතරට ඇතුළත් විය.

මෙම ප්‍රතිසංස්කරණවලින් පසුව 2000 වර්ෂයේ දී ප්‍රාථමික අලෙවිකාර ක්‍රමය ස්ථාපිත කිරීම, 2004 දී නිර්ලේඛන රජයේ සුරැකුම්පත් පද්ධතියකට මාරුවීම සහ 2006 දී සහ 2008 වර්ෂයේ දී පිළිවෙලින් භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ වශයෙන් විදේශීය ආයෝජකයින් සඳහා රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රමානුකූල ව විවෘත කිරීම ද සිදුවිය. විනිවිදභාවය සහ වෙළෙඳපොළ පදනම් කරගත් භාවිතයන් සඳහා කැපවෙමින් මහ බැංකුව 2017 සහ 2023 දී භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික නිකුත් කිරීම සඳහා වෙබ් පදනම් කරගත් පද්ධති හඳුන්වා දුන්නේ ය.

## අරමුදල් රැස් කිරීම සහ ණය සේවාකරණය

මෙම කාලය පුරා ම විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ සලකා බැලීම්වලට යටත් ව හැකි තරම් අවම පිරිවැයකින් රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීමේ කාර්යය මහ බැංකුව විසින් සිදු කරන ලදි. මේ අතර ශ්‍රී ලංකා රජය විසින් එවකට පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් 2022 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ අන්තර්වාර ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරන තෙක් ම ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ මූල්‍ය නියෝජිතයා ලෙස රාජ්‍ය ණය සේවාකරණය සම්බන්ධයෙන් නොබිඳුණු වාර්තාවක් පවත්වාගෙන යන ලදි.

## රජයේ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට පහසුකම් සැපයීම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් ක්‍රමය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය පුරා ම මහ බැංකුව විසින් රජයට පුළුල් වශයෙන් තාක්ෂණික සහ මෙහෙයුම් සහාය ලබා දෙන ලදි. මෙම සහයෝගය මුලින් ම දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය කෙරෙහි යොමු වූ අතර පසුව විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය දක්වා ව්‍යාප්ත විය. ඒ අනුව 2023 ජූලි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ මහ බැංකුව විසින් රජයට දෙන ලද නොපිය වූ තාවකාලික අත්තිකාරම් සහ මහ බැංකුව ප්‍රාථමික වෙළෙඳපොළෙන් මිල දී ගත් කල් නොපිරුණු භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට පහසුකම් සපයන ලදි.

## රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කිරීම

අන්තර්ජාතික මුල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම යටතේ ඇති කොන්දේසිවලට අනුව සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ඉහළම භාවිතයන්ට අනුකූල ව 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවන ලදි. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම තුළින් මින් පෙර මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් වෙන් වෙන් ව කරන ලද ණය කළමනාකරණ කාර්යයන් ඒකාබද්ධ කිරීම සිදු විය.

සුමට සංක්‍රාන්තියක් සහතික කිරීමේ අරමුණින් යුතු ව ශ්‍රී ලංකා මහ බැංකුව දශක හතකට වැඩි කාලයක් මුළුල්ලේ රැස් කරගත් පුළුල් ආයතනික අත්දැකීම් සහ දැනුම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට සිය සේවා ස්ථානයේදී ම කාර්යස්ථ පුහුණුවක් වශයෙන් ලබා දෙන ලදි.

සංක්‍රාන්ති අවධිය ආරම්භයේ දී ණය කළමනාකරණ මෙහෙයුම් කටයුතු මහ බැංකුවේ අධීක්ෂණය යටතේ ද අනතුරු ව මුදල් අමාත්‍යාංශයේ වගකීම හා අධීක්ෂණය යටතේ ද සිදු විය. මෙම ක්‍රමානුකූල ප්‍රවේශය මඟින් මෙහෙයුම් අඛණ්ඩතාව, ස්ථාවරත්වය සහ ඵලදායී දැනුම් හුවමාරුව සහතික කරනු ලැබූ අතර 2025 දෙසැම්බර් මාසයේ දී රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සම්පූර්ණයෙන් ම එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදි.

## රාජ්‍ය ණය කළමනාකරණ පාලන ව්‍යුහයේ ප්‍රතිසංස්කරණ

සාර්ව ආර්ථික ස්ථායීතාව තහවුරු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ මුදල් ප්‍රතිපත්ති බලධාරීන් අතර ඵලදායී සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස පවතී. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකු පනතේ ප්‍රතිපාදනවලට අනුකූල ව ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සම්බන්ධීකරණයක් පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයාගේ සභාපතිත්වයෙන් සහ මහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ සාමාජිකත්වයෙන් යුත් සම්බන්ධීකරණ සභාවක් ස්ථාපනය කර ඇත.

තව ද මෙහෙයුම් මට්ටමේ කටයුතුවල දී රාජ්‍ය ණය කළමනාකරණ සම්බන්ධ කටයුතුවලට අඛණ්ඩ සහයෝගීතාව තහවුරු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් සහ මහ බැංකු නියෝජිතයන්ගෙන් සමන්විත රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවක් ක්‍රියාත්මක වේ.

මුදල් අමාත්‍යාංශය යටතේ පූර්ණ ක්‍රියාකාරීත්වයෙන් යුත් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයක් ස්ථාපනය කිරීම මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සහ රාජ්‍ය ණය කළමනාකරණය යන ද්විත්ව කාර්යභාරයන් ඉටු කිරීම හේතුවෙන් දීර්ඝ කාලීන ව පැන නැඟී පැවති බැඳියාවන් අතර ගැටුම නිරාකරණය කර ගැනීමට හැකියාව ලැබී ඇත. මෙම ආයතනික ස්වාධීනත්වය හේතුවෙන් මිල ස්ථායීතාව පවත්වා ගැනීම සිය ප්‍රාථමික අරමුණ ලෙසත්, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම සිය අනෙක් අරමුණ ලෙසත් සලකා ජාත්‍යන්තර ව පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූල ව සිය මූලික විෂය පථයන් කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ලැබී ඇත.

## බැංකුව කළමනාකරණය කිරීම

# මානව ප්‍රාග්ධනය කළමනාකරණය

### ආයතනයට අවශ්‍ය දක්ෂ හා සුදුසු සේවකයින් හඳුනාගෙන බඳවා ගැනීම සඳහා ගත් ආරම්භක ක්‍රියාමාර්ග

නිරන්තරයෙන් වෙනස් වන ආයතනික අවශ්‍යතාවලට සමගාමී ව මහ බැංකු අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ එහි මෙහෙයුම් සුමට ව පවත්වා ගෙන යාම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසර පුරා ඉලක්කගත කුසලතාවලින් හෙබි පුද්ගලයින් බඳවා ගැනීම සහ එමඟින් ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සඳහා මුලපිරීම් රාශියක් සිදු කරන ලදි. 2025 වසර තුළ දී කාර්ය මණ්ඩල අවශ්‍යතාවල මනා තුලනයක් පවත්වා ගැනීමේ අරමුණින් විවිධ දෙපාර්තමේන්තුවල හඳුනාගත් තනතුරු සඳහා පුද්ගලයින් බඳවා ගැනීම සහ බැංකුවේ කාර්ය මණ්ඩල ධූරාවලියේ පහළ ශ්‍රේණියක් සඳහා සුදුස්සන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීම යනාදිය තුළින් බැංකුව සිය ශ්‍රම බලකාය තවදුරටත් ශක්තිමත් කිරීමට අඛණ්ඩ ව කටයුතු කරන ලදි. මෙම බඳවා ගැනීමේ ප්‍රයත්න තුළින් විශේෂඥ දැනුම, ක්ෂේත්‍ර පළපුරුද්ද සහ විවිධ වෘත්තීය අත්දැකීම් බැංකුවට එක් වූ අතර එමඟින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දායකත්වයක් ලැබුණි.

### මිනිස්බල සැලසුම්කරණය

මහ බැංකුවේ ශ්‍රම බලකාය කාර්යක්ෂම ව සැලසුම් කිරීම සඳහා විද්‍යාත්මක සහ ව්‍යුහගත ප්‍රවේශයක් භාවිත කරමින් සිදු කරන මිනිස් පැය ගණනය කිරීමේ ක්‍රමවේදය ඇතුළු ව්‍යුහගත මිනිස්බල සැලසුම්කරණ ක්‍රියාවලියේ අදියරයන් වසර පුරා අඛණ්ඩ ව ක්‍රියාත්මක කරන ලදි. නිශ්චිත සැලසුම් කාලසීමාවක් තුළ දෙපාර්තමේන්තුවල දැනට සිදු කරන සහ සිදු කිරීමට අපේක්ෂිත සියලු ම ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ විවිධ වූ කාර්ය මණ්ඩල මට්ටම්වල එක් එක් ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කාලය ඇස්තමේන්තු කිරීම මඟින් ප්‍රශස්ත කාර්ය මණ්ඩල අවශ්‍යතාව තීරණය කිරීම සඳහා මෙම ප්‍රවේශය යොදා ගනු ලැබේ. බැංකුවේ කාර්යක්ෂම සහ ඵලදායී ක්‍රියාකාරිත්වය මෙන්ම ආයතනික අවශ්‍යතා සමඟ මානව සම්පත අඛණ්ඩ ව අනුකූල වන බව සහතික කරමින් අනාගත බඳවා ගැනීම් තීරණය කිරීම සඳහා මෙම ක්‍රමවේදය උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### සේවකයින්ගේ වෘත්තිය ප්‍රගතිය සහ දක්ෂ සේවක පිරිසක් අනුප්‍රාප්තිකයින් ලෙස සූදානම් කිරීම

සේවකයින්ගේ වෘත්තීය ප්‍රගතිය සහ අභ්‍යන්තර වශයෙන් සේවක කුසලතා සංවර්ධනය කිරීම සඳහා බැංකුවේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරමින් නායකත්ව සහ කළමනාකරණ කුසලතා ශක්තිමත් කිරීම සඳහා සුදුසුකම් ලත් නිලධාරීන්ට උසස් වීම් ලබා දීම උපායමාර්ගිකව සිදු කරන ලදි. වෘත්තීය දියුණුව පිණිස ගත් මෙම මුලපිරීම් මඟින් නායකත්ව සංවර්ධනය, අනුප්‍රාප්තික සූදානම සහ අභ්‍යන්තර කුසලතා වර්ධනය කිරීම කෙරෙහි බැංකුවේ අඛණ්ඩ අවධානය පිළිබිඹු කරයි.

### මානව සම්පත් උපායමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

#### මානව සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීමට ගත් නව ක්‍රියාමාර්ග

අනාගතයේ අනුප්‍රාප්තිකයින් ලෙස කටයුතු කිරීමට සූදානම්, මනා නිපුණත්වයකින් යුතු, ඉහළ කාර්යසාධනයක් සහිත ශ්‍රම බලකායක් ගොඩ නැංවීම සඳහා බැංකුවේ ඇති කැපවීමට සමගාමී ව දැනට ක්‍රියාත්මක "මානව සම්පත් උපායමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය" යටතේ පරිවර්තනීය මානව සම්පත් ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙන ලදි. මෙම ක්‍රියාමාර්ග මඟින් කාර්ය සාධන කළමනාකරණය, නිපුණතා ඇගැයීම. නායකත්ව සංවර්ධනය, රැකියා කාණ්ඩ රාමුව, නම්‍යශීලී සේවා පහසුකම් සහ කුසලතා සහභාගීත්ව ඇතුළු ප්‍රධාන ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරන ලදි.

#### වැඩිදියුණු කළ සේවක කාර්ය සාධන ඇගැයීම් පද්ධතිය

සේවක කුසලතා ඵලදායී ව කළමනාකරණය කරන සහ ඉහළ කාර්ය සාධනයක් සහිත සංස්කෘතියක් ඇති කිරීම සඳහා සහාය දැක්වීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි දියුණු කළ කාර්ය සාධන ඇගැයීම් පද්ධතියක් හඳුන්වා දෙන ලදි. පැහැදිලිව නිර්වචනය කළ අරමුණු සහ නිපුණතා මත පදනම් වූ ඇගැයීම් තුළින් විනිවිදභාවය, වගවීම සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ශක්තිමත් කරමින් සේවක ඉලක්ක, දෙපාර්තමේන්තු අරමුණු සහ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා සමඟ අනුකූල කිරීම මඟින් පුද්ගල සහ ආයතනික කාර්ය සාධනය ශක්තිමත් කිරීම සඳහා මෙම සංශෝධිත ඇගයීම් රාමුව සැලසුම් කර ඇත.

#### විස්තීර්ණ නිපුණතා රාමුව

නායකත්ව නිපුණතා ආකෘතිය (Leadership Competency Model), තාක්ෂණික නිපුණතා ආකෘතිය (Technical Competency Model), සහ නායකත්ව ඇගැයීම් සහ සේවක හැකියා හඳුනා ගැනීමේ රාමුව (Leadership Assessment and Profiling Framework) අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීම තුළින් නිරන්තරයෙන් වෙනස් වන බැංකුවේ මෙහෙයුම් අවශ්‍යතාවලට අනුකූල ව මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය නවීකරණය කර නිපුණතා පාදක කරගත් කුසලතා කළමනාකරණය ශක්තිමත් කිරීමට පියවර ගනිමින් සිටී. නායකත්ව නිපුණතා ආකෘතිය මඟින් අනුවර්තනය වීමේ හැකියාව, උපායමාර්ගික දිශානතිය, අවදානම් පිළිබඳ දැනුම්වත් භාවය, නවෝත්පාදන බිහි කිරීමේ හැකියාව, පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීම සහ කුසලතා සංවර්ධනය යන නිපුණතා කෙරෙහි අවධානය යොමු කරමින් බැංකුවේ සියලු ම තනතුරු සඳහා අවශ්‍ය වන නායකත්ව හැසිරීම් සහ හැකියා මෙමඟින් නිර්වචනය කරනු ලබයි. තාක්ෂණික නිපුණතා ආකෘතිය මඟින් රැකියා අවශ්‍යතා සහ ආයතනික අරමුණුවලට අනුකූල වන බව සහතික කරමින් විශේෂිත රැකියා භූමිකා සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම සහ කුසලතා ගෙන හැර දක්වන ව්‍යුහගත රාමුවක් සපයයි. මෙම ආකෘතීන්වලට ගැළපෙන ලෙස නායකත්ව ඇගැයීම් සහ සේවක හැකියා හඳුනා ගැනීමේ රාමුව, නායකත්ව හැකියා හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය (Leadership Profiling Centre), මධ්‍යම කළමනාකාරීත්ව හැකියා හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය (Middle Management Profiling Centre) සහ මූලික විධායක මට්ටමේ හැකියා හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය (Executive Profiling Centre) ලෙස අදියර තුනක් යටතේ ස්ථාපිත වෙමින් පවතින අතර එමඟින් වත්මන් සහ අනාගත භූමිකා සඳහා ඇති සූදානම සහතික කරමින් බැංකුවේ විවිධ මට්ටම්වල නිපුණතා ඇගැයීමට සහ සංවර්ධනයට පහසුකම් සලසයි.

#### රැකියා කාණ්ඩ රාමුව

එක හා සමාන මෙහෙයුම් වගකීම් සහිත සහ එකිනෙක සැසඳිය හැකි දැනුම, කුසලතා සහ නිපුණතා අවශ්‍ය වන්නා වූ රැකියා භූමිකාවන් එකට කාණ්ඩ කරමින් මහ බැංකුව සඳහා සාර්ව මට්ටමේ ව්‍යුහයක් ලෙස රැකියා කාණ්ඩ රාමුව හඳුන්වා දී ඇත. අර්ථ දක්වා ඇති රැකියා කාණ්ඩ තුළ අදාළ භූමිකාවන් ඒකාබද්ධ කිරීම මඟින් නායකත්ව හා තාක්ෂණික හැකියාවන් පුළුල් සහ ශක්තිමත් කිරීම තුළින් ක්‍රමවත් අයුරින් සේවකයන්ගේ වෘත්තීය ගමන් මඟ සුමට කොට ප්‍රගතියක් ඇති කිරීමට අවශ්‍ය පහසුකම් සලසයි.

#### මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය සහ නවීකරණය කිරීම

මානව සම්පත් කළමනාකරණයේ දී දැනට යොදාගන්නා ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය සහ නව සේවා ප්‍රවාහ හඳුන්වා දීම හරහා මානව සම්පත් කළමනාකරණයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වැඩි කිරීම කෙරෙහි බැංකුවේ අවධානය යොමු වී ඇත. 2025 වසර අවසානය වන විට මෙම වැඩසටහනෙහි සැලකිය යුතු කොටසක් සම්පූර්ණ කර ඇති අතර එමඟින් බැංකුවේ මානව සම්පත් කළමනාකරණයේ සුවිශේෂ පරිවර්තනයක් සනිටුහන් කරයි.

## මානව සම්පත් පරිවර්තන ක්‍රියාවලිය මෙහෙය වන නියෝජිත වැඩසටහන

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට සහ මානව සම්පත් උපායමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට අනුකූල ව අභ්‍යන්තර වශයෙන් වෙනස් වීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා පරිවර්තන ක්‍රියාවලිය මෙහෙය වන නියෝජිත වැඩසටහන ආරම්භ කරන ලදි. මෙහි දී නිලධාරින්ට මානව සම්පත් කළමනාකරණයේ වෙනස්කම් සඳහා මුල පිරීමේ පෙර ගමන්කරුවන් ලෙස කටයුතු කිරීමට අවස්ථාව හිමි වන අතර එමගින් ආයතනික වෙනස්වීම්, නායකත්ව සහ නිපුණතා සංවර්ධනය, සංස්කෘතිමය පරිවර්තනය සහ මානව සම්පත කේන්ද්‍ර කරගත් ප්‍රතිසංස්කරණ බැංකුව පුරා තිරසර ලෙස ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දෙයි. සේවකයින්ගේ සහභාගීත්වය වැඩිදියුණු කිරීම හා විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම උදෙසා විවෘතභාවයට හා සාමූහික ගැටලු නිරාකරණයට ඉඩ ප්‍රස්ථා සළසමින් විවෘත සාකච්ඡා පැවැත්වීමටත් ඉහළ කළමනාකාරිත්වය සමස්ත සේවකයින් සමඟ විවෘත රැස්වීම් පැවැත්වීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබීය.

## පුහුණුව සහ සංවර්ධන

බැංකුවේ පුහුණු සහ සංවර්ධන රාමුව ශක්තිමත් කිරීම සඳහා වසර පුරා විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදි. සේවකයින්ට ලැබුණු ඉගෙනුම් අවස්ථා සැලකිය යුතු අන්දමින් ඉහළ යෑම මගින් මෙම ප්‍රයත්න සාර්ථක වූ අතර සේවකයින්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සහ වෘත්තීය වර්ධනයේ අයෝජනය සඳහා මහ බැංකුවේ ඇති කැපවීම එමගින් පෙන්නුම් කෙරිණි. පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නිරත වීමට සේවකයින් දිරිමත් කරන අතරම පෙර වසරට සාපේක්ෂ ව බැංකුව ලබා දී ඇති විදේශ පුහුණු අවස්ථාවන්හි සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේ ය. මෙහි දී විදේශීය වැඩසටහන්, මාර්ගගත සම්මන්ත්‍රණ මෙන්ම භෞතික සහ මාර්ගගත යන පුහුණු ක්‍රමවේද ද්විත්වයෙහි පුළුල් සහභාගීත්වයක් දක්නට ලැබුණි. ඊට අමතරව, මෙහෙයුම් සහ නායකත්ව පුහුණු අවස්ථා මෙන්ම සහායක කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා ඉලක්කගත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර එමගින් ශක්‍යතා සංවර්ධනය සඳහා පරිපූර්ණ සහ සියලු පාර්ශ්ව ආවරණය වූ ප්‍රවේශයක් සහිත බව තහවුරු කළේ ය.

### 2025 දෙසැම්බර් 31 වන විට ප්‍රධාන මානව සම්පත් සංඛ්‍යාන

රූප සටහන 14




## බැංකු විදු පියෙස

2025 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව සම්පත් සංවර්ධන අංශය වන බැංකු විදු පියෙස, බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීය සංවර්ධනය හා හැකියාවන් වර්ධනය කිරීම සඳහා වන ප්‍රමුඛ ආයතනයක් ලෙස තවදුරටත් ශක්තිමත් විය. බැංකු විදු පියෙස විසින් ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලයෙහි කුසලතා හා දැනුම වර්ධනය කිරීමට සහ රාජකාරී කටයුතු වඩාත් සාර්ථක ව ඉටු කිරීමට අවශ්‍ය පූර්ව සූදානම ඉහළ නැංවීම සඳහා ව්‍යුහාත්මක සහ පුළුල් පරාසයක් ආවරණය වන පුහුණු වැඩසටහන්, වැඩමුළු මෙන්ම දැනුම්වත් කිරීමේ වැඩසටහන් රැසක් දියත් කළ අතර මූල්‍ය ක්ෂේත්‍රයේ නියුතු වුවන්හට ලබා දෙන පුහුණු අවස්ථා ද තවදුරටත් පුළුල් කරන ලදි.

සංකීර්ණ දත්ත සැකසීමට, සංඛ්‍යාත්මක විශ්ලේෂණ සිදු කිරීමට සහ නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට උපකාරී වන ප්‍රයෝගික නිගමනයන්ට එළඹීම සඳහා මහ බැංකු කාර්ය මණ්ඩලයට අවශ්‍ය තාක්ෂණික, විශ්ලේෂණාත්මක සහ උපායමාර්ගික නිපුණතා වර්ධනය කිරීම කෙරෙහි බැංකු විදු පියෙස විසින් විශේෂ අවධානයක් යොමු කරන ලදි. මහ බැංකුවේ මූලික කාර්යයන් කළමනාකරණය කිරීමට, ගතික වෙළෙඳපොළ තත්ත්වයන්ට අනුවර්තනය වීමට සහ තොරතුරු මත පදනම් වූ උපායමාර්ගික තීරණ ගැනීමට හුරු කරමින් කාර්ය මණ්ඩලයේ මූල්‍ය හා මෙහෙයුම් නිපුණත්වය තවදුරටත් වැඩිදියුණු කරන ලදි. තව ද ආචාර ධර්ම භාවිතය, වගවීම සහ මෙහෙයුම් විශිෂ්ටත්වය පෝෂණය වන පරිසරයක් ප්‍රවර්ධනය කරමින් ඉලක්කගත ව සිදු කළ පුහුණු වැඩසටහන් හරහා කාර්ය මණ්ඩලයේ නියාමන අනුකූලතාව, නායකත්ව හැකියාවන් සහ වෘත්තීය නිපුණතා ක්‍රමානුකූල ව වර්ධනය කළේය. මානව සම්පත් සංවර්ධනය කිරීමේ දී අත්‍යවශ්‍ය වන මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ආයතනික සම්බන්ධීකරණය ඉහළ නැංවීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව මෙතෙක් සිදු කළ පුහුණු කාර්යයන්, බැංකු විදු පියෙස වෙත ඒකාබද්ධ කිරීම 2025 වර්ෂයේ දී ආරම්භ කළ අතර ඒකාබද්ධ පුහුණු වැඩසටහන් 2026 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වනු ඇත.

තව ද බැංකු විදු පියෙස විසින් මෙහෙයුම් සහ තාක්ෂණික ක්ෂේත්‍රවල නව ප්‍රවණතා සහ අභියෝග පිළිබඳව ද කල්තියා අවධානය යොමු කරමින් නියාමන රාමු, සයිබර් ආරක්ෂා හා සම්බන්ධ අවදානම්, දූෂණ විරෝධී ක්‍රියාමාර්ග සහ කෘත්‍රිම බුද්ධිය හා ක්ලවුඩ් පරිගණනය ඇතුළු තාක්ෂණික නවෝත්පාදන පිළිබඳ දැනුම්වත් කිරීමේ සැසි සංවිධානය කරන ලදි. බැංකු විදු පියෙස, මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සහ මූල්‍ය ක්ෂේත්‍රයේ නියුතු වුවන් යන දෙපාර්ශ්වයට ම ප්‍රතිලාභ සහිත ව කලාපීය හා ජාත්‍යන්තර ආයතන සමඟ වන සහයෝගිතාව තුළින් දැනුම හුවමාරුව, ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සහ විදේශීය වෘත්තිමය පුහුණුවීම් සඳහා අවස්ථාව ලබා දුන්නේ ය.

ඒකාබද්ධ හා ඉදිරිදැක්මක් සහිත මානව සම්පත් සංවර්ධන ප්‍රවේශයක් අනුගමනය කිරීම තුළින්, බැංකු විදු පියෙස විසින් සහභාගීවන්නන්ගේ තාක්ෂණික නිපුණතාව සහ නියාමන දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම පමණක් නොව ආයතනික කාර්යක්ෂමතාව ද ශක්තිමත් කිරීම පිණිස ආයතනික නවීකරණය මෙන්ම ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය, ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර වර්ධනය සඳහා අර්ථවත් දායකත්වයක් සපයන ලදි.

# තොරතුරු තාක්ෂණය

2025 වසරේ දී තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධාන අවධානය යොමු වුයේ බැංකුවේ මූලික යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව, ආරක්ෂාව, ප්‍රශස්තකරණය (optimisation) සහ නවීකරණය තුළින් ශක්තිමත් කිරීම කෙරෙහි ය.

## ගෙවීම් සහ පියවීම් ක්‍රියාවලීන් පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනය

මෙහි දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධානතම පියවරක් වූයේ පවතින ගෙවීම් සහ පියවීම් ක්‍රියාවලි පිළිබඳ පූර්ණ සමාලෝචනයක් සිදු කිරීමයි. අදාළ දෙපාර්තමේන්තු හරහා පවතින වැඩ ප්‍රවාහ (Workflows) විස්තරාත්මක ව ක්‍රියාවලිය සිතියම්ගත කිරීම (Business process mapping) අවසන් කරන ලද අතර එමගින් පවතින අකාර්යක්ෂමතා සහ ප්‍රධාන බාධා (Bottlenecks) හඳුනා ගැනීමට හැකි විය. මෙම සොයා ගැනීම් පදනම් කරගෙන වැඩ ප්‍රවාහයන් සරල කිරීම, මානව මැදිහත්වීම් අවම කිරීම සහ අදියර වශයෙන් ස්වයංක්‍රියකරණයට ඉඩ සැලසීම අරමුණු කරගත් අනාගත (To-Be) ක්‍රියාවලීන් මේ වන විට සැලසුම් කරමින් පවතී.

## වෙබ් අඩවි පාදක විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් වෙන්දේසි පද්ධතිය

මෙයට සමගාමී ව බැංකුවේ මූලික පද්ධති වැඩිදියුණු කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදි. වෙබ් අඩවි පාදක විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් (OMO) වෙන්දේසි පද්ධතියේ සංවර්ධන කටයුතු සැලකිය යුතු ලෙස ඉදිරියට ගිය අතර එහි මූලික පද්ධති මොඩියුලයන් නිම කරන ලදි. මෙමගින් දේශීය වෙළෙඳපොළ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව, විශ්වසනීයත්වය සහ පරිශීලක අත්දැකීම ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ.

එසේම බාහිර පාර්ශ්වකරුවන් සඳහා තෝරා ගත් මූල්‍ය හා ආර්ථික දත්ත වෙත පාලිත ප්‍රවේශයක් ලබා දීම සඳහා සුරක්ෂිත විවෘත වැඩසටහන් අතුරු මුහුණත් API (Application Programming Interface) වේදිකාවක් සඳහා වන මූලික කටයුතු ද ආරම්භ කරන ලදි. මීට අමතර ව සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ සරල කිරීම සඳහා හඳුන්වා දුන් පද්ධති මගින් මානව සම්පත් දෙපාර්තමේන්තුවේ කටයුතු ද ශක්තිමත් විය.

## මධ්‍යගත විශාල දත්ත (Big Data) සහ දත්ත ගබඩා වේදිකාව (Data Warehouse Platform)

2025 වසරේ ගත් තවත් ප්‍රධාන ප්‍රතිපත්තිමය පියවරක් වූයේ මධ්‍යගත විශාල දත්ත (Big Data) සහ දත්ත ගබඩා (Data Warehouse) වේදිකාවක් සඳහා වන මාර්ග සිතියම සකස් කිරීමයි.

මෙම ප්‍රයත්නය මගින් දත්ත ඒකාබද්ධ කිරීම, විශ්ලේෂණ හැකියාවන් ඉහළ නැංවීම සහ බැංකුව පුරා සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම (Evidence-based decision-making) කරා යන උපායමාර්ගික වෙනසක් පෙන්නුම් කරයි.

**මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ ව්‍යුහය** රූප සටහන - 15



### නියාමන තාක්ෂණය සහ අධීක්ෂණ සහාය

පසුගිය වසර තුළ නියාමන තාක්ෂණය (RegTech) සහ අධීක්ෂණ සහයෝගීතාව සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් FinNET පද්ධතිය හරහා නව සහ සංශෝධිත නියාමන වාර්තාකරණ ක්‍රමවේදයන් (Regulatory returns) ක්‍රියාත්මක කරන ලදි. මෙයට අදාළ පාර්ශ්වයන් අතර සිදුවන ගනුදෙනු (Related party transactions) මෙන්ම සයිබර් සහ තොරතුරු තාක්ෂණ ආරක්ෂණ සිද්ධීන් පිළිබඳ වැඩිදියුණු කළ වාර්තාකරණය ඇතුළත් විය.

ප්‍රතිපත්ති විශ්ලේෂණය, අධීක්ෂණය සහ කළමනාකරණ කටයුතු සඳහා සහාය වීම පිණිස ව්‍යාපාරික බුද්ධි මෙවලම් (Business Intelligence tools) භාවිතයෙන් විශ්ලේෂණාත්මක දත්ත පුවරු (Dashboards) සහ වාර්තාකරණ විසඳුම් සංවර්ධනය කරන ලදි. මීට අමතර ව බැංකුවේ ප්‍රතිපත්තිමය සහ මෙහෙයුම් අවශ්‍යතාවලට මෙන්ම ජාත්‍යන්තර ISO ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි අභ්‍යන්තර පද්ධති කිහිපයක්ම තවදුරටත් ශක්තිමත් කරන ලදි.

### ජාතික වශයෙන් වැදගත් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නඩත්තු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රධාන දත්ත මධ්‍යස්ථානය (Primary Data Centre) සඳහා Telecommunications Industry Association (TIA)-942 Rated-3 ජාත්‍යන්තර සහතිකය සාර්ථක ව යාවත්කාලීන කරගනිමින් ජාතික මට්ටමේ තීරණාත්මක තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සම්බන්ධයෙන් ක්ෂේත්‍රයේ ඉහළ ම ප්‍රමිතීන් පවත්වාගෙන යන ලදි.

හදිසි ආපදා තත්ත්වයක දී දත්ත සහ පද්ධති යථා තත්ත්වයට පත් කිරීමේ හැකියාව (Disaster Recovery - DR) ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය සහ ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානය අතර අතිරේක ජාල සබැඳි (Redundant network links) ස්ථාපිත කරන ලදි. එමඟින් පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව සහ බිඳ වැටීමක දී වහාම ක්‍රියාත්මක වීමේ සූදානම (Failover readiness) සැලකිය යුතු ලෙස ඉහළ නැංවිය. මෙයට සමගාමී ව CBSLNET VPN (Virtual Private Network) හි ආරක්ෂාව ද වැඩි දියුණු කරන ලද අතර වඩාත් ශක්තිමත් සංකේතනයක් (Encryption) සහ වඩාත් විශ්වසනීය සබැඳි ස්ථාවරත්වයක් (Tunnel stability) තහවුරු කරන ලදි.

### සේවක අර්ථසාධක අරමුදලේ (EPF) තොරතුරු තාක්ෂණ පද්ධති

සේවක අර්ථසාධක අරමුදලේ (EPF) පද්ධතිවල ස්ථායීතාව, දත්තවල නිරවද්‍යතාව (Data integrity) සහ අඛණ්ඩ සේවාවක් සහතික කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණාත්මක මෘදුකාංග යෙදුම්, යටිතල පහසුකම් සහ මෙහෙයුම් සහයෝගීතා සේවාවන් අඛණ්ඩ ව සපයන ලදි.

සේවක අර්ථසාධක අරමුදලේ (EPF) FileNet ලේඛන කළමනාකරණ පද්ධතිය (Document Management System) යාවත්කාලීන කිරීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදි. මෙය ආයතනයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ගනු ලැබූ වැදගත් පියවරකි.

### පද්ධති ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව

2025 වසර පුරාම පද්ධති ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලෙස පැවතුණි. SWIFT පාරිභෝගික ආරක්ෂණ වැඩසටහන (Customer Security Programme) ඇතුළු ජාත්‍යන්තර තොරතුරු ආරක්ෂණ ප්‍රමිතීන්ට පූර්ණ ලෙස අනුකූල වීම අඛණ්ඩ ව පවත්වාගෙන යන ලදි.

තීරණාත්මක පද්ධති සඳහා අවදානම් තක්සේරු කිරීම් (Vulnerability assessments) සිදු කරන ලද අතර ප්‍රධාන ගෙවීම් සහ පියවීම් වේදිකාවල ස්වාධීන ආරක්ෂණ ඇගයීම් ද ආරම්භ කරන ලදි.

වැඩිදියුණු කරන ලද ආරක්ෂණ පාලනය සහ අවදානම් කළමනාකරණ පිළිවෙත්වලට අනුකූල ව මහ බැංකුව විසින් වරප්‍රසාදිත ප්‍රවේශ කළමනාකරණ (Privileged Access Management - PAM) විසඳුමක් ක්‍රියාත්මක කරන ලදි. මීට අමතර ව බැංකුවේ සූදානම ශක්තිමත් කිරීම සඳහා තොරතුරු සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ පරිශීලක දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද සංවිධානය කරන ලදි.



# පොදු පරිපාලන කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 වසරේ දී ද සමස්ත ආයතනික පරිපාලන කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන කළමනාකරණය, විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, විදේශ අධ්‍යයන කටයුතු හා විදේශ පුහුණු සංචාර සම්බන්ධයෙන් පහසුකම් සැලසීම, වත්කම් සත්‍යාපනය සහ බැහැර කිරීම් කළමනාකරණය කිරීම, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට අවශ්‍ය කාර්යාලයීය සේවා සහ සන්ධාන සේවා සැපයීම තුළින් එහි ආයතනික පරිපාලනය ශක්තිමත් කිරීම අඛණ්ඩ ව කරගෙන යන ලදි.

## සමස්ත ආයතනික පරිපාලනය

2025 වර්ෂය තුළ දී ද බැංකුවේ සමස්ත ආයතනික පරිපාලනය; අදාළ පාලන රෙගුලාසි, වගවීම, අවදානම් කළමනාකරණය සහ යහපාලන ගුණාංගවලට අනුකූලව සිදු කරන ලදි. බැංකුවේ සියලුම දේපල සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගැනීම, පිටතින් ලබාගෙන ඇති තැපැල් කළමනාකරණ සේවාව අධීක්ෂණය කිරීම, බැංකුවේ ලිපි ද්‍රව්‍ය සහ භාණ්ඩ ලේඛන කළමනාකරණය කාර්යක්ෂම ව කරගෙන යෑම, බැංකුව සම්බන්ධ විශේෂ උත්සව සංවිධානය කිරීම සහ සේවා සපයන්නන් සමඟ පාලක මණ්ඩලය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීම මීට අයත් විය.

## ප්‍රසම්පාදන කළමනාකරණය

මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික අයවැය පදනම් කරගෙන 2025 වසර සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට අනුව 2025 වසර තුළ දී ප්‍රසම්පාදන කටයුතු කරගෙන යන ලදි. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල ව සකස් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතෙහි දක්වා ඇති ප්‍රසම්පාදන පටිපාටියට අනුකූල ව සියලු ප්‍රසම්පාදන කටයුතු කර ගෙන යන ලදි. 2025 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික ප්‍රසම්පාදන කොමිෂම විසින් නිකුත් කරන ලද 2024 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල ව ශ්‍රී ලංකා මහ බැංකුව ශක්තිමත් ප්‍රසම්පාදන කාර්යරාමුවකට අවතීර්ණ වෙන ලදි. එකී ප්‍රතිසංවිධානවලට අනුව විවිධ දෙපාර්තමේන්තු මගින් දැනට කරගෙන යනු ලබන ප්‍රසම්පාදන කටයුතු ඒකාබද්ධ කර නව ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවක් 2026 වසරේ දී පිහිටුවීමට පාලක මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. ඊට අමතර ව මහ බැංකුව විසින් ඉතා කෙටි කාල සීමාවක් තුළ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවාවන් ගණනාවක් ප්‍රසම්පාදනය කළ අතර මධ්‍යගත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා පත් කරන ලද සියලුම ප්‍රසම්පාදන කමිටු නියෝජනය කරමින් පූර්ණ සම්පත් දායකත්වය ලබා දෙන ලදි.

## විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම

දෙදහස් දෙසිය හැට හයක (2,266) ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සඳහා සේවා සපයමින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය යටතේ අදාළ ගෙවීම් කටයුතු සහ මෙහෙයුම් කටයුතු අඛණ්ඩ ව සිදු කළේ ය. විශ්‍රාම පාරිතෝෂික හා පරිවර්තිත විශ්‍රාම වැටුප් ගෙවීම, අර්ථසාධක අරමුදල් මුදා හැරීම, මාසික විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනන්දරු අරමුදල්, වැන්දඹු පුරුෂ හා අනන්දරු අරමුදල් ගෙවීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති නීතිරීතිවලට අනුව ජීවත්වීමේ සහතික ලබා ගැනීම හා ඒවා සත්‍යාපනය කිරීම ඇතුළු විශ්‍රාම ප්‍රතිලාභීන්ගේ නොයෙකුත් අවශ්‍යතා ඉටුකර දීම සඳහා ඔවුන් සමඟ ලිපි ගනුදෙනු සිදු කිරීම මෙම සේවාවන්ට අයත් විය.

## සේවක යහපැවැත්ම සහ සහාය

සේවක තෘප්තිය වෙනුවෙන් කළමනාකාරිත්වයේ කැපවීම විදහා දක්වමින් බැංකුවේ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ යෝජනා ක්‍රම යටතේ සේවකයින්ට වෛද්‍ය සහ කාර්ය මණ්ඩල ණය පහසුකම් වැනි ප්‍රතිලාභ අඛණ්ඩ ව ලබා ගත හැකි විය.

## ආරක්ෂක සේවා

ශ්‍රී ලංකා මහ බැංකුව සිය කාර්ය මණ්ඩලය සහ එහි තීරණාත්මක යටිතල පහසුකම් ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් ආරක්ෂක පද්ධතියක් පවත්වා ගැනීමට ප්‍රමුඛත්වය දී ඇත. ඒ සඳහා විධිමත් ආරක්ෂක ක්‍රමවේද, නිතිපතා කෙරෙන පරීක්ෂා කිරීම්, නවීන ආරක්ෂක සේවා තාක්ෂණය යොදා ගැනීම්, පූර්ව ක්‍රියාකාරී ගිනි ආරක්ෂණ පියවර සහ අඛණ්ඩ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

## සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම

2025 වසරේ දී මහ බැංකුව විසින් එහි ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා යොදා ගනු ලබන සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීමේ ක්‍රමවේදයට අනුව යල්පිනූ, හානි වූ, සේවාකරණය කළ නොහැකි සහ අලුත්වැඩියා කළ නොහැකි වත්කම් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ කටයුතු සිදු කරන ලද අතර මහ බැංකු අත්පොතේ අදාළ විධිවිධානවලට යටත්ව හඳුනා ගත් එකී වත්කම් බැහැර කිරීම සිදු කරන ලදි.

## කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම

මහ බැංකුව විසින් අධිපතිතුමාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ රාජකාරී කටයුතු පහසු කිරීම සඳහා අවශ්‍ය උසස් මට්ටමේ කාර්යාලයීය සහ සන්ධාන සේවාවක් සපයන ලදි. දේශීය සහ විදේශීය නිල සංචාර සංවිධානය කිරීම, නිල උත්සව සඳහා අදාළ කටයුතු සංවිධානය කිරීම සහ දේශීය හා විදේශීය සම්භාවනීය අමුත්තන් හමුවීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මීට අයත් විය.

## නීති කටයුතු

2025 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තම නීති කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කරමින් නෛතික ආරවුල්වල දී ආයතනයේ අයිතිවාසිකම් ආරක්ෂා කළ අතර ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ දී ජාතික වැදගත්කමක් ඇති කරුණු සම්බන්ධයෙන් නීතිමය දායකත්වය ලබා දීම ද සිදු කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ නීති සංශෝධන වැඩසටහන් කිහිපයකට ම සක්‍රිය ව සම්බන්ධ වී සිටින අතර, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත සංශෝධනය කිරීම, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත සංශෝධනය කිරීම සහ නව ගෙවීම් හා පියවීම් පද්ධති පනතක් හඳුන්වා දීම ද ඊට ඇතුළත් වේ. ඊට අමතර ව ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත, කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත, රාජ්‍ය වාණිජ ව්‍යවසාය පනත් කෙටුම්පත සහ බේරාගැනීම්, පුනරුත්ථාපනය හා වස්තුභංගත්ව පනත් කෙටුම්පත සකස් කිරීමේ ක්‍රියාවලියට ද ශ්‍රී ලංකා මහ බැංකුව සිය තාක්ෂණික සහාය ලබා දී ඇත.

### 2025 දී විශ්‍රාම ගත් ප්‍රධාන නිලධාරීන්

වසර ගණනාවක් පුරා සේවයට කැප වී 2025 වසරේ දී විශ්‍රාම ගත් සියලුම නිලධාරීන්ට කෘතවේදී වෙමු. ඔවුන් ඉටු කළ අමිල සේවය ආයතනයේ ඉදිරි ගමනට ඉමහත් පිටිවහලක් වූ අතර ඔවුන්ගේ අනාගත කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමු.



**ජානක කරුණාරත්න**
නියෝජ්‍ය අධිපති

- **ජමාල්ඩීන් අමීර්**
  ලේකම්
- **සාලිය ගුණතිලක**
  අතිරේක අධ්‍යක්ෂ, ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## තොරතුරු දැනගැනීමේ අයිතිය සහ විනිවිදභාවය

2025 දී ශ්‍රී ලංකා මහ බැංකුව විනිවිදභාවය සඳහා වූ සිය කැපවීම තවදුරටත් ශක්තිමත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් අයදුම්පත් සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාර ව අප්‍රමාදී ව ප්‍රතිචාර දැක්වීම තුළින් විවෘත හා වගවීමේ පාලනයක් සඳහා වන සිය කැපවීම විදහා දක්වන ලදි.

**2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 10 වන වගන්තිය අනුකූල ව ඉදිරිපත් කරනු ලබන 2025 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ වාර්ෂික වාර්තාව**

| | | |
|---|---|---|
| 01 | 2025 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබුණු මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 220 |
| 02 | 2025 වසර තුළ දී ලැබුණු මුළු තොරතුරු ඉල්ලීම් ගණනින් තොරතුරු සපයන ලද ඉල්ලීම් සංඛ්‍යාව | 155 |
| 03 | 2025 වසර තුළ දී මුළු තොරතුරු ඉල්ලීම් ගණනින් තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව | 46 |
| 04 | වෙනත් පොදු අධිකාරීන් වෙත යොමු කරන ලද මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව<br>(ඉල්ලීම් 11ක් සඳහා තොරතුරුවලින් කොටසක් සපයන ලදි) | 30 |
| 05 | 2025 වසර තුළ දී ලැබුණු හා 2025.12.31 දිනය වන විට තොරතුරු සැකසෙමින් පැවතුණු ඉල්ලීම් සංඛ්‍යාව | 9 |
| 06 | තොරතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වර්ෂය තුළ එකතු කරන ලද ගාස්තු | රු. 27,750/- |
| 07 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව | 15 |
| 08 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව | 31 |
| 09 | තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අභියාචනා සංඛ්‍යාව | 7 |
| 10 | තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ නියමය පරිදි තොරතුරු ලබා දී ඇති වාර සංඛ්‍යාව | 2 |
| 11 | නම් කළ නිලධාරි වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සංඛ්‍යාව | 47 |
| 12 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්තා නඩත්තු කිරීම, කළමනාකරණය කිරීම සහ විනාශ කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන පරිචයන් | සටහන 01* |
| 13 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 8 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ කටයුතු | අදාළ නොවේ |

සටහන 01*: ශ්‍රී ලංකා මහ බැංකුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 7 වන වගන්තියේ විධිවිධානවලට අනුව වාර්තා හා තොරතුරු පවත්වාගෙන යයි. මීට අමතර ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019.03.07 දින අංක 09/03/002/005/2019 දරන අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

## අභ්‍යන්තර අරමුදල් හා තැන්පතු රක්ෂණ අරමුදල් කළමනාකරණය

බැංකුවේ පුළුල් ප්‍රතිපත්ති අරමුණු සපුරාලන ඒකාබද්ධ ආයෝජන රාමුවක් යටතේ අභ්‍යන්තර අරමුදල් සහ තැන්පතු රක්ෂණ ක්‍රමයේ අරමුදල් කළමනාකරණය සිදු කරනු ලැබේ.

ආරක්ෂාව, ද්‍රවශීලතාව සහ අවදානම මත ගලපන ලද තිරසාර ප්‍රතිලාභ සඳහා ප්‍රමුඛත්වය දෙමින් අදාළ ආයෝජන මූලධර්මවලට අනුකූල ව මෙම අරමුදල් කළමනාකරණය කෙරේ.

සියලුම ආයෝජන ක්‍රියාකාරකම් පාලක මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්ති, අවදානම් රුචිය සහ උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ පරාමිතීන්ට අනුව මෙහෙයවනු ලබන ව්‍යුහගත ප්‍රවේශයකට අනුව සිදු කරනු ලබයි.

අඛණ්ඩ වෙළෙඳපොළ විශ්ලේෂණය සහ විචක්ෂණශීලී අවදානම් නිරීක්ෂණය මත පදනම් ව ආයෝජන තීරණ සඳහා සහාය ලබා ගැනෙන අතර රජයේ සුරැකුම්පත් සහ අනෙකුත් සුදුසුකම් ලත් වත්කම් කාණ්ඩ හරහා ආයෝජන කලඹ විවිධාංගීකරණය කර ඇත.

ශක්තිමත් කරන ලද මෙහෙයුම් පද්ධති, වැඩිදියුණු කළ තාක්ෂණික වේදිකා සහ දැඩි අනුකූලතා පිළිවෙත්, මෙම අරමුදල් කළමනාකරණයෙහි පාරදෘශ්‍යභාවය සහ ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම බැංකුවේ අරමුණු සමඟ අනුගත වී ඇති බව සහතික කරයි.

# පාලනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් කටයුතු ඵලදායී ව අධීක්ෂණය, වගවීම සහ නිසි කළමනාකරණය සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති මහ බැංකුවේ පාලන ව්‍යුහය ප්‍රධාන මණ්ඩල දෙකකින් සමන්විත වේ. ඒවා නම් පාලක මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයයි. මෙම මණ්ඩල දෙක ස්ථාපිත කර ඇත්තේ වෙනස් ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කිරීම සඳහා ය.

## පාලක මණ්ඩලය

මුදල් ප්‍රතිපත්තිය හැර මහ බැංකුවෙහි කටයුතු පරිපාලනය සහ කළමනාකරණය අධීක්ෂණය කිරීම සම්බන්ධ ව පාලක මණ්ඩලය වගකිව යුතු ය. මහ බැංකු අධිපතිවරයා පාලක මණ්ඩලයේ සභාපතිවරයා වන අතර ආර්ථික විද්‍යාව, බැංකුකරණය, මූල්‍ය, ගිණුම්කරණය සහ විගණනය, නීතිය හෝ අවදානම් කළමනාකරණය යන අංශවල විශේෂඥතාවක් සහිත තවත් සාමාජිකයින් හය දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ.

බැංකුවේ පොදු ප්‍රතිපත්ති හා සම්බන්ධ තීරණ ගැනීම, ආයතනික උපායමාර්ගය සකස් කිරීම, අයවැය සහ මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම සහ අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ කටයුතු අධීක්ෂණය කිරීම පාලක මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

## මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය

මෙම මණ්ඩලයට පැවරී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ දේශීය මිල ස්ථායීතාව අත්කර ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සමඟ සමපාත වන නම්‍යශීලී විනිමය අනුපාත ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමයි. එහි සභාපතිවරයා ලෙස මහ බැංකු අධිපති කටයුතු කරන අතර පාලක මණ්ඩලයේ සාමාජිකයින් සහ ආර්ථික විද්‍යාව හෝ මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥයින් දෙදෙනෙක් ද මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සඳහා වගකිව යුතු නියෝජ්‍ය අධිපතිවරු දෙදෙනා ද මෙහි සාමාජිකයින් ලෙස කටයුතු කරති.

මෙම ව්‍යුහය හරහා ශ්‍රී ලංකා මහ බැංකුව විනිවිදභාවය, වගවීම සහ අඛණ්ඩත්වය සහතික කරයි.

## පාලක සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් පත් කිරීම හා ධූර කාලය

මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශය මත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ වගන්තිය අනුව ස්ථාපිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ඇති ව ජනාධිපතිවරයා විසින් මහ බැංකු අධිපතිවරයා, පාලක මණ්ඩල සාමාජිකයින් සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සඳහා විශේෂඥ සාමාජිකයින් පත් කරනු ලැබේ. අධිපතිවරයා හැර අනෙකුත් පත් කරන ලද සාමාජිකයෝ විධායක නොවන නිලධාරින් ලෙස සේවය කරති.

අධිපතිවරයාගේ සහ පත් කරන ලද සාමාජිකයින්ගේ ධූර කාලය වසර හයක් වන අතර තවත් එක් ධූර කාලයක් සඳහා නැවත පත් කිරීමට ද හැකිය. එසේ වුව ද සමස්ත ධූර කාලය වසර දොළහක් නොඉක්මවිය යුතුය.

## පාලක මණ්ඩල සංයුතිය

- ආචාර්ය නන්දලාල් වීරසිංහ - අධිපති (සභාපති)
- නිහාල් ෆෝන්සේකා මහතා - පත් කළ සාමාජික
- ආචාර්ය රවීන්ද්‍ර රත්නායක - පත් කළ සාමාජික
- අනුෂ්ක විජේසිංහ මහතා - පත් කළ සාමාජික
- විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා - පත් කළ සාමාජික
- මනිල් ජයසිංහ මහතා - පත් කළ සාමාජික
- මෛත්‍රී වික්‍රමසිංහ මහතා - පත් කළ සාමාජික
  - *පාලක මණ්ඩලයෙහි ලේකම් - දීමුතු සමරතුංග මිය, සහකාර අධිපති*

## මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සංයුතිය

- ආචාර්ය නන්දලාල් වීරසිංහ - අධිපති (සභාපති)
- නිහාල් ෆොන්සේකා මහතා - පත් කළ සාමාජික
- ආචාර්ය රවීන්ද්‍ර රත්නායක - පත් කළ සාමාජික
- අනුෂ්ක විජේසිංහ මහතා - පත් කළ සාමාජික
- විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා - පත් කළ සාමාජික
- මනිල් ජයසිංහ මහතා - පත් කළ සාමාජික
- මෛත්‍රී වික්‍රමසිංහ මහතා - පත් කළ සාමාජික
- ආචාර්ය දුෂ්නි වීරකෝන් - පත් කළ සාමාජික (විශේෂඥ)
- මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ - පත් කළ සාමාජික (විශේෂඥ)
- ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර - මිල ස්ථායිතාව භාර නියෝජ්‍ය අධිපති/සාමාජික
- සිරිකුමාර කුඩාගම මහතා - මූල්‍ය පද්ධති ස්ථායිතාව භාර නියෝජ්‍ය අධිපති/සාමාජික
  - *මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයෙහි ලේකම් - දීමුතු සමරතුංග මිය, සහකාර අධිපති*

## පාලක සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීම්

පාලක මණ්ඩලය අවම වශයෙන් මසකට වරක්වත් රැස්වන අතර මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අවම වශයෙන් සෑම මාස දෙකකට වරක්වත් රැස් වේ. සභාපතිවරයාට රැස්වීම් කැඳවීමේ බලය ඇති අතර ඊට අමතරව ඕනෑම සාමාජිකයින් දෙදෙනෙකුගේ ලිඛිත ඉල්ලීමක් මත ද රැස්වීමක් කැඳවිය හැකිය.

පාලක මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් පස් දෙනෙකු වන අතර මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූරණය අධිපතිවරයා හෝ මිල ස්ථායිතාව භාර නියෝජ්‍ය අධිපතිවරයා ඇතුළු ව සාමාජිකයින් අට දෙනෙකු වේ.

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සෑම රැස්වීමකින් ම පසුව මෑත කාලීන ආර්ථික ප්‍රවණතා සහ ආර්ථික දැක්ම පිළිබඳ පැහැදිලි කිරීම් සමඟ මුදල් ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශයට පත් කරයි.

# පාලනය




* රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ කටයුතු 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කරන ලද අතර 2026 ජනවාරි 01 දින සිට රජයේ ණය කළමනාකරණ මෙහෙයුම් කටයුතුවල සම්පූර්ණ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පවරන ලදි.

** 2026 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මූල්‍ය සමාවේශන දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලදි.

# පාලනය

## මණ්ඩල අනු කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය ශක්තිමත් කිරීමට හා මෙහෙයුම් අධීක්ෂණය සහතික කිරීමට පාලක මණ්ඩලය යටතේ විශේෂයෙන් පිහිටුවන ලද මණ්ඩල අනු කමිටු කිහිපයක් ඇත. ඒවා නම්,

- විගණන කමිටුව
- මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව
- මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව
- ආචාර ධර්ම කමිටුව

## ප්‍රතිපත්ති හා සම්බන්ධිත අනෙකුත් කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික විශ්ලේෂණය සඳහා කැප වූ කොන්දේසි හා ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ උපදෙස් දීමට ද කමිටු ස්ථාපනය කර ඇත එනම්

- මුදල් ප්‍රතිපත්ති කමිටුව
- මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව

## අධීක්ෂණ, කළමනාකරණ හා මෙහෙයුම් කමිටු

අධීක්ෂණ හා කළමනාකරණ කමිටු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය සඳහා සහාය දක්වයි. එම කමිටුවලට ඇතුළත් වන්නේ,

- ආයතනික කළමනාකරණ කමිටුව
- තොරතුරු තාක්ෂණ අධීක්ෂණ කමිටුව
- ආයෝජන අධීක්ෂණ කමිටු
  - අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුව
  - ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුව
  - සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන අධීක්ෂණ කමිටුව
- මූල්‍ය අවදානම් කළමනාකරණ කමිටුව
- මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව

මෙහෙයුම් කටයුතු සඳහා පහත කමිටු සහාය වෙති.

### මෙහෙයුම් කමිටු

- වෙළෙඳපොළ මෙහෙයුම් කමිටුව
- මානව ප්‍රාග්ධන කමිටුව
- සුවතා කමිටුව
- ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණ කමිටුව

## ජාතික මට්ටමේ කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය අංශ සංවර්ධනය හා ස්ථාවරත්වය ප්‍රවර්ධනය කරන ප්‍රධාන ජාතික කමිටුවලට ද දායක වේ.

- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, මුදල් ප්‍රතිපත්තිය සහ මූල්‍ය පද්ධති ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණ කවුන්සිලය
- මූල්‍ය අංශ අධීක්ෂණ කමිටුව
- අර්බුද කළමනාකරණ කමිටුව
- මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික කවුන්සිලය
- ජාතික ගෙවීම් කවුන්සිලය
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුව
- තිරසර මූල්‍ය ඉදිරි දැක්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන පාර්ශ්වකරුවන්ගේ කමිටුව

### චර්යාධර්ම සංග්‍රහය

ශ්‍රී ලංකා මහ බැංකුවේ චර්යා ධර්ම සංග්‍රහය මණ්ඩල, සාමාජිකයින් හා සේවකයින් අතර සුපිළිපන් බව, වෘත්තීයභාවය සහ සදාචාරාත්මක හැසිරීම ප්‍රවර්ධනය කරයි.

මෙම සංග්‍රහය මගින් වෘත්තීය ක්‍රියාකාරකම්වල දී පවත්වා ගත යුතු ඉහළ ආචාර ධර්ම ප්‍රමිතීන්, බැඳියාවන් අතර ගැටුම් හෙළිදරව් කිරීම සහ රාජකාරියට අදාළ පොදු නොවන තොරතුරුවල දැඩි රහස්‍යභාවය සුරැකීම තහවුරු කර තිබේ. සේවක හැසිරීම සඳහා වෘත්තීයභාවය සහ වගවීම, මූලික වන අතර අදාළ සියලුම නීති, රෙගුලාසි සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති සමඟ දැඩි අනුකූලතාවකින් යුතුව කටයුතු කිරීමේ අවශ්‍යතාව ද දක්වා ඇත.

### දෘෂ්කෘත නිවේදන ප්‍රතිපත්තිය (whistleblowing policy)

මහ බැංකුවේ දෘෂ්කෘත නිවේදන ප්‍රතිපත්තිය හරහා ආචාර ධර්ම විරෝධී හැසිරීම්, අයථා ක්‍රියාකාරකම් රහසිගත ව වාර්තා කිරීමට එහි සේවකයින්ට ඉඩ ප්‍රස්ථාවක් ලබා දී ඇති අතර එය විනිවිදභාවය සහ වගවීමේ පරිසරය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට හේතු වී ඇත. යහපත් විශ්වාසයකින් ක්‍රියා කරන හා රහස් හෙළි කරන්නන්, පළිගැනීම් සහ වෙනස්කම්වලට භාජනය වීමෙන් වළක්වන අතර සියලුම වාර්තා කිරීම් අවශ්‍ය පරිදි සුදුසු පිළියම් ක්‍රියාමාර්ග සමඟ පරිපූර්ණ සහ අපක්ෂපාතී පරීක්ෂණයකට යටත් වේ.

### දත්ත පාලනය

මහ බැංකුව එහි දත්තවල සංවේදීතාව සැලකිල්ලට ගෙන එහි තොරතුරුවල විශ්වසනීයත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දත්ත පාලනයට ප්‍රමුඛත්වය දෙයි. ඒ අනුව නිවැරදි, සම්පූර්ණ සහ විශ්වසනීය දත්ත එහි දත්ත කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් වේ. එසේම දත්ත ආරක්ෂණ නීතිවලට අනුකූල වීම අත්‍යවශ්‍ය වන අතර දත්ත ආරක්ෂණ පියවර තුළින් දත්ත සඳහා අනවසර ප්‍රවේශය, උල්ලංඝනය කිරීම් මෙන්ම වෙනත් තර්ජනවලින් දත්ත ආරක්ෂා කිරීමට ද කටයුතු යොදා ඇත. අදාළ තනතුරු සහ ඒවායේ වගකීම් මත පදනම් ව සංවේදී තොරතුරු වෙත ප්‍රවේශ වීම දැඩි ලෙස නියාමනය කරනු ලැබේ.

# මණ්ඩල අනු කමිටු

## විගණන කමිටුව (AC)

**අරමුණ හා කාර්යය**

ව්‍යුහාත්මක හා ක්‍රමානුකූල ආකාරයකින් උපදෙස් හා මග පෙන්වීම් ලබා දීමේ දී විනිවිදභාවය හා වගවීම සහතික කිරීම. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 103 වන වගන්තිය අනුව අභ්‍යන්තර විගණන කාර්යය, මූල්‍ය ප්‍රකාශවල සුපිළිපන්බව, බාහිර විගණකවරුන් හා සම්බන්ධව කටයුතු කිරීම, දෘෂ්කෘත නිවේදන, අනුකූලතාව සහ වංචා වාර්තා කිරීම ඇතුළු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ඇගයීම හා අභ්‍යන්තර විගණන නිර්දේශවලට ඇති අනුකූලතාව සහ අවදානම් කළමනාකරණ රාමුවෙහි ඵලදායීත්වය අධීක්ෂණය කිරීම.

**සංයුතිය**

**මනිල් ජයසිංහ මහතා**
සභාපති

**ආචාර්ය රවීන්ද්‍ර රත්නායක**
සාමාජික

**මෛත්‍රී වික්‍රමසිංහ මහතා**
සාමාජික

## මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (BROC)

**අරමුණ හා කාර්යය**

පාලක මණ්ඩලය විසින් ලබාදෙන නිල බලය අනුව, මහ බැංකුව පුරා ක්‍රියාත්මක වන ආයතනික මට්ටමේ අවදානම් කළමනාකරණ රාමුව (Enterprise-wide Risk Management Framework) සහ අනුකූලතා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඒවායේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් පාලන රාමුවට අනුකූලව, ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශයන් අනුව අවදානම් කළමනාකරණය හා අනුකූලතා ක්‍රියාවලීන් සඳහා විශේෂ අවධානයක් යොමු කරමින්, ඒ සම්බන්ධයෙන් පුළුල් ප්‍රතිපත්ති හා උපායමාර්ග ස්ථාපිත කිරීම.

**සංයුතිය**

**නිහාල් ෆොන්සේකා මහතා**
සභාපති

**ට්‍රෙවින් ජයසේකර මහතා**
බාහිර සාමාජික

**රනෙල් විජේසිංහ මහතා**
බාහිර සාමාජික

## ආචාර ධර්ම කමිටුව (EC)

**අරමුණ හා කාර්යය**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 22 සහ 25 වගන්ති යටතේ අවශ්‍යතා සපුරාලන ආචාරධර්ම, නියාමන අවශ්‍යතා සහ යහ පාලන භාවිතයන් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති, තීරණ සහ මෙහෙයුම් අනුකූල වන බව සහතික කිරීම සඳහා උපදේශක සහ අධීක්ෂණ මණ්ඩලයක් ලෙස ක්‍රියා කිරීම.

**සංයුතිය**

**අනුෂ්ක විජේසිංහ මහතා**
සභාපති

**ආචාර්ය රවීන්ද්‍ර රත්නායක**
සාමාජික

**අමල් කබ්රාල් මහතා**
බාහිර සාමාජික

**සියලුම නියෝජ්‍ය අධිපතිවරු**

## මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

**අරමුණ හා කාර්යය**

මහ බැංකුවෙහි පාරිශ්‍රමික රාමුව, උපායමාර්ගික අරමුණුවලට අනුගතව වගවන, ඉහළ දක්ෂතා සහිත පුද්ගලයින් ආකර්ෂණය කර රඳවා ගැනීමට හා අභිප්‍රේරණය කිරීමට හැකිවන ලෙස සකස් කිරීම සඳහා පාලක මණ්ඩලයට උපදෙස් දීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

**නිහාල් ෆොන්සේකා මහතා**
සභාපති

**විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා**
සාමාජික

**මනිල් ජයසිංහ මහතා**
සාමාජික

**චන්ද්‍රසිරි හේවාපත්තිනි මහතා**
බාහිර සාමාජික

පාලනය

## ප්‍රතිපත්ති හා සම්බන්ධිත අනෙකුත් කමිටු

### මුදල් ප්‍රතිපත්ති කමිටුව

**අරමුණ හා කාර්යය**

සාර්ව ආර්ථික ප්‍රවණතාවන් සහ පුරෝකථන ඇගයීම සහ අනාගත මුදල් ප්‍රතිපත්ති දිශානතීන් පිළිබඳ නිර්දේශ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

මහ බැංකු අධිපති (සභාපති)

සියලුම නියෝජ්‍ය අධිපතිවරු, සහකාර අධිපතිවරු සහ ආර්ථික පර්යේෂණ, සංඛ්‍යාන, වෙළෙඳපොළ මෙහෙයුම් යන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ මුදල් සහ බැංකු අංශ අධීක්ෂණය කරන ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ

### මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව

**අරමුණ හා කාර්යය**

සාමාජිකයන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් ඉස්මතු කරන ලද මූල්‍ය පද්ධති ස්ථායීතාව හා සම්බන්ධ කරුණු ඇගයීම, මූල්‍ය පද්ධතියේ අවදානම අධීක්ෂණය කිරීම සහ තාක්ෂණික කරුණු මත පදනම් ව සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එම අවදානම් අවම කිරීම සඳහා පාලක මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

සාර්ව විචක්ෂණතා අධ්‍යයන භාර නියෝජ්‍ය අධිපති, මිල ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපති සහ සාර්ව විචක්ෂණතා අධ්‍යයන, බැංකු අධීක්ෂණ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ, ආර්ථික පර්යේෂණ, තැන්පතු රක්ෂණ හා නිරාකරණ, ගෙවීම් සහ පියවීම් යන දෙපාර්තමේන්තු භාර සහකාර අධිපතිවරු හා එම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## අධීක්ෂණ/කළමනාකරණ/මෙහෙයුම් කමිටු

### ආයතනික කළමනාකරණ කමිටුව

**අරමුණ හා කාර්යය**

බැංකුවේ මානව ප්‍රාග්ධන නිපුණතාව සහ එහි තිරසරභාවයට බලපාන ප්‍රතිපත්ති යෝජනා පිළිබඳ ව පාලක මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ආයතනික කාර්යයන් සම්බන්ධ ගැටලු විසඳීම. තාක්ෂණික කරුණු මත පදනම් ව පාලක මණ්ඩලය විසින් ඇතැම් තීරණ ගැනීමේ බලය ආයතනික කළමනාකරණ කමිටුව වෙත ලබා දී ඇත.

**සංයුතිය**

අධිපති (සභාපති)

සියලුම නියෝජ්‍ය අධිපතිවරු සහ සහකාර අධිපතිවරු

### තොරතුරු තාක්ෂණ අධීක්ෂණ කමිටුව

**අරමුණ හා කාර්යය**

බැංකුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාමුව ආයතනික ඉලක්ක සමඟ අනුගත වන ලෙස උපායමාර්ගික දිශානතියකට යොමු කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමාලෝචනය කර පාලක මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

තොරතුරු තාක්ෂණ භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

සියලුම සහකාර අධිපතිවරු සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ

### ආයෝජන අධීක්ෂණ කමිටු

**අරමුණ හා කාර්යය**

පුළුල් ආයෝජන තීරණ ගැනීමේ දී ආයෝජන මාර්ගෝපදේශවලට අනුකූල වීම තහවුරු කිරීම, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීමට සහ සමාලෝචනය කිරීමට අවශ්‍ය තොරතුරු සැපයීම, පාලක මණ්ඩලයේ උපායමාර්ගික තීරණ මෙහෙයුම් නියෝග බවට පරිවර්තනය කිරීම, අරමුදල් කළමනාකරණ දෙපාර්තමේන්තු විසින් සිදු කරනු ලබන ආයෝජන කටයුතු අධීක්ෂණය කිරීම, නව ණය නිකුත් කිරීම කරන්නන්/ප්‍රතිපාර්ශ්වයන් අනුමත කිරීම, ආයෝජන කාර්ය සාධනය, අවදානම සහ අනුකූලතා අධීක්ෂණය, විශේෂයෙන් නොවැළැක්විය හැකි අවස්ථාවන්හි දී ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සඳහා අවශ්‍ය විචලනයන් නිර්දේශ කිරීම.

**සංයුතිය**

අදාළ දෙපාර්තමේන්තු භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති/නියෝජ්‍ය අධිපති (සභාපති)

ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනවල දක්වා ඇති පරිදි අදාළ දෙපාර්තමේන්තු අධීක්ෂණය කරන සහකාර අධිපති

### මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව

**අරමුණ හා කාර්යය**

මෙහෙයුම් සහ අනුකූලතා අවදානම් කළමනාකරණයට සුදුසු රාමුවක් ශ්‍රී ලංකා මහ බැංකුව සතු බව සහතික කිරීම සහ මෙහෙයුම් සහ අනුකූලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පාලක මණ්ඩල අනුමත ප්‍රතිපත්ති, ක්‍රමවේද සහ මාර්ගෝපදේශවලට අනුකූල ව ක්‍රියාත්මක වන බව අධීක්ෂණය කිරීම.

**සංයුතිය**

පාලක මණ්ඩලය විසින් පත් කරන ලද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති/නියෝජ්‍ය අධිපති (සභාපති)

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, සියලු නියෝජ්‍ය අධිපතිවරු, සියලු සහකාර අධිපතිවරු, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා අධ්‍යක්ෂ/ප්‍රධාන අවදානම් නිලධාරි, ප්‍රධාන අනුකූලතා නිලධාරි

# පාලනය

## මූල්‍ය අවදානම් කළමනාකරණ කමිටුව

**අරමුණ හා කාර්යය**

මහ බැංකුවෙහි මූල්‍ය ස්ථායිතාවට බලපාන වෙළෙඳපොළ, ණය, ද්‍රවශීලතා සහ අනෙකුත් අවදානම්, අනුමත අවදානම් සීමාව තුළ පවතින බව අධීක්ෂණය කිරීම සහ සහතික කිරීම.

**සංයුතිය**

මූල්‍ය දෙපාර්තමේන්තුව අධීක්ෂණය කරන නියෝජ්‍ය අධිපති (සභාපති)

දේශීය මිල ස්ථායිතාව හා මූල්‍ය පද්ධති ස්ථායිතාව භාර නියෝජ්‍ය අධිපතිවරු, දේශීය මිල ස්ථායිතා හා මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තු භාර සියලුම සහකාර අධිපතිවරුන් සහ මූල්‍ය දෙපාර්තමේන්තුව භාර සහකාර අධිපති

ඡන්දය ප්‍රකාශ නොකරන සාමාජිකයින්: ආර්ථික පර්යේෂණ, වෙළෙඳපොළ මෙහෙයුම් සහ ආයෝජන කළමනාකරණ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා අධ්‍යක්ෂ/ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන ගණකාධිකාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක

## වෙළෙඳපොළ මෙහෙයුම් කමිටුව

**අරමුණ හා කාර්යය**

මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූල ව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් පොලී අනුපාතිකය අපේක්ෂිත මට්ටමේ පවත්වා ගනිමින් අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළෙහි රුපියල් ද්‍රවශීලීතාව කළමනාකරණය කිරීම සහ නම්‍යශීලී විනිමය අනුපාතික තන්ත්‍රයට අනුකූල ව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ ව නිර්දේශ දෛනිකව ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

මිල ස්ථායිතා පද්ධති භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

ආර්ථික පර්යේෂණ සහ වෙළෙඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තු භාර සහකාර අධිපතිවරු සහ එම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## මානව ප්‍රාග්ධන කමිටුව

**අරමුණ හා කාර්යය**

බැංකුවේ මානව ප්‍රාග්ධන අවශ්‍යතා ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා උපායමාර්ගික දිශානතිය පෙන්වා දීම සහ ඒ සම්බන්ධයෙන් ආයතනික කළමනාකරණ කමිටුව වෙත අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

මානව සම්පත් භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

මානව සම්පත් භාර සහකාර අධිපති, ප්‍රධාන මානව සම්පත් නිලධාරී, මානව සම්පත් උපායමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති අධ්‍යක්ෂ, මානව සම්පත්, බැංකු විදු පියෙස, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා, සන්නිවේදන, ලේකම් යන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ අදාළ සහකාර අධිපතිවරුන් විසින් පත් කරන ලද නිත්‍ය නොවන සාමාජිකයින් හතර දෙනෙකු

## සුවතා කමිටුව

**අරමුණ හා කාර්යය**

කාර්ය මණ්ඩලයේ සුව සාධනය ආරක්‍ෂා කරමින් සුරක්ෂිත සේවා ස්ථානයක් සහ සෞඛ්‍ය සම්පන්න කාර්ය මණ්ඩලයක් බිහි කිරීම.

**සංයුතිය**

කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ, පහසුකම් කළමනාකරණ, ආරක්ෂක සේවා, මානව සම්පත් (ප්‍රධාන මානව සම්පත් නිලධාරී ඇතුළු ව), බැංකු විදු පියෙස, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ, අවදානම් කළමනාකරණය හා අනුකූලතා හා නීති දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණ කමිටුව

**අරමුණ හා කාර්යය**

පෙර සූදානම් බව ශක්තිමත් කිරීම, ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සහ අර්බුදකාරී වාතාවරණයක දී නිසි අවස්ථාවේ දී ප්‍රතිචාර දැක්වීම සම්බන්ධීකරණය කිරීම මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අත්‍යවශ්‍ය මෙහෙයුම් කටයුතු අඛණ්ඩ ව සිදු කරන බව සහතික කිරීම.

ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය අධීක්ෂණය කිරීම, මෙහෙයුම් කටයුතුවල ස්ථායිතාවට එල්ල විය හැකි අවදානම් නිරීක්ෂණය කිරීම මෙන්ම අර්බුදකාරී තත්ත්වයන් යටතේ වුව ද මහ බැංකුවට තම කටයුතු ඵලදායී ලෙස ඉටුකළ හැකි බව සහතික කිරීම.

**සංයුතිය**

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

ගෙවීම් සහ පියවීම්, තොරතුරු තාක්ෂණ, පහසුකම් කළමනාකරණ, ආරක්ෂක සේවා, මානව සම්පත්, මූල්‍ය හා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තු ප්‍රධානීන්

# පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්



## පාලනය > පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්



2025 දෙසැම්බර් 31 දිනට

## පාලනය > පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්



### නන්දලාල් වීරසිංහ

**අධිපති/ප්‍රධාන විධායක නිලධාරී**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය, ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී උපාධිය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- සභාපති - පාලක මණ්ඩලය
- සභාපති - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ නම් කරන ලද නිලධාරියා - ශ්‍රී ලංකා මහ බැංකුව



### නිහාල් ෆොන්සේකා

**මණ්ඩල සාමාජික**

විද්‍යාවේදී උපාධිය, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ, ශ්‍රී ලංකාව

ජ්‍යෙෂ්ඨ සාමාජික, බැංකුකරුවන්ගේ වරලත් ආයතනය, එක්සත් රාජධානිය

ගරු සාමාජික, සුරැකුම්පත් සහ ආයෝජන පිළිබඳ වරලත් ආයතනය, එක්සත් රාජධානිය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සභාපති - පාලක මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව
- සභාපති - මණ්ඩල මානව සම්පත් සහ වේතන කමිටුව



### රවීන්ද්‍ර රත්නායක

**මණ්ඩල සාමාජික**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය, ලා ට්‍රෝබ් විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාව

ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ආර්ථික විද්‍යාව පිළිබඳ කලාවේදී උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සාමාජික - විගණන කමිටුව
- සාමාජික - ආචාර ධර්ම කමිටුව



### අනුෂ්ක විජේසිංහ

**මණ්ඩල සාමාජික**

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ලීඩ්ස් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, යුනිවර්සිටි කොලේජ් ලන්ඩන්, එක්සත් රාජධානිය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සභාපති - ආචාර ධර්ම කමිටුව



### විශ්වනාදමූර්ති ගෝවින්දසාමි

**මණ්ඩල සාමාජික**

විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, හාර්ට්ෆර්ඩ් විශ්ව විද්‍යාලය, එක්සත් ජනපදය

ජ්‍යෙෂ්ඨ සාමාජික, සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සාමාජික - මණ්ඩල මානව සම්පත් සහ වේතන කමිටුව



### මනිල් ජයසිංහ

**මණ්ඩල සාමාජික**

ජ්‍යෙෂ්ඨ සාමාජික, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

ජ්‍යෙෂ්ඨ සාමාජික, වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය, එක්සත් රාජධානිය

ජ්‍යෙෂ්ඨ සාමාජික, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය

සාමාජික, වරලත් රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණ ආයතනය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සභාපති - විගණන කමිටුව
- සාමාජික - මණ්ඩල මානව සම්පත් සහ වේතන කමිටුව



**මෛත්‍රී වික්‍රමසිංහ**

**මණ්ඩල සාමාජික**

ජනාධිපති උපදේශක
ජ්‍යෙෂ්ඨ සාමාජික, කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනය, එක්සත් රාජධානිය

නීතිවේදී උපාධිය (ගෞරව),
කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සාමාජික - විගණන කමිටුව



**දුෂ්නි වීරකෝන්**

**මණ්ඩල සාමාජික**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය,
මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය,
මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය,
බෙල්ෆාස්ට්හි රැජින විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය



**ප්‍රියංග දුනුසිංහ**

**මණ්ඩල සාමාජික**

ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය



**චන්ද්‍රනාත් අමරසේකර**

**නියෝජ්‍ය අධිපති**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය,
මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයේ, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය,
මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ කලාවේදී උපාධිය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සාමාජික - ආචාර ධර්ම කමිටුව



**සිරිකුමාර කුඩාගම**

**නියෝජ්‍ය අධිපති**

නීතිපති උපාධිය,
මොනෑෂ් විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාව

නීතිපති උපාධිය,
කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීතිවේදී උපාධිය,
කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩල
- සාමාජික - ආචාර ධර්ම කමිටුව

# ආයතනික කළමනාකාරිත්වය



**රුවනි ගුණසේකර**
සහකාර අධිපති

**චාමින්ද බණ්ඩාර**
සහකාර අධිපති

**පී කේ ජී හරිස්චන්ද්‍ර**
සහකාර අධිපති (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මුදා හැර ඇත)

**චන්ද්‍රනාත් අමරසේකර**
නියෝජ්‍ය අධිපති

**නන්දලාල් වීරසිංහ**
අධිපති



අනුරාධා දිල්රුක්ෂිණී
සහකාර අධිපති

දිමුතු සමරතුංග
සහකාර අධිපති

එනෝකා මොහොට්ටි
සහකාර අධිපති

නෙළුමනී දවුලගල
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති

සිරිකුමාර කුඩාගම
නියෝජ්‍ය අධිපති

2025 දෙසැම්බර් 31 දිනට

# ප්‍රධාන නිලධාරීන්

## දෙපාර්තමේන්තු ප්‍රධානීන් (2025 දෙසැම්බර් 31 වන දිනට)



## පාලනය > ප්‍රධාන නිලධාරීන්

**මහින්ද ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ, අවදානම් කළමනාකරණ සහ අනුකූලතා

**සමන් නානායක්කාර**
ප්‍රධාන අනුකූලතා නිලධාරි

**ඩිලනි කරුණාරත්න**
අධ්‍යක්ෂ, තැන්පතු රක්ෂණ හා නිරාකරණ

**කල්හාරි මායාදුන්න**
ප්‍රධාන අභ්‍යන්තර විගණක

**මේනකා ජයවර්ධන**
අධ්‍යක්ෂ,
බැංකු විදු පියෙස

**සිසිර විතාරණ**
අධ්‍යක්ෂ,
පහසුකම් කළමනාකරණ

**ප්‍රියන්ත හේරත්**
අධ්‍යක්ෂ,
තොරතුරු තාක්ෂණ

**චතුර ආරියදාස**
අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය සංවර්ධන



**ප්‍රියන්ත තිලකවීර**
අධ්‍යක්ෂ,
සාර්ව විචක්ෂණතා අධ්‍යයන

**අනිල් පෙරේරා**
අධ්‍යක්ෂ,
වෙළෙඳපොළ මෙහෙයුම්

**සුභානි කීර්තිරත්න**
අධ්‍යක්ෂ,
මූල්‍ය බුද්ධි ඒකකය

**ලසන්ති සිරිමාන්න**
ප්‍රධාන ගණකාධිකාරී

**රුක්ෂණා ද සිල්වා ජයතිලක**
අධ්‍යක්ෂ,
බැංකු අධීක්ෂණ

**රාජා දයානන්ද**
මහ බැංකු ලේකම්

**සංජී බාලසූරිය**
ප්‍රධාන තොරතුරු
ආරක්ෂණ නිලධාරි

2025 දෙසැම්බර් 31 දිනට

## අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් (2025 දෙසැම්බර් 31 වන දිනට)



**සුරේකා කැටවල**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ



**ලසන්තා සිරිවර්ධන**
අතිරේක අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල



**ලසිත පත්බේරිය**
අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ



**සුනන්ද ඔබේසේකර**
අතිරේක අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්



**උදයන්ති තෙන්නකෝන්**
අතිරේක ලේකම්, ලේකම් දෙපාර්තමේන්තුව



**චන්ද්‍රිකා රාජපක්ෂ**
අතිරේක අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල



**ඩිල්හාන් ද සිල්වා**
අතිරේක අධිකාරී, ව්‍යවහාර මුදල්



**ලංකාපති ශ්‍රීධරන්**
අතිරේක අධ්‍යක්ෂ, සාර්ව විචක්ෂණතා අධ්‍යයන



**අයේෂ් ආරියසිංහ**
අතිරේක අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය



**ඉඳුනිල් ඒකනායක**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු විදු පියෙස



**චතුර ගමගේ**
අතිරේක අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ



**ප්‍රියංකා වීරසේකර**
අතිරේක ලේකම්, ලේකම් දෙපාර්තමේන්තුව



**එරන්දි වීරසිංහ**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ



**මනීෂා විමලසූරිය**
අතිරේක අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්



**සිසිර ජයසේකර**
අතිරේක ප්‍රධාන ගණකාධිකාරී

## පාලනය > ප්‍රධාන නිලධාරීන්



**විපුල වික්‍රමාරච්චි**
අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ



**නිශාන්ත ජයවීර**
අතිරේක අධ්‍යක්ෂ, ආයෝජන කළමනාකරණ



**මල්කාන්ති වරකාගොඩ**
අතිරේක අධ්‍යක්ෂ, මානව සම්පත්



**නයනා පෙරේරා**
අතිරේක අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල



**මානෙල් දමයන්ති**
අතිරේක අධිකාරී, ව්‍යවහාර මුදල්



**ශාන් කුරින්චිදරන්**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ



**පවිත්‍රි විතානගේ**
අතිරේක අධ්‍යක්ෂ, නීති



**ඩිලිනි විලත්ගමුව**
අතිරේක අධ්‍යක්ෂ, නීති



**එරන්දි ලියනගේ**
අතිරේක ලේකම්, ලේකම් දෙපාර්තමේන්තුව



**ප්‍රදීපා කුමාරි**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ



**නිරෝධා මල්ලිකාරච්චි**
අතිරේක අධ්‍යක්ෂ, මානව සම්පත්

# විගණන කමිටු වාර්තාව

**පාලනය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව අභ්‍යන්තර පාලනයන් සහ මූල්‍ය වර්තාකරණයේ ඵලදායීතාව ශක්තිමත් කරමින් විගණන කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය සහ කළමනාකාරිත්වය වෙත ක්‍රමවත් අධීක්ෂණයක් සහ මග පෙන්වීමක් අඛණ්ඩ ව සපයන ලදි.**

## 1. විගණන කමිටුවේ කාර්යභාරය

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 103(4) වගන්තියට අනුව විගණන කමිටුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය යටතට (අ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය අධීක්ෂණය කිරීම (ආ) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විසින් නිකුත් කරන ලද නිරීක්ෂණ සහ නිර්දේශවලට ඇති අනුකූලතාව අධීක්ෂණය කිරීම (ඇ) විගණන නිරීක්ෂණයන් සම්බන්ධයෙන් විගණකවරුන් සමඟ සාකච්ඡා කිරීම (ඈ) විගණකවරුන් සමඟ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම ඇතුළත් වේ. ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 103(6) වගන්තියට අනුව පාලක මණ්ඩලය විසින් විගණන කමිටුවේ සංයුතිය සහ බලතල, කාර්ය සහ කර්තව්‍ය ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන ප්‍රඥප්තියෙහි නිර්වචනය කර ඇත. මෙම නීතිමය පදනම මඟින් ජාත්‍යන්තර යහ පරිචයන් සමඟ අනුගතවන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ මූල්‍ය වගවීම පිළිබඳ කැපවීම තවදුරටත් ශක්තිමත් කරමින්, අභ්‍යන්තර පාලන ක්‍රමවේද ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම, නියාමන අනුකූලතාව ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් පිළිබඳ මහජන විශ්වාසය ප්‍රවර්ධනය කිරීම සඳහා විගණන කමිටුවේ ස්වාධීනත්වය සහ අධීක්ෂණ බලතල තහවුරු කරයි.

2025 වර්ෂය තුළ විගණන කමිටුව, පාලක මණ්ඩලයේ පහත සඳහන් පත් කළ සාමාජිකයන්ගෙන් සමන්විත විය.

i. **මනිල් ජයසිංහ මහතා** - සභාපති
ii. **ආචාර්ය රවින්ද්‍ර රත්නායක** - සාමාජික
iii. **රජීව් අමරසූරිය මහතා** - සාමාජික (2025 ජූනි 27 දක්වා)
iv. **මෛත්‍රී වික්‍රමසිංහ මහතා** - සාමාජික (2025 ඔක්තෝබර් 23 දින සිට)

පාලක මණ්ඩලයේ ලේකම්වරයා විගණන කමිටුවේ ලේකම්වරයා වන අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා, විගණන කමිටුවේ සහකාර ලේකම් ධූරය දරයි. විගණකාධිපතිවරයාගේ නියෝජිතයකු සියලුම විගණන කමිටු රැස්වීම්වල දී නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී වේ.

කමිටු සාමාජිකයින් හා රැස්වීම් සඳහා සහභාගි වීම්

| | සහභාගි වීම සඳහා සුදුසුකම්ලත්/සහභාගි වූ |
|---|---|
| **මනිල් ජයසිංහ මහතා** - සභාපති | 13/13 |
| **ආචාර්ය රවින්ද්‍ර රත්නායක** - සාමාජික | 13/13 |
| **රජීව් අමරසූරිය මහතා** - සාමාජික | 08/05 |
| **මෛත්‍රී වික්‍රමසිංහ මහතා** - සාමාජික | 02/02 |

## 2. විගණන ප්‍රඥප්තිය

පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන ප්‍රඥප්තිය, විගණන කමිටුවේ සංයුතිය, අධිකාරිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය නිර්වචනය කරන අතර පාලනය පිළිබඳ ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූලව එහි ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කරයි. විගණන ප්‍රඥප්තිය බැංකුවේ මෙහෙයුම්වල පාලනය, අනුකූලතාව, අවදානම කළමනාකරණය, අභ්‍යන්තර පාලන පරිසරය සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ස්වාධීන අධීක්ෂණයක් සඳහා අවශ්‍ය ක්‍රමවත් පද්ධතිමය රාමුවක් සපයයි.

එහි අධිකාරි බලය සම්පූර්ණ කිරීම සහ කාර්යයන් ඵලදායී ව සිදු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු, දත්ත, කළමනාකාරිත්වය සහ විගණන වාර්තා වෙත ඇති නිර්බාධි ප්‍රවේශය සඳහා විගණන කමිටුව බල ගන්වා ඇත. එසේ ම වාස්තවික තීරණ ගැනීම සහ දැනුම්වත් පාලනය සඳහා පහසුකම් සැලසීමට, අවශ්‍ය අවස්ථාවන්හි දී ස්වාධීන හා බාහිර උපදේශකයන්ගේ සේවය ලබාගැනීමට අවශ්‍ය අධිකාරි බලය විගණන ප්‍රඥප්තිය මඟින් කමිටුවට ලබා දී ඇත.

මීට අමතරව විගණන ක්‍රියාවලිය කාර්යක්ෂම ව සිදු කිරීම, විගණන නිරීක්ෂණය සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම, උද්ගත වෙමින් පවතින අවදානම් සඳහා පාලන ව්‍යූහයන්ගේ ඇති ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම සඳහා පාලක මණ්ඩලය සහ අභ්‍යන්තර හා බාහිර විගණකයින්, අනෙකුත් තහවුරු කරන්නන් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට විගණන කමිටුව කටයුතු කරයි. මූල්‍ය ප්‍රකාශ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව සත්‍ය හා සාධාරණ ආකාරයට ඉදිරිපත් කර ඇති බව තහවුරු කිරීමේ දී මූල්‍ය වාර්තාකරණය හා සබැඳි කරුණු සම්බන්ධයෙන් කළමනාකාරීත්වය සහ බාහිර විගණකයින් අතර වන එකඟ නොවීම් සමථයට පත් කිරීමට ද කමිටුව බල ගන්වා ඇත. තව ද විගණන ප්‍රඥප්තිය මගින් කමිටුවේ ක්‍රියාකාරීත්වය සඳහා පටිපාටිමය මාර්ගෝපදේශ නියමකර එහි සංයුතිය, ගණපූරණය, රැස්වීම් වාර ගණන, න්‍යාය පත්‍රය සැකසීම, වාර්තාකරණමය අවශ්‍යතා සහ කාර්යසාධන ඇගයීම පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇත.

විගණන කමිටුව විසින් එහි ක්‍රියාකාරකම්, ප්‍රධාන තීරණ හා නිර්දේශයන් මෙන්ම විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කළමනාකාරීත්ව ප්‍රගතිය පිළිබඳ සාරාංශගත වාර්තාවක් සෑම සිව්මසකට වරක් පාලක මණ්ඩලය වෙත ලබා දිය යුතුය. මෙම ව්‍යූහමය වාර්තාකරණ යාන්ත්‍රණය මහ බැංකුවේ මූල්‍යමය සහ මෙහෙයුම් කටයුතුවල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වන අඛණ්ඩ අධීක්ෂණය හා වගවීම තහවුරු කරයි.

### 3. විගණන කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

#### 3.1. අභ්‍යන්තර විගණන කර්තව්‍ය අධීක්ෂණය කිරීම

විගණන කමිටුව විසින් 2025 වසර තුළ දී පහත කටයුතු සිදුකරන ලදි.

i. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සමාලෝචනය කර අනුමත කිරීම

ii. අවදානම් පදනම් කරගත් 2026 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය සහ නිර්දේශ කිරීම, සහ අවදානම් පදනම් කරගත් 2025 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

එමෙන්ම විගණන කමිටුව විසින් පහත සමාලෝචනයන් ද සිදු කරන ලදි.

iii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කළ විගණනවල ත්‍රෛමාසික ප්‍රගතිය

iv. ක්‍රියාවලි හිමිකරුවන් වෙත ලබා දුන් අභ්‍යන්තර විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ත්‍රෛමාසික තත්ත්වය

v. කාලානුරූප ස්වයං තක්සේරු වාර්තාව සහ අභ්‍යන්තර විගණන කර්තව්‍ය පිළිබඳ 2024 වසර සඳහා වන අඛණ්ඩ අධීක්ෂණ වාර්තාව

vi. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ 2026 වසර සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම

vii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ 2026 වසර සඳහා වන අයවැය

viii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආචාරධර්ම සංග්‍රහය සහ බැඳියාවන් අතර ගැටීම් ප්‍රකාශනය

ix. අභ්‍යන්තර විගණනය පිළිබඳ වාර්ෂික සේවාදායක ප්‍රතිපෝෂණ සමීක්ෂණයේ ප්‍රතිඵල

#### 3.2. මූල්‍ය ප්‍රකාශන සහ බාහිර විගණනය පිළිබඳ සමාලෝචනය

විගණන කමිටුව විසින් වසර තුළ දී පහත සමාලෝචනයන් සිදු කරන ලදි.

i. 2024 මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික ව්‍යවස්ථාපිත විගණනයේ ප්‍රගතිය සහ 2025 මූල්‍ය වර්ෂය සඳහා වන බාහිර විගණනකරුගේ විගණන සැලැස්ම

ii. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ

iii. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බෙදාහැරිය හැකි ලාභය පිළිබඳ නිර්ණය

iv. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ විගණනයට අදාළ ව විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද බාහිර විගණකගේ අතුරු කළමනාකාරිත්ව ලිපිය, අවසන් කළමනාකාරිත්ව ලිපිය සහ ඒ සඳහා වූ මහ බැංකු කළමනාකාරිත්වයේ ප්‍රතිචාර

v. 2023 මූල්‍ය වර්ෂය සඳහා බාහිර විගණන නිරීක්ෂණයන් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

vi. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ ඇතුළු ව ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පිළිබඳ විගණකාධිපතිවරයාගේ කෙටුම්පත් වාර්තාව සහ මහ බැංකුවේ ප්‍රතිචාර

vii. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ ඇතුළු ව ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට අදාළ ව ගත් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

viii. 2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාම අරමුදල් හයේ (06) මූල්‍ය ප්‍රකාශ

ix. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශ

x. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස තුන සඳහා වූ මූල්‍ය ස්ථායීතා අරමුදලේ මූල්‍ය ප්‍රකාශ

xi. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශ

xii. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ අදාළ ප්‍රතිචාර

xiii. නව ගිණුම්කරණ ප්‍රමිතීන්, ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචන ක්‍රියාවලිය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නව අපේක්ෂිත ණය හානි ආකෘතිය ප්‍රතිග්‍රහණය කිරීම

#### 3.3. අනෙකුත් ක්‍රියාකාරකම් සමාලෝචනය

විගණන කමිටුව විසින් පහත සමාලෝචන සිදු කරන ලදි.

i. ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන ප්‍රඥප්තිය

ii. ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු සහ සයිබර් ආරක්ෂණ තත්ත්වය

iii. බැංකුවේ ඉහළ මට්ටමේ විවිධ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් පාලක මණ්ඩලය වෙත ලබා දෙන ලද කමිටුවේ අදහස්

iv. විගණන කමිටුව විසින් දෙපාර්තමේන්තු, කමිටු සහ බැංකුවේ කළමනාකාරිත්වය වෙත තමන් විසින් ලබා දුන් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

v. ශ්‍රී ලංකා මහ බැංකුවේ අයවැය, අයවැය කාර්යසාධනය සහ මූල්‍ය කාර්යසාධනය

2026 වසර තුළ දී විගණන කමිටුව විසින් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, සේවක අර්ථසාධක අරමුදල, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සහ මූල්‍ය ස්ථායිතා අරමුදල ආදියෙහි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන ලදි.

මීට අමතර ව 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ව විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද බාහිර විගණකවරයා විසින් ඉදිරිපත් කරන ලද අතුරු කළමනාකරණ ලිපිය කමිටුව විසින් සමාලෝචනය කරන ලදි.

තවදුරටත් විගණන කමිටුව 2025 වර්ෂයේ දී සිදු කළ ක්‍රියාකාරකම් පිළිබඳ ව 2026 ආරම්භයේ දී ස්වයං-ඇගයීමක් සිදු කරන ලදි.

# අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව

## අවදානම් කළමනාකරණය

දේශීය හා විදේශීය වෙළෙඳපොළ තත්ත්වයන් තුළින් මතුවන අවදානම්වලින් හෙබි පරිසරයක් තුළ ක්‍රියාත්මක වන බැවින් බැංකුවේ පරමාර්ථවලට හෝ කීර්තිනාමයට හානි කළ හැකි මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම් අවම කිරීම සඳහා සැකසූ පරිපූර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ (Risk Management Policy Statement) දක්වා ඇති නියමයන් මත පදනම් ව ගොඩනගන ලද මෙම රාමුව ගෝලීය ප්‍රමිතීන්ට හා මනා පරිචයන්ට සමගාමී වෙමින් විවිධ පාර්ශ්වකරුවන් හරහා ව්‍යුහගත අවදානම් හිමිකාරිත්වය හා වගවීම තහවුරු කරයි. මෙමඟින් සියලු මෙහෙයුම් මට්ටම් සඳහා අවදානම් අවම කිරීමේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට ද හැකියාව ලබා දෙයි.

මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (Board Risk Oversight Committee), පාලක මණ්ඩලයෙන් පැවරෙන විධිමත් අධිකාරිත්වය තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ හා අනුකූලතා කාර්යය අධීක්ෂණය කරනු ලබන අතර ශ්‍රී ලංකා මහ බැංකුවට බලපාන ඉදිරියේ දී උද්ගත විය හැකි අවදානම් ප්‍රවණතා ද සමාලෝචනය කරයි.

2025 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව ආයතනික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස ව්‍යවසාය මට්ටමේ අවදානම් කළමනාකරණ (Enterprise-wide Risk) ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් ඉහළ සිට පහළ ප්‍රවේශය (Top-down approach) නියෝජනය කරන අවදානම් රුචි රාමුවක් (Risk Appetite Framework) ක්‍රියාත්මක කරන ලදි. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන සන්ධිස්ථානයක් වූයේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය උපායමාර්ගික අරමුණු ඉටු කිරීමෙහිලා දරා ගැනීමට සූදානම් අවදානම්වල මට්ටම් හා ස්වභාවය විධිමත්ව ප්‍රකාශ කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් අවදානම ආවරණය කරන පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රථම අවදානම් රුචි ප්‍රකාශනය (Risk Appetite Statement) හඳුන්වා දීමයි. මෙය අවදානම් කළමනාකරණයෙහි මූලික වෙනසක් ඇති කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය හා උපායමාර්ගික ප්‍රමුඛතා අතර සමගාමීතාවක් ඇති කිරීමට හේතු විය.

තව ද ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති තීරණ ගැනීමට උපකාරී වන ලෙස ශේෂ පත්‍ර අවදානම ඵලදායී හා විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ශේෂ පත්‍ර අවදානම් තක්සේරු රාමුව (Balance Sheet-Risk Appetite Framework) ස්ථාපිත කරන ලදි. 2025 වර්ෂයේ දී ශේෂ පත්‍ර අවදානම් තක්සේරු රාමුව යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ශේෂ පත්‍රය සම්බන්ධ මූල්‍ය අවදානම් අධීක්ෂණය කිරීමට හා පාලක මණ්ඩලයට කාලෝචිත නිර්දේශ ලබා දීමට මූල්‍ය අවදානම් කළමනාකරණ කමිටුව (Financial Risk Management Committee) නමින් නව ආයතනික කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කරන ලදි.

### මෙහෙයුම් අවදානම

ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූල ව පහළ මට්ටමේ සිට ඉහළ මට්ටමට යන අවදානම් පාලන ස්වයං තක්සේරු ක්‍රමවේදය (Risk Control Self-Assessment – RCSA) අඛණ්ඩ ව ක්‍රියාත්මක කරන ලදි. එමඟින් එක් එක් දෙපාර්තමේන්තු පළමු පෙළ අවදානම් හිමිකරුවන් ලෙස ඉටු කරන භූමිකාව තවදුරටත් ශක්තිමත් කර ඇත. මූලාශ්‍රයේ දී ම අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය කිරීම, සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තු මට්ටමේ අවදානම් තක්සේරු ක්‍රියාවලිය අත්‍යවශ්‍ය වේ. මෙතුළින් මෙහෙයුම් දැනුම වැඩි වශයෙන් ඇති ස්ථානය වන දෙපාර්තමේන්තු තුළදීම අවදානම් හඳුනාගැනීමට හැකියාව ලැබීම නිසා දෛනික තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ අවදානම් පිළිබඳ අවබෝධය අන්තර්ගත කිරීම සහ උද්ගත විය හැකි අවදානම් කාලෝචිතව හඳුනාගැනීමට හැකි වේ.

තව ද සිද්ධි වාර්තා කිරීමේ පද්ධතිය (Incident Reporting System) තුළින් මෙම ව්‍යුහය තවදුරටත් ශක්තිමත් කරමින් වාර්තා කරන සිදුවීම් සහ ඒවාට ප්‍රතිචාර ලෙස ක්‍රියාත්මක කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීමේ හැකියාව ලබා දේ. මෙම ක්‍රියාවලිය හරහා එකතු වන තොරතුරු මධ්‍යගත අවදානම් දත්ත ගබඩාවක් (centralized risk repository) නිර්මාණය කිරීම සඳහා උපකාර වන අතර එමඟින් අවදානම් කළමනාකරණ ඒකකයට දෙපාර්තමේන්තු අතර අවදානම් ප්‍රවණතා විශ්ලේෂණය කිරීම, පාලන ක්‍රමවේදයන්ගේ කාර්යක්ෂමතාව ඇගයීම, සහ අවදානම් අවම කිරීමේ උපායමාර්ග තවදුරටත් වර්ධනය කිරීම සඳහා සහාය ලබාදේ. දෙපාර්තමේන්තු මට්ටමේ අවදානම් පාලන ස්වයං තක්සේරු ක්‍රියාවලිය සහ සිද්ධි වාර්තා කිරීමේ පද්ධතිය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් මැනවින් කළමනාකරණය කිරීමේ හැකියාව ඉහළ නංවන අතර කරමින් සමස්ත පාලන පරිසරය තවදුරටත් ශක්තිමත් කරයි.

### මූල්‍ය අවදානම්

ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර සංචිත කළමනාකරණය, දේශීය වෙළෙඳපොළ ද්‍රවශීලතා ක්‍රියාකාරකම් සහ මූල්‍ය ස්ථායීතාව පවත්වා ගැනීම වැනි මූලික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී වෙළෙඳපොළ අවදානම් සහ ණය අවදානම් සහිත පරිසරයක් ඇති වේ. මෙවැනි පසුබිමක් තුළ ලෝකයේ බොහෝ මහ බැංකු ශක්තිමත් මූල්‍ය අවදානම් කළමනාකරණ රාමුවක් සහ ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රතිපත්ති ගොඩනැංවීමට වැඩි අවධානයක් යොමු කරනු ලබයි. එයට අනුකූල ව ශේෂපත්‍ර අවදානම් රුචි රාමුව පිහිටුවීමත් සමඟින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමස්ත අවදානම් කළමනාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කර ඇති අතර විවිධ අවස්ථා යටතේ ශේෂපත්‍ර යේ හිමිකම් පුරෝකථනය කිරීම සඳහා ආතති පරීක්ෂණ සිදු කරමින් එම පරීක්ෂණවල ප්‍රතිඵල මූල්‍ය අවදානම් කළමනාකරණ කමිටුව, මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සහ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි.

2025 වර්ෂය තුළ ජාත්‍යන්තර සංචිත (International Reserves&, තැන්පතු රක්ෂණ හා නිරාකරණ දෙපාර්තමේන්තු අරමුදල් (Deposit Insurance and Resolution Department Funds) ඇතුළු අභ්‍යන්තර ආයෝජන අරමුදල් (Internal Investment Funds) සහ සේවක අර්ථසාධක අරමුදල (Employees' Provident Fund) සම්බන්ධ අරමුදල් කළමනාකරණ කටයුතු නියමිත පරිදි සමාලෝචනය කරන ලදි.
ස්ථාපිත පාලන හා අධීක්ෂණ සැලසුම් අනුව සෑම ප්‍රධාන මූල්‍ය හා මූල්‍ය නොවන අවදානමක් ම අදාළ ආයෝජන අධීක්ෂණ කමිටු/මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කළ අතර තීරණාත්මක අවස්ථාවල දී මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටු හරහා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි.

## අනුකූලතා කාර්යය

මහ බැංකුව එයට අදාළ වන නීතිමය, ව්‍යවස්ථාමය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුකූල වීම සහතික කිරීම සඳහා ශක්තිමත් අනුකූලතා රාමුවක් ස්ථාපනය කර ඇත. එමඟින් ආයතනය තුළ ශක්තිමත් අනුකූලතා සංස්කෘතියක් ප්‍රවර්ධනය කෙරේ.

සියලුම දෙපාර්තමේන්තු තමන්ට අදාළ කාර්යයන්ගෙන් පැන නගින අනුකූලතා අවදානම් හඳුනා ගැනීම, අවම කිරීම සහ ස්ථාපිත යාන්ත්‍රණයන් හරහා වාර්තා කිරීම සඳහා වගකීම දරන අතර ආයතනය පුරා අනුකූලතා අවදානම් කළමනාකරණය පිළිබඳ ස්වාධීන අධීක්ෂණය මහ බැංකුවේ අනුකූලතා ඒකකය විසින් සිදු කරනු ලැබේ. වාර්තා කරන ලද අනුකූලතා ගැටලු සමාලෝචනය කිරීම සහ ඇගයීම් කිරීම, ඒවායේ තීව්‍රතාව තක්සේරු කිරීම හා අවධානයට ලක්විය යුතු වැදගත් කරුණු අදාළ පාලන කමිටු වෙත යොමු කිරීමට පහසුකම් සැලසීම මෙන්ම නිර්දේශිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම ද මීට ඇතුළත් වේ.

මීට අමතර ව මහ බැංකුව සිය ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කටයුතුවල දී මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ දැඩි අවශ්‍යතා බලාත්මක කරනු ලබයි. මෙහි දී අදාළ නීතිමය සහ නියාමන රාමුවලට අනුකූල ව සියලුම විදේශීය පාර්ශවකරුවන් සඳහා ඔබේ පාරිභෝගිකයා හඳුනා ගැනීම සහ ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගය (KYC and CDD) පිළිබඳ පියවර අනුගමනය කරනු ලැබේ.

## තොරතුරු සහ සයිබර් ආරක්ෂණ අවදානම

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ආයතනික අවදානම් කළමනාකරණ රාමුව යටතේ දෙවන පේළියේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීම සඳහා තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ඒකකය 2025 වසරේ දී පිහිටුවන ලදි. පාලනය, ප්‍රතිපත්තිමය මඟපෙන්වීම්, තොරතුරු ආරක්ෂක අනුකූලතා අධීක්ෂණය මෙන්ම තොරතුරු සහ සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් නිරීක්ෂණය කිරීම හරහා ශ්‍රී ලංකා මහ බැංකුව තුළ සයිබර් ප්‍රතිරෝධීතාව ශක්තිමත් කිරීම මෙම ඒකකයේ වගකීම වේ.

පළමු පෙළේ කාර්යභාරයන්ගෙන් ස්වාධීන ව ක්‍රියාත්මක වන තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ඒකකය සියලුම දෙපාර්තමේන්තු හරහා සිදු වන තොරතුරු සහ සයිබර් ආරක්ෂණ අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ අවම කිරීමේ ක්‍රියාවලි අධීක්ෂණය කරයි. පළමු පෙළේ සියලු දෙපාර්තමේන්තු සිය අවදානම් හිමිකරුවන් ලෙස තමන්ගේ කාර්යභාරයන්ගෙන් උද්භව වන තොරතුරු සහ සයිබර් අවදානම් හඳුනා ගෙන ස්ථාපිත වාර්තාකරණ නාලිකා මඟින් ඒවා ඉක්මනින් වාර්තා කිරීමේ වගකීම දරන අතර තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ඒකකය විසින් එම අවදානම් ඇගයීමේ අනුකූලතාව සහතික කිරීම, ජාත්‍යන්තර තොරතුරු ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් සයිබර් අවදානම් තත්ත්වයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සිදු කරයි. මෙහි ප්‍රගතිය නිරන්තරයෙන් මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව, මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව, සහ පාලක මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

# අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මහ බැංකුවේ වටිනාකම් නිර්මාණය කිරීම, ආරක්ෂා කිරීම සහ පවත්වා ගැනීම සඳහා ස්වාධීන, අවදානම් මත පදනම් වූ සහ වාස්තවික තහවුරුවක්, උපදෙස්, දැක්මක් සපයන අතර පාලනය, අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලීන්හි ඵලදායීතාව ඇගයීමට සහ වැඩිදියුණු කිරීමට විනයවත් සහ පද්ධතිමය ප්‍රවේශයක් ගෙන ඒමෙන් බැංකුවට එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වේ. අවදානම් කළමනාකරණ රාමුවේ තෙවැනි පෙළ ලෙස කටයුතු කරමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, මහ බැංකුවේ මෙහෙයුම් සඳහා වටිනාකම් එකතු කිරීමට සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය අනාගතය කේන්ද්‍ර කර ගත් නිර්දේශ සපයයි. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා (CIA), අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානියා ලෙස මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා කාර්යමය වශයෙන් විගණන කමිටුවටත්, පරිපාලනමය වශයෙන් අධිපතිවරයාටත් වාර්තා කරයි. අභ්‍යන්තර විගණන කාර්යයේ වැදගත්කම ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 102 වගන්තියෙන් මනාව පිළිගෙන ඇති අතර එහි අභ්‍යන්තර විගණන කාර්යයේ පාලනය, ස්වාධීනත්වය සහ වාස්තවික බව ආරක්ෂා කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත තොරතුරු සඳහා ඇති නිර්බාධී ප්‍රවේශය සහතික කරන අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ පත් කිරීම සහ ඉවත් කිරීම ද නිර්වචනය කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 102 (5) වගන්තිය ප්‍රකාර ව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය, ආයතන ව්‍යුහය තුළ ස්ථානගත වීම සහ වාර්තාකරණයේ වගකීම් ඇතුළු විෂය පථය, අධිකාරී බලය සහ කොන්දේසි, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යය සහ වගකීම් සහිත ව, පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මහ බැංකුවේ විගණන ප්‍රඥප්තියේ නිර්වචනය කර ඇත.

තව ද 2025 වසර තුළ දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ (Institute of Internal Auditors), නව ගෝලීය අභ්‍යන්තර විගණන ප්‍රමිතීන් (GIAS) ප්‍රතිග්‍රහණය කරන ලද අතර මෙමගින් 2009 සිට ප්‍රතිග්‍රහණය කරන ලද අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා වූ දිගුකාලීන කැපවීම ශක්තිමත් කරන ලදි.

## විගණනයන් සිදු කිරීම

2025 වසර තුළ දී අවදානම් පදනම් කර ගත් වාර්ෂික විගණන සැලැස්ම බැංකුවේ වැදගත් කාර්යයන් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කළ අතර ප්‍රතිපත්තීන්, අනුකූලතාව, මෙහෙයුම්, තොරතුරු සහ සයිබර් ආරක්ෂණය, නෛතික සහ අනෙකුත් අදාළ අවදානම් ආවරණය කරමින්, බැංකුවේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීම සඳහා එහි මෙහෙයුම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලදි. තව ද බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය සහ අවදානම් කළමනාකරණ කාර්යය අතර අවදානම් සම්බන්ධ තොරතුරු හුවමාරුව වසර තුළ අඛණ්ඩ ව සිදු කරන ලදි.

## විගණන ප්‍රගතිය සහ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳ පසු විපරම් වාර්තා කිරීම

වසර තුළ දී සිදු කරන ලද විගණනයන්හි ප්‍රගතිය සහ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විගණන කමිටුවට වාර්තා කරන ලදි. තව ද, විගණන කමිටුවේ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ කළමනාකරණ ලිපියේ ඉස්මතු කර දක්වා ඇති බාහිර විගණකගේ නිරීක්ෂණ මත ගනු ලැබූ ක්‍රියාමාර්ග ද කාලීන ව විගණන කමිටුව වෙත වාර්තා කරන ලදි.

## අවදානම් පාදක වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අවදානම් පාදක වාර්ෂික විගණන සැලැස්ම සැකසීමේ දී, ආයතනික උපායමාර්ග සහ අරමුණුවලට අනුකූල වීම ශක්තිමත් කිරීම සඳහා 2024 වසර තුළ දී ප්‍රතිග්‍රහණය කරන ලද වටිනාකම් දාම ප්‍රවේශය අඛණ්ඩ ව අනුගමනය කරන ලදි. මේ සම්බන්ධයෙන් විගණනය කළ හැකි ක්‍රියාකාරකම් හඳුනා ගැනීම පිළිබඳ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම සහ එවැනි ක්‍රියාකාරකම් අදාළ ක්‍රියාවලි හිමිකරුවන් සමඟ සෘජුව ම තහවුරු කරගැනීම සඳහා විගණන සංගහනය (Audit Universe) යාවත්කාලීන කිරීමේ දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ දෙපාර්තමේන්තු එකිනෙක සමඟ රැස්වීම් පැවැත්විය. ඒ අනුව යාවත්කාලීන කරන ලද විගණන සංගහනය භාවිතා කර විස්තීර්ණ අවදානම් තක්සේරු ක්‍රමවේදයකට අනුව 2026 වසර සඳහා අවදානම් පාදක වාර්ෂික විගණන සැලැස්ම සකස් කරන ලදි.

## පාර්ශ්වකරුවන් අතර සහයෝගීතාව

වෘත්තීය විශිෂ්ටත්වය සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ නව ගෝලීය අභ්‍යන්තර විගණන ප්‍රමිතීන් සමඟ ශක්තිමත් අනුකූලතාව පෙන්නුම් කරමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අවදානම් පාදක අභ්‍යන්තර විගණනය පිළිබඳව බැංකු විද්‍යපීයෙස විසින් නේපාල රාෂ්ට්‍ර බැංකුවේ (Nepal Rastra Bank) නිලධාරීන් සඳහා 2025 මැයි මාසයේ දී සංවිධානය කරන ලද විශේෂ පුහුණු වැඩසටහනකට සම්පත් දායකත්වය සපයන ලදි.

තව ද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් සපයනු ලබන අභ්‍යන්තර විගණන සේවාවෙහි ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ වාර්ෂික සේවාදායක ප්‍රතිපෝෂණ සමීක්ෂණය පවත්වන ලද අතර එහි ප්‍රතිඵල විගණන කමිටුවට දැනුම් දෙන ලදි.

## තත්ත්ව තහවුරු කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන (QAIP)

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇති තත්ත්ව තහවුරු කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන තුළ ගෝලීය අභ්‍යන්තර විගණන ප්‍රමිතීන් සමඟ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි අනුකූලතාව පිළිබඳ බාහිර සහ අභ්‍යන්තර තක්සේරු කිරීම් මෙන් ම, සිය අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි සහ අඛණ්ඩ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමෙහි ලා අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රගතියෙහි කාර්ය සාධනයන් ද අන්තර්ගත වේ.

අභ්‍යන්තර විගණන කාර්යය තුළ තත්ත්ව ප්‍රවර්ධනය, සහ තත්ත්ව තහවුරු කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර තක්සේරු කිරීම් සිදු කරන ලද අතර එහි 2025 වර්ෂයට අදාළ කාලානුරූප ස්වයං තක්සේරු වාර්තාව සහ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්ය සාධනයෙහි අඛණ්ඩ අධීක්ෂණය අන්තර්ගත විය.

02

# මූල්‍ය ප්‍රකාශ

81 මූල්‍ය සමාලෝචනය
84 විගණකාධිපති වාර්තාව
88 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
90 ආදායම් ප්‍රකාශය
91 අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය
92 ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය
93 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
95 මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

# මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය කාර්යසාධනය හා වගවීම

ශ්‍රී ලංකා මහ බැංකුව, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන මඟින් ස්ථාපිත කර පාලනය කරන අතර, එමඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිකාරී බලය, බලතල, පාලන රාමුව සහ මූල්‍ය වාර්තාකරණයේ වගවීම නිර්වචනය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන මූල්‍ය අධිකාරිය වන අතර මුදල් ප්‍රතිපත්තිය තීරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පද්ධතිය අධීක්ෂණය කිරීම හා නියාමනය, ගෙවීම් හා පියවීම් පද්ධතිය අධීක්ෂණය, විනිමය අනුපාත ප්‍රතිපත්තිය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම යන කාර්යයන් සඳහා බලතල පැවරී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකු පනත ප්‍රකාරව දේශීය මිල ස්ථායීතාවය අත්කර ගැනීම හා පවත්වාගෙන යාම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන අතර මූල්‍ය පද්ධති ස්ථායීතාවය සුරක්ෂිත කිරීම අනෙකුත් අරමුණ වේ. එම නිසා බැංකුවේ කාර්යසාධනය මනිනු ලබන්නේ මෙකී අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී එහි ප්‍රතිපත්ති හා ක්‍රියාවන්හි සඵලතාව මත මිස එහි ලාභදායිත්වය මත නොවේ. මෙම වෙනස ශ්‍රී ලංකා මහ බැංකුව වෙනත් රාජ්‍ය අංශයේ ආයතනවලින් වෙන් කර දක්වන්නේ බැංකුවට සිය මුදල් මෙහෙයුම් කටයුතු මඟින් ගිණුම්කරණ ලාභ ඉපයීමට ඇති හැකියාව පවතින බැවිනි. ලාභදායීත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම බැංකුවේ අරමුණුවලට බාධා පමුණුවන ක්‍රියාවන් දිරිමත් කිරීමක් වන අතර එමඟින් බැංකුවට බලතල පැවරී ඇති මිල හා මූල්‍ය පද්ධති ස්ථායීතාවයේ ආරක්ෂාව තහවුරු කිරීමේ අරමුණුවලට බාධා පමුණුවයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ තුළින් එහි ප්‍රතිපත්ති හා මෙහෙයුම් කටයුතුවලින් විශේෂයෙන් මුදල් ප්‍රතිපත්තිය, විනිමය අනුපාත, විදේශ සංචිත කළමනාකරණය, ද්‍රවශීලතා කටයුතු සහ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම යන කටයුතුවලින් උපයන ලද ලාභ හෝ අලාභ නිරූපණය වේ. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික මූල්‍ය වාර්තා තුළින් පිළිබිඹුවන මූල්‍ය කාර්යසාධනය මෙහි ඉහත සඳහන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණුවල පුළුල් සන්දර්භය හා බැංකුවේ පොදු ප්‍රතිපත්ති වගකීම් අවබෝධ කරගැනීම තුළින් අර්ථ නිරූපණය කිරීම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි xvi වන කොටස (වගන්ති 92 සිට 99 දක්වා) තුළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම ඇතුළුව මහ බැංකුව සම්බන්ධ මූල්‍ය විධිවිධාන අඩංගු වේ. මහ බැංකු පනතේ 101 වන වගන්තිය ප්‍රකාරව, මහ බැංකුවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිගේ මතය වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමඟ ප්‍රකාශයට පත් කළ යුතුය. තව ද, මහ බැංකු පනතෙහි 103 (4) (ඇ) වගන්තිය අනුව, විගණකවරුන් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීමේ බලතල විගණන කමිටුවට පැවරී ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ 2025 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි විධිවිධානවලට අනුකූලව සකස් කර, සමාලෝචනය කර විගණනය කර ඇත.

### මූල්‍ය සමාලෝචනය

#### මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2024 වර්ෂයට සාපේක්ෂව, 2025 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ථ මූල්‍ය තත්ත්වයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.

#### වත්කම් සංයුතිය

මහ බැංකුවේ මුළු වත්කම් ප්‍රමාණය රු. බි. 422.4 කින් (එනම් 10.9% ප්‍රතිශතයකින්) ඉහළ ගොස් ඇති අතර ඒ සඳහා විදේශීය වත්කම්වල රු. බි. 365.4 ක වැඩි වීම සහ දේශීය වත්කම්වල රු. බි. 57.0 ක වැඩිවීම ප්‍රධානවම බලපා ඇත.

විදේශීය වත්කම්වල වැඩිවීම සඳහා මූලික වශයෙන් බලපෑ සාධක ලෙස මහ බැංකුවේ විදේශ සංචිතය 2024 වසරේදී පැවති ඇ.එ.ජ. ඩොලර් බි. 5.6 සිට ඇ.එ.ජ. ඩොලර් බි. 6.1 දක්වා වැඩිවීමත්, 2025 වසර අවසානය වන විට ඇ.එ.ජ. ඩොලරයකට සාපේක්ෂව රුපියලේ අගය වසර මුල දී පැවති 292.58 සිට 309.99 ක අගයක් දක්වා අවප්‍රමාණය වීමත් දැක්විය හැකිය. විදේශ සංචිතවල වර්ධනය, ස්ථාවර ආදායම් සුරකුම්පත්වල සිදු කළ ඉහළ ආයෝජන, ස්ථාවර තැන්පතු, නැවත මිලදී ගැනීමේ ගිවිසුම් මත සිදු කළ ආයෝජන සහ මුදල් ශේෂයන්ගේ ඉහළ යාම තුළින් පෙන්නුම් කරන ලදි.

2025 වසර අවසානයේ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පැවති අඩු ප්‍රතිලාභ අනුපාතයන් හේතුවෙන් ලැබුණු වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන ලාභයන් නිසා, වෙළෙඳපොළ මිලට භාණ්ඩාගාර බැඳුම්කර හිමිකාරීත්වයේ සිදුවූ රු.බි. 86.0 ක ඉහළ යාම, දේශීය වත්කම්වල වැඩිවීම සඳහා ප්‍රධානවම බලපාන ලදි. කෙසේ වෙතත්, වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්ව සඳහා සිදුකළ සංශෝධන ප්‍රකාරව, භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම් ශේෂයන්වල දළ අඩුවීම වන රු. බි. 25.1 ත්, භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙතින් බැංකුවට ලැබිය යුතු දෑ වල සිදු වූ රු. බි. 16.0 ක අඩුවීමත්, සෞභාග්‍යා ණය පහසුකම් යටතේ වෙනත් මූල්‍ය ආයතනවලට ලබා දුන් ණය ක්‍රමයෙන් පියවීම හේතුවෙන් අඩු වූ රු. බි. 4.2 ත් හේතුවෙන් දේශීය වත්කම්වල සිදුවූ වැඩි වීම අර්ධ වශයෙන් සීමා විය.

**මුළු වත්කම් සංයුතිය (රු. බි.)** ප්‍රස්ථාරය - 06



## බැරකම් සංයුතිය

මුළු බැරකම් රු.බි. 135.4කින් වැඩි වූ අතර, එයට ප්‍රධාන වශයෙන් දේශීය මූල්‍ය බැරකම්වල රු. බි. 249.6ක වැඩි වීම සහ විදේශීය මූල්‍ය බැරකම්වල රු. බි. 114.2ක අඩු වීම හේතු විය.

**මුළු බැරකම් සංයුතිය (රු. බිලියන)** ප්‍රස්ථාරය - 07




- විදේශීය මූල්‍ය බැරකම්
- දේශීය මූල්‍ය බැරකම්
- අනෙකුත් දේශීය මූල්‍ය බැරකම්

දේශීය මූල්‍ය බැරකම් වැඩිවීම ප්‍රධාන වශයෙන් රු. බි. 210.2 කින් සංසරණයේ ඇති මුදල් ප්‍රමාණය වැඩිවීමෙන් සහ දේශීය වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන්ට අනුව වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන සමඟ පවත්වාගෙන යනු ලබන ශේෂයන් රු. බි. 46.7 කින් වැඩිවීමෙන් සිදුවිය. කෙසේ වෙතත්, වසර අවසානයේ දී දේශීය මූල්‍ය වෙළෙඳපොළ තුළ පැවති ද්‍රවශීලතාවය හේතුකොටගෙන නිත්‍ය තැන්පතු පහසුකම් (SDF) රු. බි. 18කින් අඩු වීම මගින් දේශීය මූල්‍ය බැරකම් වල වූ වැඩිවීම අර්ධ වශයෙන් පිය වී ඇත.

ප්‍රධාන වශයෙන් ඉන්දියානු මහ බැංකුව (RBI) සමඟ ඇති විශේෂ මුදල් හුවමාරු පහසුකමේ මාසික වාරිකය සහ අදාළ පොලී මුදල් ලෙස රු. බි. 254.0ක් ගෙවීම හේතුවෙන් විදේශීය මූල්‍ය බැරකම් අඩු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් වලින් පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමේ රු. බි. 87.2ක වැඩි වීම, තැන්පතු ආරක්ෂණ අරමුදල විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් වලින් පවත්වාගෙන යනු ලබන ගිණුමේ රු. බි. 11.6ක වැඩි වීම, චීන යුවාන් අගයට සාපේක්ෂව, රුපියලේ අගය පහළ යාම හේතුවෙන් පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා (PBoC) සමඟ ඇති මුදල් හුවමාරු පහසුකමේ රුපියල් අගය රු. බි. 27.6 කින් වැඩි වීම සහ 2025 වසර තුළ විශේෂ ගැනුම් හිමිකමට සාපේක්ෂව රුපියලේ අගය පහළ යාම හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ආශ්‍රිත බැරකම් රු. බි. 18.3කින් වැඩිවීම හේතුවෙන් විදේශීය මූල්‍ය බැරකම්වල සිදුවූ අඩුවීම අර්ධ වශයෙන් පියවී ඇත.

## මුළු හිමිකරු ප්‍රාග්ධන

සමස්තයක් වශයෙන්, පසුගිය වසරට සාපේක්ෂව මුළු හිමිකරු ප්‍රාග්ධනය රු. බි. 287.0 කින් වර්ධනය වූ අතර, එයට වර්තමාන වසරේ ලාභය රු.බි. 193.1 ක්, අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට වර්ගීකරණය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල ඉහළ වෙළෙඳපොළ තක්සේරුකරණ ලාභ, ආයු ගණන ලාභ සහ මහ බැංකු පනතට අනුකූලව සිදුකළ ව්‍යවස්ථාපිත ගැලපීම් දායක විය.

උපලබ්ධි නොවූ විනිමය සහ මිල ප්‍රත්‍යාගණන සඳහා මහ බැංකු පනතේ 95 වගන්තියට අනුව අවශ්‍ය කරන ගැළපීම් සිදු කර ඇත.

මහ බැංකු පනතේ 97 වගන්තිය මඟින් මහ බැංකුවේ විගණනය කළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශවලින් සිය වත්කම්වල අගය සිය මුදල්මය බැරකම් සහ ගෙවා නිමි ප්‍රාග්ධනයේ එකතුවට වඩා අඩු බවට පිළිබිඹු කරන්නේ නම්, ප්‍රාග්ධනය යළි අනූන මට්ටමකට රැගෙන ඒමේ අවශ්‍යතාවය මතුවිය හැකි බව දක්වා ඇත. මුදල්මය බැරකම්වලට, සංසරණයේ පවතින මුදල් සහ මහ බැංකුවෙහි බලපත්‍රලාභී වාණිජ බැංකු සහ රජයේ ආයතන විසින් දරනු ලබන තැන්පතු ඇතුළත් වේ. ඒ අනුව, 2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා, මහ බැංකුවේ වත්කම්, එහි මුදල්මය බැරකම් සහ ගෙවා නිමි ප්‍රාග්ධනය රු. බි. 2,452.0 ක යහපත් මට්ටමකින් ඉක්මවා ඇත.

## ආදායම් ප්‍රකාශය

### ආදායම, වියදම සහ ශුද්ධ ලාභය/(අලාභය)

2024 වසරේ දී රු. බි. 274.8 ක ශුද්ධ ලාභය හා සැසඳීමේ දී, 2025 වසරේ දී රු. බි. 193.1 ක ශුද්ධ ලාභයක් ශ්‍රී ලංකා මහ බැංකුව වාර්තා කළේය. මෙය ප්‍රධාන වශයෙන් දේශීය හා විදේශීය මුදල් ප්‍රභවයන්ගෙන් ලැබුණු මුළු ආදායමේ සැලකිය යුතු අඩුවීමක් පිළිබිඹු කරන අතර එය එම කාලය තුළ මුළු වියදම්වල අනුරූප අඩුවීම ඉක්මවා ගියේය.

**හිමිකරු ප්‍රාග්ධනයේ සංයුතිය** ප්‍රස්ථාරය - 08



**බදුවලට පසු ශුද්ධ ලාභය/(අලාභය)** ප්‍රස්ථාරය - 09




**විදේශීය මූල්‍ය වත්කම්වලින් ලැබුණු ශුද්ධ ආදායම** ප්‍රස්ථාරය - 10




**දේශීය මූල්‍ය වත්කම්වලින් ලැබුණු ශුද්ධ ආදායම** ප්‍රස්ථාරය - 11




සමාලෝචනයට භාජනය වූ කාලපරිච්ඡේදය තුළ දී, විදේශීය මූල්‍ය වත්කම්වලින් ලැබුණු ශුද්ධ ආදායම රු. බි. 44.2 කින් පහත වැටීමට විදේශීය පොලී ආදායම රු. බි. 5.8 කින් ඉහළ යාම, විදේශීය පොලී වියදම රු. බි. 36.3 කින් අඩුවීම හා විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය රු.බි. 18.7 කින් අඩුවීම හේතු විය.

දේශීය මූල්‍ය වත්කම්වලින් ලැබුණු ශුද්ධ ආදායම රු. බි. 38.3 කින් අඩු වීම හේතුවෙන් ශුද්ධ ලාභයේ සමස්ථ පහත වැටීම තවදුරටත් තීව්‍ර විය.

## බෙදිය හැකි ලාභය

බෙදිය හැකි ලාභය ගණනය කිරීමේ දී, ආරම්භක රඳවා ගත් ඉපැයීම්වල සෘණ අගය (negative retained earnings) පියවා ගැනීම සඳහා ගැලපීම් සිදු කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 95 වගන්තිය ප්‍රකාරව, මිල ප්‍රත්‍යාගණනවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලැබීම් සහ විනිමය අනුපාතවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලැබීම් සහ අලාභ, බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභයෙන් බැහැර කර අදාළ උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන සංචිත ගිණුම්වලට වෙන් කරනු ලැබේ. ගණනය කළ ගැලපුම් කරන ලද බෙදාහැරිය හැකි ලාභය බෙදාහැරීම ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 96 වගන්තිය ප්‍රකාරව, ගෙවා නිමි ප්‍රාග්ධනය සහ පොදු සංචිත මහ බැංකුවේ මුළු මුදල්මය බැරකම්වලින් යටත් පිරිසෙයින් සියයට හයක්වත් වන තෙක්, විශේෂ සංචිතවලට සහ පොදු සංචිතයට මාරු කිරීම සහ ආණ්ඩුව විසින් මහ බැංකුවට ගෙවිය යුතුව තිබෙන යම් බැඳීම් රුපියල් වලින් පියවා ගැනීමෙන් පසු ඒකාබද්ධ අරමුදලට ගෙවා බැර කිරීම සිදු කරනු ලැබේ.

ඒ අනුව, ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ඉතිරි වූ ශේෂය රු. බි. 44.9 ක් වූ අතර ආණ්ඩුව විසින් මහ බැංකුවට ගෙවිය යුතුව තිබෙන බැඳීම් පියවා ගැනීමෙන් පසු රු. බි. 41.9 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදි.

මූල්‍ය ප්‍රකාශ සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ මතය මින් ඉදිරියට ඉදිරිපත් කර ඇත.

# විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } BAN/G/CBSL/1/25/1

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 08 April 2026

ගරු මුදල් අමාත්‍යතුමා,

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශ

### 1.1 මතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ (බැංකුව) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 101 (4) වගන්තයේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදි.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශවලින් 2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRS) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. එම ප්‍රමිතීන් යටතේ වූ මාගේ වගකීම්, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

### 1.3 බැංකුවේ 2025 මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාවේ අන්තර්ගත වූ වෙනත් තොරතුරු

2025 මහ බැංකු මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාවේ අන්තර්ගත වන එහෙත් මූල්‍ය ප්‍රකාශ සහ මාගේ විගණන වාර්තාවේ අන්තර්ගත නොවූ තොරතුරු, වෙනත් තොරතුරු ලෙස දක්වා ඇති අතර, මෙම තොරතුරු මා විසින් මෙම විගණන වාර්තාව ලබා දෙන දිනයෙන් පසු දිනකදී මා වෙත ලැබීමට නියමිතය. මෙම වෙනත් තොරතුරු පිළිබඳ වගකීම පාලක මණ්ඩලය සතු වේ.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මාගේ මතය තුළ මෙම වෙනත් තොරතුරු ආවරණය නොවන අතර, ඒ සඳහා කුමන ආකාරයක හෝ තහවුරු කිරීමක් මා විසින් ඉදිරිපත් කරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ දී, මට පැවරී ඇති වගකීම වන්නේ අදාළ වෙනත් තොරතුරු ලැබුණු අවස්ථාවකදී, එය කියවා බලා එම වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශ සමඟ හෝ මෙම විගණනය පිළිබඳ මාගේ දැනුවත් වීම සමඟ ප්‍රමාණාත්මකව නොගැලපෙන බව හෝ ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සමන්විත වේ ද යන්න තීරණය කිරීමයි.

මා විසින් බැංකුවේ 2025 මූල්‍ය ප්‍රකාශ හා මෙහෙයුම් වාර්තාව කියවන අවස්ථාවේ දී එහි කිසියම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අඩංගු වේ නම් ඒවා නිවැරදි කිරීම සඳහා ඒ පිළිබඳව පාලනය කරන පාර්ශවයන් වෙත දැනුම් දීම මා විසින් සිදු කළ යුතුය. එයින් පසු තවදුරටත්, ප්‍රමාණාත්මක, නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශයන් අඩංගු වේ නම්, ඒ පිළිබඳව මා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය ප්‍රකාරව ඉදිරියේ දී මවිසින් ගරු පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීමට නියමිත වාර්තාවේ ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ පාලක මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

පාලක මණ්ඩලය විසින් බැංකුව ඈවර කිරීමේ අරමුණින් හෝ බැංකුවේ මෙහෙයුම් කටයුතු අවසන් කිරීමේ අරමුණින් හෝ එලෙස ඈවර කිරීම හෝ මෙහෙයුම් කටයුතු අවසන් කිරීම හැර වෙනත් කිසිඳු යථාර්තවාදී විකල්පයක් නොමැති අවස්ථාවකදී හැර, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම සහ අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අදාළ වන පරිදි අනාවරණය කිරීම ද පාලක මණ්ඩලය සතු වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් කරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.5 මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබා ගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති (ISAs) ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයන් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ පාලක මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම පාලක මණ්ඩලය යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනයේ දී හඳුනාගත් අනෙකුත් කරුණු අතර සැලසුම් කරන ලද විෂය පථය, විගණනයේ කාලය සහ අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් සැලකිය යුතු සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය කරන පාර්ශවයන් වෙත මම දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1** **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.**

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (සසස) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ස) (ඇ) (සඩ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද සියලු ප්‍රමාණාත්මක නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ව ඇත.

**2.2** **අනුගමනය කරන ලද ක්‍රියා මාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් දෑ ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.**

2.2.1 2018 අංක 19 දරන විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට බැංකුව සම්බන්ධවී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව;

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු සහ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව;

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව;

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**අත්සන් කළේ**
**එල්. එස්. අයි. ජයරත්න**
**විගණකාධිපති**

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| 2025 දෙසැම්බර් 31 දිනට | සටහන් | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානයන් | 8 | 1,118,017,512 | 1,063,528,275 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 9 | 95,447,519 | – |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 9 | 875,952,785 | 672,461,750 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 10 | 16,039 | 27,957,163 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම් | 11 | 246,363,338 | 222,876,069 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | | 1,341,225 | – |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | | 2,337,138,418 | 1,986,823,257 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 12 | 1,834,889,192 | 1,748,873,060 |
| ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | 13 | 1,107,251 | 26,194,922 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 14 | 46,834 | 46,834 |
| බැංකු සඳහා දෙන ලද ණය | 15 | 5,418,490 | 9,561,430 |
| විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 16 | 17,568,400 | 9,062,661 |
| වෙනත් වත්කම් | 17 | 42,872,049 | 52,777,144 |
| මුළු දේශීය මූල්‍ය වත්කම් | | 1,901,902,216 | 1,846,516,051 |
| මුළු මූල්‍ය වත්කම් | | 4,239,040,634 | 3,833,339,308 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන් | 18 | 26,705,749 | 11,629,873 |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොගය | 19 | 3,868,196 | 4,839,378 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | 20 | 4,877,338 | 2,294,558 |
| දේපල, පිරියත හා උපකරණ | 21 | 23,739,905 | 23,489,058 |
| අස්පෘශ්‍ය වත්කම් | 22 | 235,548 | 515,650 |
| මුළු මූල්‍ය නොවන වත්කම් | | 59,426,736 | 42,768,517 |
| **මුළු වත්කම්** | | 4,298,467,370 | 3,876,107,825 |

පිටු අංක 95 සිට 195 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| 2025 දෙසැම්බර් 31 දිනට | සටහන් | 2025<br>රු. '000 | 2024<br>රු. '000 |
|---|---|---|---|
| **බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 23 | **4,287,792** | 1,038,618 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 10 | **28,650,448** | 37,196,388 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 24 | **799,898,325** | 781,616,569 |
| අනෙකුත් විදේශීය බැරකම් | 25.1 | **642,153,677** | 868,551,340 |
| අනිකුත් | 25.2 | **204,212,644** | 104,975,256 |
| මුළු විදේශීය මූල්‍ය බැරකම් | | **1,679,202,886** | 1,793,378,171 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 26 | **227,700,087** | 180,946,953 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 27 | **7,905,167** | 1,534,996 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 28 | **176,322,112** | 194,337,033 |
| සංසරණයෙහි පවතින මුදල් | 29 | **1,568,938,866** | 1,358,722,883 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 30 | **34,521,441** | 30,171,551 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 16 | **8,002,998** | 7,444,769 |
| මුළු දේශීය මූල්‍ය බැරකම් | | **2,023,390,670** | 1,773,158,185 |
| මුළු මූල්‍ය බැරකම් | | **3,702,593,557** | 3,566,536,356 |
| **අනිකුත් බැරකම්** | | | |
| විලම්භිත ප්‍රදාන | 31 | **14,913** | 7,168 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 32 | **525,430** | 1,051,139 |
| මුළු අනිකුත් බැරකම් | | **540,343** | 1,058,307 |
| මුළු බැරකම් | | **3,703,133,900** | 3,567,594,663 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල් | | **50,000,000** | 50,000,000 |
| අනිකුත් සංචිත | 33 | **494,261,135** | 279,869,905 |
| රඳවාගත් ලාභ | | **51,072,335** | (21,356,743) |
| මුළු හිමිකරු ප්‍රාග්ධනය | | **595,333,470** | 308,513,162 |
| **මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | **4,298,467,370** | 3,876,107,825 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2026 මාර්තු 27 වැනි දින පාලක මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ**
අධිපති

**ඩී.එස්.එල්. සිරිමාන්න**
ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 95 සිට 195 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

# ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොලී ආදායම | 35 | **51,682,966** | 45,935,187 |
| විදේශ සංචිත ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ වාසිය/(පාඩුව) | 36.1 | **13,905,212** | 23,147,517 |
| වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවලින් ලැබූ වාසිය/(පාඩුව) | 36.2 | **(19,657,427)** | 41,467,764 |
| විදේශීය මූල්‍ය වත්කම්වලින් ලැබූ මුළු ආදායම | | **45,930,751** | 110,550,468 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොලී වියදම | 37 | **(45,129,429)** | (81,422,985) |
| විදේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ ආපසු හැරවුම්/(අයකිරීම්) | 38 | **1,150,692** | (1,734,322) |
| විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම | | **(43,978,737)** | (83,157,307) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය/(පාඩුව) | | **22,690,918** | 41,422,028 |
| විදේශීය මූල්‍ය වත්කම්වලින් ලද ශුද්ධ ආදායම | | **24,642,933** | 68,815,189 |
| **ශුද්ධ දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොලී ආදායම | 35 | **199,808,971** | 219,402,560 |
| මිල වෙනස්කම් මත උපලබ්ධි ලාභය/(පාඩුව) | | **–** | 18,882,826 |
| පොලී වියදම | 37 | **(13,525,723)** | (15,093,654) |
| දේශීය ණය ප්‍රශස්තකරණයේ බැහැර කිරීම්වල ලාභය/(පාඩුව) | | **2,744,703** | 4,168,300 |
| දේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ ආපසු හැරවුම්/(අයකිරීම්) | 38 | **(8,469)** | 4,814 |
| දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ශුද්ධ ආදායම | | **189,019,482** | 227,364,846 |
| අනිකුත් ආදායම් | 39 | **1,460,669** | 1,457,028 |
| අනිකුත් වියදම් | 39.1 | **–** | (387,009) |
| මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම | | **215,123,084** | 297,250,054 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| සේවක මණ්ඩල වියදම් | 40 | | |
| – වැටුප් සහ වේතන | | **(11,051,292)** | (10,517,344) |
| – නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | **(2,919,517)** | (4,790,845) |
| – පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | | **1,231,639** | 91,918 |
| | | **(12,739,170)** | (15,216,271) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **(855,935)** | (798,226) |
| තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) | | **(4,928,546)** | (3,568,292) |
| සෙමින් චලනය වන මුදල් තොග සඳහා වෙන්කිරීම් | | **(54)** | – |
| පරිපාලන සහ අනිකුත් වියදම් | 41 | **(3,452,302)** | (2,876,131) |
| මුළු මෙහෙයුම් වියදම් | | **(21,976,008)** | (22,458,920) |
| බදුවලට පෙර ලාභය/(අලාභය) | | **193,147,076** | 274,791,135 |
| බදු | 42 | **–** | – |
| **වර්ෂය සඳහා ලාභය/(අලාභය)** | | **193,147,076** | 274,791,135 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 95 සිට 195 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

# අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|---|
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | | 193,147,076 | 274,791,135 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | |
| **පසු කාලයකදී ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය වන හෝ විය හැකි අයිතම** | | | |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව) | 33 | 3,515,239 | (37,849) |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන රජයේ සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව) | 33 | 84,729,446 | 6,552,700 |
| | | 88,244,685 | 6,514,851 |
| **පසු කාලයකදී ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළ හඳුනාගත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් (වියදම)/ආදායම | 16 | 5,825,984 | 17,222,767 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන මත වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය | 33 | – | (2,122,707) |
| | | 5,825,984 | 15,100,060 |
| **අනෙකුත් විස්තීරණ ආදායම/(වියදම)** | | 94,070,669 | 21,614,911 |
| **මුළු විස්තීරණ ආදායම/(වියදම)** | | 287,217,745 | 296,406,045 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 95 සිට 195 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

# ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | දායක ප්‍රාග්ධනය රු. '000 | අනිකුත් සංචිත රු. '000 | රඳවාගත් ලාභ රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|
| 2024 ජනවාරි 1 දිනට ශේෂය | 50,000,000 | 252,773,117 | (291,588,061) | 11,185,056 |
| මහ බැංකු පනතේ 94(2) වගන්තිය පරිදි පොදු සංචිතයේ අරමුදල් රඳවාගත් ලාභවලට මාරු කිරීම | | (266,061,930) | 266,061,930 | – |
| අනෙකුත් සංචිත වලින් රදවාගත් ලාභ වෙත මාරු කිරීම් | – | (35,117,739) | 35,117,739 | – |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය) | – | – | 274,791,135 | 274,791,135 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | – | 709,906 | (709,906) | – |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය/(අලාභය) මාරු කිරීම (IRR) | – | 288,036,060 | (288,036,060) | – |
| ශ්‍රී.ලං.ම.බැ. නාමකරණය කරන ලද අරමුදල්වලට මාරු කිරීම් | – | – | (469,337) | (469,337) |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය | – | (37,849) | – | (37,849) |
| ශ්‍රී.ලං.ම.බැ. සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | – | – | (191) | (191) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම් | – | 33,746,758 | (33,746,758) | – |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | – | – | 17,222,767 | 17,222,767 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ රජයේ සුරැකුම්පත්වල වෙළෙඳපොළ ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | – | 6,552,700 | – | 6,552,700 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ ප්‍රාග්ධන ආයෝජන වල වෙළෙඳපොළ ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | – | (2,122,707) | – | (2,122,707) |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ | – | 1,391,589 | – | 1,391,589 |
| 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය | 50,000,000 | 279,869,905 | (21,356,743) | 308,513,162 |
| **2025 ජනවාරි 1 දිනට ශේෂය** | **50,000,000** | **279,869,905** | **(21,356,743)** | **308,513,162** |
| 2024 සඳහා විදේශ වත්කම් මත වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන ලාභය, වෙළෙඳ ප්‍රත්‍යා ගණන සංචිතයට මාරු කිරීම | **–** | **36,204,396** | **(36,204,396)** | **–** |
| ශ්‍රී.ලං.ම.බැ. සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | **–** | **–** | **(299)** | **(299)** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය) | **–** | **–** | **193,147,076** | **193,147,076** |
| වෙළෙඳ ප්‍රත්‍යා ගණන සංචිතයට මාරු කිරීම් | **–** | **8,888,100** | **(8,888,100)** | **–** |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | **–** | **969,804** | **(969,804)** | **–** |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය/(අලාභය) මාරු කිරීම (IRR) | **–** | **22,690,918** | **(22,690,918)** | **–** |
| ශ්‍රී.ලං.ම.බැ. නාමකරණය කරන ලද අරමුදල්වලට මාරු කිරීම් | **–** | **–** | **(1,177)** | **(1,177)** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය | **–** | **3,515,239** | **–** | **3,515,239** |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | **–** | **–** | **5,825,984** | **5,825,984** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ රජයේ සුරැකුම්පත්වල වෙළෙඳපොළ ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | **–** | **84,729,446** | **–** | **84,729,446** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ | **–** | **(395,961)** | **–** | **(395,961)** |
| පොදු සංචිතයට මාරු කිරීම් | **–** | **57,789,288** | **(57,789,288)** | **–** |
| **2025 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **50,000,000** | **494,261,135** | **51,072,335** | **595,333,470** |

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 95 සිට 195 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්** | | | |
| ලැබුණු පොලිය - විදේශීය මුදල් | | 42,784,293 | 32,083,551 |
| ලැබුණු පොලිය - දේශීය මුදල් - අනිකුත් | | 676,280 | 2,525,696 |
| ලැබුණු පොලිය - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | 194,895,494 | 212,853,272 |
| ද්‍රවශීලතා කළමනාකරණය සහ වෙළෙඳ ආදායම් | | 4,754,868 | 47,293,711 |
| උපලබ්ධි වූ විනිමය ලාභය/(අලාභය) | | 25,852,829 | (23,767,952) |
| ලැබුණු අනිකුත් ආදායම් | | 1,442,255 | 1,453,992 |
| | | 270,406,019 | 272,442,270 |
| **වියපැහැදම්** | | | |
| ගෙවන ලද පොලිය - විදේශිය මුදල් | | 45,420,375 | 84,280,154 |
| ගෙවන ලද පොලිය - දේශිය මුදල් | | 10,386,990 | 12,534,671 |
| සේවකයින්ට ගෙවීම් | | 14,365,017 | 13,830,850 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | 9,176,251 | 17,047,380 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් | | (25,087,671) | (307,757,018) |
| | | 54,260,962 | (180,063,963) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 43 | 216,145,057 | 452,506,233 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම | | (8,331,328) | (4,298,616) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් ප්‍රාග්ධන අයකරගැනීම් | | 4,157,540 | 38,295,257 |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ආදායම | | 26,774 | 1,817 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම | | (18,014,920) | (32,698,840) |
| ලැබුණු පොලිය - දේශීය මුදල් - නාමකරණය කරන ලද අරමුදල් | | 3,048,321 | 2,855,316 |
| | | (19,113,613) | 4,154,934 |
| **වියපැහැදම්** | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ අඩුවීම | | 222,744,305 | 466,337,028 |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | (18,661,586) | (9,480,198) |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම | | 175,881,576 | 496,030,356 |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම | | (18,377) | 11,225 |
| දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩු කිරීමෙන් පසු) | | 796,810 | 82,291 |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනීම | | 23,222 | 307,336 |
| රන් තොගයේ දළ වැඩිවීම/(අඩුවීම) | | 5,890,537 | – |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන්/(අයකරගත්) ණය හා අත්තිකාරම් | | 14,176 | 70,657 |
| | | 386,670,663 | 953,358,695 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (405,784,276) | (949,203,761) |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 95 සිට 195 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **(496,142,678)** | (400,604,963) |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **706,358,661** | 572,824,663 |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **210,215,983** | 172,219,700 |
| **වියපැහැදම්** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්) | 44 | **(8,111,528)** | (306,067,744) |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව/(ආපසු ගැනීම්) | 45 | **(46,753,134)** | (38,474,372) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්) | | **(54,864,662)** | (344,542,116) |
| සංසරණ මුදල් ශුද්ධ අඩුවීම | | **265,080,645** | 516,761,816 |
| **වියපැහැදම්** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ලැබීම්/(ආපසු ගෙවීම්) | | **65,179,925** | 62,561,507 |
| අතිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **1,477** | 190 |
| විශ්‍රාම අරමුදල සඳහා ගෙවීම | | **–** | 9,577,789 |
| | | **65,181,402** | 72,139,486 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය | | **199,899,243** | 444,622,330 |
| මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | **10,260,024** | (52,075,198) |
| මුදල් සහ මුදල් සමානයන් මත විනිමය අනුපාතයන්ගේ බලපෑම | | **749,943** | (26,985,613) |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමානයන් | | **663,509,519** | 742,570,330 |
| දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන් | 8 | **674,519,486** | 663,509,519 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 95 සිට 195 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## 1 වාර්තා කිරීමේ ආයතනය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී. ලං. ම. බැ.") 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ස්ථාපිත කරන ලද අතර, ඒ මගින් මහ බැංකුවේ මුදල් මණ්ඩලයට ශ්‍රී. ලං. ම. බැ. පරිපාලනය සහ නියාමනයේ අරමුණ සහ අනෙකුත් අදාළ කරුණු සඳහා අවශ්‍ය බලතල, කාර්යයන්, සහ වගකීම් පවරන ලදි. මුදල් නීති පනත වෙනුවට 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනත 2023 සැප්තැම්බර් 15 වන දින බලාත්මක කරන ලදි.

ශ්‍රී ලංකා මහ බැංකු පනත, ශ්‍රී. ලං. ම. බැ. ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය හා නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා මහ බැංකු පනතින් මහ බැංකුවේ පාලක මණ්ඩලය සහ මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති මණ්ඩලය ස්ථාපිත කර ඇත. මහ බැංකුවේ කටයුතුවල පරිපාලනය සහ කළමනාකරණය අධීක්ෂණය කිරීමේ සහ මුදල් ප්‍රතිපත්ති නොවන මහ බැංකුවේ පොදු ප්‍රතිපත්තිය තීරණය කිරීමේ වගකීම පාලක මණ්ඩලයට පැවරී ඇත. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීමේ සහ දේශීය මිල ස්ථායීතාව අත්කර ගැනීම සහ පවත්වාගෙන යාම පිණිස, නම්‍යශීලී උද්ධමන ඉලක්ක රාමුව සමඟ සමපාත වන්නා වූ නම්‍යශීලී විනිමය අනුපාත උපායමාර්ගයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයට පැවරී ඇත.

පාලක මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2026 මාර්තු 27 දින අනුමත කරන ලදි.

### 1.1 ප්‍රාථමික ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකු පනත තුළ ශ්‍රී. ලං. ම. බැංකුවේ ස්වාධීනත්වය වර්ධනය කිරීම සඳහා විශේෂ විධිවිධාන ඇති අතර, ඒවායේ අරමුණ වන්නේ බැංකුවේ විනිවිද භාවය සහ වගවීම වැඩිකිරීම සහ ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩ මිල ස්ථායීතාව පවත්වාගෙන යාම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීමත්ය.

ශ්‍රී ලංකා මහ බැංකු පනත පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික පරමාර්ථය වන්නේ දේශීය මිල ස්ථායිතාව අත්කර ගැනීම සහ පවත්වාගෙන යාමයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙක් පරමාර්ථය වන්නේ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීමයි. ඉහත සඳහන් බැංකුවේ මූලික සහ අනෙක් පරමාර්ථය හැර, ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය හා ගෙවීම් පද්ධතිය පරිපාලනය, අධීක්ෂණය, නියාමනය සඳහා සහ රජයේ මූල්‍ය නියෝජිතයා ලෙස කටයුතු කිරීමට බැංකුව මූලිකවම වගකීමට බැඳී සිටී.

## 2 ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

බැංකුව සිදුකරනු ලබන ක්‍රියාකාරකම්වල ප්‍රධාන වශයෙන් ඇතුළත් වනුයේ,

- මුදල් ප්‍රතිපත්ති සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය
- ශ්‍රී ලංකාවේ නිල ජාත්‍යන්තර සංචිත පවත්වාගෙන යාම සහ ඒ සංචිතවල විචක්ෂණශීලී සහ ඵලදායී කළමනාකරණය සහතික කිරීම.
- ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය හා ඒ ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය, ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම
- මූල්‍ය ආයතන ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය, අධීක්ෂණය හා නිරාකරණය
- මහ බැංකු පනතේ වගන්ති 7(1) ප්‍රකාරව පනවා ඇති අනෙකුත් කාර්යයන්

ඉහත සඳහන් ප්‍රධාන අරමුණු හා අනෙකුත් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අනුගමනය කරන කටයුතු විදේශ මුදල් හා දේශීය මුදල් කටයුතු ලෙස ප්‍රධාන වශයෙන් වර්ගකෙරේ. එම කටයුතුවලින් ඇති වූ ප්‍රතිඵල ශ්‍රී. ලං. ම. බැංකුවේ මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇත.

### 2.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ අරමුණු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යූරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර්වලින් පවතී.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය උපකරණ ප්‍රධාන වශයෙන් සෛවරී සුරැකුම්පත්, ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ රඳවා ගත් සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන සමඟ පවත්නා වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

### 2.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ:

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම්/ගලාඒම් හිලව් කිරීම මඟින් ද්‍රවශීලතා කළමනාකරණය සිදු කරනු ලබයි. මෙම කටයුතු බොහොමයක් දෛනික විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් මඟින් සිදුකරනු ලැබේ.

(ii) සංසරණයේ පවතින මුදල් සඳහා වගකීමට සහායවීම සඳහා ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගෙන යනු ලබයි. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළෙඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

### 2.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

භාරකාරත්ව සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන අගයන්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංගයන්ට අයත් කොටසක් නොවන බැවින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර නොමැත.

## 3 මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ පදනම

### 3.1 අනුකූලතා ප්‍රකාශනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙම මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කර ඇති ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා. මූ. වා. ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර ඇත.

### 3.2 සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම යන සංකල්පය මත පිළියෙල කර ඇති අතර, බැංකුව අනාගතයේදී දිගටම පවතී යැයි උපකල්පනය මත සිට එහි වගකීම් නිරවද්‍යතාව ඉටුකරනු ඇතැයි බලාපොරොත්තු වේ.

පහත අයිතමයන් හැරුණු කොට මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත පදනම්ව පිළියෙල කරනු ලබයි.

- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, ලාභ අලාභ සඳහා පවත්වාගෙන යනු ලබන අනෙකුත් මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ලාභ අලාභ හා අනෙකුත් විස්තීරණ ආදායම් මඟින් සාධාරණ අගයට මිණුම් කරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ අගයට මිණුම් කෙරේ.
- රන්, ආදායම් ප්‍රකාශය තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම.
- ඉඩම් හා ගොඩනැගිලි අත්පත් කර ගැනීමේදී පිරිවැයට මිනුම් කරන නමුත් අනතුරුව ප්‍රත්‍යාගණනය කරනු ලබන වටිනාකමින් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ වෙන්කිරීම් අඩුකරන ලද වටිනාකමට මිණුම් කෙරේ.
- සේවා නියුක්තියන්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව, අදාළ නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම වල වත්කම්හි සාධාරණ අගය අඩුකර මිනුම් ගත කිරීම.

### 3.3 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාළ ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් මෙහෙයුම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේදී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙළට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය සටහන් 2හි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ කටයුතු වලට උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

### 3.4 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය බැංකුවේ ක්‍රියාකාරී මුදල් ඒකකයද වේ. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන මූල්‍ය තොරතුරු ආසන්න රුපියල් දහසට වටයා ඇත. සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකයන්හි කිසිදු වෙනසක් සිදු වී නොමත.

### 3.5 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

එක් එක් සමාන කාණ්ඩයන්හි අයිතම මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ. අසමාන ස්වභාවයේ සහ කාර්යයන් හී අයිතම ඒවා වැදගත් නොවේනම් වෙන වෙන ඉදිරිපත් කෙරේ.

### 3.6 හිලව් කිරීම

බැංකුවට හඳුනාගත් ප්‍රමාණ හිලව් කිරීමට නෛතික හිමිකමක් ඇත්නම් සහ ඉන් මූල්‍ය වත්කම ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට හෝ උපලබ්ධි කිරීමට සහ ඒ සමඟම වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන්නේනම් පමණක් මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කොට ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශවල ඉදිරි පත් කෙරේ.

### 3.7 සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන වසරේ ඉදිරිපත් කිරීමට අනුකූලවීම සඳහා අවශ්‍ය විටක සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලබයි.

## 4 සැලකිය යුතු ගිණුම් විනිශ්චයන් ඇස්තමේන්තු භාවිතය සහ උපකල්පන

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ විනිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ.

මෙම උපකල්පනයන්, ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලසීමාවල දී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැකිය.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ. මූල්‍ය ප්‍රකාශවල හඳුනාගෙන ඇති ප්‍රමාණ කෙරෙහි වඩාත් ප්‍රමාණාත්මක බලපෑමක් සහිත ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී සිදුකළ විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් මඟින් පැහැදිලි කෙරේ.

### 4.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය

බැංකුව විසින් මූල්‍ය වත්කම් වල දරාගෙන සිටින ව්‍යාපාර ආකෘතිය හා මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි වලින් ඇතිවන මුදල් ප්‍රවාහ, මූලික මුදල හා ඒ මත වන පොලිය පමණක්ද යන්න තක්සේරු කිරීම සඳහා විනිශ්චයන් භාවිතා කරයි.

### 4.2 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තාකළ මූල්‍ය වත්කම් හා බැරකම්වල සාධාරණ අගය සක්‍රීය වෙළෙඳපොළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලැබාගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය අකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළෙඳපොළ දත්ත මත ලබා ගන්නා අතර, එවැනි දත්ත

නොමැති අවස්ථාවන් හීදී විනිශ්චයන් මගින් සාධාරණ අගය ලබා ගනු ලබයි. විනිශ්චයන්ට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (long dated derviate) වෙනස්වීම වැනි අකෘති වලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත.

### 4.3 මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුව විසින් මුල්වරට හඳුනාගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවධානමෙහි සැලකිය යුතු වර්ධනයක් වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වන නිර්නායකයන් ස්ථාපිත කිරීමේදී, අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඇතුලත් කිරීමේදී භාවිතා කරන ක්‍රමවේදය තීරණය කිරීමේදී සහ ගෙවීම් පැහැර හැරීමෙන් ඇති වන සත්‍ය අලාභය සහ ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවය තීරණය කිරීමේදී බැංකුව විනිශ්චයන් භාවිතා කරයි.

### 4.4 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයු ගණන අගයුමක් භාවිතයෙන් තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීම වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම්වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණන ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 16 හි දැක්වේ.

## 5 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම්

මෙම මූල්‍ය වර්ෂය තුළදී ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව පැවති අතර, යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයේ ඒවා සමඟ අනුකූලව පවතී.

පහත සඳහන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් සඳහා වූ සංශෝධන 2025 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන ගිණුම් කාල සීමාවන්ට අදාළ වන පරිදි වෙනස් වුවද, ඒවා බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි බැංකුව බලාපොරොත්තු නොවේ.

- හුවමාරු කිරීමේ හැකියාව පිළිබඳ අපහසුතා - විදේශ විනිමය අනුපාත වෙනස්වීම්වල බලපෑම් IAS 21 හි සංශෝධන

## 6 ප්‍රකාශිත නමුත් වාර්තා කරන දිනට බලසහිත නොවූ ප්‍රමිතීන් මත වූ සංශෝධන සහ නිර්වචනයන්

නව සංශෝධන හා බැඳුනු නව නිර්වචනයන් 2026 ජනවාරි 01 දිනට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදවලට බල පැවැත්වෙන අතර ඒවා නියමිත දිනට පෙර යොදා ගැනීමට අවසර ඇත. එසේ වුවද, මෙම මූල්‍ය වාර්තා පිලියෙල කිරීමේ දී බැංකුව විසින් මෙකී සංශෝධිත ප්‍රමිතීන් නියමිත දිනට පෙර අදාල කර නොගන්නා ලදි. තවද පහත දක්වා ඇති සංශෝධිත ප්‍රමිත බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත  සැළකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි බැංකුව බලාපොරොත්තු නොවේ.

- මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මිණුම්කරණයට අදාල සංශෝධන – 2026 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා බලපානු ලබන IFRS 9 සහ IFRS 7 හි සංශෝධන.
- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම – 2027 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා බලපානු ලබන IFRS 18 හි සංශෝධන.

## 7 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 7.1 විදේශීය මුදල් පරිවර්තනය හා ශේෂයන්

විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතිකයට ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. වාර්තාකරන දිනයට විදේශීය මුදල්වලින් නම්කළ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාරව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. මූල්‍ය අයිතම මත විදේශ විනිමය පරිවර්තන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. පරිවර්තන අරමුණ සඳහා,  වාර්තා කරන දිනට, ප්‍රධාන ව්‍යවහාර මුදල් සඳහා පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදි.

| මුදල | 2025 රු. | 2024 රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | 206.7972 | 180.9920 |
| කැනේඩියානු ඩොලර් 1 | 225.9269 | 203.4796 |
| යූරෝ 1 | 364.0574 | 302.8822 |
| ජපන් යෙන් 1 | 1.9799 | 1.8617 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | 424.5383 | 382.3288 |
| ස්ටර්ලින් පවුම් 1 | 417.5934 | 365.9047 |
| ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 1 | 309.9944 | 292.5833 |
| චීන යුවාන් 1 (අක්වෙරළ) | 44.3641 | 40.0837 |
| නවසීලන්ත ඩොලර් 1 | 178.4018 | 163.6418 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදු වුන දින තිබූ විදේශ මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වල සටහන් කර ඇත.

### 7.2 සාධාරණ අගය මිනුම් කිරීම

බැංකුව විසින් විදේශීය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ රන් වැනි මූල්‍ය නොවන වත්කම් එක් එක් වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 49 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය. මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වෙළෙඳපොළ ගණුදෙනුකරුවන්, ඔවුන්ට උපරිම ආර්ථික වාසි සැලසෙන ආකාරයට කටයුතු කිරීමේදී යොදා ගනු ලබන උපකල්පන මත පදනම්ව වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරයි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම් කිරීමේදී, එම වත්කම වෙළෙඳපොළ ගනුදෙනුකරුවෙක්ට එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කොට හෝ එම වත්කම් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීමට හැකියාව ඇති වෙනත් වෙළෙඳපොළ ගනුදෙනුකරුවෙක්ට විකිණීමෙන් ආර්ථික වාසි ජනනය කිරීමට ඇති හැකියාව සලකා බලනු ලැබේ.

බැංකුව විසින් අදාළ නිරීක්ෂණය කළහැකි දත්ත භාවිතය උපරිම කරමින් සහ නිරීක්ෂණය කළනොහැකි දත්ත භාවිතය අවම කරමින් සාධාරණ අගයන් මිනුම් කිරීමට ප්‍රමාණවත් දත්ත ලබාගත හැකි අවස්ථාවන්ට සුදුසු අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි.

සාධාරණ අගය මිනුම්ගත කළ හෝ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කළ සියලුම වත්කම් හා වගකීම් සාධාරණ අගයේ ධුරාවලිය තුළ වර්ගීකරණයට ලක් කරන අතර, සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් මැනීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වී පහත පරිදි විස්තර කෙරේ:

මට්ටම 1 : අනන්‍ය වත්කම් හා වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

මට්ටම 2 : සෘජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

මට්ටම 3 : නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

පුනරාවර්තන පදනම මත හඳුනාගත් වත්කම් හා වගකීම් වල ඉහත ධුරාවලි මට්ටම් අතර මාරුවීම් සිදු වී ඇත්දැයි යන්න වර්ගීකරණයේ නැවත තක්සේරු කිරීම තුළින් (සාධාරණ අගයට මිනුම් කිරීම උදෙසා සමස්තයක් වශයෙන් වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම බැංකුව තහවුරු කරනු ලබයි.

## 7.3 මූල්‍ය උපකරණ

බැංකුව, විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් අතර වෙන්කොට දක්වමින් මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ග ඉදිරිපත් කරනු ලබයි.

විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන් ඇති වේ. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතුව සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මඟින් බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ අවදානම් පැතිකඩ වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව සලකනු ලැබේ.

### 7.3.1 හඳුනාගැනීම හා මූලික මිනුම් කිරීම

සියලුම මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව දෙන ලද ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම සහ ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළු වන පිරිවැය මත හඳුනාගනී. මූල්‍ය වත්කම් හා බැරකම්වල සියලුම ආකාරයේ මිලදී ගැනීම් සහ විකුණුම් පිළිවෙළින් වෙළෙඳ දිනය මත හඳුනාගනු ලැබේ. සාමාන්‍ය ආකාරයේ මිලදී ගැනීම් සහ විකුණුම් යනු වෙළෙඳපොළේ රෙගුලාසිය හෝ සම්මුතිය මඟින් පොදුවේ නියමිත කාල රාමුව තුළ දී වත්කම් භාරදීම අවශ්‍යවන මූල්‍ය වත්කම් මිලට ගැනීම හෝ විකිණීම වේ.

### 7.3.2 පළමු දින ලාභය හෝ අලාභය

මූල්‍ය උපකරණවල ගණුදෙනු මිල, එහි මුලින් හඳුනාගත් සාධාරණ අගයට වඩා වෙනස්වන විට සහ සාධාරණ වටිනාකම පදනම් වී ඇත්තේ වෙළෙඳපොළ ගණුදෙනුවලදී නිරීක්ෂණය කළ හැකි යෙදවුම් පමණක් භාවිතා කරමින් තක්සේරු කිරීමේ තාක්ෂණක් මත වන විට, ගණුදෙනු මිල සහ සාධාරණ අගය අතර වෙනස බැංකුව ශුද්ධ වෙළෙඳ අදායමට ගිණුම් ගතකරනු ලැබේ. සමහර යෙදවුම් නිරීක්ෂණය කළ නොහැකි අකෘති මත සාධාරණ අගය ගණනය කර ඇති විටදී, ගනුදෙණු මිල සහ සාධාරණ වටිනාකම අතර වෙනස හඳුනා නොගනු ලබයි. හඳුනා ගැනීමට කල් දැමූ ප්‍රමාණය, වත්කම් හෝ බැරකම් වල මිල ගණනය කිරීමේදී වෙළෙඳපොළ සහභාගීවන්නන් සැළකිල්ලට ගන්නා සාධකයක (කාලය ඇතුළුව) වෙනසක් ඇති වූ විට අදායාම් ප්‍රකාශයට හඳුනා ගැනේ. මෙම පදනම මත, බැංකු විසින් හඳුනා නොගෙන කල් දමන ලද ප්‍රමාණය සරල මාර්ග ක්‍රමයට හඳුනා ගැනීම සුදුසු බව බැංකුව තීරණය කරයි. එවැනි පවතින මුදලක් මූල්‍ය උපකරණ ඉවත් කරන අවස්ථාවකදී හෝ නිරීක්ෂණ යෙදවුම් නිරීක්ෂණය කල හැකි වූ විට ආදායම් ප්‍රකාශනයට හඳුනාගනු ලැබේ.

### 7.3.3 මූල්‍ය වත්කම් වර්ගීකරණය

#### මූල්‍ය වත්කම්

මූලික හඳුනාගැනීම මත, බැංකුව විසින් මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි.

- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්
- විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVOCI)
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVTPL)

පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන්නේ නම් සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම් කර නොමැතිනම්, මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

- එම මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම, සහ
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මඟින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොලියෙන් පමණක් සමන්විත වීම.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන්නේනම් සහ ලාභය හෝ අලාභය තුළින් නම්කර නොමැතිනම් පමණක් අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබයි.

- මූල්‍ය වත්කම ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ රැස්කිරීම හා මූල්‍ය වත්කම් විකිණීම යන පරමාර්ථ ද්විත්වයෙන් අත්කර ගන්නා ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම, සහ

- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොලියෙන් පමණක් සමන්විත වීම.

### ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම

ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම බැංකුවේ මූලික සහ අනෙකුත් පරමාර්ථ වන දේශීය මිල ස්ථායිතාව පවත්වාගෙන යාම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීම මත පදනම් වේ. බැංකුව විසින් ව්‍යාපාර ආකෘතියේ අරමුණ පිළිබඳ තක්සේරුවක් කරනු ලබන්නේ යම් වත්කමක් කළඹ මට්ටමක් දරාගෙන සිටීම තුළ වන අතර එයට හේතුව වන්නේ ව්‍යාපාරය කළමණාකරණය කරන ආකාරය හා කළමණාකාරිත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමගින් හොඳින්ම නිරූපනය කිරීමයි. එසේ සලකා බලන තොරතුරු වලට පහත ඒවා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

- ව්‍යාපාර ආකෘතියේ සහ එම ව්‍යාපාර අකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම්වල කාර්ය සාධනය සහ අගය කිරීම ආයතනයේ ප්‍රධාන කළමණාකාරිත්වයට වාර්තා කරන ආකාරය
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපෑ හැකි අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් අවදානම් කළමණාකරණය කරන ආකාරය.
- පූර්ව කාලසීමාවාන් හි විකුණුම්වල වාර ගණන, වටිනාකම, එම විකුණුම්වල කාලසීමාව, එවැනි විකුණුම් සඳහා බලපෑ හේතු සාධක සහ අනාගත විකුණුම්වල කටයුතු පිළිබඳ අපේක්ෂාවන් සලකා බැලීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් විකුණුම් පිළිබඳ තොරතුරු හුදෙකලාව සැලකිල්ලට නොගත යුතු නමුත් ඒ වෙනුවට එය බැංකුවේ මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම හා මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගන්නේ කෙසේද යන සමස්ථ තක්සේරුවේ කොටසක් ලෙස යොදා ගත යුතුවේ.

වෙළඳාම හෝ කළමනාකරණය සඳහා තබාගත් සහ සාධාරණ අගමේ පදනමක් මත කාර්ය සාධනය මනිනු ලබන මූල්‍ය වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. එයට හේතුව ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සඳහා සහ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීමට හෝ රඳවාගෙන නොමැති නිසාය.

### ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු, මූලික මුදල හා එහි පොලිය (SPPI) පමණක් ගෙවීම ද යන්න පිළිබඳ තක්සේරුව.

බැංකුව විසින් මූලික මුදල සහ එහි පොලිය පමණක් ගෙවීමේ කොන්දේසිය (SPPI Test) සපුරා ඇති බව හඳුනා ගැනීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි තක්සේරු කරනු ලැබේ. මෙම තක්සේරු අරමුණ සඳහා, 'මූලික මුදල' යන්න මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කමක සාධාරණ අගය ලෙස නිර්වචනය කරන අතර, 'පොලිය' යන්න මුදලේ කාලීන වටිනාකම සඳහා සහ නිශ්චිත කාලසීමාවක් තුළ ගෙවීමට ඇති මුල් මුදල හා බැඳි ණය අවධානම සඳහා සහ අනෙකුත් මූලික ණයදීමේ අවධානම හා පිරිවැය සඳහා ප්‍රතිෂ්ඨාව ලෙස නිර්වචනය කෙරේ.

ණය දීමේ වැඩපිළිවෙලක පොලියේ වඩාත් සැලකියයුතු පොලී අංක වන්නේ නියමාකාරයෙන් මුදලේ සහ ණය අවදානමේ කාලීන වටිනාකම සඳහ ප්‍රතිෂ්ඨාව වේ. මූලික මුදල සහ එහි පොලිය පමණක් ගෙවීමේ තක්සේරුව සිදු කිරීම සඳහා, බැංකුව විසින් විනිශ්චයන් අදාළ කර ගන්නා අතර, මූල්‍ය වත්කම් නම්කළ මුදල් ඒකකය හා පොලී අනුපාතය නියම කර ඇති කාලසීමාව වැනි අදාළ සාධක සලකා බලනු ලබයි.

මෙයට වෙනස්ව, ණය දීමේ මූලික එකඟතාවයකට සම්බන්ධ නැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවධානම හෝ විචලනයට අවමයට වැඩි අනාවරණයක් හඳුන්වාදෙන ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසි, හිඟ මුදල මත මූලික මුදල හා එහි පොලිය (SPPI) ගෙවීම පමණක් වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ වලට හේතු නොවේ. එවන් අවස්ථාවලදී, එකී මූල්‍ය වත්කම ලාභය හෝ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම අවශ්‍ය වේ.

### 7.3.3.1 ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අරමුනින් මූල්‍ය වත්කම් දැරීම පර්මාර්ථය කරගත් ව්‍යාපාර ආකෘතිය යටතේ රඳවාගත් හා ගිවිසුම්ගත නියමයන් අනුව නිශ්චිත දිනයන්හි දී මූලික මුදල හා එහි පොලිය පමණක් ලබාදෙන මූල්‍ය වත්කම්, ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මෙම උපකරණ පසුකාලීනව සඵල පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ.

### 7.3.3.2 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වනුයේ ව්‍යුත්පන්න නොවන ආයෝජන හා අනෙකුත් මූල්‍ය වත්කම් කාණ්ඩයකට වාර්තා නොකරන ලද ආයෝජනයි. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ආයෝජන තුළ ස්කන්ධ සුරැකුම්පත් හා ණය සුරැකුම්පත් ඇතුලත් වේ.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති විදේශ විනිමය ණය සුරැකුම්පත් ප්‍රකාශිත වෙළෙඳපොළ මිලගණන්වලට පසුව අගය කෙරේ. වෙළෙඳපොළ වටිනාකම තුළ වෙනස්වීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ආයෝජනවල වටිනාකමෙහි අඩුවීමක් හෝ වැඩිවීමක් ලෙස හඳුනා ගනී.

ස්කන්ධ ආයෝජන, නියාමන අවශ්‍යතා යටතේ සිදු කරන ලද උපායමාර්ගික ආයෝජන වන බැවින් පිරිවැයට හඳුනාගනු ලැබේ.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති දේශීය හා විදේශීය ණය සුරැකුම්පත් හා ස්කන්ධ ආයෝජන වල වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම් නිසා උද්ගතවන වාසි හෝ අවාසි ඍජුවම ප්‍රාග්ධන හිමිකම (අනෙකුත් විස්තීරණ ආදායම) තුළ හඳුනා ගන්නා අතර, ආයෝජනය විකිණීම, එකතු කිරීම හෝ වෙනත් ආකාරයෙන් බැහැර කරන තුරු, හෝ ආයෝජනය හානිකරණය කළයුතු බවට තීරණය කරන තුරු එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි අනෙකුත් සංචිත යටතේ පෙන්වනු ලබන අතර, එම අවස්ථාවේදී ස්කන්ධය ලෙස මෙයට පෙර වාර්තාකළ සමුච්චිත ලාභය හෝ අලාභය හඳුනා නොගැනීම මත ආදායම් ප්‍රකාශයට ප්‍රතිචක්‍රියකරණය නොකරනු ලබන ස්කන්ධ ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස්වීමේ ව්‍යතිරේකය සහිතව ආදායම තුළ ඇතුළත් කෙරේ. පොලී ආදායම සඵල පොලී ක්‍රමය භාවිතයෙන් ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

#### 7.3.3.3 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

වෙළෙඳාම සඳහා තබාා ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්’ වර්ගීකරණය තුළ ඇතුළත් කර ඇත. මූලික හඳුනාගැනීම මත, ආරෝපණය කළ ගනුදෙනු පිරිවැය ලාභය හෝ අලාභය තුල දරණ ලද ලෙස හඳුනා ගනී. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිලට අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයන් හී වෙනස්වීම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත්වල වටිනාකම් තුළ වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර, එයින් උද්ගත වන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනී.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් ලාභය හෝ අලාභය ‘උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් ලාභය/(අලාභය)’ ලෙස වාර්තා කරනු ලැබේ. ලාභය හෝ අලාභය උපලබ්ධි වී ඇති විට (සුරැකුම්පත් විකිණීම මඟින්) එය ‘උපලබ්ධි මිල ප්‍රත්‍යාගණනයෙන් ලාභය/(අලාභය)’ ලෙස වාර්තා කරනු ලැබේ.

### 7.3.4 මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් වෙනස් කිරීම

#### මූල්‍ය වත්කම් වෙනස් කිරීම

මූල්‍ය වත්කමක නියමයන් වෙනස් කරන්නේනම්, වෙනස්කළ වත්කම්වල මුදල් ප්‍රවාහ සැලකියයුතු ලෙස වෙනස් වන්නේද යන්න බැංකුව ඇගයීමට ලක් කරයි. මුදල් ප්‍රවාහ සැලකියයුතු ලෙස වෙනස් වන්නේනම්, එහිදී මුල් මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහවලට ගිවිසුම්ගත අයිතීන් කල්පිරී ඇති බවට සලකනු ලැබේ. මෙම සිද්ධිය තුළ, මුල් මූල්‍ය වත්කම හඳුනා නොගන්නා අතර නව මූල්‍ය වත්කමක් සාධාරණ අගයට හඳුනා ගනී.

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ වෙනස්කළ වත්කමේ මුදල් ප්‍රවාහ සැලකියයුතු ලෙස වෙනස් වන්නේ නැතිනම්, එහිදී වෙනස් කිරීම මූල්‍ය වත්කම හඳුනා නොගැනීමට හේතු නොවනු ඇත. මෙම සිද්ධිය තුළ, බැංකුව මූල්‍ය වත්කමේ දළ ධාරණ අගය නැවත ගණනය කරන අතර, ලාභය හෝ අලාභය තුළ වෙනස් කිරීමේ ලාභයක් හෝ අලාභයක් ලෙස දළ ධාරණ අගය ගැලපීමෙන් ඇතිවන ප්‍රමාණය හඳුනා ගනී.

#### මූල්‍ය බැරකම් වෙනස් කිරීම

පවත්නා මූල්‍ය වගකීමක් වෙනුවට සැලකියයුතු වෙනස් නියමයන් මත එම ණයකරුගෙන් වෙනත් වගකීමකින් ප්‍රතිෂ්ඨාපනය කරන විට පවත්නා වගකීමක නියමයන් සැලකියයුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනා නොගැනීමක් සහ නව වගකීමක හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලැබේ. මෙම සිද්ධිය තුළ, වෙනස් කළ නියමයන් මත පදනම් නව මූල්‍ය වගකීමක් සාධාරණ අගයට හඳුනා ගනී. කල්පිරුණු මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ වෙනස් කළ නියමයන් සහිත නව මූල්‍ය වගකීම අතර වෙනස ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

### 7.3.5 ප්‍රතිවර්ගීකරණය

බැංකුව විසින් මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා වූ ව්‍යාපාර ආකෘතිය වෙනස් කිරීමේදී හැර, මූල්‍ය වත්කම් පළමුවරට හඳුනාගත් පසු ප්‍රතිවර්ගීකරණය නොකරයි.

### 7.3.6 ඉවත් කිරීම්

#### මූල්‍ය වත්කම්

බැංකුවට මූල්‍ය වත්කමෙහි මුදල් ප්‍රවාහ සඳහා ඇති ගිවිසුම්ගත අයිතිවාසිකම් අවසන්වීමේදී හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභවල හිමිකාරිත්වය සැලකිය යුතු ප්‍රමාණයක් වෙනත් පාර්ශ්වයකට පවරන ගනුදෙනුවක් තුළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය මාරු කිරීමේදී හෝ බැංකුව හිමිකාරිත්වයේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකියයුතු ලෙස මාරු නොකර හෝ රඳවාගෙන නොමැති විට හා මූල්‍ය වත්කමේ පාලනය රඳවාගෙන නොමැති විට මූල්‍ය වත්කමක් ඉවත් කරනු ලබයි.

මූල්‍ය වත්කමක් ඉවත් කිරීමේදී, වත්කමේ ධාරණ අගය (හෝ ඉවත් කරන ලද වත්කමේ කොටසකට වෙන්කළ ධාරණ අගය) සහ (i) ලද ප්‍රතිශ්ඨාව (භාරගත් යම් නව වගකීම අඩුකළ නව වත්කම ඇතුළුව) අතර වෙනස සහ (ii) අනෙකුත් විස්තීරණ ආදායම් තුළ හඳුනා ගෙන තිබූ සම්මුච්චිත ලාභය හෝ අලාභය යන දෙකම ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනි.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට නම්කළ ස්කන්ධ ආයෝජන සම්බන්ධයෙන් අනෙකුත් විස්තීරණ ආදායම තුළ හඳුනාගත් සමුච්චිත යම් ලාභ/අලාභ එවැනි සුරැකුම්පත් හඳුනා නොගැනීම මත ලාභය හෝ අලාභය තුළ හඳුනා නොගනී. බැංකුව විසින් නිර්මාණය කරන හෝ රඳවාගන්නා ඉවත් කිරිම සඳහා සුදුසුකම් ලබන මාරුකළ මූල්‍ය වත්කම්වල පොලිය වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනා ගනී.

බැංකුව ගනුදෙනුවලට ඇතුළත් වන අතර, ඒතුළින් එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හඳුනාගත් වත්කම් මාරු කරන නමුත් මාරුකළ වත්කමේ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල හෝ සැලකියයුතු කොටසක් හෝ ඒවායින් කොටසක් රඳවා ගනී. එවැනි අවස්ථාවලදී, මාරුකළ වත්කම් හඳුනා නොගනි. එවැනි ගනුදෙනුවලට උදාහරණ වන්නේ සුරැකුම්පත් ණයදීම සහ විකිණීමේ සහ මිලදී ගැනීමේ ගනුදෙනුය. මූල්‍ය වත්කමක හිමිකාරත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල සැලකියයුතු ලෙස රඳවා නොගන්නා හෝ මාරු නොකරන ගනුදෙනුවලදී සහ ඉන් වත්කමේ පාලනය රඳවාගනී නම්, මාරු කරන ලද වත්කමේ වටිනාකම තුළ වෙනස්වීම්වලට නිරාවරණය වන ප්‍රමාණය මඟින් තීරණය කරන එහි අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට බැංකුව තවදුරටත් වත්කම හඳුනා ගනී.

#### මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකමක් ඉවත් කරනු ලබනුයේ එහි වගකීම යටතේ බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් පිරීම සිදු වූ විටය. පවත්නා මූල්‍ය වගකීමක් වෙනුවට සැලකියයුතු වෙනස් නියමයන් මත එම ණයහිමියාගෙන් වෙනත් වගකීමකින් ප්‍රතිස්ථාපිත කිරීමේදී හෝ පවත්නා වගකීමේ කාලය සැලකියයුතු ලෙස වෙනස් කරන්නේනම්, එවැනි මාරු කිරීම හෝ වෙනස් කිරීම මුල් වගකිම හඳුනා නොගැනීම සහ නව වගකීමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

### 7.3.7 මූල්‍ය වත්කම් හා වගකීම් නිශ්ප්‍රභා කිරීම

මූල්‍ය ප්‍රකාශ තුළ දක්වා ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් නිශ්ප්‍රභා කර දක්විය හැක්කේ, බැංකුවට පිළිගත් ප්‍රමාණයන් නිශ්ප්‍රභා කිරීමට දැනට බලාත්මක කළ හැකි නෛතික අයිතියක් තිබේ නම් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට වත්කම් සාක්ෂාත් කර ගැනීමට සහ වගකීම් එකවර පියවීමේ අරමුණක් තිබේ නම් පමණි.

### 7.3.8 මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුව විසින් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කරනු ලබන සියලු විදේශීය සහ දේශීය මූල්‍ය වත්කම් සහ අනකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට නිරූපිත සියලු විදේශීය සහ දේශීය මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණ දීමනා හඳුනා ගනී. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මිනුම් කර ඇති මූල්‍ය වත්කම් සහ ස්කන්ධ ආයෝජන මත හානිකරණ අලාභ හඳුනා නොගැනේ.

#### අපේක්ෂිත ණය අලාභ මැනීම

බැංකුව විසින් ආයෝජන ශ්‍රේණියේ පවතින (BBB/Baa සහ ඉහළ ශ්‍රේණිගත) ආයෝජන සහ අධිජාතික මූල්‍ය ආයතන සමඟ සිදු කර ඇති විදෙශ මූල්‍ය වත්කම් සහ ඉල්ලීම මත ආපසු ලබා ගත හැකි ආයෝජන සඳහා මාස 12ක අපේක්ෂිත ණය අලාභවලට සමාන ප්‍රමාණයකට අලාභ දීමනා හඳුනා ගනී. මාස 12ක අපේක්ෂිත ණය අලාභයක් හඳුනා ගන්නා මූල්‍ය උපකරණ "පළමු අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හඳුනා ගනී.

මූලික හඳුනා ගැනීමේ දී ආයෝජන ශ්‍රේණිය පහළ හෝ මූලික හඳුනා ගැනීමෙන් පසුව ණය අවදනම BBB/Baa අගයට වඩා පහළ හෝ ආයෝජනයක ණය ශ්‍රේණිගත කිරීම එක් ශ්‍රේණිගත කාණ්ඩයකින් පහළ ශ්‍රේණිගත කාණ්ඩයකට අඩු කරනු ලැබූ අවස්ථාවක දී හෝ ගිවිසුම් අනුව ගෙවිය යුතු මුදල් ප්‍රවාහ දින 30කට වඩා ප්‍රමාද වී ඇති අවස්ථාවල දී එම මූල්‍ය වත්කම් සඳහා ජීව කාල අපේක්ෂිත ණය අලාභ ගණනය කරනු ලබයි. ජීව කාල අපේක්ෂිත ණය අලාභ හඳුනාගන්නා නමුත් ණය හානිකරණය වී නොමැති මූල්‍ය උපකරණ "දෙවන අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හඳුනා ගනී. ජීව කාල අපේක්ෂිත ණය අලාභ ණය හානිකරණය වූ වත්කම් සඳහා ගණනය කරනු ලබන අතර ඒවා "තෙවන අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හැඳින්වේ.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ දී යොදා ගන්නා ප්‍රධාන මූලිකාංගයන් පහත විස්තර කර ඇත.

#### ණය පැහැර හැරීමේ සම්භාවිතාව (PD)

ණය පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ ගෙවීම් පැහැර හැරීමට ඇති නැඹුරුව සම්බන්ධ ඇස්තමේන්තුවකි. ඇගැයීමට ලක් කෙරෙන කාල පරාසය ඇතුළත, නියමිත කාලයකදී ණය පැහැර හැරීමක් සිදු විය හැක්කේ එම මූල්‍ය පහසුකම පෙර දී ගිණුම්වලින් ඉවත් නොකර තවදුරටත් ආයෝජන කළඹෙහි පවතින අවස්ථාවලදී පමණි.

විදේශ මුදල්වලින් නම් කරන ලද මූල්‍ය වත්කම් සඳහා, බැංකුව විසින් ණය පැහැර හැරීමේ සම්භාවිතාව බ්ලූම්බර්ග් (Bloomberg) වෙතින් ලබා ගන්නා "නිකුත් කරන්නන්ගේ ස්කන්ධ ණය පැහැර හැරීමේ සම්භාවිතයන්" භාවිත කරමින් තීරණය කරයි. නිකුත් කරන්නන්ගේ ස්කන්ධ ණය පැහැර හැරීමේ සම්භාවිතයන් ලබා ගත නොහැකි අවස්ථාවල දී, අදාළ නිකුත් කරන්නන්ගේ හෝ ප්‍රතිපාර්ශ්වයන්ගේ සංයුක්ත ණය ශ්‍රේණිගත කිරීම් අනුව බ්ලූම්බර්ග් තොරතුරු පද්ධතියේ ඇති පොදු ණය පැහැරහැරීමේ සම්භාවිතා බැංකුව මඟින් වාර්තා කරන දිනට ඇති පැහැරහැරීමේ සම්භාවිතාවය භාවිත කරනු ලැබේ. නිකුත් කරන්නන්ගේ ස්කන්ධ ණය පැහැර හැරීමේ සම්භාවිතවයන් හෝ සංයුක්ත ණය ශ්‍රේණිගත කිරීම මත ණය පැහැර හැරීමේ අගයන් දෙකම ලබාගත නොහැකි අවස්ථාවල දී අදළ නිකුත් කරන්නන් හෝ ප්‍රතිපාර්ශවයන් පිහිටා ඇති රටේ ස්වෛරී ණය පැහැර හැරීමේ සම්භාවිතාව භාවිත කරනු ලබයි.

දේශීය මුදල්වලින් නම් කරන ලද මූල්‍යවත්කම් සඳහා අදළ නිකුත් කරන්නන්ගේ හෝ ප්‍රතිපාර්ශ්වයන්ගේ සංයුක්ත ණය ශ්‍රේණිගත කිරීම් අනුව බ්ලූම්බර්ග් තොරතුරු පද්ධතියේ ඇති පොදු ණය පැහැර හැරීමේ සම්භාවිතා වගුව මඟින් වාර්තා කරන දිනට ඇති පැහැර හැරීමේ සම්භාවිතාවය භාවිත කරනු ලැබේ.

#### ගෙවීම් පැහැර හැරීමේ දී ඇති නිරාවරණය

ගෙවීම් පැහැර හැරීමේ දී ඇති නිරාවරණය යනු අනාගත ගෙවීම් පැහැර හරින දිනයක දී බැංකුවට අහිමි වන්නා වූ මූල්‍ය වත්කමෙහි වටිනාකම පිළිබඳව කරනු ලබන ඇස්තමේන්තුවයි. මෙම ගණනය කිරීමට මූලික මුදල සහ එහි පොලිය ආපසු ගෙවීම, ගිවිසුමකින් හෝ වෙනත් ආකාරයකින් නියම කරන ලබන ණය බැඳියාවන්ගේ අනාගත නිකුත් කිරීම හා මගහැරුණු ගෙවීම් සඳහා වන උපචිත පොලිය ඇතුළත් වේ.

#### පැහැර හැරීමක දී වන අලාභය (LGD)

පැහැර හැරීමක දී වන අලාභය යනු දෙන දිනයක දී ගෙවීම් පැහැර හැරීම හේතුවෙන් බැංකුවට ඇති වන අලාභය පිළිබඳ ඇස්තමේන්තුවකි. එය ගෙවිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හා ඇප උපලබ්ධි කිරීමෙන් ලැබෙන ප්‍රමාණය ද ඇතුළුව ණය හිමියාට ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහය අතර වෙනස පදනම් කර ගණනය කරනු ලබයි. සිය අවදනම් නිරාවරණය මත පදනම්ව විවිධ වර්ගයේ මූල්‍ය වත්කම් සඳහා භාවිත කළ යුතු පැහැර හැරීමක දී වන අලාභය තීරණය කිරීමට අභ්‍යන්තරව අනුමත කළ ප්‍රතිපත්තියක් බැංකුව සතු වේ.

#### ආර්ථික සාධක ගැලපීම

පැහැර හැරීමේ සම්භාවිතාව, යම් මොහොතක පවතින පැහැර හැරීමේ සම්භාවිතාවකට පරිවර්තනය කිරීම සඳහා බැංකුව විසින් ආර්ථික සාධක ගැලපීම යොදා ගනී. විදේශීය මූල්‍ය වත්කම් සඳහා, බර තබන ලද ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ප්‍රධාන ලෝක ආර්ථික සාධක ද දේශීය මූල්‍ය වත්කම් සඳහා බර තබන ලද ප්‍රමාණාත්මක දේශීය ආර්ථික සාධක මේ සඳහා භාවිත කෙරෙයි.

#### ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීම ඇගැයීම (SICR)

බැංකුව විසින් මූලික හඳුනා ගැනීමෙන් පසු ණය අවදනම සැලකිය යුතු ලෙස වැඩි වී ඇත්දැයි තීරණය කිරීම සඳහා, සෑම ගිණුම් වාර්තා දිනයක දී ම ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සාධක සලකා බලනු ලැබේ.

ණය තත්ත්වය අඩු වීමේ සාධක ලෙස පහත සාධක සලකා බැලෙන අතර ඒවා පහත සාධකවලට පමණක් සීමා නොවේ.

**ගෙවීම් ප්‍රමාද වන දින**

- දින 30 හෝ ඊට වැඩි ප්‍රමාදය - දෙවන අදියරේ මූල්‍ය උපකරණ ලෙස වර්ගීකරණය කෙරේ
- දින 90 හෝ ඊට වැඩි ප්‍රමාදය - තෙවන අදියරේ මූල්‍ය උපකරණ ලෙස වර්ගීකරණය කෙරේ

**අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම පහළ යෑම**

- පවතින ණය ශ්‍රේණිගත මට්ටමට වඩා පහළට අඩු වීම - දෙවන අදියරේ මූල්‍ය උපකරණ ලෙස වර්ගීකරණය කෙරේ.
- පවතින ණය ශ්‍රේණිගත මට්ටම ආයෝජන ශ්‍රේණියට වඩා අඩු මට්ටමට පහළට යෑම - තෙවන අදියරේ මූල්‍ය උපකරණ ලෙස වර්ගීකරණය කෙරේ.

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

### ණය හානිකරණය වූ මූල්‍ය වත්කම්

එක් එක වාර්තාකරණ දිනයට මූල්‍ය වත්කම් ණය හානිකරණය වී ඇත්දැයි (තෙවන අදියරේ මූල්‍ය වත්කම් ලෙස) බැංකුව විසින් අගයනු ලබයි. මූල්‍ය වත්කමක් ණය හානිකරණය වූ මූල්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබන්නේ මූල්‍ය වත්කම් නිකුත් කර ඇති ප්‍රතිපාර්ශ්වයට දින 90ක් හෝ ඊට වඩා ප්‍රමාද වී තිබෙන විට හෝ ඇපකර හෝ වෙනත් ණය ශක්තිමත් කිරීම් සාක්ෂාත් නොකර තම බැඳීම් සම්පූර්ණයෙන් ගෙවීම අපේක්ෂා කළ නොහැකි විට ය.

### මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාව ඉදිරිපත් කිරීම

- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්, වත්කම්වලට දළ ධාරණ වටිනාකමෙන් අඩු කිරීමක් ලෙස
- විස්තීර්ණ ආදයම තුළින් සාධාරණ අගයට මනිනු ලබන වත්කම්: මෙවැනි වත්කම්වල ධාරණ වඩිනාකම ඒවායේ සාධාරණ අගය වන හෙයින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ කිසිදු අලාභ වෙන් කිරීමක් හඳුනා නොගනී. කෙසේ වෙතත් ණය දීමනාව අනාවරණය කෙරෙන අතර එය වෙනත් විස්තීර්ණ ආදයම තුළ හඳුනා ගනී.
- ණය ඇපකර ගිවිසුම්: වෙන් කිරීමක ලෙස

### 7.3.9 ලියා හැරීම

මූල්‍ය වත්කමක් සම්පූර්ණයෙන්ම සහ එහි කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් නොමැති විට ණය සහ ණය සුරැකුම්පත් ලියා හරී. (කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්). ණයකරුට ලියා හැරීමට යටත් වන ප්‍රමාණ ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීමට හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර නොමැති බව බැංකුව තීරණය කරන අවස්ථාවකදී මෙසේ ලියා හරිනු ලබයි. මෙම ඇගයීම එක් එක් වත්කම් මට්ටමේදී සිදු කරයි. පෙර ලියා හරින ලද ප්‍රමාණයන් ආපසු අයකර ගැනීම ආදායම් ප්‍රකාශයේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ 'මූල්‍ය උපකරණ මත වන හානිකරණ අලාභ' තුළ ඇතුළත් කරනු ලැබේ.

### 7.4 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකුව විසින් භාවිත කරනු ලබන අතර ඒවා භාවිත කරනුයේ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර, එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල සාධාරණ අගයෙහි ඇතිවන වෙනස්වීම් 'උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනවල වාසිය/(පාඩුව)' ආදායම් ප්‍රකාශය තුළ වාර්තා කරනු ලැබේ.

ගනුදෙනුවක මිල ඒ හා සමාන ගනුදෙනු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්තමාන වෙළෙඳපළ ගනුදෙනුවල සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ නිරීක්ෂණය කල හැකි වර්තමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් වන ඇගයීම් ශිල්ප ක්‍රමයක් මත පදනම් වී, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දින 1 වෙනස) 'උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)' තුළ වහාම හඳුනාගනු ලබයි. සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත භාවිතයෙන් තීරණය කරන අවස්ථාවක දී, එම ගණුදෙණුවේ මිල හා ආකෘතියේ වටිනාකම අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණය ඉවත් කල විට පමණක් ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

### 7.5 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට (IMF) අදාළ ශේෂයන්

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා. මු. අ.) සමඟ තම බලතල ප්‍රකාර ගනුදෙනු කරයි. බැංකුව විසින් ජා. මු. අ. සමඟ සිදුකෙරෙන සියලුම ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා. මු. අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කරන අතර, එම පංගුව සඳහා ජා. මු. අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා. මු. අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි. ගැ. හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා. මු. අ. පංගු වත්කම සහ වි. ගැ. හි. හිමිකම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කරන අතර අනෙකුත් ජා. මු. අ. හා අදාල වත්කම් සහ වගකීම් සඵල පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලැබේ. ජා. මු. අ. විසින් ප්‍රකාශිත පරිදි වාර්තාකරණ දිනට යොදා ගන්නා විනිමය අනුපාතිකයට ජා. මු. අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා. මු. අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියලුම අනෙකුත් ගාස්තු සහ පොලිය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

### 7.6 ශ්‍රී ලංකා බැංකු තැන්පතු රක්ෂණ අරමුදලෙහි විදේශීය ආයෝජන

ශ්‍රී ලංකා බැංකු තැන්පතු රක්ෂණ අරමුදලෙහි විදේශ ආයෝජන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරන අතර, එම අගයන් මූල්‍ය වාර්තා සටහන් හි ශ්‍රී ලංකා බැංකු තැන්පතු රක්ෂණ අරමුදල වෙනුවෙන් කර ඇති විදේශ ආයෝජන ලෙස වෙන්ව දක්වා ඇත. එම විදේශ ආයෝජනවලට අදාල වත්කම්වලට සමාන අගයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ, ශ්‍රී ලංකා බැංකු තැන්පතු රක්ෂණ අරමුදලට ඇති වගකීම් ලෙස වෙන්ව පෙන්වා ඇත. මෙම ආයෝජන පළමුව පිරිවැයට හා පසුව සාධාරණ අගයට ගිණුම්ගත කර ඇත. මේවායේ සාධාරණ අගයට, ක්‍රමක්ෂය පිරිවැයට හා උපලබ්ධි ලාභයට හෝ අලාභයට වන වෙනස්වීම් ශ්‍රී ලංකා බැංකු තැන්පතු රක්ෂණ අරමුදලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති වගකීම් අගයට ගලපා දක්වා ඇත. තව ද මෙම විදේශ ආයෝජන මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවට ආර්ථික වාසි නොලැබෙන අතර භාරකාරී කාර්යභාරයක් පමණක් ඉටුකරනු ලබයි.

### 7.7 මුදල් සහ මුදල් සමානයන්

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ පරිණත කාලය මාස තුනකට අඩු, සාධාරණ අගය වෙනස්වීමේ සැලකිය යුතු අවදානමක් නොමැති සහ බැංකුව මඟින් එහි කෙටිකාලීන බැඳීම් කළමණාකරණය සඳහා යොදා ගන්නා ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු මූල්‍ය වත්කම් මුදල් සහ මුදල් සමානයන්ට අයත් වන අතර, මුදල් සහ මුදල් සමානයන් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම සහ ඇතැම් වියදම් දැරීම ද සිදුකරන අතර, එමඟින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර, එය ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමඟ ගනුදෙනු සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමඟ කරනු ලබන ගනුදෙනුවලින් සමන්විත වේ. ශ්‍රී ලංකා රජය සමඟ ගනුදෙනුවලට රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල සහ බැඳුම්කර මිලදී ගැනීම ඇතුළත් වේ. එවැනි මිලට ගැනීම්, බැහැර කිරීම් හෝ ඒ මත පොලීය හුදෙක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල පොත් සටහන් වශයෙන් පිළිබිඹු කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් 44 සහ සටහන් 45 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාර, තනි ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මඟින් හිමිකමක් නියෝජනය කරයි. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ.

සංසරණ මුදල්වල වෙනස්වීම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන, මහ බැංකු අතර පවත්නා ක්ෂේත්‍රයේ පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මඟින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් නිකුත් කරන චෙක්පත් මඟින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමඟ වන තැන්පතු ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණ සඳහා වූ මුදල් භාවිතා කිරීමෙන් බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහය සකස් කරයි.

## 7.8 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම්

ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු ඒවායේ උපචිත ආදායම් හා වියදම් ද ඇතුළුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ වාර්තා කරනු ලැබේ.

## 7.9 නිත්‍ය තැන්පතු සහ ණයදීමේ පහසුකම්

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය ප්‍රතිමිලදී ගැනුම් පහසුකම) සුරැකුම් රහිත 'තැන්පතු පහසුකමක්' බවට පරිවර්තනය කරන ලදි. එබැවින් සහභාගීත්ව ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනික පදනමක් මත පිරිසිදු තැන්පතුවක් ලෙස ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකමේ ක්‍රියාපටිපාටිය, (පෙර නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම) නිත්‍ය ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ පහසුකම හා සමාන වන අතර, මෙම දෙවර්ගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ක්‍රමක්‍ෂය පිරිවැයට හඳුනාගනී.

## 7.10 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් වලින් සහ බැඳුම්කර වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්හි ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වාර්තා කරනු ලැබේ.

## 7.11 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 127 වැනි වගන්තිය ප්‍රකාරව, මහ බැංකුව විසින් මුදල් වර්ෂයේ පළමු මාසය ඇතුළත ඒකාබද්ධ අරමුදලින් දරණු ලැබීමට බලයලත් වියදම් මූල්‍යනය කිරීම සඳහා අලුත්, ඍජු තාවකාලික අත්තිකාරම් රජයට ලබාදිය හැකිය. එවැනි සෑම නව අත්තිකාරමක් ම මාස 06 කට නොඉක්මවනු ලබන කාලසීමාවක් ඇතුළත ආපසු ගෙවනු ලැබිය යුතුය. අදාළ කාලය සඳහා 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ මුදල් අමාත්‍යංශය විසින් ප්‍රකාශිත අර්ථ වාර්ෂික වාර්තාවේ වාර්තා කළ ඇති පරිදි, හිඟව පවතින එවැනි අත්තිකාරම්වල මුළු ප්‍රමාණය පෙර මූල්‍ය වර්ෂයේ පළමු මාස හතරේ ආදායමෙන් සියයට දහය නොඉක්මවිය යුතුය. එවැනි නව අත්තිකාරම් මහ බැංකුව විසින් තීරණය කරන පරිදි පවත්නා වෙළෙඳපොළ අදාළ අනුපාතයට පොලී දැරිය යුතුය.

## 7.12 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත.

## 7.13 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයුම් යටතේ ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් වරින් වර රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදුකරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ ක්‍රියාකාරීත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදාගනී.

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන අවස්ථාවක, වෙළෙඳපොළ අනුපාතයට (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ අනුපාත පරිදි) සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම සඳහා බැංකුවේ කොන්දේසි විරහිත ඇපවීමකි.

ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකම් සහ කිසියම් අවස්ථාවක ප්‍රතිමිලදී ගැනීමේ මෙහෙයුම් සඳහා භාවිතා නොකළ සුරැකුම්පත් අසම්භාව්‍ය බැරකමක් ලෙස වාර්තා කරනු ලැබේ. ගෙවන ලද කොමිස් මුදල උපචිත පදනම මත වියදම් කරනු ලැබේ.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශ්වයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභය ද මාරු කරන්නේනම් පමණි.

### 7.14 සේවක ණය

සහනදායී පොලී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා මහ බැංකු සේවයේ ස්ථිර කර ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. මෙම ණය, ශ්‍රී. ලං. මූ. වා. ප්‍ර. 9 'මූල්‍ය උපකරණ' අනුව, වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

**වට්ටම් අනුපාතය:** සාමාන්‍ය බරතබන ලද මූලික ණය දීමේ අනුපාතය (AWPR) වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරන අතර, එය ණයවල කාලසීමාව සමඟ වෙනස් වේ.

සහනදායී පොලී අනුපාතයන්ට මෙම ණය ලබාදීමේදී බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට වර්ෂයේ ආරම්භ දිනට සහ වර්ෂයේ අවසාන දිනට සේවක ණයවල වර්තමාන අගයන් අතර වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර, බැංකුව විසින් මෙම ණය වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම්, බැංකුව විසින් උපයනු ලැබිය හැකි ආදායම වාර්තා කිරීමට සමාන අගය, අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගය කිරීම ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන්**

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකනු ලැබේ.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ කලින් පියවීමක් නොමැත.

### 7.15 රන්

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ ජාත්‍යන්තර සංචිත කළමණාකරණය පිළිබඳ දැක්වෙන 40 (2) වගන්තිය ප්‍රකාරව රත්‍රන් නියෝජනය කරන බැර ශේෂ ද ජාත්‍යන්තර සංචිතවල කොටසක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබිය හැක. එසේම එම පනතේ 94 (32) වගන්තිය මගින් මහ බැංකුව විසින් ලාභ බෙදා හැරීමට පෙරාතුව පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ජාත්‍යන්තරව පිළිගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව ආදායම් ප්‍රකාශයේ වාර්තා වූ රත්‍රන් සම්බන්ධයෙන් මහ බැංකුවේ තත්ත්වය හේතු කොටගෙන, වෙළෙඳපොළ මිල ප්‍රත්‍යාග ණනයෙන් උද්ගත වන උපලබ්ධි නොවූ ලැබීම් පිළිබඳව විස්තර කරනු ලබයි.

රත්‍රන් මූලික අවස්ථාවේදී පිරිවැයට හඳුනා ගනු ලැබේ. මෙම රත්‍රන් ජාත්‍යන්තර සංචිතවල කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර රටාව තුළ වෙළෙඳාම් කරන පාරිභෝගික භාණ්ඩයක් ලෙස භාවිතා නොකරන බැවින් රත්‍රන් සාධාරණය අගයට අගය කරන අතර, ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයට මාරු කෙරේ. ලාභ බෙදා හැරීමට පෙරාතුව, රත්‍රන්වලින් උපලබ්ධි නොවූ ලාභ අදාළ සංචිත ගිණුමට මාරු කෙරේ.

### 7.16 මුදල් තොග

බැංකුවේ තොගය තුළ, සංසරණය සඳහා මෙතෙක් නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසි නිෂ්පාදනය සහ නිර්මාණය කිරීමේ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී, එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කෙරේ.

### 7.17 අනෙකුත් තොග

අනෙකුත් තොග, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම් යන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ.

### 7.18 දේපළ, පිරියත හා උපකරණ

සියලුම දේපල, පිරියත හා උපකරණ මූලික අවස්ථාවේදී පිරිවැයට හඳුනාගනු ලැබේ. පසුව ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී පිරිවැයට, හඳුනා ගැනීම සඳහා වූ නිර්ණායකයන් සපුරන ලද්දේ නම්, පිරිවැය දරන අවස්ථාවේදී දේපල, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය ඇතුළත් වනු ඇත.

ඉඩම් සහ ගොඩනැගිලි පසුකාලීන සමුච්චිත ක්‍ෂයවීම් සහ පසුකාලින සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ ප්‍රත්‍යාගණනය කරන දිනට එහි සාධාරණ අගය වන ප්‍රත්‍යාගණන අගයට අගය කරනු ලබයි.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50ට වැඩි |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 හෝ කල්බදු කාලසීමාව යන දෙකෙන් අවමය |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරගත නොහැකි බව සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් මඟින් පෙන්නුම් කරන විටක දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගයන් හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර තුනකට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් තුළදී ප්‍රත්‍යක්ෂ වූ විටය. ප්‍රත්‍යාගනන අතිරික්තය ප්‍රත්‍යාගන සංචිතයට බැරකර, මූල්‍ය තත්ව ප්‍රකාශයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගනන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම්ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන් වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමඟ ගලපනු ලැබේ.

වත්කමක් බැහැර කිරීමේදී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ලාභ වලට මාරුකරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරිමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත් කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවෙන් නොමැති නම් එය දේපල, පිරියත සහ උපකරණ ලෙස හඳුනාගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය, සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරු ගැලපීම් කරනු ලැබේ.

ප්‍රාග්ධන නොනිමි වැඩ එහි පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වන අතර ගොඩනැගිලි ඉදි කිරීමේදී ප්‍රධාන පිරියත සහ යන්ත්‍ර සහ පද්ධති සංවර්ධනයේදී සෘජුව දරා ඇති අතර ප්‍රාග්ධනීකරණය කිරීමට සූදානමින් පවතින වියදම් වේ.

## 7.19 කල්බදු

යම් ගිවිසුමක් ආරම්භයේදී, එම ගිවිසුම කල්බදු ගිවිසුමක්ද හෝ ගිවිසුමෙහි කල්බද්දක් අන්තර්ගත වේද යන්න බැංකුව තක්සේරු කරයි. ප්‍රතිෂ්ඨාව හුවමාරුව තුළ යම් කාලසිමාවක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ අයිතිය ගිවිසුම පවරා දෙන්නේනම් එවන් ගිවිසුමක් කල්බද්දකි නැතිනම් කල්බද්දක් සමන්විත වේ. යම් ගිවිසුමක් හඳුනාගත් වත්කමක භාවිතය පාලනය කිරිමේ අයිතිය බැංකුවට පවරා දෙන්නේද යන්න තක්සේරු කිරීම සඳහා, බැංකුව විසින් ජා. මූ. වා. ප්‍ර. 16 හි ඇතුළත් වන කල්බදු සඳහා වන නිර්වචනය භාවිතා කරයි.

### බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීම

බැංකුව විසින් කල්බද්ද ආරම්භ වන දිනයේ දී වත්කම භාවිතා කිරීමේ හිමිකමක් හා කල්බදු වගකීමක් හඳුනාගනු ලැබේ. වත්කම භාවිතා කිරිමේ හිමිකම මුලිකවම පිරිවැයට මනිනු ලබන අතර එය කල්බද්ද ආරම්භ වන දිනයට හෝ ඊට පෙර කරන ලද කල්බදු ගෙවීම් සඳහා කල්බදු වගකීම ගැලපීමේ මුලික ප්‍රමාණය සමඟ දරන ලද මූලික සෘජු පිරිවැය සහ ඉඩම් හා කාර්යාල පරිශ්‍රයන් සඳහා සිදුකරන ලද නවීකරණයන් ඉවත්කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය සමන්විත වේ.

වත්කම භාවිතා කිරීමේ හිමිකම, ඉන්පසුව කල්බද්ද ආරම්භ කළ  දිනයේ සිට කල්බදු කාලය අවසන් වන දිනය තෙක් සරල මාර්ගික ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. මීට අමතරව, වත්කම භාවිතා කිරීමේ හිමිකමෙන් කලින් කල හානිකරණ අලාභ අඩුකරන අතර, ඇත්නම්,  කල්බදු වගකීමේ නැවත මැනීම් සඳහා ගලපනු ලැබේ.

කල්බදු ආරම්භ කළ දිනට, නොගෙවූ කල් බදු ගෙවීම් වල වර්තමාන වටිනාකමට කල්බදු වගකීම මනිනු ලැබේ. මේ සඳහා කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය භාවිතයෙන් කල්බදු ගෙවීම් වට්ටම් කරනු ලබන අතර, එම පොලී අනුපාතිකය නිශ්චය කළ නොහැකි විට, ඒ සඳහා බැංකුවේ වර්ධක ණය අනුපාතිකය භාවිතා කරනු ලැබේ.

කල්බදු වගකීම් මැනීමේදි ඇතුළත් කල්බදු ගෙවීම්වල පහත දෑ සමන්විත වේ.

- ප්‍රධාන ස්ථාවර ගෙවීම් ඇතුළත් වන ස්ථාවර ගෙවීම්:
- අනුපාතිකයක් මත රඳා පවතින, කල්බද්ද ආරම්භක දිනට අනුපාතිකයක් භාවිතයෙන් මනිනු ලැබූ විචල්‍ය කල්බදු ගෙවීම්;

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. යම් අනුපාතිකයක වෙනස්වීමකින් ඇතිවන අනාගත කල්බදු ගෙවිම්වල වෙනසක් ඇති අවස්ථාවක, අවශේෂ වටිනාකම් ඇපයක් යටතේ ගෙවීමට අපේක්ෂිත අගය පිළිබඳ බැංකුවේ ඇස්තමේන්තුව තුළ වෙනසක් ඇත්නම්, කලින් අවසන් කිරීමේ විකල්පයක් සඳහා එය දීර්ඝ කිරීමේ විකල්පයක් සහ දඩමුදල් ක්‍රියාවේ යොදවන්නේද යන්න පිළිබඳ තක්සේරුව බැංකුව වෙනස් කරන්නේනම් හෝ සංශෝධිත ප්‍රධාන ස්ථිර කල්බදු ගෙවිමක් ඇත්නම්, එය නැවත මනිනු ලැබේ.

කල්බදු වගකීම මේ ආකාරයෙන් මැනීමේදී, අනුරූප ගැලපීම වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගයට ගලපනු ලැබේ නැතිනම් වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගය ශුන්‍ය දක්වා අඩුවි ඇත්නම්, එම කල්බදු වගකීමෙහි වෙනස් වීම ආදායම් ප්‍රකාශයට වාර්තා කරනු ලැබේ.

බැංකුව විසින් වත්කම භාවිතා කිරීමේ හිමිකම හා කල්බදු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පිළිවෙලින් 'දේපල, පිරියත හා උපකරණ' (සටහන 21) හා 'විවිධ බැරකම් හා උපචිත' (සටහන 32) තුළ දක්වා ඇත.

## 7.20 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක දෘඩාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග, අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, මෙම අස්පෘෂ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හාණිකරණ අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ. මෘදුකාංග වත්කම් සඳහා පසුකාලීනව ඇතිවන වියදම් ප්‍රාග්ධනීකරණය කරන්නේ එමඟින් ඊට අදාල නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් පමණි. අනෙකුත් සියලූ වියදම් දරා ඇති පරිදි වියදම් කෙරේ.

වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ අපේක්ෂිත පරිභෝජන රටාව වඩාත් මැනවින් පිළිබිඹු වන බැවින් අදාල වත්කම පාවිච්චිය සඳහා ලබාගතහැකි දිනයේ සිට වසර 4ක ඵලදායී ජීව කාලයක් තුළ සරල මාර්ගික පදනමක් මත ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

යම් ආයතනයකට පහත සඳහන් කරුණු පෙන්විය හැකි නම් පමණක් සංවර්ධනය තුළින් (හෝ අභ්‍යන්තර ව්‍යාපෘතියක සංවර්ධන අදියරකින්) ඇති වන්නා වූ අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගනු ලැබේ.

(අ) භාවිතයට ගැනීමට හැකි වන පරිදි අස්පෘශ්‍ය වත්කම් නිම කිරීමට ඇති තාක්ෂණික ශක්‍යතාව.

(ආ) අස්පෘශ්‍ය වත්කම සම්පූර්ණ කර එය භාවිතා කිරීමට ඇති අභිප්‍රාය

(ඇ) අස්පෘශ්‍ය වත්කම් භාවිතා කිරීමට ඇති හැකියාව

(ඈ) අස්පෘශ්‍ය වත්කම අනාගත ආර්ථික ප්‍රතිලාභ උපදවන ආකාරය. වෙනත් කරුණු ලෙස එය අභ්‍යන්තරව භාවිතා කිරීමට ඇති හැකියාව.

(ඉ) අස්පෘශ්‍ය වත්කම සංවර්ධනය සම්පූර්ණ කිරීමට සහ භාවිතා කිරීමට ප්‍රමාණවත්. තාක්ෂණික, මූල්‍ය සහ වෙනත් සම්පත් පැවතීම.

(ඊ) අස්පෘශ්‍ය වත්කම් එහි සංවර්ධනය තුළ අදාළ වියදම් විශ්වාසදායක ලෙස මැනීමට ඇති හැකියාව.

### 7.21 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් යන්නට නාමකරණ ලද අතර අරමුදල්වල ආයෝජන, ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යනු ලබන සේවක ණය සහ රජයෙන් අය කර ගත යුතු දෑ ඇතුළත් වේ.

### 7.22 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී, ධාරණ අගය හානිකරණය වී ඇති බවට සිද්ධීන් හෝ වාතාවරණයන්හී වෙනස්වීම් මඟින් දක්වන්නෙම්, කිසියම් මූල්‍ය නොවන වත්කමක හානිකරණය පිළිබඳ හැඟවීමක් තිබේද යන්න බැංකුව තක්සේරු කරයි. එවැනි හැඟවීමක් පවතිනම්, බැංකුව වත්කමේ අයකරගතහැකි ප්‍රමාණය පිළිබඳ තක්සේරුවක් සිදු කරයි. වත්කමක ධාරණ අගය එහි අයකරගතහැකි ප්‍රමාණය ඉක්මවන්නේනම්, වත්කම හානිකරණය වී ඇති බවට සලකනු ලබන අතර එහි අයකරගතහැකි ප්‍රමාණයට කපා හරිනු ලබයි. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

එක් එක් වාර්තා කිරීමේ දිනයේදී, හානිකරණය පිළිබඳ යම් හැඟවීමක් තිබේද යන්න තීරණය කිරීමට මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගය බැංකුව සමාලෝචනය කරයි. එවැනි හැඟවීමක් පවතිනම්, එහිදී වත්කමේ අයකරගතහැකි ප්‍රමාණය තක්සේරු කෙරේ.

හානිකරණ පරීක්ෂාව සඳහා, අනෙකුත් වත්කම්වල මුදල් ගලාඒම් වලින් බොහෝ දුරට ස්වාධීනව අඛණ්ඩ භාවිතයෙන් මුදල් ප්‍රවාහ උපදවන කුඩා වත්කම් සමූහවලට වත්කම් කාණ්ඩගත කරනු ඇත.

වත්කමක 'අයකරගත හැකි ප්‍රමාණය' එම වත්කමෙහි භාවිතයේ පවතින වටිනාකම සහ විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගය යන දෙකෙන් ඉහළ අගය වේ. වත්කමක 'භාවිතයේ වටිනාකම' මුදලේ කාලීන වටිනාකම සහ වත්කමට විශේෂිත අවදානම් පිළිබඳ වර්තමාන වෙළෙඳපොළ තක්සේරුව පිළිබිඹු කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතයෙන් ඒවායේ වර්තමාන අගයට වට්ටම් කළ එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත පදනම් වේ. වත්කමක ධාරණ අගය එකී වත්කමේ අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේනම් හානිකරණ අලාභයක් හඳුනාගනු ලබයි.

ගලපන ලද හානිකරණ අලාභ නැවත හැරවිය හැක්කේ අදාල වත්කමේ ධාරණ අගය එම වත්කම මත හානිකරණ අගයක් හඳුනා නොගත් අවස්ථාවක නිර්ණය කළ, ක්ෂය හෝ ක්‍රමක්ෂය ගලපන ලද ශුද්ධ ධාරණ අගය ඉක්මවා නොයන අවස්ථාවක පමණි.

### 7.23 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇති විටෙක සහ වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභවල ඇතුළත් සම්පත්වල ගලායාමක් අවශ්‍යවීමත්, එම බැඳීමේ ප්‍රමාණය විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාග නු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූරණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූරණය නිසැකවම තහවුරු වන අවස්ථාවේදී එය වෙනම වත්කමක් ලෙස හඳුනාගනී.

### 7.24 සංසරණයේ පවතින මුදල

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් නියෝජනය කරයි. සංසරණයේ පවතින මුදල් සඳහා වගකීම. ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

### 7.25 පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්ම

#### 7.25.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායක යෝජනා ක්‍රමයක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි. බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ක්‍රියාත්මක කරයි. පළමු යෝජනා ක්‍රම තුන සම්බන්ධයෙන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන අරමුදල්වලට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකක බැර ආයුගණක ඇගයීමේ ක්‍රමයක් භාවිතයෙන් එක් එක් සැලසුම සඳහා වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් බැංකුවේ බැඳීම් එක් එක් සැලැස්ම සඳහා වෙන වෙනම ගණනය කරනු ලබන්නේ සේවා නියුක්තිකයින්ගේ වර්තමාන හා පෙර කාලසීමාවන් හි සපයන ලද සේවා සඳහා උපයාගෙන ඇති අනාගත ප්‍රතිලාභ ප්‍රමාණය ඇස්තමේන්තු කරමින් ය. ප්‍රතිලාභ වට්ටම් කර එහි වර්තමාන අගය තීරණය කරයි. මෙහිදී හඳුනානොගත් අතීත සේවා පිරිවැය සහ සැලසුම් වත්කම්වල සාධාරණ අගය අඩුකරනු ලැබේ. වට්ටම් අනුපාතය වනුයේ ඉදිරියට ඇති සේවා කාලයේ සාමාන්‍යයට ආසන්න කල්පිරීම් දිනයන් සහිත රජයේ බැඳුම්කරවල තක්සේරු දිනට ඉපැයීම් අනුපාතයයි. සටහන් අංක 16 හි හෙළිදරව් කල සියළුම ප්‍රධාන ආයුගණන උපකල්පන, වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ.

#### 7.25.2 නිශ්චිත දායක සැලසුම්

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලබයි. බැංකුව විසින්

සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිශ්චිත දායක සැලසුම්වලට දායකත්වයන් සඳහා බැඳීම් ඒවා පැන නගින අවස්ථාවන්හි දී ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

## 7.26 ප්‍රදානයන්

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, (ප්‍රදානයන් ලබා ගැනීම සඳහා යුක්තිසහගත සහතිකයක් ඇති සහ සියළුම අදාළ කොන්දේසි, ඇත්නම්, අනුකූල වෙන අවස්ථාව) හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට සම්බන්ධනම්, ක්‍රමානුකූල පදනමක් මත වියදමට ඒවා ගැලපීමට අවශ්‍ය කාලසීමාවන් පුරා ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. ප්‍රදානයක් වත්කමට සම්බන්ධනම්, එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂයකිරීමේ ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශයට මුදා හරිනු ලැබේ.

## 7.27 අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්

අසම්භාව්‍ය වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් මඟින් පමණක් පැවැත්ම තහවුරු කෙරෙන වියහැකි බැඳීම් හෝ ආර්ථික ප්‍රතිලාභ මාරුකිරීම නිශ්චිත නොවන හෝ විශ්වාසනීය ලෙස අගය කළ නොහැකි වර්තමාන බැඳීම් වෙති. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනා නොග න්නා සියලුම ණය ගැතිකම් ඇපවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් අයිතම ලෙස අදාළ ශීර්ෂ යටතේ දක්වා ඇත. අවශ්‍යවන අවස්ථාවන්හි දී එවැනි ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කරනු ලබයි.

## 7.28 ආදායම සහ වියදම

බැංකුව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම නිශ්චිතව මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් හඳුනා ගනී. දරන ලද පිරිවැය සහ ආදායමේ විශේෂ අයිතමවල ඉපයීම අතර සෘජු සම්බන්ධතාවයක් මත පදනම් වී ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනා ගනී. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත හා උපකරණ කාර්යක්‍ෂම තත්ත්වයකින් පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීමේදී ආදායමට අයකරනු ලැබ ඇත.

ආදායම් හා වියදම් හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලිය යුතුය.

### 7.28.1 පොලී ආදායම් සහ වියදම්

පොලිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම් මිස, සැබෑ මිලදී ගැනීමේ මිල පදනම්ව, සඵල ඵලදායිත්ව ක්‍රමයට, උපචිත පදනමක් මත පොලී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනී. ස්ථාවර ආදායම් ආයෝජන හා සුරැකුම්පත් මත උපයන කූපන්, භාණ්ඩාගාර බිල්පත් හා අනිකුත් වට්ටම් කළ උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල, පොලී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවලදි පොලී ආදායම අත්හිටුවනු ලබයි. එවැනි ආදායම් ලැබෙනතුරු පොලී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

### 7.28.2 ලාභාංශ

බැංකුවේ ලැබීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

### 7.28.3 විවිධ ආදායම් හා වියදම්

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනමක් මත හඳුනාගනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, (විකුණුම් ප්‍රතිශ්ධාවෙන් වත්කමේ ධාරණ අගය හා විකුණුම් වියදම් අඩු කිරීමෙන් ලැබෙන) විකුණුම් වියදම් ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

ප්‍රධාන ලාභ උත්පාදන කටයුතුවලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ අලාභ එකතුකොට ශුද්ධ පදනමක් මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

### 7.28.4 සේවක මණ්ඩල වියදම්

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම්, අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ ඇතුළත් කෙරේ.

### 7.28.5 ආදායම් බදු වියදම

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 116 වගන්තිය, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය සහ 2021 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධිත) 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත සහ 2023 අංක 04 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත සහ 2023 අංක 14 දරණ දේශීය ආදායම් (සංශෝධිත) ප්‍රකාරව බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. 2020 අංක 04 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව 2020 ජනවාරි 01 න් ආරම්භව ආර්ථික සේවා ගාස්තු සඳහා තවදුරටත් වගකීමට බැඳී නැත. තවද, 2014 අංක 7 දරණ එකතු කල අගය මත බදු (සංශෝධිත) පනත යටතේ මූල්‍ය සේවා සැපයීම මත එකතු කල අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

## 7.29 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිද්ධීන්

වාර්තාකරණ දිනයට පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර, මූල්‍ය ප්‍රකාශයන්හි නියමිත සටහන් තුළ සුදුසු සංශෝධන හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

## 7.30 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ජා.ගි.ප්‍ර. 7 – මුදල් ප්‍රවාහ ප්‍රකාශන සමග අනුකූලව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීම සඳහා 'සෘජු ක්‍රමය' භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයයේ අරමුණ සඳහා, මුදල්/ ගෙවීම් නියෝග ගලායෑම් ගැළපීමෙන් අනතුරුව ලැබෙන අගය ඉහත නිර්වචනය කළ පරිදි, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් හා මුදල් සමානයන් සමන්විත වේ.

# මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

## 8 මුදල් සහ මුදල් සමානයන්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|---|
| බැංකු සමඟ ඇති ශේෂයන් | | 108,252,277 | 273,495,980 |
| බැංකු සමඟ ඇති කාලීන තැන්පතු | | 528,416,455 | 273,653,160 |
| එක්දින ස්ථාපනය කිරීම් | | 35,122,365 | 87,102,049 |
| මුදල් හා මුදල් සමානයන් | | 671,791,097 | 634,251,189 |
| තැන්පතු රක්ෂණ ක්‍රමය වෙනුවෙන් ඇති මුදල් ශේෂය | | 93,437 | 29,258,330 |
| තැන්පතු රක්ෂණ ක්‍රමය වෙනුවෙන් බැංකු සමඟ ඇති කාලීන තැන්පතු | | 2,634,952 | – |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් සහ මුදල් සමානයන් | | 674,519,486 | 663,509,519 |
| මුදල් සහ මුදල් සමානයන් මත ලැබිය යුතු පොලිය | | 306,470 | 390,010 |
| තැන්පතු රක්ෂණ ක්‍රමය වෙනුවෙන් ඇති මුදල් සමානයන් මත ලැබිය යුතු පොලිය | | 4,205 | – |
| සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් සහ මුදල් සමානයන් | 8.1 | 443,641,360 | 400,837,478 |
| අඩුකළා: මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභ | 8.2 | (454,009) | (1,208,732) |
| | | 1,118,017,512 | 1,063,528,275 |

8.1 25.1.1 සටහනෙහි පැහැදිලි කරන ආකාරයට ශ්‍රී. ලං. ම. බැ. හා පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා අතර ඇති වූ ද්වීපාර්ශවික මුදල් හුවමාරු පහසුකම යටතේ ලැබුනු චීන යුආන් බිලියන 10ක මුදල සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් ශේෂය නියෝජනය කරයි. මෙම පහසුකම යටතේ ලැබුණු මුදල්, රටවල් දෙක අතර වෙළෙඳ කටයුතුවලදී, සෘජු ආයෝජනවලදී සහ දෙපාර්ශවය මඟින් එකඟවන වෙනත් අරමුණු සඳහා යොදාගත හැකිය.

### 8.2 මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභයන්ගේ චලනය

| | 2025 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර 1 රු. '000 | අදියර 2 රු. '000 | අදියර 3 රු. '000 | අදියර 1 රු. '000 | අදියර 2 රු. '000 | අදියර 3 රු. '000 |
| ජනවාරි 1 දිනට ශේෂය | 1,208,732 | – | 1,208,732 | 635,409 | 230,592 | 866,001 |
| වර්ෂය තුල අය කිරීම්/(ආපසු හැරවුම්) | (754,723) | – | (754,723) | 573,323 | (230,592) | 342,731 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 454,009 | – | 454,009 | 1,208,732 | – | 1,208,732 |

## 9 විදේශ සුරැකුම්පත් වල ආයෝජන

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|---|
| **ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්** | | | |
| - විදේශ සුරැකුම්පත්වල ආයෝජනයන් | 9.1 | 95,447,519 | – |
| | | 95,447,519 | – |
| **අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්** | | | |
| - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් | | 837,025,322 | 672,461,750 |
| - තැන්පතු රක්ෂණ ක්‍රමය වෙනුවෙන් සිදුකළ විදේශ සුරැකුම්පත්වල ආයෝජනයන් | | 38,927,463 | – |
| | | 875,952,785 | 672,461,750 |
| විදේශ සුරැකුම්පත් ආයෝජනවල එකතුව | | 971,400,304 | 672,461,750 |

ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.153.6ක්, බ්‍රිතාන්‍ය පවුම් මිලියන 54.7ක්, ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 80.0ක්, නවසීලන්ත ඩොලර් මිලියන 43.7ක් සහ කැනේඩියානු ඩොලර් මිලියන 56.1ක් මුහුණත වටිනාකම ඇති විදේශ සුරැකුම්පත්වල ආයෝජනයන් 2025 වසර තුළදී විකුණා ඇත. තවද ඇ.එ.ජ. ඩොලර් මිලියන 566.0ක්, ස්ටර්ලින් පවුම් මිලියන 37.3ක්, ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 24.5ක්, ජපන් යෙන් මිලියන 6,515.4ක්, කැනේඩියානු ඩොලර් මිලියන 16.3ක් සහ යූරෝ මිලියන 44.7ක් වටිනා විදේශ සුරැකුම්පත් ආයෝජන 2025 වසර තුළදී කල්පිරෙන ලදී.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2025<br>රු. '000 | 2024<br>රු. '000 |
|---|---|---|---|
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභ | 9.2 | **1,065,903** | 1,461,863 |

**9.1** ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ගීකරණය කර ඇති විදේශ සුරැකුම්පත්වල ආයෝජනයන් තුළ, ශ්‍රී. ලං. ම. බැ. අයත් ලෝක බැංකුව විසින් මෙහෙයවන RAMP වැඩසටහනේ (Reserve Advisory Management Program) සිදුකළ ආයෝජනයන් ද ඇතුළත් වේ.

### 9.2 අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2025 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | එකතුව<br>රු. '000 | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | එකතුව<br>රු. '000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **1,461,863** | **–** | **1,461,863** | 70,273 | – | 70,273 |
| වර්ෂය තුළ අය කිරීම්/(ආපසු හැරවුම්) | **(395,960)** | **–** | **(395,960)** | 1,391,590 | – | 1,391,590 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,065,903** | **–** | **1,065,903** | 1,461,863 | – | 1,461,863 |

## 10 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

**10.1** පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමඟ වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගය යනු ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමේ, නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර, ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදය අවසානයට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර, එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟවේ.

| | 2025 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම්<br>රු. '000 | වගකීම්<br>රු. '000 | කාල්පනික අගය<br>රු. '000 | වත්කම්<br>රු. '000 | වගකීම්<br>රු. '000 | කාල්පනික අගය<br>රු. '000 |
| මුදල් හුවමාරු (Currency SWAPS) | **16,039** | **28,647,291** | **595,595,341** | 26,045,845 | 22,382,070 | 518,080,524 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forex Forward) | **–** | **3,156** | **2,944,947** | 1,911,318 | 14,814,318 | 107,346,944 |

| | 2025 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම්<br>රු. '000 | වගකීම්<br>රු. '000 | කාල්පනික අගය<br>රු. '000 | වත්කම්<br>රු. '000 | වගකීම්<br>රු. '000 | කාල්පනික අගය<br>රු. '000 |
| එකතුව | **16,039** | **28,650,448** | **598,540,288** | 27,957,163 | 37,196,388 | 625,427,468 |

**10.2** ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මුදල් හුවමාරු සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වලින් සමන්විත වන අතර, ඒවා විදේශ සංචිත පවත්වා ගැනීමේ ව්‍යවස්ථාපිත අරමුණට අනුව බැංකුව විසින් දරන විදේශ සංචිතවල ආයෝජනය, වෙළෙඳපොළ සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණ සඳහා භාවිතා කරන ලදි. මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු, විදේශ මහ බැංකු, විදේශ බැංකු සහ මූල්‍ය ආයතන සමඟ හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ශක්තිමත් කිරීමත්, කලාපීය රටවල් අතර ආර්ථික හා මූල්‍ය සහයෝගිතාව වර්ධනය කිරීමත්, විදේශ සංචිත ලැබීම් වැඩි කිරීමත් සහ මෙරටට විදේශ විනිමය ප්‍රවාහයන් වර්ධනය කිරීමත් අරමුණු කෙරේ.

**10.3** ව්‍යුත්පන්නයන් යනු පොලී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුම්ය.

**10.4** මෙම ව්‍යුත්පන්න ගනුදෙනු ඒවායේ කාල සීමාව මත පදනම්ව වර්ගීකරණය කර ඇති අතර, කෙටිකාලීන ව්‍යුත්පන්න වසරකට අඩු කාලසීමාවක් සහිත වන අතර දිගු කාලීන ව්‍යුත්පන්න වසරක් හෝ ඊට වැඩි කාලයක් සහිත වේ.

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

**10.5** විනිමය අනුපාත අවදානම, කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා කළමනාකරණය කිරීම සහ ප්‍රතිලාභ වර්ධනය කිරීම සඳහා වූ උපායමාර්ගයක් ලෙස එළඹුණු මුදල් හුවමාරු ඃක්මරරුබජහ් උ්ෂ* බැංකුවේ ව්‍යුත්පන්න කළඹෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදි බැංකුව වෙත එකඟ වූ අනුපාතවලට වෙනත් මුදල් ඒකකයක් හුවමාරු කිරීම සඳහා එකඟ වූ දිනක දී තවත් මුදල් වර්ගයකින් නිශ්චිත මුදල් ප්‍රමාණයක් ගෙවනු ලබයි.

**10.6** ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මඟින්, බැංකුව එකඟ වූ අනුපාතයකට, එකඟ වූ අනාගත දිනයක දී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

**10.7** බැංකුවේ සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, ව්‍යුත්පන්න ගිවිසුම් වෙත බැංකුවේ නිරාවරණයවීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.

**10.8** බැංකුව විදේශ සංචිත නැංවීමේ අරමුණ සඳහා බලපත්‍රලාභි වාණිජ බැංකු සමඟ කෙටි කාලීන ඇ.එ.ජ. ඩොලර්/රුපියල් විකුණුම් මිලදී ගැනීම් හුවමාරු ගිවිසුම්වලට හා ඉදිරි හුවමාරු ගිවිසුම්වලට ඇතුළත් විය. 2025 දෙසැම්බර් 31 දිනට, පැවති හුවමාරු ගිවිසුම හා ඉදිරි හුවමාරු ගිවිසුම්වල වටිනාකම ඇ. එ. ජ. ඩොලර් මිලියන 1,930.8 ක් විය [සටහන 53 (ආ)].

තවද, බැංකුව 2025 වර්ෂය තුළ විදේශීය ප්‍රතිපාර්ශවයන් සමඟ කෙටි කාලීන ඇ. එ. ජ. ඩොලර්/ජපන් යෙන් විකුණුම් මිලදී ගැනීම් ගිවිසුම් වලට එළඹුණු අතර 2025 දෙසැම්බර් 31 වනවිට, එම ගිවිසුම් නොතිබුණි [සටහන 53 (ආ)].

**10.9** විදේශ සංචිත ඉහළ නැංවීමේ අරමුණින් බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ දිගුකාලීන ඇ. එ. ජ. ඩොලර්/රුපියල් විකුණුම් - මිලදී ගැනීම් හුවමාරු පහසුකම් වලට එළඹෙන ලදි. 2025 දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ බැංකුවේ එවැනි දිගුකාලීන හුවමාරු පහසුකම් සඳහා ගෙවිය යුතු මුදල් පහත පරිදි වේ.

| බැංකුව | ගිවිසුම්ගත දිනය | ගෙවිය යුතු මුදල ඇ. එ. ජ. ඩොලර් (මිලියන) | අවසාන වාරිකය කල්පිරෙන දිනය | කාලසීමාව/කොන්දේසි |
|---|---|---|---|---|
| ලංකා බැංකුව | 2021 ජුනි 29 | 39.78 | 2027 දෙසැම්බර් 15 | • අවුරුදු 6ක් සඳහා ශූන්‍ය පිරිවැය ලෙස<br>• ආසන්න වශයෙන් ඇ.එ.ජ. මිලියන 10ක් සෑම මාස 6කදීම පියවෙන පරිදි අදියර 5කදී පියවීම කළ යුතුය. |
| මහජන බැංකුව | 2021 සැප්තැම්බර් 30 | 39.78 | 2027 දෙසැම්බර් 15 | |
| DFCC බැංකුව | 2021 නොවැම්බර් 15 | 68.75 | 2028 අගෝස්තු 15 | • අවුරුදු 7ක් සඳහා ශූන්‍ය පිරිවැය ලෙස<br>• ඇ.එ.ජ. ඩොලර් මි. 6.25ක් සෑම මාස 3කට වරක්ම පියවෙන පරිදි අදියර 20කදී පියවීම කළ යුතුය. |
| කොමර්ෂල් බැංකුව | 2021 නොවැම්බර් 17 | 35.00 | 2026 නොවැම්බර් 23 | • වසර 05ක කාලසීමාවක් සහිත මෙම ගිවිසුම පළමු මාස 18 සඳහා ශූන්‍ය පිරිවැය යටතේත්, ඉතිරි කාලසීමාව සඳහා ඇ.එ.ජ. ඩොලර් 01කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගින් අර්ධ වාර්ෂිකවත් පියවිය යුතුය. |
| ජාතික සංවර්ධන බැංකුව (NDB) | 2022 මාර්තු 18 | 21.00 | 2029 මාර්තු 19 | • සම්පූර්ණ කාලසීමාව අවුරුදු 07කි. ඉන් පළමු මාස 18 තුළදී ඇ.එ.ජ. ඩොලර් 1කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගිනුත් ඉතිරි කාලසීමාව සඳහා ඇ.එ.ජ. ඩොලර් 1කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගින් අර්ධ වාර්ෂිකවත් පියවිය යුතුය.<br>• ඇ.එ.ජ. ඩොලර් මිලියන 3ක් අර්ධ වාර්ෂිකව පියවන පරිදි අදියර 12ක් යටතේ පියවිය යුතුය. |

## 11 ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|---|
| **ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කළ** | | | |
| ජා.මූ.අ. පංගුව | 11.1 | **245,722,776** | 221,291,888 |
| විශේෂ ගැනුම් හිමිකමේ දැරීම | 11.2 | **325,751** | 925,452 |
| | | **246,048,527** | 222,217,340 |
| **ක්‍රමක්ෂය පිරිවැය යටතේ මිනුම් කළ** | | | |
| ජා.මූ.අ. සමඟ තැන්පතු | 11.3 | **–** | 301,574 |
| කලින් ගෙවීම් - ජා.මූ.අ. ණය | | **314,811** | 357,164 |
| අඩුකළා - ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභ | 11.4 | **–** | (9) |
| | | **314,811** | 658,729 |
| | | **246,363,338** | 222,876,069 |

### 11.1 ජා.මූ.අ. පංගුව (IMF Quota)

ජා.මූ.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබාගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රාග්ධන දායකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික ප්‍රමාණය මත පදනම් කර ගනිමින් තීරණය කරනු ලබයි. ජා.මූ. අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල් වශයෙන් පිළිගත් විදේශ මුදලකින් හෝ විශේෂ ගැනුම් හිමිකම මඟින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශීය මුදලින්ද ගෙවිය යුතුය. ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ.

ජා.මූ අරමුදල, පොදු පංගු සමාලෝචන ගිවිසුම මත පදනම්ව, 2016 ජනවාරි මස දී 189ක් වූ ජා.මූ.අ සාමාජිකයන්ගේ පංගුව වැඩි කිරීමට තීරණය කරන ලදි. (වර්තමානයේ ජා.මූ.අ. සාමාජික රටවල් ගණන 191 කි.) එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ජා.මූ.අ. පංගුව වි.ගැ.හි. මිලියන 413.40 ක් වූ පෙර පංගු ප්‍රමාණයේ සිට 2016 පෙබරවාරි 17 වන දිනට වි.ගැ.හි. මිලියන 578.80 දක්වා වර්ධනය විය.

ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 24 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මඟින් ජා.මූ.අ. සමඟ රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර, පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

### 11.2 විශේෂ ගැනුම් හිමිකම් දැරීම

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම යනු ජා.මූ.අ. සාමාජිකයන් හට නිදහස්ව භාවිතා කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන්ට එම මුදල් සඳහා අනෙකුත් සංචිත මුදල් හුවමාරු කරගත හැකිවීමය. වි.ගැ.හි සංචිත වත්කමක් ලෙස සලකනුයේ ජා.මූ.අ. සාමාජිකයින් වි.ගැ.හි දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාළ විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම තුළිණි. අබාධව භාවිතා කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.හි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මඟින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මඟින් ය. අදාළ වාර්තාකරණ දිනයන්හී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දක්වේ.

විශේෂ ගැණුම් හිමිකම් දැරීමේ ලක්ෂණ සතුව මුදල් වලට සමාන ලක්ෂණ පවතී. එමනිසා, ජා.මූ.වා.ප්‍ර. 9 යටතේ, මෙය ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට පවතින අගයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සාධාරණ අගය ගණනය කිරීමට කල්පිරීමේ කාලයක් නොමැති බැවින්, සාධාරණ අගය ක්‍රමක්ෂය පිරිවැය අගයට සමාන වේ.

### 11.3 ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF – HIPC) භාර තැන්පතුව

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF–HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21වන දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත – Administrated) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුතු විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමක් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මගපෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේදී ශ්‍රී ලංකාවට අනුව SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙන්ය. මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදනය කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය. යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව 2018 වසර දක්වා බල පැවැත්වෙන පොලී රහිත තැන්පතුවක් වශයෙනි. පසුව මෙය 2024 දක්වා දීර්ඝ කරන ලදී. 2025 දී ශ්‍රී ලංකා රජය විසින් මෙම තැන්පතුව, ප්‍රදාන ගිණුමට මාරු කිරීමට අවසර දීමෙන් පසු මෙය වත්කමෙන් ඉවත් කරන ලදී.

### 11.4 ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2025<br>රු. '000 | 2024<br>රු. '000 |
|---|---|---|
| **අදියර 1** | | |
| ජනවාරි 1 දිනට ශේෂය | **9** | 7 |
| වර්ෂය තුළ දී අයකිරීම්/(ආපසු හැරවුම්) | **(9)** | 2 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **–** | 9 |

## 12 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 අංක 16 දරණ ශ්‍රී.ලං.ම. බැංකු පනතේ 86 (4) වගන්තිය යටතේ ද්විතීක වෙළෙඳපොළෙන් හා 86 (5) වගන්තිය යටතේ ප්‍රාථමික වෙළෙඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම සිදුකරයි.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2025<br>රු. '000 | 2024<br>රු. '000 |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | **1,834,889,192** | 1,748,873,060 |
| | **1,834,889,192** | 1,748,873,060 |

2025 වසර තුළ දී මුහුණත වටිනාකම රුපියල් මිලියන 6,700ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර කල් පිරුණි.

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ආයෝජන, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) යටතේ සඳහන් අපේක්ෂිත ණය අලාභ (ECL) ගණනය කිරීම්වලට යටත් වේ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 වසර සඳහා වන ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් කළඹ සඳහා අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තුවක් සඳහා ඇගයීමක් සිදු කළ අතර, එහි දී ලැබුණු අපේක්ෂිත ණය අලාභ අගය වත්කම් පිරිවැය සමඟ සැසඳීමේ දී මූල්‍ය වාර්තාකරණය කිරීමට තරම් වැදගත් නොවූ (Deemed Immaterial) බැවින් අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු වෙනස් වී ඇද්ද යන්න තක්සේරු කිරීම සඳහා බැංකුව තම විනිශ්චයන් සහ උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරනු ඇත.

## 13 ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | **1,107,000** | 26,189,000 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් මත ලැබිය යුතු පොලී | **251** | 5,922 |
| | **1,107,251** | 26,194,922 |

## 14 මූල්‍ය සහ අනිකුත් ආයතනවල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 114 (2) (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙම වගන්තිය යටතේ, පාලක මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකු අතර ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට සහ දරා ගැනීමට බැංකුව වෙත බලතල පවරා ඇත.

### 14.1 ආයෝජන තත්ත්වය

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | 2025 කොටස් ගණන | 2025 මිලදී ගැනීමේ පිරිවැය රු. '000 | 2024 කොටස් ගණන | 2024 මිලදී ගැනීමේ පිරිවැය රු. '000 |
|---|---|---|---|---|---|
| සීමාසහිත ලංකා පේ (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **2,986,824** | **35,989** | 2,986,824 | 35,989 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **500,000** | **5,000** | 500,000 | 5,000 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | **48,244** | **5,845** | 48,244 | 5,845 |
| | | | **46,834** | | 46,834 |

## 15 බැංකු සඳහා දෙන ලද ණය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|---|
| බැංකු සඳහා දෙන ලද ණය | 15.1 | **5,561,004** | 9,704,369 |
| අඩුකළා - බැංකු සඳහා දෙන ලද ණය මත අපේක්ෂිත ණය අලාභ | 15.2 | **(142,514)** | (142,939) |
| | | **5,418,490** | 9,561,430 |

### 15.1 බැංකු සඳහා දෙන ලද ණය

මේවා 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ඵලදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ. කෙසේවෙතත්, 2023 අංක 16 දරණ නව ශ්‍රී ලංකා මහ බැංකු පනත පැනවීමත් සමඟ, ඉතුරුම් විධිවිධාන එනම් නව පනතේ 134 වන වගන්තිය යටතේ මෙම ණය පාලනය කරනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2025<br>රු. '000 | 2024<br>රු. '000 |
|---|---|---|
| **මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය (MLTC ණය)** | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | 11,772 | 13,906 |
| **සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම** | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | – | 129 |
| **සෞභාග්‍යා ණය පහසුකම** | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | 4,797,376 | 8,302,336 |
| - අනෙකුත් | 340,644 | 813,371 |
| **ශ්‍රී.ලං.ම. බැංකුවේ ණය ඇපකර පහසුකම යටතේ ලබාදුන් ණය** | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | 130,478 | 120,456 |
| - අනෙකුත් | 9,090 | 9,091 |
| **දේශීය කෘෂිකර්මාන්තය නඟාසිටුවීමේ ණය යෝජනා ක්‍රමය (DAD-PP නියමු ව්‍යාපෘතිය)** | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | 222,769 | 364,714 |
| - අනෙකුත් | 48,875 | 80,366 |
| | 5,561,004 | 9,704,369 |

සෞභාග්‍යා ණය පහසුකම සහ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම යනු කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආපදාවන්ගෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්ථාපිත කරන ලද ණය යෝජනා ක්‍රම වන අතර, සැමට ප්‍රතිලාභ බෙදී යන කෘෂිකාර්මික සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා පරිමාණ ගොවි ප්‍රජාව වෙත දැරිය හැකි මූල්‍ය පහසුකම් ලබාදීම ඇතුළුව වඩාත් හොඳ වෙළෙඳපොළ අවස්ථා උදාකිරීම හා තාක්ෂණික සහාය ලබා දී සඳහා දේශීය කෘෂිකර්මාන්තය නඟාසිටුවීමේ ණය යෝජනා ක්‍රමය DAD-PP නියමු ව්‍යාපෘතිය ලෙස හඳුන්වා දී ඇත. දැනට ශ්‍රී ලංකා මහ බැංකු පනත විසින් පනවා ඇති ප්‍රතිමූල්‍යකරණ සීමාවන් හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව ණය ලබා නොදෙන අතර, සියලුම ණය පහසුකම් අයකර ගැනීමේ අදියර පවතී.

### 15.2 බැංකුවලට ලබා දුන් ණය මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2025 | | | | 2024 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අදියර 1<br>රු.'000 | අදියර 2<br>රු.'000 | අදියර 3<br>රු.'000 | එකතුව<br>රු.'000 | අදියර 1<br>රු.'000 | අදියර 2<br>රු.'000 | අදියර 3<br>රු.'000 | එකතුව<br>රු.'000 |
| ජනවාරි 1 දිනට ශේෂය | 7,220 | 6,173 | 129,546 | 142,939 | 14,696 | 10,457 | 110,318 | 135,471 |
| වර්ෂය තුළ දී අයකිරීම්/(ආපසු හැරවුම්) | (5,260) | (5,188) | 10,023 | (425) | (7,476) | (4,284) | 19,228 | 7,468 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,960 | 985 | 139,569 | 142,514 | 7,220 | 6,173 | 129,546 | 142,939 |

## 16 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

සියම සුදුසුකම්ලත් සේවකයින් ආවරණය වන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හතක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පැරණි) යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. 1998 ජනවාරි 01 දිනට පසු බැංකු සේවයට එක්වී වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කල සේවකයන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය දායක මුදල් නොගෙවන විශ්‍රාමවැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහිදී ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කාන්තා සේවිකාවන් සඳහා වූ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය. එහිදී 1998 ජනවාරි 01 දිනට පසුව එකතු වූ බැංකුවේ සේවකයින් සඳහා නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය විවෘතව පවතී. වැන්දඹු සහ අනත්දරු (පැරණි) සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු (පැරණි) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා 1994 අගෝස්තු 01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් දායක වන අතර, 1994 අගෝස්තු 01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් දායක වේ. තවද නව වැන්දඹු අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අයත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5.5% කින් දායක වේ.

බැංකුවේ අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් සහ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ මාසික විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා, ආයුගණක අගය භාවිතා කරමින් ගණනය කළ බැරකමට සමාන ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉදිරියට ගෙනයනු ලැබේ.

බැංකුවට පශ්චාත්-සේවක වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ඇති අතර, ඒ යටතේ විශ්‍රාමලත් සේවකයන්ට තමා හා තම කලත්‍රයන්, දෙමව්පියන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් විසින් දරන ලද ඇතැම් වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය ලබා දේ.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, නව වැන්දඹු සහ අනත්දරු හා වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවල වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් හා ප්‍රවර්ථන සේවා පිරිවැය නැවත තක්සේරු කිරීම සඳහා ස්වාධීන ආයුගණක, කේ. ඒ. පණ්ඩිත් උපදේශකයන් හා ආයුගණකයන්ගේ (මුම්බායි) සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වෙන වශයෙන් පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ වෙතත්, පාරිතෝෂික යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය බැංකුවේ ගිණුම් පොත්වලින් වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවද, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලබන අතර, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර, බෙදාහැරීමක් නොමැතිව නැවත ආයෝජනය කරනු ලැබේ.

මුළු සැලසුම් වත්කම්/ආයෝජනයේ සාධාරණ අගය වන රු. මි. 77,684.50 (2024 - රු.මි. 79,783.16) මුළු ප්‍රතිලාභ බැරකමෙහි වර්තමාන අගය වන රු.මි. 56,553.68 (2024 - රු.මි. 68,106.70), ඉක්මවා යන අතර, වාර්තාකරණ කාලය අවසානයේදී රු. මි. 21,130.87 (2024 - හිඟය - රු.මි. 11,676.47) ක අතිරික්තයක් පෙන්නුම් කරයි.

2025 දෙසැම්බර් 31 දිනට

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම | 34,274,521 | 4,157,356 | 7,873,508 | 935,322 | 1,309,971 | 701,459 | 7,301,539 | 56,553,676 |
| සැලසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ වටිනාකම | (43,737,487) | (12,262,790) | (9,791,258) | (4,122,125) | (2,846,005) | (435,536) | (4,489,349) | (77,684,550) |
| ශුද්ධ ප්‍රතිලාභ බැරකම්/(වත්කම්) | (9,462,966) | (8,105,434) | (1,917,750) | (3,186,803) | (1,536,034) | 265,923 | 2,812,190 | (21,130,874) |

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විශ්‍රාම සේවක හා අනෙකුත් සේවක පශ්චාත් ප්‍රතිලාභ සැලසුම් යටතේ දක්වා ඇති බැරකම් ශේෂය පහත සඳහන් කරුණු හේතුවෙන් ස්වාධීන ආයුගණක විසින් දෙනු ලැබූ ශුද්ධ බැරකම් ශේෂයෙන් වෙනස් වේ.

(අ) වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ශුද්ධ වත්කම් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශවල ගිණුම් ගතකොට නැත්තේ එකී අරමුදල්වල යම් ඉතිරි ශේෂයක් වෙතොත් එය ලබා ගැනීමට ඇති සම්භාවිතාව ඉතා අඩු බැවිනි.

(ආ) පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා, බැංකුව අදාළ වත්කම් වෙනම අරමුදලක් (අභ්‍යන්තරව පවත්වාගන්නා) තුළ තබා නොගන්නා බැවින්, ආයුගණකයාට අනුව මූල්‍ය ප්‍රකාශන නියෝජනය කරන්නේ ශුද්ධ බැරකම් ප්‍රමාණය නොව දළ බැරකම් ප්‍රමාණයයි.

| | 2025<br>රු. '000 | 2024<br>රු. '000 |
|---|---|---|
| **විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වල වත්කම් තත්ත්වය** | | |
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **9,462,966** | 1,335,417 |
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | **8,105,434** | 7,727,244 |
| | **17,568,400** | 9,062,661 |
| **විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වල වගකීම් තත්ත්වය** | | |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (දළ අගය) | **701,459** | 596,971 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (දළ අගය) | **7,301,539** | 6,847,798 |
| | **8,002,998** | 7,444,769 |

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| 2025 ජනවාරි 1 දිනට | **(1,335,417)** | **(7,727,244)** | **(1,191,328)** | **(3,306,888)** | **(1,148,656)** | **307,478** | **2,725,588** | **(11,676,467)** |
| ශුද්ධ ප්‍රතිලාභ වියදම්/(ආදායම්) | **(154,908)** | **(786,619)** | **(176,000)** | **(395,893)** | **(329,104)** | **74,618** | **447,711** | **(1,320,195)** |
| අනෙකුත් විස්තීරණ ආදායම්වල හඳුනාගත් අගය | **(7,779,489)** | **1,258,913** | **(550,422)** | **515,978** | **(58,274)** | **42,062** | **652,530** | **(5,918,702)** |
| දායක ගෙවීම් | **(193,152)** | **(850,484)** | **–** | **–** | **–** | **(158,235)** | **(1,013,639)** | **(2,215,510)** |
| 2025 දෙසැම්බර් 31 දිනට | **(9,462,966)** | **(8,105,434)** | **(1,917,750)** | **(3,186,803)** | **(1,536,034)** | **265,923** | **2,812,190** | **(21,130,874)** |

| පුරෝකථනය කළ ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන වටිනාකම්වල වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| 2025 ජනවාරි 1 දිනට | 44,210,086 | 3,946,467 | 9,936,350 | 1,016,579 | 1,552,444 | 596,971 | 6,847,798 | 68,106,695 |
| පොලී පිරිවැය | 5,128,370 | 457,790 | 1,152,617 | 117,923 | 180,084 | 69,249 | 794,345 | 7,900,378 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | – | 109,741 | – | – | – | 38,950 | 150,865 | 299,556 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (4,047,163) | (30,132) | (975,752) | (64,384) | (4,020) | (64,467) | (587,474) | (5,773,392) |
| මූල්‍ය උපකරණවල වෙනස හේතුවෙන් - බැඳීම් මත ආයුගණක (ලාභ)/අලාභ | (9,130,754) | (565,641) | (2,310,464) | (349,340) | (455,928) | 51,582 | 243,736 | (12,516,809) |
| බැඳීම් මත ආයුගණන ලාභ | (1,886,018) | 239,131 | 70,757 | 214,544 | 37,391 | 9,174 | (147,731) | (1,462,752) |
| 2025 දෙසැම්බර් 31 දිනට | 34,274,521 | 4,157,356 | 7,873,508 | 935,322 | 1,309,971 | 701,459 | 7,301,539 | 56,553,676 |

| සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| 2025 ජනවාරි 1 දිනට | 45,545,503 | 11,673,711 | 11,127,678 | 4,323,467 | 2,701,100 | 289,493 | 4,122,210 | 79,783,162 |
| පොලී ආදායම | 5,283,278 | 1,354,150 | 1,290,811 | 501,522 | 313,328 | 33,581 | 478,176 | 9,254,846 |
| සේවායෝජක දායකත්වයන් | 193,152 | 850,484 | – | – | – | 158,235 | 1,013,639 | 2,215,510 |
| සේවාදායක දායකත්වයන් | – | – | 37,806 | 12,294 | 195,860 | – | 19,323 | 265,283 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (4,047,163) | (30,132) | (975,752) | (64,384) | (4,020) | (64,467) | (587,474) | (5,773,392) |
| සැලසුම් වත්කම්/ ආයෝජන මත ප්‍රතිලාභ, පොලී ආදායම රහිත | (3,237,283) | (1,585,423) | (1,689,285) | (650,774) | (360,263) | 18,694 | (556,525) | (8,060,859) |
| 2025 දෙසැම්බර් 31 දිනට | 43,737,487 | 12,262,790 | 9,791,258 | 4,122,125 | 2,846,005 | 435,536 | 4,489,349 | 77,684,550 |

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

| 2025 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් වියදම්/(ආදායම්) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| **වර්ෂය සඳහා බැඳීම් මත ආයුගණනික (ලාභ)/අලාභ** | | | | | | | | |
| මූල්‍ය උපකල්පන වෙනස මත | (9,130,754) | (565,641) | (2,310,464) | (349,340) | (455,928) | 51,582 | 243,736 | (12,516,809) |
| පළපුරුද්ද මත | (1,886,018) | 239,131 | 70,757 | 214,544 | 37,391 | 9,174 | (147,731) | (1,462,752) |
| සැලසුම් වත්කම්/ ආයෝජන මත ප්‍රතිලාභ, පොලී ආදායම රහිත | 3,237,283 | 1,585,423 | 1,689,285 | 650,774 | 360,263 | (18,694) | 556,525 | 8,060,859 |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ (ආදායම)/වියදම | (7,779,489) | 1,258,913 | (550,422) | 515,978 | (58,274) | 42,062 | 652,530 | (5,918,702) |

| 2025 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රතිලාභ වියදම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රතිලාභ බැඳීම් මත පොලී පිරිවැය | 5,128,370 | 457,790 | 1,152,617 | 117,923 | 180,084 | 69,249 | 794,345 | 7,900,378 |
| සැලසුම් වත්කම්/ ආයෝජන මත පොලී ආදායම | (5,283,278) | (1,354,150) | (1,290,811) | (501,522) | (313,328) | (33,581) | (478,176) | (9,254,846) |
| ප්‍රවර්තන සේවා පිරිවැය | – | 109,741 | – | – | – | 38,950 | 150,865 | 299,556 |
| සේවාදායක දායකත්වයන් | – | – | (37,806) | (12,294) | (195,860) | – | (19,323) | (265,283) |
| ප්‍රතිලාභ වියදම/(ආදායම) | (154,908) | (786,619) | (176,000) | (395,893) | (329,104) | 74,618 | 447,711 | (1,320,195) |

| සැලසුම් වත්කම්/ ආයෝජනවල සංයුතිය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 42,235,794 | 11,379,503 | 9,597,010 | 3,944,348 | 2,648,967 | 432,006 | 4,161,583 | 74,399,211 |
| ප්‍රතිවිකුණුම්වල ආයෝජන | 620,487 | 165,251 | 55,510 | 19,213 | 70,664 | – | 111,452 | 1,042,577 |
| ණයකරවල ආයෝජන | 726,217 | 436,072 | 46,235 | 104,249 | 62,025 | 3,529 | 216,314 | 1,594,641 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | 138,517 | 278,921 | 86,454 | 51,837 | 63,626 | – | – | 619,355 |
| ජංගම ගිණුම්වල ඉතිරි ශේෂය | 16,472 | 3,043 | 6,049 | 2,478 | 724 | – | – | 28,766 |
| 2025 දෙසැම්බර් 31 දිනට සැලසුම් වත්කම්/ආයෝජනවල එකතුව | 43,737,487 | 12,262,790 | 9,791,258 | 4,122,125 | 2,846,006 | 435,535 | 4,489,349 | 77,684,550 |

## 2025 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභ ගෙවීම් සඳහා කල්පිරීම් විශ්ලේෂණය

| වාර්තා කළ දින සිට ඉදිරි වර්ෂ වල ගෙවීමට සැලසුම් කළ ප්‍රතිලාභ ගෙවීම් | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| ඊළඟ වසර 1 | 4,171,935 | 27,242 | 984,949 | 74,200 | 1,705 | 80,826 | 515,054 | 5,855,911 |
| ඊළඟ වසර 2 | 4,106,235 | 35,108 | 960,752 | 80,384 | 4,691 | 81,090 | 533,660 | 5,801,920 |
| ඊළඟ වසර 3 | 4,065,673 | 52,094 | 935,487 | 85,813 | 8,206 | 79,204 | 559,556 | 5,786,033 |
| ඊළඟ වසර 4 | 4,007,365 | 67,582 | 909,240 | 90,508 | 12,316 | 77,341 | 592,257 | 5,756,609 |
| ඊළඟ වසර 5 | 3,937,292 | 77,829 | 882,154 | 94,496 | 17,068 | 82,049 | 593,887 | 5,684,775 |
| වසර 6 සිට 10 දක්වා එකතුව | 18,215,889 | 1,027,596 | 3,985,339 | 510,698 | 186,882 | 381,588 | 3,389,441 | 27,697,433 |

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

### 2024 දෙසැම්බර් 31 දිනට

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| 2024 ජනවාරි 1 දිනට | 21,003,126 | (4,507,115) | 4,845,307 | (1,927,607) | (814,840) | 323,203 | 884,701 | 19,806,775 |
| ශුද්ධ ප්‍රතිලාභ වියදම්/(ආදායම්) | 2,646,394 | (472,949) | 567,024 | (256,540) | (293,224) | 82,354 | 166,676 | 2,439,735 |
| අනෙකුත් විස්තීරණ ආදායම්වල හඳුනාගත් අගය | (16,862,608) | (1,936,291) | (4,874,262) | (1,122,741) | (40,592) | (98,079) | 1,674,211 | (23,260,362) |
| දායක ගෙවීම් | (8,122,329) | (810,889) | (1,729,397) | – | – | – | – | (10,662,615) |
| 2024 දෙසැම්බර් 31 දිනට | (1,335,417) | (7,727,244) | (1,191,328) | (3,306,888) | (1,148,656) | 307,478 | 2,725,588 | (11,676,467) |

| පුරෝකථනය කළ ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන වටිනාකම්වල වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව<br>රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය<br>රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| 2024 ජනවාරි 1 දිනට | 52,618,936 | 2,964,009 | 12,463,640 | 1,310,948 | 966,603 | 562,315 | 4,491,378 | 75,377,829 |
| පොලී පිරිවැය | 6,629,986 | 373,465 | 1,570,419 | 165,179 | 121,792 | 70,852 | 565,914 | 9,497,607 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | – | 94,948 | – | – | – | 41,630 | 74,902 | 211,480 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (4,297,908) | (39,479) | (964,635) | (65,183) | (2,514) | (61,643) | (601,268) | (6,032,630) |
| මූල්‍ය උපකල්පනවල වෙනස හේතුවෙන් - බැඳීම් මත ආයුගතන (ලාභ)/අලාභ | (8,435,462) | 562,982 | (1,803,234) | (221,162) | 509,017 | (57,705) | 2,330,784 | (7,114,780) |
| බැඳීම් මත ආයුගණන ලාභ | (2,305,466) | (9,458) | (1,329,840) | (173,203) | (42,454) | 41,522 | (13,912) | (3,832,811) |
| 2024 දෙසැම්බර් 31 දිනට | 44,210,086 | 3,946,467 | 9,936,350 | 1,016,579 | 1,552,444 | 596,971 | 6,847,798 | 68,106,695 |

| සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| 2024 ජනවාරි 1 දිනට | 31,615,810 | 7,471,124 | 7,618,333 | 3,238,555 | 1,781,443 | 239,112 | 3,606,677 | 55,571,054 |
| පොලී ආදායම | 3,983,592 | 941,362 | 959,910 | 408,058 | 224,462 | 30,128 | 454,441 | 7,001,953 |
| සේවායෝජක දායකත්වයන් | 8,122,329 | 810,889 | 1,729,397 | – | – | – | – | 10,662,615 |
| සේවාදායක දායකත්වයන් | – | – | 43,485 | 13,661 | 190,554 | – | 19,699 | 267,399 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (4,297,908) | (39,479) | (964,635) | (65,183) | (2,514) | (61,643) | (601,268) | (6,032,630) |
| සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොලී ආදායම රහිත | 6,121,680 | 2,489,815 | 1,741,188 | 728,376 | 507,155 | 81,896 | 642,661 | 12,312,771 |
| 2024 දෙසැම්බර් 31 දිනට | 45,545,503 | 11,673,711 | 11,127,678 | 4,323,467 | 2,701,100 | 289,493 | 4,122,210 | 79,783,162 |

| 2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායම්හි හඳුනාගත් වියදම්/(ආදායම්) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| **වර්ෂය සඳහා බැඳීම් මත ආයුගණන (ලාභ)/අලාභ** | | | | | | | | |
| මූල්‍ය උපකල්පන වෙනස මත | (8,435,462) | 562,982 | (1,803,234) | (221,162) | 509,017 | (57,705) | 2,330,784 | (7,114,780) |
| පළපුරුද්ද මත | (2,305,466) | (9,458) | (1,329,840) | (173,203) | (42,454) | 41,522 | (13,912) | (3,832,811) |
| සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොලී ආදායම රහිත | (6,121,680) | (2,489,815) | (1,741,188) | (728,376) | (507,155) | (81,896) | (642,661) | (12,312,771) |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ (ආදායම)/වියදම | (16,862,608) | (1,936,291) | (4,874,262) | (1,122,741) | (40,592) | (98,079) | 1,674,211 | (23,260,362) |

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

| 2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රතිලාභ වියදම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ප්‍රතිලාභ බැඳීම් මත පොලී පිරිවැය | 6,629,986 | 373,465 | 1,570,419 | 165,179 | 121,792 | 70,852 | 565,914 | 9,497,607 |
| සැලසුම් වත්කම්/ආයෝජන මත පොලී ආදායම | (3,983,592) | (941,362) | (959,910) | (408,058) | (224,462) | (30,128) | (454,441) | (7,001,953) |
| ප්‍රවර්තන සේවා පිරිවැය | – | 94,948 | – | – | – | 41,630 | 74,902 | 211,480 |
| සේවාදායක දායකත්වයන් | – | – | (43,485) | (13,661) | (190,554) | – | (19,699) | (267,399) |
| ප්‍රතිලාභ වියදම/(ආදායම) | 2,646,394 | (472,949) | 567,024 | (256,540) | (293,224) | 82,354 | 166,676 | 2,439,735 |

| සැලසුම් වත්කම්/ ආයෝජනවල සංයුතිය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 44,650,902 | 11,485,484 | 11,010,285 | 4,277,287 | 2,663,919 | 286,048 | 3,933,210 | 78,307,135 |
| ප්‍රතිවිකුණුම්වල ආයෝජන | 333,050 | 70,146 | 68,195 | 12,999 | 15,756 | – | 107,601 | 607,747 |
| ණයකරවල ආයෝජන | 559,311 | 114,784 | 46,234 | 30,630 | 17,614 | 3,445 | 81,399 | 853,417 |
| ජංගම ගිණුම්වල ඉතිරි ශේෂය | 2,240 | 3,297 | 2,964 | 2,551 | 3,811 | – | – | 14,863 |
| 2024 දෙසැම්බර් 31 දිනට සැලසුම් වත්කම්/ආයෝජනවල එකතුව | 45,545,503 | 11,673,711 | 11,127,678 | 4,323,467 | 2,701,100 | 289,493 | 4,122,210 | 79,783,162 |

## 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභ ගෙවීම් සඳහා කල්පිරීම් විශ්ලේෂණය

| වාර්තා කළ දින සිට ඉදිරි වර්ෂ වල ගෙවීමට සැලසුම් කළ ප්‍රතිලාභ ගෙවීම් | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව රු. '000 | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය රු. '000 | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| ඊළඟ වසර 1 | 4,171,542 | 19,330 | 933,923 | 37,316 | 1,619 | 75,469 | 497,670 | 5,736,869 |
| ඊළඟ වසර 2 | 4,330,368 | 20,528 | 959,356 | 47,434 | 4,660 | 74,838 | 519,875 | 5,957,059 |
| ඊළඟ වසර 3 | 4,502,455 | 37,076 | 983,774 | 57,807 | 8,375 | 73,011 | 550,972 | 6,213,470 |
| ඊළඟ වසර 4 | 4,665,530 | 55,197 | 1,007,086 | 68,350 | 12,867 | 70,861 | 582,472 | 6,462,363 |
| ඊළඟ වසර 5 | 4,817,062 | 72,692 | 1,029,199 | 79,028 | 18,244 | 71,324 | 599,022 | 6,686,571 |
| වසර 6 සිට 10 දක්වා එකතුව | 25,755,120 | 894,305 | 5,430,441 | 557,586 | 212,471 | 346,259 | 3,485,189 | 36,681,371 |

සියලුම සේවක ප්‍රතිලාභ බැඳීම් නිශ්චය කිරීමේ දී යොදාගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් පහත දැක්වේ.

| | 2025 | 2024 |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | 10.20% | 11.60% |
| වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය | 10.20% | 11.60% |
| වැටුප් වැඩිවීම් අනුපාතය - පාරිතෝෂික හා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 2028 වසර දක්වා 0.00%<br>ඉන්පසුව 5.00% | 2028 වසර දක්වා 0.00%<br>ඉන්පසුව 5.00% |
| | 2025 | 2024 | 2025 | 2024 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | **227,700,087** | 180,946,953 | **227,700,087** | 180,946,953 |
| රජය හා රජයේ ආයතන විසින් තැන්පතු | **7,905,167** | 1,534,996 | **7,905,167** | 1,534,996 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවිකල සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම | **176,322,112** | 194,337,033 | **176,322,112** | 194,337,033 |
| සංසරණයේ ඇති මුදල | **1,568,938,866** | 1,358,722,883 | **1,568,938,866** | 1,358,722,883 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **34,521,441** | 30,171,551 | **34,521,441** | 30,171,551 |

ජා. මූ. අ. හා සම්බන්ධ ශේෂ, බැංකු වෙත ලබා දී ඇති ණය හා වෙනත් වත්කම් යටතේ ඇතුලත් කර ඇති නාමකරණය කරන ලද අරමුදල් වලින් කරන ලද ආයෝජනවල සාධාරණ වටිනාකම, ඒවායේ ධාරණ වටිනාකමෙන් වෙනස් වේ. ඒ අනුව ජා. මූ. අ. හා සම්බන්ධ ශේෂ සහ අනෙකුත් වත්කම්වල සාධාරණ වටිනාකම, ඒවායේ ධාරණ වටිනාකමෙන් වෙනස් වේ.

විදේශීය මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති මුදල් හා මුදල් සමානයන්, දේශීය මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත්, විදේශීය මූල්‍ය වගකීම් යටතේ දක්වා ඇති බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන, ජා. මූ. අ. වගකීම් සහ අනෙකුත් වගකීම් සහ දේශීය මූල්‍ය වගකීම් යටතේ දක්වා ඇති බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පතු, රජය හා රජයේ ආයතනවල තැන්පතු, ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් සංසරණයේ පවත්නා මුදල් හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි සාධාරණ වටිනාකම හා ඒවායෙහි ධාරණ වටිනාකම්වලින් වෙනස් නොවේ.

## 50 සංසන්දනාත්මක තොරතුරු

පහත සඳහන් සංසන්දනාත්මක තොරතුරු වර්තමාන වසරේ ඉදිරිපත් කිරීම සඳහා අනුකූලවීමට ප්‍රතිවර්ගීකරණය කර ඇත.

### 50.1 උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව) සහ මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය/(පාඩුව) ප්‍රතිවර්ගීකරණය

| ආදායම් ප්‍රකාශයට වෙනස්වීම් | පෙර වාර්තා කළ පරිදි<br>රු. '000 | ගැලපීම<br>රු. '000 | ප්‍රතිවර්ගීකරණය කළ පසු ශේෂය<br>රු. '000 |
|---|---|---|---|
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව) | 36,204,396 | (36,204,396) | – |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය/(පාඩුව) | 28,410,885 | (28,410,885) | – |
| විදේශ සංචිත ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ වාසිය/(පාඩුව) | – | 23,147,517 | 23,147,517 |
| වෙළඳපොළ මෙහෙයුම් කටයුතුවලින් ලැබූ වාසිය/(පාඩුව) | – | 41,467,764 | 41,467,764 |
| මුළු එකතුව | 64,615,281 | – | 64,615,281 |

කලින් වසරේදී වෙන වෙනම ඉදිරිපත් කළ උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වූ වාසිය/(පාඩුව) සහ මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ වාසිය/(පාඩුව), අදාළ ක්‍රියාකාරකම්වල ස්වභාවය වඩාත් හොඳින් පිළිබිඹු කිරීම සඳහා ප්‍රතිවර්ගීකරණය කර ඇත. ඒ අනුව, මෙම අගයන් මේ වසරේ දී විදේශ සංචිත ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ වාසිය/(පාඩුව) සහ වෙළඳපොළ මෙහෙයුම් කටයුතුවලින් ලැබූ වාසිය/(පාඩුව) යන ශීර්ෂයන් යටතේ ඉදිරිපත් කර ඇත.

## 51 සම්බන්ධිත පාර්ශව

### 51.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමඟ ගනුදෙනු

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගණුදෙනුවලට ඇතුළත් වේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම අයිතිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මඟින් පාලනය කෙරෙන ආයතන සම්බන්ධිත පාර්ශ්වයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී තනිව නොව සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන, රජය සහ රජය මඟින් පාලනය කෙරෙන ආයතන සමඟ බැංකුව විසින් එළැඹි ගණුදෙනු සහ විධිවිධානයන් හි විස්තර පහත පරිදි වේ.

## මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

| ගනුදෙනු වල ස්වභාවය | සටහන් | 2025 රු. '000 | 2024 රු. '000 |
|---|---|---|---|
| **ගනුදෙනු:** | | | |
| මිලදී ගන්නා ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | – | 1,125,844 |
| ප්‍රතිවිකිණීමේ/ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත්/විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ රජයේ සුරැකුම්පත් | | 10,287,612,870 | 11,280,112,844 |
| ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් ශ්‍රී ලං.ම.බැ. සහ රජයේ සුරැකුම්පත් මත පොලී ආදායම | | 161,764 | 4,164,552 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකිණූ ශ්‍රී.ලං.ම.බැ. සහ රජයේ සුරැකුම්පත් මත පොලී වියදම | | 3,092,355 | 2,551,106 |
| රජය වෙනුවෙන් ලද අරමුදල | | 788,800,158 | 853,928,592 |
| රජය වෙනුවෙන් දරන ලද විය පැහැදම් | | 792,081,752 | 1,062,078,470 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය | 51.1.3 | 4,041,470 | 2,947,555 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ, සේවා සහ බදු සඳහා ගෙවීම් | 51.1.4 | 6,868,444 | 11,136,712 |
| වර්ෂය තුළ දී දළ විදේශ විනිමය ගනුදෙනු | 51.1.6 | | |
| විකුණුම් | | 43,618,034 | 68,814,477 |
| මිලදී ගැනීම් | | 563,601,550 | 916,768,375 |
| ඇ.එ.ජ.ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | 1,187,848,850 | 4,086,139 |
| බාහිර නෛතික වියදම් | | 8,853 | 6,050 |
| වර්ෂය තුළදී අත්හල තැන්පතු වෙනුවෙන් ලද අරමුදල | | 771,266 | 476,420 |
| කුලී ආදායම් | | 223,023 | 188,745 |
| ලාභාංශ ආදායම් | | 197,535 | 129,728 |
| අනෙකුත් ගනුදෙනු | 51.1.9 | 387,567 | 466,495 |
| **ශේෂයන්:** | | | |
| ශ්‍රී ලං.ම.බැ. විසින් අයිතිකාරීත්වය දරන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 51.1.7 | 1,834,889,192 | 1,748,873,060 |
| කොවිඩ් -19 පුනරුද ණය පහසුකම යටතේ ලබාදුන් ණය | | 4,797,376 | 8,302,464 |
| DAD-PP ණය පහසුකම යටතේ ලබාදුන් ණය | | 222,769 | 364,714 |
| ශ්‍රී ල. ම. බැ. ණය සහතික යෝජනා ක්‍රමය යටතේ හඳුනාගත් ණය සහ MLTC ණය | | 142,250 | 134,362 |
| නිශ්චිත අරමුණු සඳහා දරන ලද රජයේ සුරැකුම්පත් | | 29,161,311 | 23,923,607 |
| බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් පද්ධතියේ (RTGS) ශේෂයන් | 26 | 1,700,322,145 | 132,888,982 |
| ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රො ගිණුමේ ශේෂය | | 165,798 | 36,714 |
| භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙතින් ලැබිය යුතු දෑ | | 4,397,939 | 19,033,179 |
| භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙත කළ යුතු ගෙවීම් | 25.2 | 162,515,866 | 29,660,536 |
| දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතන සමඟ ජංගම ගිණුම් ශේෂයන් | | 156,540 | 178,324 |
| අත්හල තැන්පතු වල ශේෂයන් | | 8,954,423 | 8,172,494 |
| අනෙකුත් ශේෂයන් | 51.1.9 | 57,808 | 57,571 |

51.1.1 ශ්‍රී ලංකා මහ බැංකු පනතේ IX කොටසේ 61 වන වගන්තිය යටතේ පැවරෙන බලය හා පාලක මණ්ඩලය මඟින් පැවරෙන බලය ප්‍රකාරව, ශ්‍රී.ලං.ම.බැ. විසින් බලපත්‍ර නිකුත් කළ බැංකුවල කටයුතු නියාමනය හා සුපරීක්ෂණය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු පනතේ IX කොටසේ 61 වන වගන්තිය යටතේ පැවරෙන බලය හා පාලක මණ්ඩලය මඟින් පැවරෙන බලය ප්‍රකාරව, ශ්‍රී.ලං.ම.බැ. විසින් බලපත්‍ර නිකුත් කළ බැංකු නොවන, මූල්‍ය සමාගම්වල නියාමනය සහ සුපරීක්ෂණ කාර්යයන් කරගෙන යනු ලබයි.

51.1.2 ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වැනි වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය ණය කළමණාකරණ ඒජන්සිය හෝ කාර්යාලය ක්‍රියාත්මක වන තෙක්, ආණ්ඩුව වෙනුවෙන් ආණ්ඩුවේ සුරැකුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් සහ දේශීය හා විදේශීය ණය සඳහා සේවා සැපයීම ද ඇතුළත් වන පරිදි රාජ්‍ය ණය කලමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකු නියෝජිතයා ලෙස කටයුතු කරනු ලබයි.

2024 දෙසැම්බර් මාසයේ දී රාජ්‍ය ණය කළමණාකරණ කාර්යාලය, 2024 අංක 33 දරණ රාජ්‍ය ණය කළමණාකරණ පනත යටතේ මූල්‍ය, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තුළ ස්ථාපිත කරන ලදි.

2025 දෙසැම්බර් මාසයේ දී පූර්ණ වශයෙන් ක්‍රියාවට නැංවූ රාජ්‍ය ණය කළමණාකරණ කාර්යාලය මීට පෙර ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ක්‍රියාත්මක වූ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද රාජ්‍ය ණය කළමණාකරණ කාර්යයන්හි සියලුම වගකීම් භාර ගන්නා ලදි. කෙසේවෙතත්, 2026 ජනවාරි 01 වෙනිදා සිට ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ රාජ්‍ය සුරැකුම්පත් රෙජිස්ට්‍රාර් ලෙස පත් කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව යටතේ, රාජ්‍ය ණය කළමණාකරණ පනතේ හා ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධි විධානයන්ට ද යටත්ව, පත්‍රිකා රහිත සුරැකුම්පත් පියවීම් පද්ධතිය හා මධ්‍යම තැන්පතු පද්ධතිය රාජ්‍ය සුරැකුම්පත් සඳහා ක්‍රියාවට නංවනු ලබයි.

51.1.3 ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 44 වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකාව තුළ මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව, බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව තුළ නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්) සමාගම විසින් කරගෙන යනු ලබන අතර, මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජය විසිනි.

51.1.4 බැංකුව සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ සුවිශේෂ බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමඟ ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

51.1.5 සටහන් අංක 56 හි පැහැදිලි කර ඇති පරිදි බැංකුව පොදුවේ භාරකරු ලෙස කටයුතු කිරීම මඟින් රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදුකරනු ලැබේ.

51.1.6 ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන අනුව, බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය, විදේශීය විනිමය වෙළඳපොළෙහි සංවර්ධනය හා බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශුද්ධ විවෘත විදේශ විනිමය තත්ත්වය නියාමනය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළඳපොළ සංවර්ධන නියාමනයේ දී, ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය දැඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි මෙම අංශ දෙකෙහි ම සිටිය යුතු බව සැළකේ. කෙසේවෙතත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් (IMF-EFF) වැඩසටහන යටතේ දක්වන ලද ශුද්ධ නිල ජාත්‍යන්තර විනිමය සංචිත (NIR) ඉලක්කය සපුරාලීම සඳහා විදේශ සංචිත එක්රැස් කිරීමේ අවශ්‍යතාව හේතුවෙන් බැංකුවේ මැදිහත්වීමේ උපායමාර්ගික අවධානය ප්‍රධානවම විදේශ විනිමය මිලදී ගැනීම කෙරෙහි යොමුවිය. 2025 වසර තුළ දී වටිනාකම් දිනය මත පදනම්ව බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් ඇ.ඩො.මි. 1,992.35 ක ශුද්ධ මිලදී ගැනීම් සිදුකර ඇත.

51.1.7 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 31 වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ප්‍රධාන වශයෙන් විවෘත වෙළඳපොළ මෙහෙයුම් තුළින් බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ ඍජු කාර්යයන් ඉටු කිරීම සහ එම පනතේ 32-34 වගන්ති ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයට හිමිකාරීත්වය ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2025 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් අංක 12,26 සහ 28 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොලිය 35 සටහනෙහි දැක්වේ.

51.1.8 රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුනි.

51.1.9 තනි වශයෙන් ගත්කල සුවිශේෂී නොවන, රජය, රජයේ දෙපාර්තමේන්තු සහ රජය මඟින් පාලනය වන ආයතන සමඟ බැංකුව විසින් සිදුකල ගනුදෙනුවල ශේෂයන්, අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් හි ඇතුලත් වේ.

## 51.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමඟ ගණුදෙනු

අධිපතිතුමා සහ නියෝජ්‍ය අධිපතිවරුන් ඇතුළත් පාලක මණ්ඩලය සහ සහකාර අධිපතිවරුන් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය බැංකුව සමඟ සිදුකරන ලද ගනුදෙනු පහත පරිදි වේ.

## 51.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය වෙත කළ ගෙවීම්

| | 2025<br>රු. '000 | 2024<br>රු. '000 |
|---|---|---|
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | **252,129** | 295,175 |

ඉහත ගෙවීම් තුළ, ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම්වලට යටත්ව සිදුකරන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ ඇතුළත් වේ.

## 51.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමඟ වූ වෙනත් ගණුදෙනු

| | 2025<br>රු. '000 | 2024<br>රු. '000 |
|---|---|---|
| කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන්ට දුන් ණය ශේෂය | **238,684** | 263,898 |
| වසර තුළ දී ප්‍රදානය කළ ණය | **227,510** | 124,331 |
| වසර තුළ දී අය කරගත් ණය | **269,162** | 238,654 |

සියලුම ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇති අතර, මෙම ණය සඳහා අදාළ වන වාර්ෂික පොලී අනුපාතයන් 2% සිට 7% දක්වා පරාසයන්හි වේ. සියලු ණය මාසිකව ගෙවිය යුතු වේ.

### 51.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග ගණුදෙනු

| | 2025 රු. '000 | 2025 රු. '000 |
|---|---|---|
| ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය | **79,791** | 295,175 |

සටහන් අංක 16 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම් සඳහා විවිධ මුදල් ප්‍රමාණවලින් දායක වූ අතර 2025 වසරේදී රු.මි. 1,645.66 ක් (2024 - රු.මි. 1,617.89) සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලදි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී, බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැළසුම් සඳහා බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂ ප්‍රමාණයන් 30.2 සටහනෙහි දක්වා ඇත.

## 52 අසම්භාව්‍ය බැරකම්

### 52.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්

බැංකුව රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිතයෙක් ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශවයන්ට ඇප සපයනු ලැබේ. 2025 දෙසැම්බර් 31 දිනට එවැනි ඇප කිසිවක් නොවීය.

### 52.2 ණය ඇපකර

බැංකුවෙහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්යයන් වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගී මූල්‍ය ආයතන මඟින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ණය මත සහභාගී මූල්‍ය ආයතන වෙත ණය ඇපවීම් නිකුත් කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය ඇපකර මුදල් පරිපාලනය සහ ලබාගත් ණය අරමුදල් පැහැරහැරීමකින් තොරව නිසි පරිදි භාවිතා කරන බවට සහතික කිරීම සඳහා පශ්චාත් ණය සුපරීක්ෂණයයි. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයන් සහභාගීත්ව මූල්‍ය ආයතනවලට සිදුවිය හැකි පාඩු සඳහා ආවරණයක් ලෙස ණය ඇපකර පහසුකම් සැලසීම, ප්‍ර.සං.දෙ. විසින් 2023 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකු පනත බලගැන්වෙනතෙක් අඛණ්ඩව සිදුකරන ලදි. මෙය ණය පැහැර හැරීමේ ප්‍රමාණය මත වන ඇපයක් නොවන අතර සහභාගත්ව මූල්‍ය ආයතන මඟින් ණය ලබාදුන් පාර්ශ්වයන්ගෙන් ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු, ඉතිරිවන පාඩු සඳහා වන ආවරණයකි. මෙම වැඩපිළිවෙල මඟින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් ප්‍රමාණය පහත දැක්වේ.

| දේශීය වාණිජ බැංකු වෙත ලබාදුන් ණය ඇපකර | නොපියවා පැවැති ඇප ප්‍රමාණය 2025 රු. '000 | 2025 රු. '000 |
|---|---|---|
| සම්බන්ධිත පාර්ශව | **27,773** | 131,687 |
| අනෙකුත් | **–** | 109 |
| මුළු ණය ඇප ප්‍රමාණය | **27,773** | 131,796 |

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය ඇපකර මත අපේක්ෂිත ණය අලාභය, සටහන 38 හි වාර්තා කොට ඇත.

### 52.3 නෛතික හිමිකම්

බැංකුවට එරෙහිව නීති කෘත්‍යන් ගණනාවක් 2025 දෙසැම්බර් 31 දිනට ශේෂව තිබුණු අතර, මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යන්න බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

## 53 බැඳීම්

(අ) 2025 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.මි. 895.7ක ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2025 දෙසැම්බර් 31 දිනට ඉදිරි හුවමාරු ගණුදෙනු පහත පරිදි වේ.

| ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු | | 2025 රු. '000 | 2025 රු. '000 |
|---|---|---|---|
| ඉදිරි විනිමය විකුණුම් | ඇ.එ.ජ. ඩොලර් | **1,930,810** | 1,318,306 |
| | ජපන් යෙන් | **–** | 71,100,000 |
| ඉදිරි විනිමය මිලදී ගැනීම් | ඇ.එ.ජ. ඩොලර් | **–** | 373,500 |

## 54 මූල්‍ය වත්කම් මාරු කිරීම්

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී, මූලිකව දේශීය හා විදේශීය යන දෙවර්ගයෙන්ම පවත්නා ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් බැංකුව විසින් ගණුදෙනු වලට එළඹීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වත්කම් මාරුවීමක් සිදු විය හැක. සටහන් 7.3.6 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, එසේ මාරුකරන ලද මූල්‍ය වත්කම් පෙර හඳුනාගත් ලෙසම හෝ බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට හඳුනා ගැනීමට හෝ සම්පූර්ණයෙන් හඳුනා නොගෙන සිටීමට සිදු විය හැක.

සම්පූර්ණයෙන් ඉවත් නොකරන ලද හෝ පහත ගණුදෙනු තුළින් මූලිකව බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමක් පවතී නම් බැංකුව මූල්‍ය වත්කම් මාරුකිරීමක් සිදුකරයි.

- ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්
- සුරැකුම්පත් ණයට දීම
- සුරැකුම්පත් ඔඩපන කිරීම

### 54.1 සම්පූර්ණයෙන් ඉවත් නොකල නමුත් මාරුකල මූල්‍ය වත්කම්

#### (අ) ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්

බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් වල කොටසක් ලෙස ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ගණුදෙනුවල නිරතවන අතර, හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතුව පැවතීම හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ "ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්" යටතේ එම ප්‍රමාණය සම්පූර්ණයෙන් හඳුනාගෙන තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. ඒ මත ගෙවිය යුතු

මුදල් ප්‍රතිෂ්ඨාව සහ එහි උපචිත පොලිය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේශීය මූල්‍ය වගකීම්හි ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ලෙස හඳුනාගෙන ඇත.

### (ආ) සුරැකුම්පත් ණයට දීම

සුරැකුම්පත් ණය, යන්නෙන් ස්ථාපිත වෙළඳපොළ ව්‍යවහාර විස්තර කරන අතර එමගින්, ගාස්තුවකට යටත්ව, සුරැකුම්පත් එක් පාර්ශවයකගෙන් (ණය දීමනාකරු ශ්‍රී ලංකා මහ බැංකුව), තවත් පාර්ශ්වයකට (ණය ගන්නා) තාවකාලිකව හුවමාරු වීම සිදුවේ. ණයගන්නා ඉල්ලූ විටදී හෝ යම් එකඟ වූ කාලසීමාව අවසානයේදී ඒවා නැවත ලබා දීමට බැඳේ. මේ වන විට අධිජාතික බැඳුම්කර සහ විවිධ නිකුත්කරන්නන් විසින් නිකුත් කරන ලද බැඳුම්කර සඳහා භාරකරු ලෙස තෝරාගත් නිශ්කාශණ ආයතනයක් කටයුතු කරයි. නිශ්කාශණ ආයතනයේ කැමැත්ත පරිදි එම බැඳුම්කර සඳහා වන ඉල්ලුම මත පදනම්ව ණය දීමට බලය පැවරෙන පරිදි බැංකුව ගිවිසුමක් අත්සන් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය දීමට සම්බන්ධ නොවන බැවින් හා නිශ්කාශන ආයතන, ණයකරුවන්ට සෘජුවම ණයදෙන බැවින්, මෙම ක්‍රියාවලිය "ස්වයං බැඳුම්කර ණය දීම" ලෙස හඳුන්වයි. ස්වයං බැඳුම්කර ණය දීමේ වැඩසටහන යටතේ බැඳුම්කර සඳහා යම් ණයදීමක් සිදුකර ඇත්නම්, එක් එක් මාසය අවසානයේ භාරකරු විසින් ස්වයං බැඳුම්කර ණයදීම සඳහා ගාස්තු ශ්‍රී ලංකා මහ බැංකුවට එවනු ලබයි. හිමිකාරීත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතු වීම හේතුවෙන් බැංකුව විසින් එම සුරැකුම්පත් සම්පූර්ණයෙන්ම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාග ැනීම තවදුරටත් සිදු කරයි. මෙම සුරැකුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ "අනෙකුත් විස්තීරණ ආදායම මඟින් සාධාරණ අගයට වූ සුරැකුම්පත්" ලෙස ඉදිරිපත් කරයි.

### (ඇ) සුරැකුම්පත් ඔඩපන කිරීම්

2017 ජනවාරි මාසය දක්වා විදේශීය සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35.0 ක සුරැකුම්පත් එහි ගෝලීය භාරකාර, යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.එ.ජ ඩොලර් මිලියන 30.0 ක ණය පහසුකම් බැංකුව විසින් වෙනමම පවත්වා ගන්නා ගිණුමකට ලබාගන්නා ලදි. පහසු සහ කාර්යක්ෂම පියවීමක් සඳහා ණය මාර්ග පහසුකම යථාවත් කිරීමේ අදහස ඇතිව වර්තමානයේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 3.0 ක වටිනාකමින් යුත් සුරැකුම්පත් යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කර ඇත.

| | 2025 අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් රු. '000 | 2024 අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් රු. '000 |
|---|---|---|
| **වත්කම්** | | |
| යූරෝ ක්ලියර් බැංකුව වෙත ඔඩපන කරන ලද සුරැකුම්පත් | **929,983** | 877,750 |
| වත්කම් වල ධාරණ අගය | **929,983** | 877,750 |

## 55 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් හා අනෙකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදුකරනු ලබයි. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

**55.1** බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති යටතේ විදේශීය ණය සහ ප්‍රදාන මුදාහැරීම් සහ ආපසු ගෙවීම් සිදු කරනු ලැබේ. තවද, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශවීය අරමුදල් රැස් කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම් පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කරනු ලැබේ.

**55.2** බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) මුදල් සම්බන්ධයෙන් භාරකාරත්වය උසුලයි. පනතේ විධිවිධාන ප්‍රකාරව, දායක මුදල් ලබා ගැනීම, අධිභාර ලබා ගැනීම, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම , සේ.අ.අ. ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම පාලක මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය. සේ. අ. අ. හි මූල්‍ය ප්‍රකාශ වෙන්ව පවත්වා ගෙන යන අතර, ඒවා විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

### 55.3 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදල වර්තමානයේදී 2023 අංක 17 දරණ (විශේෂ විධිවිධාන) බැංකු පනත මඟින් පාලනය වේ. සියලුම බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් මෙහි සාමාජිකත්වය දරන අතර වර්තමාන සාමාජිකත්ව ආයතන සංඛ්‍යාව 62කි. මෙම ණය යෝජනා ක්‍රමය මගින් විශේෂිත වූ ණය මූල්‍ය උපකරණ හැරුණු කොට ඉල්ලුම්, කාලීන හා ඉතුරුම් තැන්පතු ආවරණය කරනු ලබයි. සැළකිය යුතු ආකාරයේ කළමණාකරණය කරන ලද මෙම අරමුදලෙහි 2025 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. බිලියන 160.9 ක් ලෙස දැක්වේ. දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන උපරිම වන්දි මුදල් ප්‍රමාණය රු. ලක්ෂ 11 කි. වන්දි ගෙවීම්, අරමුදලේ පවතින්නා වූ ශේෂයට සීමා විය යුතු අතර මුළු ශේෂය ඉක්මවා යන කිසිදු වගකීමකට ශ්‍රී ලංකා මහ බැංකුව වග කියනු නොලැබේ. බැංකුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ පරිපාලනයේ අධීක්ෂණය සම්බන්ධව වගකිව යුතු වන අතර දෛනික මෙහෙයුම් හා අදාළ බලතල, රාජකාරී සහ කාර්යයන් , තැන්පතු රක්ෂණ හා නිරාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත පවරා ඇත. මෙම යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශ වෙනම පවත්වාගෙන යනු ලබන අතර විගණකාධිපති විසින් විගණන කටයුතු සිදු කරනු ලබයි.

**55.4** ශ්‍රී.ලං.ම.බැ. පනතේ 87(1) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි, ශ්‍රී.ලං.ම.බැ. පාලක මණ්ඩලය වෙනුවෙන්, රජය හෝ විදේශ අනුග්‍රාහකයකු විසින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් රජයේ අති විශේෂ නියෝජිතයා ලෙස ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. 2025 දෙසැම්බර් 31 දිනට, මේ ආකාරයට සහභාගීත්ව මූල්‍ය ආයතනවලට ලබා දුන් ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රු.මි. 20,605.61කි.

# 03

# අතිරේක තොරතුරු


197 ප්‍රකාශන සහ තොරතුරු බෙදා හැරීම 2025
198 ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වන සංවත්සරය
200 ප්‍රාදේශීය කාර්යාල
201 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන

# ප්‍රකාශන සහ තොරතුරු බෙදා හැරීම 2025

## ප්‍රකාශනය

### ආර්ථික සහ මූල්‍ය

මූල්‍ය ප්‍රතිපත්ති වාර්තාව - 2025 පෙබරවාරි, 2025 අගෝස්තු

වාර්ෂික ආර්ථික විවරණය 2024

මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් 2024

මූල්‍ය ස්ථායිතා විවරණය 2025

ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028)

වෙළෙඳපොළ මෙහෙයුම් වාර්තාව - 2024 දෙසැම්බර්, 2025 ජූලි

PULSE - ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් විවරණය 2025

### වාර සඟරා

සටහන

නිව්ස් සර්වේ

වෛප්පහම්

### වෙනත් ප්‍රකාශන

මාණ්ඩලික පත්‍රිකා

සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව 2024

මූල්‍ය බුද්ධි ඒකකයේ වාර්ෂික වාර්තාව 2024

නොසැලෙන පහන් ටැඹ - ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වසරක ගමන් මග

මහ බැංකුවෙන් ළමා අතට පොත් පෙළ

ශ්‍රී ලංකාවේ රජයේ අයවැය න්‍යාය සහ පරිචය

දැන් අපිත් දන්නවා (චිත්‍ර කතාව)

## දත්ත සහ තොරතුරු බෙදා හැරීම

### ආර්ථික දර්ශක හා විවරණිකා

සාර්ව ආර්ථික කටයුතු පිළිබඳ ප්‍රස්ථාර එකතුව

ආර්ථික දත්ත එකතුව

දෛනික විදේශ විනිමය අනුපාත

මූල්‍ය සාධනීය දර්ශක

ගෙවීම් සංග්‍රහය

විදේශීය අංශ විවරණිකාව

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන

ආර්ථික දත්ත පිළිබඳ මාසික විවරණිකාව

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ශ්‍රම සංක්‍රමණය පිළිබඳ විවරණිකාව

කෘෂිකර්ම දත්ත විවරණිකාව

දෛනික, සතිපතා සහ මාසික ආර්ථික දර්ශක

ජාතික ගිණුම් ඇස්තමේන්තු

විශේෂ දත්ත ප්‍රචලිත සම්මතය (SDDS) පිළිබඳ ජාතික සාරාංශ දත්ත

දෛනික මිල වාර්තාව (ප්‍රධාන වෙළෙඳපොළ තුළ තෝරාගත් මූලික පාරිභෝගික අයිතම)

රජයේ සුරැකුම්පත් පිළිබඳ දත්ත

### 2025 සහ ඉදිරිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය

**මහ බැංකුවේ අරමුණු වන මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීම සඳහා වන ප්‍රධාන ප්‍රමුඛතා සහ උපායමාර්ගික දිශානතීන් දක්වා ඇති 2025 වර්ෂය සහ ඉදිරිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ජනවාරි මාසයේ දී ඉදිරිපත් කළේ ය. රටේ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන්වලට අනුකූල වන පරිදි සාර්ව ආර්ථික ස්ථායිතාවට සහාය වීම, ආර්ථික ප්‍රකෘතිමත් වීම සඳහා මඟ පෙන්වීම සහ විදේශීය හා මූල්‍ය අංශවල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා සැලසුම් කර ඇති මුදල්, මූල්‍ය සහ ආයතනික පියවරයන් මෙම ප්‍රකාශයේ අන්තර්ගත වේ.**

# ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වන සංවත්සරය

මුදල් හා මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වා ගනිමින් දශක හතකට වැඩි කාලයක් ජාතියට ඉටු කළ මහඟු සේවය සමරමින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය 75 වැනි සංවත්සරය 2025 වසරේ දී සනිටුහන් කළේ ය. තිරසාර ආර්ථික වර්ධනයක් සහ ජාතික සෞභාග්‍යය උදෙසා අවශ්‍ය ස්ථාවර සාර්ව ආර්ථික පරිසරයක් පවත්වාගෙන යාම සඳහා මහ බැංකුවේ අඛණ්ඩ කැපවීම විදහා දක්වමින් මෙම සංවත්සරය "සමෘද්ධිය සඳහා ස්ථාවරත්වය" යන තේමාව යටතේ සමරනු ලැබිය.

ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසර මුළුල්ලෙහි සංවත්සර වැඩසටහන් මාලාවක් සංවිධානය කළ අතර එහි අරමුණ වූයේ බැංකුවේ ආයතනික ජයග්‍රහණ ඉස්මතු කිරීම, දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමඟ පවතින සබඳතා ශක්තිමත් කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදකයින්, විශේෂඥයින් මෙන්ම මහ බැංකු කාර්ය මණ්ඩලය අතර දැනුම හුවමාරු කර ගැනීම ප්‍රවර්ධනය කිරීමයි. එමෙන් ම සමස්ත ප්‍රජාව උදෙසා මහ බැංකුවේ ඇති කැපවීම ද මෙයින් විදහා දැක් වේ.

### 75 වන සාංවත්සරික සමරු දේශනය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය 75 වන සංවත්සරය නිමිති කොට ගෙන විශේෂ සමරු දේශනයක් සංවිධානය කළේ ය. මහ බැංකු අධිපතිතුමා විසින් අර්බුද සමයක දී, ඉන් මිදී යථා තත්ත්වයට පත්වීමේ දී හා ඉන් අනතුරුවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය වැදගත් වන්නේ කෙසේ ද යන තේමාව යටතේ මෙම විශේෂ සමරු දේශනය සිදු කරන ලදි. විශේෂයෙන් ම අර්බුදකාරී සමයක දී සාර්ව ආර්ථික ස්ථායීතාව ඇති කිරීම උදෙසා මහ බැංකුවේ ස්වාධීනත්වය කාලීන වශයෙන් කෙතරම් වැදගත් වනවා ද යන්න මෙම දේශනයෙන් මැනවින් පැහැදිලි වේ. ප්‍රතිපත්ති කෙරෙහි වන විශ්වාසනීයත්වය ඉහළ නැංවීම, කාර්යක්ෂම ව උද්ධමනය කළමනාකරණය කිරීම, කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගෙන යාම කෙරෙහි මහ බැංකුවේ ස්වාධීනත්වය දායක වන අයුරු ද මෙහි දී අවධාරණය කරන ලදි.

ප්‍රතිපත්ති සම්පාදකයින් අධ්‍යාපනවේදීන් සහ බැංකු ක්ෂේත්‍රය හා සම්බන්ධ වෘත්තියවේදීන් මේ අවස්ථාවට සහභාගී වූ අතර අප රටේ ආර්ථික සහ මූල්‍ය ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය පිණිස මහ බැංකුවේ ගමන් මග හා එහි කාර්යයන් විකාශය වූ ආකාරය මෙතුළින් පැහැදිලි විය.



*මහ බැංකු අධිපතිතුමා 75 වන සංවත්සර දේශනය පැවැත්වීම*

### රුපියල් 2000 සමරු නෝට්ටුව සහ සමරු තැපැල් මුද්දරය නිකුත් කිරීම

75 වන සංවත්සර සැමරුම සනිටුහන් කරමින් මහ බැංකුව විසින් "සමෘද්ධිය සඳහා ස්ථාවරත්වය" යන සංවත්සර තේමාවට අනුකූල ව රුපියල් 2,000 සමරු මුදල් නෝට්ටුවක් නිකුත් කරන ලදි. මෙය මහ බැංකුව විසින් නිකුත් කරන ලද පස්වන සමරු මුදල් නෝට්ටුවයි.

මීට අමතර ව තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශය මඟින් විශේෂ සමරු තැපැල් මුද්දරයක් ද නිකුත් කරන ලදි. තව ද මහ බැංකුවේ ඉතිහාසය, වැදගත් සන්ධිස්ථාන සහ පරිණාමය වෙමින් පවතින එහි කාර්යභාරය ඉස්මතු කෙරෙන විශේෂ පුවත්පත් අතිරේකයක් ජාතික පුවත්පත්වල පළ කරන ලදි.



*රුපියල් 2,000 සමරු මුදල් නෝට්ටුව මහ බැංකු අධිපතිතුමා විසින් ගරු ජනාධිපතිතුමා වෙත නිල වශයෙන් පිළිගැන්වීම*




*තැපැල් දෙපාර්තමේන්තුව විසින් විශේෂ සමරු තැපැල් මුද්දරයක් නිකුත් කිරීම*

### දැනුම හුවමාරු කර ගැනීම සහ ප්‍රතිපත්තිමය සංවාද

ප්‍රතිපත්ති සම්පාදකයින්, විද්වතුන් සහ මූල්‍ය අංශයේ විශේෂඥයින් අතර සංවාදය ශක්තිමත් කිරීම සඳහා දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන් කිහිපයක් ද සංවිධානය කරන ලදි.

මෑතකාලීන ආර්ථික අභියෝග ජය ගනිමින් මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සුරක්ෂිත කිරීමේ දී ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය ඉස්මතු කරමින් 2025 මැයි 23 වන දින "මූල්‍ය ස්ථායීතා සමුළුව" කොළඹ දී පවත්වන ලදි.

2025 දෙසැම්බර් 8 සිට 10 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත් වූ 2025 ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය ප්‍රධාන වැඩසටහන් තුනකින් සමන්විත විය:

- ශ්‍රී ලංකා මහ බැංකුවේ 14 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය,
- 2025 සාර්ක් ෆිනෑන්ස් (SAARCFINANCE) දත්ත සමුදාය පිළිබඳ සම්මන්ත්‍රණය, සහ
- ආසියානු සංවර්ධන බැංකුව සහ ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලද 6 වන ඒකාබද්ධ වැඩමුළුව.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ 75 වන සංවත්සරය

මීට අමතර ව මොන්ටෙක් සිං අලුවාලියා මහතාගේ ප්‍රධාන දේශනයෙන් වර්ණවත් වූ "වෙනස් වන ගෝලීය පරිසරයක් තුළ වර්ධන උපාය මාර්ගයක් සකස් කිරීම" මැයෙන් වූ ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයක් 2025 ඔක්තෝබර් 10 වන දින පවත්වන ලදි.



*මොන්ටෙක් සිං අලුවාලියා මහතා පැවැත් වූ ප්‍රසිද්ධ දේශනය*

### ප්‍රජා සහභාගීත්වය සහ සංස්කෘතික වැඩසටහන්

සංවත්සර වැඩසටහන් මාලාවේ අංගයක් ලෙස මහජන සහභාගීත්වය ශක්තිමත් කිරීමට සහ සමාජ වගකීම් ප්‍රවර්ධනය කිරීමට විශේෂාංග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි. මූල්‍ය කරුණු පිළිබඳ ව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල මගින් විශේෂ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් හයක් පවත්වන ලදි.

"මිහිකතට ආදරයෙන්" යන නමින් නම් කරන ලද රුක් රෝපණ වැඩසටහන අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිනිය විසින් අධිපති නිල නිවස, බැංකු විදු පියෙස සහ මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයන්හි දී සිදු කරන ලදි.



*"මිහිකතට ආදරයෙන්" රුක් රෝපණ වැඩසටහන*

මීට අමතර ව ආර්ථික හා මූල්‍ය තේමාවන් පිළිබඳ ව මහජන අවබෝධය සහ සහභාගීත්වය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් දීපව්‍යාප්ත චිත්‍ර තරගයක් සහ ප්‍රදර්ශනයක් පවත්වන ලදි.




*දීපව්‍යාප්ත චිත්‍ර තරගය සහ ප්‍රදර්ශනය*

සංවත්සරය සැමරීම සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය සබඳතා ශක්තිමත් කිරීම සඳහා සංස්කෘතික හා ආගමික වැඩසටහන් කිහිපයක් ද සංවිධානය කරන ලදි.



*සර්ව ආගමික වතාවත් සිදු කිරීම*

ශ්‍රී ලංකා මහ බැංකුවේ බෞද්ධ සංගමය 2025 අගෝස්තු 29 දින පිරිත් දේශනයක් සහ පසු දින හීල් දානමය පින්කමක් සංවිධානය කළේ ය.



*සර්ව රාත්‍රික පිරිත් දේශනය*

2025 ජූලි 26 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ සිංහල සංස්කෘතික සංගමය විසින් "හැන්දෑව" නමින් සංස්කෘතික වැඩසටහනක් බැංකු විදු පියසේ දී පවත්වන ලදි. එම සංගමය විසින් බැංකුවේ 75 වසරක ගමන් මඟ සනිටුහන් කරමින් "අභිමානී" නමින් විශේෂ සමරු ගීතයක් ද එළිදක්වන ලදි.




*"හැන්දෑව", සංස්කෘතික විශේෂාංගය, බැංකු විදු පියෙසේ දී*

මීට අමතර ව මහ බැංකුවේ සේවා වනිතා ඒකකය විසින් 75 වන සංවත්සරය වෙනුවෙන් ප්‍රජා සත්කාරක වැඩසටහනක් ලෙස 2025 නොවැම්බර් 8 වන දින පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් දෙකක් සඳහා පුස්තකාල දෙකක් පරිත්‍යාග කරන ලදි.

මෙමගින් මහ බැංකු කාර්ය මණ්ඩලය ආයතනික විශිෂ්ටත්වයට අමතර ව සමාජ වගකීම සහ දැනුම බෙදා දීම පිළිබඳ ඔවුන්ගේ ස්වේච්ඡා කැපවීම ඉස්මතු කරයි.

# ප්‍රාදේශීය කාර්යාල

රූප සටහන - 17



ප්‍රාදේශීය කාර්යාලය – අනුරාධපුර

**කළමනාකරු - පාලිත අබේසිංහ**
තැ.පෙ. 02, පියවර 01,
අනුරාධපුරය.
දුරකථන: 025 2222024
විද්‍යුත් ලිපිනය: roapura@cbsl.lk



ප්‍රාදේශීය කාර්යාලය - කිලිනොච්චිය

**කළමනාකරු - පහීරති සෙන්තිල්මරන්**
අරිවියල් නගර්, කිලිනොච්චිය.
දුරකථන: 021 2285912
විද්‍යුත් ලිපිනය: rokn@cbsl.lk





ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ

**කළමනාකරු - යසිනි රාජපක්ෂ**
අංක 805, ත්‍රිකුණාමල වීදිය,
මණ්ඩන්ඩාවල,
මාතලේ.
දුරකථන: 066 2222167
විද්‍යුත් ලිපිනය: romatale@cbsl.lk



ප්‍රාදේශීය කාර්යාලය - ත්‍රිකුණාමලය

**කළමනාකරු - කරුපයියා ප්‍රභාකරන්**
අංක 103, තැපැල් කාර්යාලය පාර,
ත්‍රිකුණාමලය.
දුරකථන: 026 2226965
විද්‍යුත් ලිපිනය: po-ep@cbsl.lk



ප්‍රාදේශීය කාර්යාලය - මාතර

**කළමනාකරු - සුමුදු ගුණරත්න**
තැ.පෙ. 35, අනගාරික ධර්මපාල මාවත,
මාතර.
දුරකථන: 041 2222269
විද්‍යුත් ලිපිනය: romatara@cbsl.lk



ප්‍රාදේශීය කාර්යාලය - නුවරඑළිය

**කළමනාකරු - යසස්නි අමරසේකර**
අංක 84, බදුල්ල පාර,
නුවරඑළිය.
දුරකථන: 052 2235439
විද්‍යුත් ලිපිනය: rone@cbsl.lk

# ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන හා අධීක්ෂණය කරනු ලබන ආයතන (2025 දෙසැම්බර් 31 දිනට)**

## බලපත්‍රලාභී වාණිජ බැංකු

- අමානා බැන්ක් පී එල් සී
- ඉන්දියන් ඕවර්සීස් බැන්ක්
- ඉන්දියන් බැන්ක්
- එම් සී බී බැන්ක් ලිමිටඩ්
- කාර්ගිල්ස් බැන්ක් පී එල් සී
- කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී
- ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී
- ඩොයිෂ් බැන්ක් ඒ ජී
- ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින්ග් කෝර්පරේෂන් ලිමිටඩ්
- නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
- නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී
- පබ්ලික් බැන්ක් බර්හාඩ්
- පෑන් ඒෂියා බැන්කින්ග් කෝර්පරේෂන් පී එල් සී
- බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
- මහජන බැංකුව
- යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී
- ලංකා බැංකුව
- ස්ටැන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැන්ක්
- ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
- සම්පත් බැන්ක් පී එල් සී
- සිටි බැන්ක් එන් ඒ
- සෙලාන් බැන්ක් පී එල් සී
- හබිබ් බැන්ක් ලිමිටඩ්
- හැටන් නැෂනල් බැන්ක් පී එල් සී

## බලපත්‍රලාභී විශේෂිත බැංකු

- ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
- ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
- ශ්‍රී ලංකා සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්
- සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී

## විදේශ බැංකුවල නියෝජිත කාර්යාල

- අයි සී අයි සී අයි බැන්ක් ලිමිටඩ්
- එම් යූ එෆ් ජී බැන්ක් ලිමිටඩ්
- ජේ පී මෝගන් චේස් බැන්ක් එන් ඒ

## මුදල් සමාගම්

- අබාන්ස් ෆිනෑන්ස් පී එල් සී
- ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ්
- ඇසෝෂියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී(අ)
- එච් එන් බී ෆිනෑන්ස් පී එල් සී
- එල් ඕ එල් සී ෆිනෑන්ස් පී එල් සී
- එල් බී ෆිනෑන්ස් පී එල් සී
- එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී
- එස් එම් බී ෆිනෑන්ස් පී එල් සී
- ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පී එල් සී
- කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- ජනශක්ති ෆිනෑන්ස් පී එල් සී(ආ)
- ඩයලොග් ෆිනෑන්ස් පී එල් සී
- නේෂන් ලංකා ෆිනෑන්ස් පී එල් සී(ඇ)
- පී එම් එෆ් ෆිනෑන්ස් පී එල් සී
- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්මස් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
- යූ බී ෆිනෑන්ස් පී එල් සී
- රිච්ඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ්
- ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පී එල් සී
- වැලිබල් ෆිනෑන්ස් පී එල් සී
- සර්වෝදය ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පී එල් සී
- සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී එල් සී
- සිටිසන්ස් ඩිවෙලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පී එල් සී
- සියපත ෆිනෑන්ස් පී එල් සී
- සීබීසී ෆිනෑන්ස් පී එල් සී(ඇ)
- සෙංකඩගල ෆිනෑන්ස් පී එල් සී
- සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී
- සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පී එල් සී
- ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් පී එල් සී

සටහන : 2023.12.15 වන දින, කොළඹ වාණිජ මහාධිකරණය විසින් ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය අධිකරණ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීමට නියම කරන ලදී. තවද, ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයෙහි ඈවරකරු වශයෙන් කොළඹ 04, කාසල් පටුමග, අංක 11, 03 වන මහල, එස් ජේ එම් එස් ඇසෝසියේට්ස්/බාරේ යන ලිපිනය දරන ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් මහතා පත් කිරීමට ද අධිකරණය නියෝග කරන ලදී.

## ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

(i) බලපත්‍රලාභී වාණිජ බැංකු

- අමානා බැන්ක් පී එල් සී
- එම් සී බී බැන්ක් ලිමිටඩ්
- කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී
- ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී
- නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
- නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී
- පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී
- යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී
- ලංකා බැංකුව
- සම්පත් බැන්ක් පී එල් සී
- සෙලාන් බැන්ක් පී එල් සී
- හැටන් නැෂනල් බැන්ක් පී එල් සී

(ii) බලපත්‍රලාභී විශේෂිත බැංකු

- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
- ශ්‍රී ලංකා සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්
- සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී

# ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන

### (iii) මුදල් සමාගම්

- අබාන්ස් ෆිනෑන්ස් පී එල් සී
- එච් එන් බී ෆිනෑන්ස් පී එල් සී
- එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී
- ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පී එල් සී
- ඩයලොග් ෆිනෑන්ස් පී එල් සී
- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
- ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පී එල් සී
- සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී එල් සී
- සීබීසී ෆිනෑන්ස් පී එල් සී[ඈ]
- සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පී එල් සී
- ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ්
- එල් ඕ එල් සී ෆිනෑන්ස් පී එල් සී
- එස් එම් බී ෆිනෑන්ස් පී එල් සී
- කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- නේෂන් ලංකා ෆිනෑන්ස් පී එල් සී[ඇ]
- මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්මස් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- යූ බී ෆිනෑන්ස් පී එල් සී
- වැලිබල් ෆිනෑන්ස් පී එල් සී
- සිටිසන්ස් ඩිවෙලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පී එල් සී
- සෙංකඩගල ෆිනෑන්ස් පී එල් සී
- ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් පී එල් සී
- ඇසෝෂියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී[අ]
- එල් බී ෆිනෑන්ස් පී එල් සී
- ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- ජනශක්ති ෆිනෑන්ස් පී එල් සී[ආ]
- පී එම් එෆ් ෆිනෑන්ස් පී එල් සී
- මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ්
- සර්වෝදය ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පී එල් සී
- සියපත ෆිනෑන්ස් පී එල් සී
- සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී

### (iv) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම

- කෝපරේට්ව් ලීසිං කම්පැනි ලිමිටඩ්

සටහන : 2023.12.15 වන දින, කොළඹ වාණිජ මහාධිකරණය විසින් ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය අධිකරණ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීමට නියම කරන ලදී. තවද, ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයෙහි ඈවරකරු වශයෙන් කොළඹ 04, කාසල් පටුමග, අංක 11, 03 වන මහල, එස් ජේ එම් එස් ඇසෝසියේට්ස්/බාරේ යන ලිපිනය දරන ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් මහතා පත් කිරීමට ද අධිකරණය නියෝග කරන ලදී.

## බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්

- දූම්බර මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
- සෙජය මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
- බෙරෙන්ඩිනා මයික්‍රො ඉන්වෙස්ට්මන්ට්ස් කම්පැනි ලිමිටඩ්
- ලක් ජය මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්

## ප්‍රාථමික අලෙවිකාර සමාගම්

- එච් එන් බී සෙකියුරිටීස් ලිමිටඩ්
- කැපිටල් එලයන්ස් පී එල් සී
- ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී එල් සී
- එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැණි ලිමිටඩ්
- පර්පචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්[ඊ]
- එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී එල් සී[ඉ]
- වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්[උ]

## බලයලත් මුදල් තැරැව්කරණ සමාගම්

- එම් වී එස් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
- පිගට් චැප්මන් ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
- සෙන්ට්‍රල් ෆොරෙක්ස් ඇන්ඩ් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
- ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- බී එම් ආර් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ෆස්ට් එලායන්ස් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- තැප්‍රොබේන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- විෂ්වින් මනි ඇන්ඩ් එක්ස්චේන්ජ් බ්‍රෝකර්ස් ලිමිටඩ්

[අ] 2025.11.24 වන දින එල් බී ෆිනෑන්ස් පී එල් සී ආයතනය විසින් ඇසෝෂියේටඩ් මෝටර් ෆිනෑන්ස් පී එල් සී ආයතනයෙහි 73.11% ක කොටස් හිමිකම ලබාගෙන ඇත.

[ආ] 2025.05.09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔරියන්ට් ෆිනෑන්ස් පී එල් සී ආයතනයෙහි නම ජනශක්ති ෆිනෑන්ස් පී එල් සී ලෙස වෙනස් කර ඇත.

[ඇ] නේෂන් ලංකා ෆිනෑන්ස් පී එල් සී ආයතනය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන අඛණ්ඩ ව කඩ කිරීම/පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් නව තැන්පතු ද ඇතුළු ව කුමන ආකාරයෙන් හෝ මහජන අරමුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් සීමා පනවන ලදී. තව ද, 2025.07. 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. ඒ අනුව සමාගමට අද්මිනිස්ත්‍රාසිවරයකු පත් කරන ලදී.

[ඈ] 2025.12.30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයෙහි නම සී බී සී ෆිනෑන්ස් පී එල් සී ලෙස වෙනස් කර ඇත.

[ඉ] එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී එල් සී ආයතනය 2017.07.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි කටයුතුවලට සහභාගී වීම අත්හිටුවා ඇත. අනාරක්ෂිත ආයෝජකයකු විසින් මෙම සමාගම ණයහිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගනන් බේරා වසා දැමීම සඳහා වන ඉල්ලීමක් කරන ලද අතර අධිකරණය විසින් 2022.06.17 දින ගණන් බේරා වසා දැමීම සඳහා වන නියෝගය ලබා දෙන ලදී. ගණන් බේරා වසා දැමීම සඳහා ගොනු කළ නඩුව (CHC 83/2021/CO) අධිකරණයේ විභාග වෙමින් පවතී.

[ඊ] 2017.07.06 වන දින සිට පර්පචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනය ප්‍රාථමික අලෙවිකරුවෙකු වශයෙන් කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් කරගෙන යෑම අත්හිටුවා ඇති අතර, වර්තමාන අත්හිටුවීම 2026.07.05 දින දක්වා ක්‍රියාත්මක වේ.

[උ] 2026.02.19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් ආයතනයෙහි නම වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් පී එල් සී ලෙස වෙනස් කර ඇත.

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන

### විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සඳහා බලයලත් වෙළෙන්දන්ගේ සහ බලයලත් මුදල් හුවමාරු කරන්නන්ගේ ලැයිස්තුව (2025 දෙසැම්බර් 31 දිනට)

#### බලයලත් වෙළෙන්දන්ගේ ලැයිස්තුව

(i) බලපත්‍රලාභී වාණිජ බැංකු

- අමානා බැන්ක් පී එල් සී
- ඉන්දියන් ඕවර්සීස් බැන්ක්
- ඉන්දියන් බැන්ක්
- එම්.සී.බී. බැන්ක් ලිමිටඩ්
- කාගිල්ස් බැන්ක් ලිමිටඩ්
- කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී
- චීන බැංකුව
- ඩී.එෆ්.සී.සී. බැන්ක් පී එල් සී
- ඩොයිෂ් බැන්ක් ඒ.ජී
- ද හොංකොං ඇන්ඩ් ෂැන්ග්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
- නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
- නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී
- පබ්ලික් බැනක් බහාර්ඩ්
- පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී
- මහජන බැංකුව
- යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී
- ලංකා බැංකුව
- ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව
- ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
- සම්පත් බැන්ක් පී එල් සී
- සෙලාන් බැනක් පී එල් සී
- සිටි බැන්ක් එන්.ඒ
- හබීබ් බැන්ක් ලිමිටඩ්
- හැටන් නැෂනල් බැංකුව පී එල් සී

(ii) බලපත්‍රලාභී විශේෂිත බැංකු

- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- සණස සංවර්ධන බැංකුව පී එල් සී

#### බලයලත් මුදල් හුවමාරු කරන්නන්ගේ ලැයිස්තුව

A කාණ්ඩය: මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ පමණක් නියැලෙන සමාගම්

(i) විදේශ මුදල් මිළදී ගැනීමට හා හුවමාරු කිරීමට අවසර ලබා ඇති බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්

- අභිලාශ් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ආබ්දීන් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම
- ආර්මෙක්ස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ආරියවංස එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) සමාගම
- ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ඒෂියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- කළම්බු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01
- කළම්බු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06
- කැපිටල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- කේසර් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ක්‍රවුන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ග්ලෝබල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ග්ලෝබල් විලේජ් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - ගාල්ල
- ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - ගාල්ල කොටුව
- ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - වැලිගම
- ගෝල්ඩන් මනි චේන්ජර් (පුද්.) සමාගම
- ජුවෙල් ලංකා මනි චේන්ජර් (පුද්.) සමාගම - මීගමුව
- ජේ එල් එස් මිතිරා - යාපනය
- ජෝර්ජ් මයිකල් හොල්ඩින්ස් (පුද්.) සමාගම
- ඩෙිටා එක්ස්චේන්ජ් ඉන්ටර්නැෂනල් පුද්. සමාගම
- තෝමස් කුක් ලංකා (පුද්ගලික) සමාගම - කොළඹ 02 - කළම්බු සිටි සෙන්ටර්
- තෝමස් කුක් ලංකා (පුද්ගලික) සමාගම - කොළඹ 02 - වන් ගෝල් ෆේස් සාප්පු සංකීර්ණය
- තෝමස් කුක් ලංකා (පුද්ගලික) සමාගම - මහනුවර
- දැඩිගම ශොප් (පුද්.) සමාගම
- දේවි ෆොරෙක්ස් (පුද්.) සමාගම
- නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්.) සමාගම - කිලිනොච්චි
- නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්.) සමාගම - යාපනය
- නව නාතාෂා (පුද්.) සමාගම
- නිව් රීගල්ස් මනි චේන්ජ් (පුද්.) සමාගම
- ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06
- පුෂ්පා මනි චේන්ජ් (පුද්.) සමාගම
- ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01
- බූලියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- මයූරි මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- මරුති මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06
- මරුති මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - යාපනය
- මෙට්‍රෝ ෆොරෙක්ස් (පුද්.) සමාගම
- මිලානෝ මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- යුනික් ෆොරෙක්ස් (පුද්ගලික) සමාගම
- රිව්දු එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම
- රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01
- රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06
- රෝයල් ෆොරෙක්ස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - මැජස්ටික් සිටි
- රෝයල් ෆොරෙක්ස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - හැව්ලොක් සිටි සාප්පු සංකීර්ණය
- රෝයල් මනි මාර්ට් (පුද්.) සමාගම - අලුත්ගම
- රෝයල් මනි මාර්ට් (පුද්.) සමාගම - කොළඹ 01
- ලංකා ෆොරෙක්ස් මනි චේන්ජර් (පුද්.) සමාගම - ක්‍රෙස්කැට් බුල්වර්ඩ්
- වෙස්ටර්න් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- වින්ඩ්සර් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ෂිෆාස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01
- ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06
- සෙන්ට්‍රල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- සිටි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම
- හයිෆා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (පුද්.) සමාගම

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන ආයතන

### (ii) විදේශ මුදල් මිළදී ගැනීමට, හුවමාරු කිරීමට සහ විකිණීමට අවසර ලබා ඇති බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්

- අරුජිනා ජුවලරි (පුද්.) සමාගම
- තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල
- රවී ෆොරෙක්ස් (පුද්.) සමාගම

### B කාණ්ඩයː විදේශ මුදල් මිළදී ගැනීමට, හුවමාරු කිරීමට සහ විකිණීමට අවසර ලබා ඇති ලියාපදිංචි මූල්‍ය සමාගම්

- එල් බී ෆිනෑන්ස් පී එල් සී
- ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පී එල් සී
- ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පී එල් සී
- සෙංකඩගල ෆිනෑන්ස් පී එල් සී
- සිටිසන්ස් ඩිවලප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පී එල් සී
- සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී එල් සී

### C කාණ්ඩයː විදේශ විනිමය ගනුදෙනු කිරීමට අවසර ඇති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල්

- අයි ටී සී රත්නදීප - කොළඹ 01
- ට්‍රින්කො බ්ලූ බයි සිනමන්
- පර්ල් සිටි හෝටල් (පුද්) සමාගම
- ෂැංග්‍රිලා හම්බන්තොට රිසෝට් ඇන්ඩ් ස්පා
- ෂැංග්‍රි-ලා හොටෙල් කළම්බු
- සිනමන් බෙන්තොට බීච්
- සිනමන් බේ බේරුවල
- සිනමන් ලො(ඩ්)ජ් හබරණ
- සිනමන් වයිල්ඩ් යාල
- සිනමන් සිටාඩෙල් කැන්ඩි
- හබරණ විලේජ් බයි සිනමන්
- හික්කා ට්‍රාන්ස් බයි සිනමන්

## 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ බලපත්‍රලාභී සේවා සපයන්නන් (2025 දෙසැම්බර් 31 දිනට)

### බලපත්‍රලාභී වාණිජ බැංකු

- අමානා බෑන්ක් පී එල් සී
- එම් සී බී බෑන්ක් ලිමිටඩ්
- කාගිල්ස් බෑන්ක් පී එල් සී
- කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී එල් සී
- ඩී එෆ් සී සී බෑන්ක් පී එල් සී
- ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ්
- නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී එල් සී
- නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී එල් සී
- පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී එල් සී
- මහජන බැංකුව
- යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී එල් සී
- ලංකා බැංකුව
- ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බෑන්ක්
- ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්දියා
- සම්පත් බෑන්ක් පී එල් සී
- සෙලාන් බෑන්ක් පී එල් සී
- හබිබ් බෑන්ක් ලිමිටඩ්
- හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී

### බලපත්‍රලාභී විශේෂිත බැංකු

- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- සණස ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී එල් සී

### බලපත්‍රලාභී මුදල් සමාගම්

- එල් බී ෆිනෑන්ස් පී එල් සී
- එල් ඕ එල් සී ෆිනෑන්ස් පී එල් සී
- ඩයලොග් ෆිනෑන්ස් පී එල් සී
- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී එල් සී
- සිටිසන්ස් ඩිවෙලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පී එල් සී
- සෙංකඩගල ෆිනෑන්ස් පී එල් සී
- සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී
- ෆින්ටෙක්ස් ෆිනෑන්ස් පී එල් සී

### මූල්‍ය නොවන ආයතන

- ග්ලෝබල් පේමන්ට්ස් ඒෂියා පැසිෆික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
- ඩයලොග් ආසියාටා පී එල් සී
- මොබිටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්

## ශ්‍රී ලංකා මහ බැංකුව

### නෛතිකභාවය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පිහිටුවන ලදී

### බදු ගෙවන්නන් හඳුනා ගැනීමේ අංකය

409035027

### සබඳතා තොරතුරු

ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 00100
ශ්‍රී ලංකාව

දුරකථනː +94 11 247 7000

ෆැක්ස්ː +94 11 234 6304

විද්‍යුත් තැපැලː cbslgen@cbsl.lk

වෙබ් අඩවියː www.cbsl.gov.lk

### SWIFT කේතය

CBCELKLX

### 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත

**නම් කරන ලද නිලධාරි**

ආචාර්ය නන්දලාල් වීරසිංහ
අධිපති

**තොරතුරු නිලධාරි**

නෙළුමනී දවුලගල මිය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති
rti@cbsl.lk

### විගණක

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල

SMART
MEDIA
The
ANNUAL REPORT
Company
Produced by Smart Media,
a GHG-neutral company
since 2011



STABILITY FOR PROSPERITY
1950-2025

**ශ්‍රී ලංකා මහ බැංකුව**

අංක 30
ජනාධිපති මාවත
කොළඹ 00100
ශ්‍රී ලංකාව

https://www.cbsl.gov.lk

ISBN 978-624-6764-28-9